ලංකා විදුලිබල මණ්ඩලය







50 සංවත්සරය
ஆண்டுவிழா
ANNIVERSARY
1969 - 2019

# වාර්ෂික වාර්තාව
# 2019

# පටුන


අපගේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම 1
අපගේ පාරිසරික ප්‍රතිපත්තිය 2
වසරේ විශේෂ අවස්ථා 3
50 වන සංවත්සරයෙහි විශේෂ අවස්ථා 4
අතීත කාර්ය සාධනය 6
ආයතනික තොරතුරු 7
සංවිධාන ව්‍යුහය 8
අනු ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2019 10
සභාපතිගේ සමාලෝචනය 12
සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය 16
ලංවිම සම්ප්‍රේෂණ ජාලය 19
මෙහෙයුම් සමාලෝචනය 20
- ජනන අංශය 20
- සම්ප්‍රේෂණ අංශය 31
- බෙදාහැරීමේ අංශයන් 43
- ව්‍යාපෘති අංශය 53
- වත්කම් කළමණාකරන අංශය 64
- ආයතනික ක්‍රමෝපාය අංශය 71
- වෙනත් ශාඛාවන්/ඒකක සහ සිදුවීම් 77
- මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු 89

අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 98
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 101
විසතීර්ණ ආදායම් ප්‍රකාශනය 102
මූල්‍ය තත්ව ප්‍රකාශනය 103
සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 104
මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 106
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 107
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 108
විගණකාධිපති වාර්තාව (සමූහ මූල්‍ය ප්‍රකාශන) 163
විගණකාධිපති වාර්තාවට පිළිතුරු 170
විගණකාධිපති වාර්තාව (ලංවිම මූල්‍ය ප්‍රකාශන) 178
විගණකාධිපති වාර්තාවට පිළිතුරු 185
කෙටි යෙදුම් 197




# අපගේ දැක්ම

සසිරිමත් දිවියකට විදුලිය

# අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට අනුගත වෙමින්
සමස්ත ශ්‍රී ලංකාවට කාර්යක්ෂම සමායෝජිත
සහ සකසුරුවම් විදුලිය සැපයුමක්
සංවර්ධනය කර පවත්වාගෙන යාම

# අපගේ සාරධර්ම

ගුණාත්මක බව | ජාතියට සේවා සැලසීම | කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව
කැපවීම | සුරක්ෂිත බව | වෘත්තීය නිපුණතාව
තිරසාර බව



# අපගේ පාරිසරික ප්‍රතිපත්තිය

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටු කරන්නේ ස්වභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගිකයන්, බලධාරීන්, සේවකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුගලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.


අලෙවියෙන් ලද ආදායම-2019
රුපියල් මිලියන 242,950
විදුලිය සපයන ලද නිවාස 2019
108,315
ශුද්ධ ජනනය - 2019
15,922 ගි.වො.පැ.
Rs.
අලෙවි කරන මිල
16.63
රු./කි.වො.පැ.
පිරිවැය
23.29
රු./කි.වො.පැ.
අලෙවි කළ බලශක්තිය 2019
ගි.වො.පැ. 14,611
වහළය මත සවිකරන සූර්යබල ඒකක
ගි.වො.පැ. 182
සේවකයන්
26,114
පාරිභෝගික ගිණුම්
6,500,641





ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් දියත් කරන ලද පැළ 50,000ක් සිටුවීමේ වැඩසටහන සම්පූර්ණ කරනු පිණිස විහාරමහාදේවී උද්‍යානයේ පැළ සිටුවීම



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් ලං.වි.ම. සුභසාධක ඒකකය විසින් 2019 නොවැම්බර් මස පළමුවැනි දින ප්‍රධාන කාර්යාලයේදී සංවිධානය කරන ලද පිරිත් පිංකම





2019 නොවැම්බර් මස පළමුවැනි දින ලං.වි.ම. 50වන සංවත්සර සැමරුම සඳහා බෙදාහැරීමේ අංශය 3, මාලබේ හි අළුතින් විවෘත කරන ලද මනු පරීක්ෂාගාරයේදී සංවිධානය කරන ලද පිරිත් පිංකම

# විශේෂ අවස්ථා

50 සංවත්සරය
ஆண்டுவிழா
ANNIVERSARY
1969 - 2019



පාරිභෝගික සේවා අංශය විසින් සංවිධානය කරන ලදුව ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් 2019 නොවැම්බර් මස පළමුවැනි දින පවත්වන ලද වසර 2017, 2018, 2019 නවෝත්පාදන තරගයන්හි ත්‍යාග ප්‍රදානෝත්සවය





ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් 2019 ඔක්තෝබර් මාසයේදී සිංහල හා දෙමළ මාධ්‍ය අන්තර් පාසල් අවසාන ප්‍රහේළිකා තරගය හා ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වන ලදී



50වන සාංවත්සරික සැමරුම 2019 නොවැම්බර් පළමුවන දින ප්‍රධාන කාර්යාලයෙදී පවත්වන ලදී








2019 නොවැම්බර් මස පළමුවැනි දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද 50වන සංවත්සර සැමරුම





ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් දියත් කරන ලද පැළ 50,000ක් සිටුවීමේ වැඩසටහන සම්පූර්ණ කරනු පිණිස මාවිල් ආරු රක්ෂිතයේ පැළ සිටුවීම



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් දියත් කරන ලද පැළ 50,000ක් සිටුවීමේ වැඩසටහන සම්පූර්ණ කරනු පිණිස මාදැස්සාකැලේ ජල පෝෂක ප්‍රදේශයේ ගස් සිටුවීම



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් දියත් කරන ලද පැළ 50,000ක් සිටුවීමේ වැඩසටහන සම්පූර්ණ කරනු පිණිස නිළම්බේ ජල පෝෂක ප්‍රදේශයේ ගස් සිටුවීම.



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් කොළඹ නගර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය විසින් සංවිධානය කරන ලද පැළ සිටුවීමේ වැඩසටහන



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් CEB Care පාරිභෝගික හිතවාදී ජංගම යෙදවුම දියත් කිරීම



ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් ලං.වි.ම. උතුරු පළාත් කාර්යාල කාර්ය මණ්ඩල සුභසාධක හා ක්‍රීඩා සමාජය හා කොළඹ නගරයේ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) ඒකකය ඒකාබද්ධව සංවිධානය කරන ලද ලේ දන්දීමේ වැඩසටහන්



ලං.වි.ම. සුභසාධන ඒකකය 2019 නොවැම්බර් මස පළමුවන දින ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේදී ලේ දන්දීමේ කඳවුරක් පැවැත්වීය



# අතීත කාර්ය සාධනයන්

| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දළ බලශක්ති ජනනය (ගි.වො.පැ.)** | 9,882 | 10,714 | 11,528 | 11,801 | 11,962 | 12,423 | 13,154 | 14,249 | 14,773 | 15,985 | 16,556 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය* (ගි.වො.පැ.) | 552 | 731 | 725 | 736 | 1,179 | 1,217 | 1,467 | 1,160 | 1,464 | 1,832 | 1,761 |
| **උපරිම ඉල්ලුම (මෙ.වො.)** | 1,868 | 1,955 | 2,163 | 2,146 | 2,164 | 2,152 | 2,283 | 2,453 | 2,523 | 2,616 | 2,669 |
| විදුලිය අලෙවිය (ගි.වො.පැ.) | 8,441 | 9,268 | 10,023 | 10,474 | 10,621 | 11,063 | 11,786 | 12,785 | 13,431 | 14,091 | 14,611 |
| **පාරිභෝගික ගිණුම් (සංඛ්‍යාවන්)** | 4,280,168 | 4,480,423 | 4,717448 | 4,979,862 | 5,210,761 | 5,417,532 | 5,648,132 | 5,964,194 | 6,193,131 | 6,354,281 | 6,500,641 |
| පද්ධතිමය බලශක්ති හානිය (%) | 14.59 | 12.97 | 11.72 | 11.24 | 11.14 | 10.91 | 10.40 | 10.28 | 8.45 | 8.34 | 8.23 |
| **ආදායම (ශ්‍රී.ලං.රු.මි.)** | 110,518 | 121,862 | 132,460 | 163,513 | 194,147 | 202,645 | 188,684 | 206,892 | 218,450 | 229,571 | 242,950 |
| සාමාන්‍ය විකුණුම් මිල (රු./කි.වො.පැ.) - (අ) | 13.10 | 13.03 | 13.21 | 15.56 | 17.93 | 18.50 | 16.00 | 16.18 | 16.26 | 16.29 | 16.63 |
| **විකුණුම් අවස්ථාවේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) (අ)** | - | - | 16.21 | 23.66 | 16.94 | 20.00 | 15.07 | 18.08 | 20.34 | 19.12 | 23.29 |
| වසර තුළ විදුලියනය කළ නිවාස (සංඛ්‍යාව) | 173,327 | 177,155 | 206,909 | 225,707 | 198,484 | 178,300 | 198,166 | 277,038 | 181,627 | 118,077 | 108,315 |

* - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ජෛවස්කන්ධ) 2018 වසරේ සිට වහළ මත සවිකරන සූර්ය බලය ඇතුළත් කරන ලදී.

(අ) - තාවකාලික

# ආයතනික තොරතුරු

## නෛතික ස්වභාවය

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29, 1988 අංක 32 හා (සංශෝධිත) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් සංශෝධිත 1969 අංක 17 දරන පාර්ලිමේන්තු පනතින් ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

**සභාපති**

රඛිත ජයවර්ධන මහතා *2019.11.21 දින දක්වා*
ඉංජිනේරු විජිත හේරත් මහතා *2019.12.23 දින සිට*

**උප සභාපති**

රජීව් සෙල්වරාජා මහතා *2019.11.22 දින දක්වා*

**සාමාජික / ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

කේ.කේ. තිස්ස ජිනදාස මහතා *2019.11.25 දින දක්වා*

## මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික

ආර්. සේමසිංහ මහතා *2019.04.30 දින දක්වා*
ජේ.එම්. තිලකා ජයසුන්දර මහත්මිය *2019.05.08 දින සිට*

**සාමාජිකයන්**

කේ.ඩී.එන්. රංජිත් අසෝක මහතා *2019.07.22 දින දක්වා*
එම්. දේවසුරේන්ද්‍ර මහතා *2019.09.09 දින සිට*
එස්.කේ. කන්නන්ගර මහතා
රූබන් වික්‍රමාරච්චි මහතා

**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**

එච්.ආර්.පී. පත්බේරිය මහත්මිය (වැ.බ.)

**සාමාන්‍යාධිකාරී**

ඉංජිනේරු ඒ.කේ. සමරසිංහ මහතා *2019.01.14 දින දක්වා*
ඉංජිනේරු එස්.ඩී.ඩබ්. ගුණවර්ධන මහතා *2019.01.15 දින සිට*

**විගණකවරුන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**බැංකුකරුවෝ**

මහජන බැංකුව
අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

**ප්‍රධාන කාර්යාලය**

අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථනය (011) 232 4471 (මාර්ග 8කි)
ෆැක්ස් (011) 244 9572
වෙබ් අඩවිය: www.ceb.lk

## ආයතනික කළමනාකරණය

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**

ඉංජිනේරු ඩී. තිලකසේන මහත්මිය *2019.04.18 දින දක්වා*
ඉංජිනේරු පී.එල්.ජී. කාරියවසම් මහතා *2019.04.19 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**

ඉංජිනේරු පී.එල්.ජී. කාරියවසම් මහතා *2019.04.18 දින දක්වා*
ඉංජිනේරු (ආචාර්ය) එම්.එන්.එස්. පෙරේරා මහතා *2019.04.19 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 01)**

ඉංජිනේරු පී.සී.සී. පෙරේරා මහතා *2019.01.08 දින දක්වා*
ඉංජිනේරු ඩී.ඩී.කේ. කරුණාරත්න මහතා *2019.01.09 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 02)**

ඉංජිනේරු එම්.ඒ.ඩී.එන්. ශ්‍රේෂන් මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 03)**

ඉංජිනේරු ඒ.ඩී. තිලකරත්න මහත්මිය *2019.04.30 දින දක්වා*
ඉංජිනේරු ආර්.කේ. පියදාස මහතා *2019.05.01 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 04)**

ඉංජිනේරු ඩී.ඩී.කේ. කරුණාරත්න මහතා *2019.01.08 දින දක්වා*
ඉංජිනේරු එම්.ආර්. රණතුංග මහතා *2019.01.09 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**

ඉංජිනේරු ජී.ඒ. ජයන්ත මහතා *2019.02.19 දින දක්වා*
ඉංජිනේරු එච්.එම්.ඒ. හේරත් මහතා *2019.02.20 දින සිට*

**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**

ඉංජිනේරු එන්.ඩබ්.කේ. හේරත් මහත්මිය

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**

ඉංජිනේරු එස්.ඩී.ඩබ්. ගුණවර්ධන මහතා *2019.01.14 දින දක්වා*
ඉංජිනේරු එම්.කේ.සී.එන්.කේ. අමරසිරි මහත්මිය *2019.01.19 දින සිට*

**මූල්‍ය කළමනාකරු**

ටී.කේ. ලියනගේ මහතා

# සංවිධාන ව්‍යුහය - 2019

**සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්**

**සාමාන්‍යාධිකාරී**

- අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)
- අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)
- අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)
- අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 1)
- අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 2)
- අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 3)
- අතිරේක සාමාන්‍යාධිකාරී (බෙදාහැරීමේ අංශය 4)
- අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)
- අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
- මූල්‍ය කළමනාකරු

නි.සා. (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නි.සා. (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නි.සා. (තොරතුරු තාක්ෂණ)
නි.සා. (පර්යේෂණ හා සංවර්ධන)
ව්‍යා.අ. (ව්‍යවසාය සම්පත් සැලසුම්)

නි.සා. (බලශක්ති විකුණුම්)
නි.සා. (ආයතනික කටයුතු)
නි.සා. (තාපබල සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප විදුලි)
නි.සා. (මහවැලි සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල විදුලි)
නි.සා. (ලක්ෂපාන සංකීර්ණය)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල යාන්ත්‍රික)
නි.සා. (ජනන ව්‍යාපෘති)
නි.සා. (සමනල සංකීර්ණය)
නි.සා. (වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් නඩත්තු)
බ.ක. (ලක්විජය විදුලි බලාගාරය)
නි.සා. (ජනන ආරක්ෂණ)
අ.මු.ක. (ජනන)

නි.සා. (බලශක්තිය මිලදී ගැනීම්)
නි.සා. (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
නි.සා. (ආයතනික හා නියාමන සම්බන්ධතා)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණ)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු -උතුර
නි.සා. (වත්කම් කළමනාකරණ)
නි.සා. (පද්ධති පාලන)
නි.සා. (සන්නිවේදන)
නි.සා. (බලශක්ති අලෙවිකරණ)
නි.සා. (පාලන හා ආරක්ෂණ)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්ය සාධන අධීක්ෂණ)
ව්‍යා.අ. (දිගු කාලීන පුද්ගලික විදුලිබල ප්‍රසම්පාදන)
ව්‍යා.අ. (කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය)
අ.මු.ක. (සම්ප්‍රේෂණ)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (කොළඹ නගරය)
නි.සා. (වයඹ පළාත)
නි.සා. (උතුරු මැද පළාත)
නි.සා. (උතුරු පළාත)
නි.සා. (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය
වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 1)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (මධ්‍යම පළාත)
නි.සා. (බස්නාහිර පළාත උතුර)
නි.සා. (නැගෙනහිර පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 2)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ II)
නි.සා. (සබරගමුව පළාත)
නි.සා. (ඌව පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 3)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (බස්නාහිර පළාත දකුණ I)
නි.සා. (දකුණු පළාත)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 4)

නි.සා. (වත්කම් කළමනාකරණ හා ආයතනික)
නි.සා. (පුහුණු කිරීම්)
නි.සා. (සිවිල් වැඩ හා ගොඩනැගිලි)
නි.සා. (වැඩපළ හා උපකාරක සේවා)
නි.සා. (වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතාව)
ව්‍යා.අ. (විදුලක්පාය)
අ.මු.ක. (වත්කම් කළමනාකරණ)

නි.සා. (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
නි.සා. (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
නි.සා. (සම්ප්‍රේෂණ තැනීම් ව්‍යාපෘති)
නි.සා. (ඉංජිනේරු උපදේශන සේවා)
නි.සා. (ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ)
ව්‍යා.අ. (ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල
සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති
කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන ව්‍යාපෘතිය - අදියර II)
ව්‍යා.අ. (මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ද්‍රව ස්වභාවික වායු)
ව්‍යා.අ. (පුනර්ජනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (ව්‍යාපෘති)

අ.මු.ක. (මූලස්ථාන)
අ.මු.ක. (ආයතනික)
අ.මු.ක. (භාණ්ඩාගාර කළමනාකරණ)

නි.සා. (සම්බන්ධීකරණ)
නි.සා. (පිරිස්)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

විමර්ශන කළමනාකරු

ප්‍රධාන නීති නිලධාරී

අධ්‍යක්ෂ මණ්ඩල
ලේකම්

# අනු-ආයතනද සහිත
# ලං.වි.ම.
# ආයතනික ව්‍යුහය - 2019





# කළමනාකරණ සමාලෝචන

# සභාපතිතුමාගේ සමාලෝචනය

2019 වසර තුළ මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමට ලං.වි.ම. ට හැකිවිය. එමගින් ලං.වි.ම. ට කොළඹ නගරයේ හා වරාය නගරයේ සංවර්ධන අවශ්‍යතාවනට අවශ්‍ය සහාය ලබාදීමේ හැකියාව අත්පත් කරදී ඇත.



ජාතිය වෙනුවෙන් විදුලි බලය නිෂ්පාදනය කොට ලබාදීමේ වසර 50ක කාල පරිච්ඡේදයක් 2019 නොවැම්බර් මාසයේ දී සපුරන ලදුව සමාලෝචිත වර්ෂය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට (ලං.වි.ම.) ඓතිහාසික කඩඉමක් සනිටුහන් කරන ලදී.

සරල ආරම්භයක් සහිතව සිය ගමන ආරම්භ කළ ලං.වි.ම. අද වනවිට සමස්ත ජනගහණයෙන් 99.6%කට විදුලිය ලබාදීමේ අද්විතීය ගෞරවය හිමිකරගෙන සිටින අතර එය වූකලි ඉතාමත් පැසසුම් කටයුතු හා සැලකිය යුතුවූ සාර්ථකත්වයකි. නිර්දය ප්‍රගතියක් අත්පත් කරගත් එම උද්වේගකර අඩ සියවස ඔස්සේ ලං.වි.ම. වූකලි අප රටට සේවය කිරීම සඳහා කැපවූ අත්‍යවශ්‍ය ජාතික ආයතනයක්ය යන කරුණ සනිටුහන් කරනු ලබයි.

මෙම දිගු ගමන ආරම්භයේදී මෙකී ආයතනය හා සම්බන්ධ වූ ප්‍රමුඛ පෙළේ හවුල්කරුවන්ටද අපගේ කෘතවේදිත්වය හිමිවේ. එමෙන්ම, එම සද්-කාර්යය නොකඩවා ඉදිරියට ගෙන යනු පිණිස පසු කාලීනව යෂ්ටිය සියතට ගත් අයවළුනටද අපගේ කෘතවේදිත්වය පළකළ යුතුය. රට පුරා කාර්යක්ෂම, ආරක්ෂිත හා විශ්වසනීය විදුලි පද්ධතියක් පවත්වාගෙන යාමේ ලං.වි.ම.හි මෙහෙවර සාඩම්බරව ඉටු කරනු පිණිස අද දින අප වෙත අවකාශ සැලසීමේ පදනම ඔවුහූ සාමූහිකව සකස් කළහ.

ලං.වි.ම. වූකලි 1969 අංක 31, 1979 අංක 29 හා 1988 අංක 32 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 17 දරන පනත මගින් 1969 නොවැම්බර් මස පළමුවැනි දින ස්ථාපනය කරන ලද රජය සතු ව්‍යාපාරයකි. 2009 අංක 20 දරන (සංශෝධිත) ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ලං.වි.ම. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමන විෂය පථය යටතට ගෙන එන ලදී.

විදුලිබලය ජනනය, සම්ප්‍රේෂණය හා රටපුරා බෙදාහැරීම ලං.වි.ම.හි වගකීම වේ. මෙම කාර්යයේදී එම ආයතනය වෙත එහි අනු ආයතන හතරක සක්‍රීය දායකත්වය හිමිවේ. එම ආයතන වනුයේ: ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO), එල්.ටී.එල්. හෝල්ඩිංස් ලිමිටඩ්, ලංකා කෝල් කම්පනි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම හා ට්‍රින්කොමලී විදුලිබල සමාගම නම් වූ බද්ධ ව්‍යාපාරයද වේ. ස්වාධීන විදුලිබල නිෂ්පාදනායතන ගණනාවක්ද ඒ අතර වේ.

සමාලෝචිත වර්ෂය තුළ කුටුම්බයන් 108,315ක් වෙත නව විදුලි සම්බන්ධතා ලබාදුන් අතර අතිරේක පාරිභෝගික ගිණුම් 146,360 ක් ඇති කරන ලදී. වසර තුළ විදුලි අලෙවිය ගි.වො.පැ. 14,611 ක් වූ අතර එය පසුගිය වසර හා සන්සන්දනාත්මකව 3.7% ක වර්ධනයකි. කෙසේ වුවද, පාස්කු ඉරිදා ප්‍රහාරය ප්‍රතිබිම්බනය කරමින් හෝටල් අංශයෙහි පරිභෝජනය 5.4%කින් පහත වැටිණි. ඒ අතරම, ශුද්ධ ජනනය ගි.වො.පැ.15,922ක අගයක් ගත් අතර එය පසුගිය වසර හා සාපේක්ෂව 3.6%ක වර්ධනයකි.

# සභාපතිතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

රටපුරා විදුලි බලය සම්ප්‍රේෂණ කාර්යයේ 100%ක වගකීම දරන ලං.වි.ම. විසින් බහුතර කොටස් හිමිකාරිත්වයක් දරන රජය සතු බෙදාහැරීමේ සමාගම වන ලංකා විදුලි (පෞද්ගලික) සමාගම (LECO) ආයතනයද සමගින් බෙදාහැරීමේ විශාල කොටසක (88.5%) වගකීමද දරනු ලබයි. 2019 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ විදුලිබල ජනනයෙන් 71%ක ප්‍රමාණයක් ලං.වි.ම. විසින් සිදු කරන ලදී. ඉතිරි කොටස ස්වාධීන විදුලි නිෂ්පාදකයන් හිමිකාරිත්වය දරන හා ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන තාප, ජල, සූර්ය හා සුළං පදනම්ගත බලාගාරයන් හරහා නිෂ්පාදනය කරන ලදී. වහළය මත සවිකරන සූර්ය විදුලිබල සම්බන්ධතාවයන්හි ධරිතාවයද 2018 වසර හා සන්සන්දනාත්මකව 75%ක වේගවත් වර්ධනයක් පෙන්නුම් කිරීමද දිරිගන්වන සුළු කාරණයකි. පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධ කරගැනීම උදෙසා ලං.වි.ම.හි පවත්නා දැඩි කැපවීම පෙන්නුම් කරමින් 2019 වර්ෂය අවසාන වනවිට සමස්තය කි.වො. 217,263 අගයක විය.

විදුලි බිල්පත් මගින් උපයාගත් සමස්ත ආදායම 2019 වසර තුළ රු. මිලියන 242,950ක් ලෙස 5.8%කින් හෙවත් රු. මිලියන 13,379කින් වර්ධනය වූ අතර එය වූකලි සමාගමේ එතෙක් මෙතෙක් වාර්තා වූ ඉහළම අලෙවි ආදායමයි.

2014 වර්ෂයේ සිට විදුලිය ගාස්තු ඉහළ නැංවීමක් සිදුකොට නොමැති බැවින් මෙකී 5.8%ක ඉහළ යාම මුළුමනින්ම විදුලි ඉල්ලුමේ වර්ධනය හේතුකොට ඇති වූවකි. ආයතන අතර වෙළඳ මෙහෙයුම්වලදී සාමාන්‍යයෙන් අලෙවි වර්ධනයත් සමගින් සමාන්තරව ලාභදායකත්වය ඉහළ නගින නමුදු ලං.වි.ම. සම්බන්ධයෙන් සිදුවනුයේ මෙහි විලෝමයයි. එසේ වනුයේ සහන ඉහළ යාමෙහි ප්‍රතිවිපාකයක් වශයෙන් ඇතිවන සුවිශාල අලාභයන් සහිතව දැනට පවත්නා ජනන මුහුව හේතුවෙනි. මෙම පරස්පරය අවබෝධ කරගනිමින්, වසර තුළ සමාගම විසින් විදුලි බලය වගකීම් සහගතව පරිහරණය කරන ආකාරය පිළිබඳ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ තීව්‍ර සන්නිවේදන ව්‍යාපාරයක් කෙරෙහි සිය අවධානය යොමු කරන ලදී.

2019 වසර තුළ දැඩි නියං තත්ත්වයක් සහිතව, 1990 වසරෙන් පසු ඇතිවූ දෙවන අඩුම වර්ෂාපතනය වසරේ මුල් භාගය තුළ වාර්තා වූ තත්ත්වයක එකී තීරණාත්මක වැදගත්කමක් ඉසිළීය. එකී අඩු වර්ෂාපතනය හේතුකොට ප්‍රධාන ජලාශයන් වෙත අතිශයින් අවම ජල ධාරිතාවයක් ලැබෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රධාන ජල විදුලි මෙන්ම කුඩා ජල විදුලි බලාගාරයන්ගෙන්ද සිදුවූ ජනනය ගි.වො.පැ. 4,794.5ක අගයකට පහත වැටුණු අතර එය වූකලි පෙර වසර හා සන්සන්දනාත්මකව 24.9%ක තියුණු පහත වැටීමකි. ජල විදුලි ජනනය අවම වීමත් සමගින් ලං.වි.ම.ට තාප ජනනය කෙරෙහි රඳා පවතින්නට සිදුවිය. වසර අවසානය වනවිට සමස්ත තාප විදුලිබල ජනනය 65%ක් වූ අතර එය 2018 වසර හා සාපේක්ෂව 10.6%ක වර්ධනයකි.

ලං.වි.ම. පාලනයෙන් බැහැරව පැවති කරුණක් වූ මෙකී වැඩි වියදම් සහිත තාප විදුලිය කරා ජනන මුහුව යොමු කරන්නට වීම නිෂ්පාදන පිරිවැය හා අලෙවි මිල අතර පරතරය පුළුල් වන්නට හේතු විය. එමගින් අලෙවි කරන ලද සෑම ඒකකයක් පාසාම රු. 5.85ක පමණ මුදලක් ලං.වි.ම.ට අහිමි වූ අතර, මෙසේ නිති වර්ධනය වන අලාභයන් මගින් ලං.වි.ම.හි මූල්‍ය තත්ත්වය කෙරෙහි නිශේධනීය බලපෑමක් එල්ල කෙරිණි.

ලං.වි.ම. සඳහා පිරිවැය ප්‍රතිබිම්බක විදුලි ගාස්තු ක්‍රමයක් බලාත්මක කිරීම නෛතිකව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සිදුකළ යුතු වුවද, 2014 වර්ෂයේ සිටම එවැන්නක් සිදුවී නොතිබි අතර, පාරිභෝගික අංශ ගණනාවක් සඳහා නොකඩවා සහන මිලට විදුලිය සැපයිය යුතු බවට රජය විසින් නියමයන් පනවනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලං.වි.ම. විසින් සාමාන්‍ය නිෂ්පාදන මිලට වඩා අඩු මිලකට පාරිභෝගිකයන් වෙත විදුලිය අලෙවි කළ යුතුවේ. මෙයට අමතරව, වසර තුළ රජය විසින් පනවන ලද සහනයන් ප්‍රතිපූරණය කිරීමක්ද නොමැති තත්ත්වයක, 2019 මූල්‍ය පිරිවැය වර්ෂය තුළ රු. බිලියන 22.5ක සුවිශාල ප්‍රමාණයක පිරිවැයක් ඇති කෙරෙන පරිදි ලං.වි.ම.ට තව තවත් ණය ලබාගන්නට බල කෙරිණි.

නිෂ්පාදන පිරිවැය හා විකුණුම් මිල අතර සාධාරණ සමතුලිතයක් පවත්වාගෙන යාමේ බහුවිධ ප්‍රයත්නයන් පැවතියද, ලං.වි.ම.ට නිෂ්පාදන මිලට වඩා බොහෝ සෙයින් පහළ මිලකට විදුලිය අලෙවි කිරීමට බල කෙරුණු බව අවධාරණය කළ යුතුය. වසරකට රු. බිලියන 14ක වර්ධිත ආදායමක් ලබා දෙමින් ඒ අනුව අවම මට්ටමකින් හෝ රජයේ සහනාධාරයන් ඉවත් කිරීමේ ඉඩකඩ සලසාදෙනු වස් විදුලිය ගාස්තුවෙහි අවම වශයෙන් රු. 1 ක ඉහළ නැංවීමක් සිදුකළ යුතු බවට වූ බොහෝ යෝජනා කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලදී.

එම සන්දර්භය තුළ, දැනට පවත්නා විදුලිය ගාස්තු ව්‍යුහය හා එමගින් නොකඩවා රජයේ සම්පත් කෙරෙහි ඇති කරවන්නාවූ සෘණාත්මක බලපෑම කෙරෙහි අවබෝධයක් ඇතිකර ගැනීම මේ අවස්ථාවේදී විචක්ෂණශීලී කරුණක් වන්නේය යන්න මාගේ විශ්වාසයයි.

පරිභෝජනය කරන මුල් ඒකක 30 සඳහා ඒකකයට රු. 2.50 බැගින් ගාස්තු අය කෙරෙන සේ සකසා ඇති වර්තමාන ගාස්තු ව්‍යුහය තුළ එම පරාසය තුළට සමස්ත පාරිභෝගික පිරිසෙන් 19%ක් ඇතුළත් වේ. මෙම කොටස සඳහා පරිභෝජනය කරන ඒකකයට රු. 18.29ක සහනාධාරයක් ලබාදෙනු ලබන අතර, එය වෙනත් අයුරකින් ප්‍රකාශ කරන්නේ නම් පාරිභෝගිකයන් 1,257,262 දෙනෙකු වෙත වාර්ෂිකව ලබාදෙන සහනය රු. බිලියන 3.312ක් වේ. මෙම මූලධර්මය සෑම අතිරේක ඒකක 30 ගොනුව සඳහාම නොකඩවා ක්‍රියාත්මක වූ අතර ඒකක 181 සිට ගාස්තු හා පිරිවැය සම මට්ටමකට එළඹිනි. ඒ අනුව අවසාන විග්‍රහයේදී ගෘහස්ථ පාරිභෝගිකයන් 5,651,452 දෙනෙකු හෙවත් අපගේ පාරිභෝගික පදනමෙන් 87%ක් වෙත ලබාදෙන සහනයේ සමස්ත වටිනාකම රු. බිලියන 48.623ක් විය. ඉතිරි කොටස (හෙවත් අපගේ පාරිභෝගික පිරිසෙන් 13%ක්) තුළට විවිධ කාණ්ඩ ඇතුළත් වේ. ඉන් 2019 වසර තුළ රු. බිලියන 37.635ක් වූ විශාලතම සහනය කර්මාන්ත අංශය වෙත ලබාදෙන ලදී.

විශේෂයෙන් සැලසුම් කරන ලද මෙ.වො. 300 ද්‍රව ස්වභාවික වායු බලාගාර කිහිපය අතරින් පළමු බලාගාරය ක්‍රියාත්මක කිරීම ඇතුළු ඉතා අඩු පිරිවැයකින් විදුලිබලය ජනනය කිරීම සඳහා පෙරදී අනුමත කරන ලද සැලසුම් කිසිදු බාධාවකින් හා ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කරන ලද්දේ නම් නිෂ්පාදන පිරිවැය හා විකුණුම් මිල අතර වූ මෙකී සිත් අධෛර්ය කරවන සුළු පරතරය යම්තාක් දුරකට නිරාකරණය කරගන්නට තිබිණි. කණගාටුවට කරුණ නම්, ලං.වි.ම.හි පාලනයෙන් බැහැර හේතු කරණ කොට මෙ.වො. 300 සැලසුම් ක්‍රියාත්මක නොවූ බව සටහන් කළ යුතුය.

ඉහත තත්ත්වය නොසලකා, බොහෝ සෙයින් ප්‍රමාද වූ හා අක්‍රියව තිබූ ජනන බලාගාර ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒම සඳහා 2019 වර්ෂයේදී සැලසුම් අනුගමනය කරනු පිණිස වූ දැඩි ප්‍රයත්නයක ලං.වි.ම. නිරත විය. කෙරවළපිටියේ ද්‍රව ස්වභාවික වායු බලාගාර දෙක ස්ථාපනය කොට නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය දැනට අප සතුව පවත්නා වැඩ බිමෙහි ව්‍යාප්ත කිරීමට කටයුතු ආරම්භ කරන ලදී. තවද, කැළණිතිස්ස අපගේ වැඩබිමෙහි ගෑස් ටර්බයිනය වඩාත් නවීන හා කාර්යක්ෂම යන්ත්‍රෝපකරණ සහිතව වැඩිදියුණු කිරීමටද සූර්ය හා සුළං බලාගාරයන් වේගවත්ව ව්‍යාප්ත කිරීමටද අවශ්‍ය ආරම්භක පියවර ගන්නා ලදී. වඩාත් කාර්යක්ෂම විදුලි

# සභාපතිතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

බලාගාර ක්‍රියාත්මක වනුයේ කෙතරම් වේගයකින්ද, ඒ හා සමාන වේගයකින් ලං.වි.ම. ඉතා ලාභදායී රජයේ ආයතනයක් බවට පත් කිරීමේ මං විවර කරමින් සහන අවම කරගැනීමේ ප්‍රතිලාභය රජයට අත්වනු ඇත. තවදුරටත් ප්‍රමාද කිරීමකින් තොරව සැලසුම්ගත ජනන සැලසුම් ක්‍රියාත්මක කිරීම වූකලි මෙහෙයුම් පිරිවැය අවම කරමින් ලාභ අත්පත් කරගැනීමේ පැහැදිලි මාවත වන බැවින් එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි අවධාරණයක් හා හදිසි අවධානයක්ද යොමු කරවන ලෙස අදාළ සියලු අංශ වෙත අවංකව දැනුම් දෙමි.

සමාලෝචිත වර්ෂය තුළ ලං.වි.ම. විසින් රු. බිලියන 36ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති කටයුතු සිදු කරන ලදී. පුනර්ජනනීය හා පවිත්‍ර බලශක්තිය කෙරෙහි වූ අවධානය ආයතනයේ න්‍යාය පත්‍රයෙහි ඉහළින්ම පැවතුණු අතර මේ සඳහා වූ සියලු ව්‍යාපෘති දැඩි සේ ක්‍රියාත්මක කරන ලදී. මෙ.වො. 100 මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතයේ වාණිජ මෙහෙයුම් කටයුතු 2020 වසර තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. මෙය රටේ විශාලතම සුළං ව්‍යාපෘතිය වන අතර, මෙම පහසුකමෙහි හිමිකරු හා මෙහෙයුම්කරු වීමේ සාඩම්බර භාග්‍යය ලං.වි.ම. වෙත හිමිවේ.

බ්‍රෝඩ්ලන්ඩ්ස් මෙ.වො. 35 ජල විදුලිබල ව්‍යාපෘතියේ අවසන් අදියර සම්පූර්ණ කරන ලද අතර, එහි වාණිජ මෙහෙයුම් කටයුතු 2021 ජනවාරි මාසය වනවිට ආරම්භ කෙරෙනු ඇත. මොරගොල්ලේ මෙ.වො. 30.5 ජල විදුලි ව්‍යාපෘතිය හා උමා ඔය මෙ.වො. 120 ජල විදුලි ව්‍යාපෘතිය සැලසුම්ගත කාල පරිච්ඡේදයන් තුළ අවසන් කිරීමට හැකිවනු පිණිස එම ව්‍යාපෘතීන් සඳහා සියලු සම්පත් සපයා දී ඇත. මෙම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මගින් ජාලය වෙත මෙ.වො. 285.5ක ධාරිතාවයක් එක් කෙරෙනු ඇති අතර අනාගතයේදී ජනන පිරිවැයට සැළකිය යුතු ධනාත්මක දායකත්වයක්ද සපයා දෙනු ඇත.

මෙයට අමතරව, ලං.වි.ම. විසින් නොකඩවා සුළු පරිමාණ පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදක ජාලය පුළුල් කිරීමේ කටයුතු සිදු කරන ලද අතර, සූර්ය බලය සඳහා 06ක්ද, ජෛවස්කන්ධ සඳහා 01ක්ද කුඩා ජල විදුලිය සඳහා 11ක්ද වශයෙන් නිෂ්පාදකයන් 18 දෙනෙකු සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ලබාදෙන ලදී. මෙම මූලාරම්භයන්ගෙන් ලබාදෙන විදුලිය ධාරිතාවය මෙ.වො. 25ක් වනු ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතව ඇති සූර්ය හා ජල විදුලිය සඳහා කුඩා පුනර්ජනනීය බලාගාර 70කට වැඩි සංඛ්‍යාවක්ද සමගින් මෙකී තිරසර හා අවධානය යොමුවූ ප්‍රයත්නයන් මගින් ජාලය වෙත තවත් පවිත්‍ර බලශක්තිය මෙ.වො. 90ක ප්‍රමාණයක් එක් කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර ඒ අනුව උපරිම පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් අවශෝෂණය කරගැනීමේ අපගේ අඛන්ඩ ප්‍රයත්නයන් ඵල දරන බවට වගබලාගනු ඇත.

සමාලෝචිත වර්ෂය තුළ රට පුරා ක්‍රමෝපායිකව ස්ථානගත කරන ලද ලං.වි.ම. සතු හා ලං.වි.ම. විසින් ක්‍රියාත්මක කරනු ලබන නව විදුලි වාහන ආරෝපන ස්ථාන (EVCS) 5ක් ආරම්භ කරමින් කාබන් විමෝචනය අවම කිරීමේ ජාතික ප්‍රයත්නයනට සහාය දැක්වීම සඳහා යොමු වෙමින් ලං.වි.ම. විසින් එහි ගමන් මග තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (අදියර 2), ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය සහ පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුනු කිරීමේ ව්‍යාපෘතිය වූකලි වැඩි ප්‍රමාණයක පුනර්ජනනීය බලශක්තිය ප්‍රමාණයක් අවශෝෂණය කරගැනීම ඉලක්ක කරගත් ප්‍රධාන සම්ප්‍රේෂණ ප්‍රවර්ධන ව්‍යාපෘති අතරින් සමහරකි. එම ව්‍යාපෘති අවම බාධාවන් සහිතව සමාලෝචිත වර්ෂය තුළ කටයුතු සම්පූර්ණ කිරීම දක්වා ඉදිරි ගමනක යෙදිනි.

මෙම වර්ෂය තුළ සුවිශාල මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට ලං.වි.ම.ට හැකිවිය. පද්ධතිය තුළට මෙසේ කි.වෝ. 220 භූගත සම්ප්‍රේෂණ රැහැන් ජාලයක් හඳුන්වාදීමත් සමගින් මහ කොළඹ විදුලිබල ජාලය දෙගුණයකින් විශාල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලං.වි.ම. ට කොළඹ නගරයේ හා වරාය නගරයේ සංවර්ධන අවශ්‍යතාවන් සපුරාලීමට හැකි මට්ටමකට එළැඹිණි. මෙකී ප්‍රධාන සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය අවසන් කිරීම මගින් කොළඹ ප්‍රදේශය වෙත වර්ධිත ගුණාත්මකභාවයක් හා විශ්වසනීයත්වයක්ද සහිත විදුලි සම්පාදන යුගයක ආරම්භය සනිටුහන් කෙරේ.

සුහුරු මනුකරණ නියාමන ව්‍යාපෘතිය (අදියර 1) 2019 වසර තුළ සාර්ථකව සම්පූර්ණ කිරීමත් සමගින් ඵලදායකත්ව ප්‍රවර්ධනයක් ඇති කරමින් වඩාත් පිරිවැය ඵලදායී හා කාර්යක්ෂම පාරිභෝගික සේවයක් කළමනාකරණය කිරීම කරා ලං.වි.ම. විසින් තබන ලද තවත් යෝධ නවෝත්පාදනීය පියවරක් සළකුණු කෙරිණි.

නොකඩවා ලබාදුන් මූල්‍යමය සහාය වෙනුවෙන් අපගේ අරමුදල්කරණ නියෝජිතායතන වන ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA), සහ චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (CBC) වෙත අපගේ කෘතවේදිත්වය පළ කිරීමට මෙය අවස්ථාව කරගනිමු.

ලං.වි.ම., පාරිභෝගිකයා විසින් ඉදිරියට ගෙන යනු ලබන ආයතනයක් බවට පත් කරමින් කිසිදු ඒකාධිකාරිත්ව ලක්ෂණයක් පවත්වාගෙන නොයාම සඳහා වූ ගරු අමාත්‍යතුමාගේ දැක්ම යථාර්ථයක් කරවනු පිණිස, නියමු ව්‍යාපෘතියක් ගොඩනගනු ලැබ 2019 ජුනි මාසයේදී සාර්ථකව දියත් කරන ලදී. මහජනතාව වෙත ලබාදෙන ව්‍යාපාර උපයෝගිතා මෘදුකාංගය වන 'CEB Assists'හි ස්වයං සේවා මාර්ග අතරින් එකක් ලෙස 'CEBCare' ජංගම යෙදවුම ආරම්භ කරමින් වඩාත් හොඳින් පාරිභොගිකයා වෙත සේවය සැලසීම සඳහා වූ නව මානයක් ලං.වි.ම. විසින් උත්සවාකාරයෙන් දියත් කරන ලදී.

මෙම වසර තුළ මෙකී නව තාක්ෂණයෙන් යුතු ජංගම යෙදවුම සැලසුම් කොට, වැඩිදියුණු කොට ආරම්භ කිරීමට ලං.වි.ම. ඉංජිනේරුවන්ට හැකියාව ලැබීම අපට මහත් ආඩම්බරයට කාරණයකි. මෙම යෙදවුම Google Play හා Apple's App Store මගින් ජංගම උපකරණ තුළට බාගත කළ හැකි අතර භාෂාත්‍රයෙන්ම ක්‍රියාත්මක කළ හැක. මෙම යෙදවුම දියත් කිරීම වැඩි දැනුවත්භාවයක් ලබාදෙමින් පාරදෘශ්‍යභාවය සහතික කිරීමෙහි ලා සුපිරි සේවයක් ලං.වි.ම.හි මිලියන 6.5ක් වූ පාරිභෝගික පදනම වෙත ලබාදීම කරා වූ ගමනේ වැදගත් කඩඉමක් විය. CEB Care යෙදවුමට ලං.වි.ම. විසින් ලබාදෙන සේවය විෂයයෙහි විප්ලවීය වෙනසක් සිදුකළ හැකි වූ අතර පැමිණිලි ඉදිරිපත් කිරීමේ යාන්ත්‍රණයක්, විදුලිය ඇණ හිටුවීමේ නිවේදනය, මාර්ගගතව විදුලි බිල්පත් ගෙවීමේ පහසුකම හා පරිහරණ තොරතුරු සමාලෝචනය ඇතුළත් සේවා ලබාගැනීමෙහි ලා පාරිභෝගිකයන් වෙත අංකිත අත්දැකීමක් ලබාදෙන ලදී. CEB Care යෙදවුම මගින් දීපව්‍යාප්ත ලං.වි.ම. මධ්‍යස්ථාන සියල්ලම පාහේ සම්බන්ධ කරමින් ක්‍රියාත්මකවන ලං.වි.ම. ඒකාබද්ධ ඇමතුම් මධ්‍යස්ථානයක්ද පාරිභෝගිකයන් වෙත ලබාදෙනු ලබයි.

ලං.වි.ම. විසින් නිරතුරුවම සිය ආයතනික සමාජ වගකීම් කෙරෙහි සවිඥානිකව කටයුතු කරන ලද අතර මෙම වසර තුළ වෛද්‍ය, ග්‍රාමීය රැකියා උත්පාදන, අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීම, සුපිරිසිදු පරිසරයක් සඳහා රුක් රෝපණය සහ ළමුන්ගේ දැනුම වර්ධනය වැනි බහුවිධ විෂය ක්ෂේත්‍රයන් හරහා බොහෝ ව්‍යාපෘති සම්පූර්ණ කරන ලදී.

වෛද්‍ය විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ගත්කල, කාර්ය මණ්ඩල සාමාජිකයන් 850කට ආසන්න සංඛ්‍යාවක් විසින් කොළඹ ලේ

# සභාපතිතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

බැංකුව වෙත සිය රුධිරය පයින්ට් 850ක් පරිත්‍යාග කරන ලදී මෙකී සැලකිය යුතු දායකත්වය සම්බන්ධයෙන් . ලේ බැංකුව විසින් ලං.වි.ම. වෙත සිය ප්‍රශංසාව පළකොට ඇති අතර, මෙම ආයතනය 2019 වසර තුළ ප්‍රධාන රුධිර පරිත්‍යාගශීලී ආයතන අතරින් එකක් සේ හඳුනාගෙන ඇත. ජීවිත ලබාදීමේ මෙකී ව්‍යාපෘතියට සහභාගි වූ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුටම අපගේ ආචාරය පිරිනමමු.

ග්‍රාමීය සංවර්ධනය සම්බන්ධයෙන් සලකා බලන කල, දෙහිඅත්තකණ්ඩිය මෙ.වො. 3 ඩෙන්ඩ්‍රෝ විදුලි බලාගාරය මෙහෙවරෙහි යෙදවීම මගින් සැලකිය යුතු ප්‍රමාණයක රැකියා අවස්ථා විවර විය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම හා වර්ධනයද ඇතුළත්ව රැකියා 1,000ක පමණ ප්‍රමාණයක් මෙ.වො. 1 ඩෙන්ඩ්‍රෝ බලාගාරය මගින් සැපයෙනු ඇතැයි ගණන් බලා ඇත.

අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීම් ක්ෂේත්‍රයෙහිදී මහා භාණ්ඩාගාරයේ, අදාළ මහ නගර සභාවේ, හා ස්වාධීන විදුලිබල නිෂ්පාදකයෙකුගේද හවුල්කාරිත්වය සහිතව ලං.වි.ම. විසින් අපද්‍රව්‍ය බලශක්තිය බවට පරිවර්තනය කිරීමේ දෙවන බලාගාරයේ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කරන ලදී. මෙය රත්මලාන ප්‍රදේශයේ ස්ථානගත කෙරෙනු ඇති අතර, බලශක්තිය ගි.වො.පැ. 70ක් බවට පෙරළීම සඳහා වාර්ෂිකව අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 147,000ක් යොදාගනු ඇත.

සුපිරිසිදු පරිසරයක් කරා පිය මනින ගමනේදී අපගේ කාර්ය මණ්ඩලය විසින් වසර තුළ දිවයින පුරා පැල 8000කට වැඩි ප්‍රමාණයක් රෝපණය කරන ලදී. අවසන, අපගේ දරුවන් උදෙසා, විදුලි ආරක්ෂාව හා බලශක්ති කළමනාකරණය පිළිබඳ රටේ දුවා දරුවන් දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව හා ඒකාබද්ධව දීපව්‍යාප්ත අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලියක් පැවැත්වූවෙමු.

ජනන සැලැස්ම තුළ සඳහන් කරන ලද පරිදි විදුලි බලාගාර නොපැවතීම, (වඩා වැඩි ණය පිරිවැයක් ඇතිකිරීමට හේතුවූ) සහන සහායක් නොමැති වීමෙන් ඇතිවූ මූල්‍යමය සීමාසහිතකම් සමගින්ම වඩාත් මිල අධික තාප විදුලිය භාවිත කිරීමට බල කෙරුණු දැඩි නියං කාලගුණ තත්ත්වයන් හා වසර තුළ කිසිදු විදුලි ගාස්තු ඉහළ නැංවීමක්ද සිදු නොවීම යන බාධක නොසලකා, විචක්ෂණශීලී මූල්‍ය හා පරිපාලනමය ශික්ෂණයන් හේතුකොට ලං.වි.ම.ට අයවැයගත මට්ටම් තුළ එහි මෙහෙයුම් කළමනාකරණය කරගත හැකිවිය. මෙම සාර්ථකත්වය තුළින් සන් කෙරෙන අයුරු 2019 වසර ලං.වි.ම. සඳහා සාර්ථක වසරක් වූයේය යන්න අපගේ විශ්වාසයයි.

වර්තමාන ජනන මුහුව ක්‍රියාත්මකව පවත්නා තත්ත්වයක, ආයතනයේ මනා පැවැත්ම ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබීම මත රඳා පවත්නේය යන්නද කණගාටුවෙන් වුව සඳහන් කළ යුතුය. මෙය වූකලි බරපතල විෂමතාවයක් වන අතර, පෙරදී ප්‍රකාශ කළ පරිදි ආයතනයේ මතු තිරසර මෙහෙයුම් හා එහි ප්‍රවර්ධිත කාර්ය සාධනය සඳහා වර්ෂාපතනය මත රඳා පැවතීමේ බාධාව මැඩපවත්වනු පිණිස ලං.වි.ම.හි ජනන සැලැස්ම බාධක රහිතව හා වේගවත්ව දියත් කිරීම කරා වූ රජයේ කැපවීම මගින් ප්‍රමුඛතා පදනමින් නිරාකරණය කළයුතු වන්නකි.

ඉතා ප්‍රාණවත් හා නියමු ගණයේ අමාත්‍යවරයෙකු වන විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා සහ රාජ්‍ය අමාත්‍ය ගරු චම්පිකා ප්‍රේමදාස මැතිතුමා සමගින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයද විසින් ලබාදුන් නායකත්වය විසින්, බොහෝ සෙයින් ප්‍රමාදව ඇති ජනන සැලසුම් සඳහා වූ පදනම් ක්‍රියාත්මක කිරීම සඳහාද ප්‍රයත්නයක යෙදෙන අතර, අපගේ වටිනා පාරිභෝගික භවතුන් අපේක්ෂා කරන අත්‍යවශ්‍ය රාජ්‍ය සේවයක් නිසි කළමනාකරණයක් සහිතව ලබාදීමට අවශ්‍ය සහාය ලං.වි.ම. වෙත ලබාදෙන ලදී.

2019 වසර තුළ ලං.වි.ම.හි සියලු අංශයන්ද සහිතව එම ආයතනයේ කාර්ය සාධනය ප්‍රශංසනීය හා ධනාත්මක එකක් විය. අනුකූලතාවයේ හා මනා ආයතනික පාලනයේ සියලු පැතිකඩයන් තුළ ස්ථාවරව සිටිමින්ම සක්‍රීය දායකත්වයක් හා සහභාගිත්වයක් ලබාදුන් ගුණාත්මක හා බහු-විෂය ප්‍රවීණ අධ්‍යක්ෂ මණ්ඩලය නොවන්නට මෙම ඉලක්ක සාක්ෂාත් කරගත හැකි ඒවා නොවන්නට තිබිණි. අභියෝගාත්මක වසරක් පුරා සමාගම ඉදිරියට ගෙනගිය අග්‍රගණ්‍ය සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියෙකු ලබන්නට තරම් අධ්‍යක්ෂ මණ්ඩලය භාග්‍යවන්ත විය. සිය ලං.වි.ම. කෙරෙහි වූ කැපවීම හා බැඳීම සහ රටට ගුණාත්මක හා අත්‍යවශ්‍ය සේවයක් සම්පාදනය කිරීමෙහි ලා එතුමා හා එතුමාගේ කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය ආදර්ශමත්ය.

කිසිදු කර්මාන්තමය අසහනයකින් තොරව එකමුතුව කටයුතු කළ වසරක් වෙනුවෙන් ලං.වි.ම. විසින් ඉංජිනේරු සංගමය හා කාර්ය බලකායේ අති බහුතරයක් නියෝජනය කරන සෙසු සියලු වෘත්තීය සංගම්ද සමගින් සුහද සම්බන්ධතාවයක් වසර තුළ පවත්වාගත් බවද සඳහන් කළ යුතුය. එක්ව කටයුතු කළ යහපත් වසරක් වෙනුවෙන් සියලු සංගම්වලට මාගේ අවංක ස්තුතිය පිරිනමමි.

අපගේ අනු-ආයතන විසින් ලබාදෙන සහාය හා දායකත්වය වෙනුවෙන් නිසි පිළිගැනීම හා ඇගයීමක් ලබා නොදෙන්නේ නම් එය මාගේ කාර්යය අසාර්ථක වීමක් සේ සළකමි. විශාල වූද, කුඩා වූද සියලු ආයතන විසින් අර්ථාන්විත හා නිර්මාණාත්මක වෙනසක් ඇති කරන ලදී. අවසන, අපගේ විශාල ස්වාධීන විදුලි නිෂ්පාදන පදනම විසින් ලබාදුන් අඛන්ඩ ගුණාත්මක බලශක්ති සැපයුමද අවංක ස්තුති පූර්වකව සිහිපත් කිරීමට කැමැත්තෙමි. ලංකා විදුලිබල මණ්ඩලයේ මාගේ සේවා කාලය පිළිබඳ සිහිපත් කිරීමේදී මා තුළ ඇතිකරන ලද විශ්වාසය කෙරෙහි මාගේ අධ්‍යක්ෂ මණ්ඩලයට හා සාමාන්‍යාධිකාරීවරයාටද, 2019 අභිමානනීය ස්වර්ණ ජයන්ති වර්ෂය පුරා ලංකා විදුලිබල මණ්ඩලය සාර්ථකව ඉදිරියට ගෙනයාම සඳහා මා වෙත සහාය ලබාදීමේදී දැක්වූ සාර්ථක කැපවීම සම්බන්ධයෙන් සියලු නිලතලවලට අයත් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු හටමද සත්‍යවාදීව කෘතවේදිත්වය පළ කරමි. ලං.වි.ම. තුළදී ඔබ අතරින් බොහෝ දෙනෙකු පෞද්ගලිකවම දැන හඳුනාගන්නට ලැබීමද මා ලද වරප්‍රසාදයක් සේ සලකන අතර, ඔබගේ මිත්‍රත්වය සම්බන්ධයෙන්ද, ඔබගෙන් හා ඔබගේ කාර්යයන් තුළින්ද ඉගෙනීම සඳහා මා ලද අවස්ථාවන් සම්බන්ධයෙන්ද තුති පුදමි. ඔබ සෑම සියලු දෙනා හටම නොනිමි, නොබිඳ සාර්ථකත්වයක් හා සුවසෙත පතමි.



**රකිත ජයවර්ධන මහතා**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

2019 වර්ෂය සඳහා ලං.වි.ම.හි අලෙවි ආදායම රු. බිලියන 242.95 ක් ලෙස වාර්තා විය. මෙතුළ පසුගිය වසරේ වාර්තා වූ රු. බිලියන 229.57ක අලෙවි ආදායම හා සන්සන්දනාත්මකව රු. බිලියන 13.38ක වර්ධනයක් පෙන්නුම් කරයි.



ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී හා ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් ලං.වි.ම විසින් ජාතියට ලබාදුන් සේවයේ 50වන වසර සමරන 2019 වර්ෂය තුළ එහි කාර්ය සාධනය පිළිබඳ තක්සේරුවක් ලබාදීමට හැකිවීම මා ලද සුවිශේෂී වරප්‍රසාදයක් සේ සලකමි.

## මෙහෙයුම් කාර්ය සාධනය

ලං.වි.ම. දැක්ම හා මෙහෙවර ප්‍රකාර දැරිය හැකි මිලකට ගුණාත්මක හා විශ්වසනීය විදුලි සැපයුමක් සඳහා වූ ජනතා අපේක්ෂාවන් සපුරාලීමේ ප්‍රමුඛ වගකීම මා උර මත පැටවී ඇත. දෛනික විදුලි ඉල්ලුම සපුරාලනු වස් තාප පදනම්ගත විදුලි ජනන විධික්‍රම යොදාගන්නට ලං.වි.ම. වෙත බල කෙරෙන පරිදි රට තුළ පැවති වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ජල විදුලි පෝෂක ජලාශයන්හි ධාරිතාවය සිඳී ගිය 2019 වර්ෂයෙහි විදුලි ඉල්ලුම සපුරාලීම ලං.වි.ම. මුහුණ පෑ සුවිශාල අභියෝගයක් විය.

ඓතිහාසිකව, ලං.වි.ම. බොහෝ සෙයින්ම ජල විදුලිය පදනම් කරගත් විදුලි නිෂ්පාදනයක් මත රඳා පැවති නමුත් වසර ගණනාවක් පුරා දිගින් දිගටම ඉහළ නැගී විදුලි ඉල්ලුම හා ආර්ථික වශයෙන් ගොඩනැගීමේ හැකියාවක් සහිතව රටතුළ පවත්නා ජල මූලාශ්‍රයන් සිඳී යාම සමගින් ඊළඟ ලාභදායී ගල් අඟුරු විදුලිබල ජනන මූලාශ්‍රය ක්‍රියාත්මක කරවීමෙහි පැවති ප්‍රමාදයද හේතුකොට, ජනන මුහුව තුළ ඉන්ධන තෙල් පදනම්ගත විදුලි ජනන විකල්ප සැලකිය යුතු දායකත්වයක් ගන්නට විය. රටතුළ පවත්නා ඉතිරි ජල විභවයන් අතරින් උමා ඔය ජල විදුලි බලාගාරයේ (මෙ.වො. 122) හා බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරයේ (මෙ.වො. 35) වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම සඳහා ලං.වි.ම. තුළ පැවති අපේක්ෂා තවදුරටත් ප්‍රමාද කෙරුණු අතර, 2020 වසර දක්වා මෙම බලාගාරයන්හි වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ නොවනු ඇත. තවද, 2015 වර්ෂය තුළ හදිසියේ අවලංගු කරන ලද සාම්පූර් ගල් අඟුරු බලාගාරයට ආදේශකයක් ලෙස 2019 වර්ෂය තුළ මෙහෙවරෙහි යෙදවීමට සැලසුම් කරන ලද යෝජිත කෙරවළපිටියේ මෙ.වො. 300 ස්වභාවික වායු බල ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය 2019 වර්ෂය වනවිටද ආරම්භ කළ නොහැකි විය. කටයුතු සම්පූර්ණ කරන ලද්දේ නම්, ශ්‍රී ලංකාව තුළට ස්වභාවික වායු සැපයූ පසු ඩීසල් බලගත තාප බලාගාර හා සාපේක්ෂව සැලකිය යුතු අඩු මිලකට පදනම් ධාරිතා සහ මධ්‍ය ධාරිතා ජනනය මෙම බලාගාරය මගින් සම්පාදනය කළ හැකිව තිබිණි. සිදුකළ පසුකාලීන සැලසුම්වලට අනුව එය 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ හැකි බවක් පෙන්නුම් කරයි.

2019 වසර වූකලි 1990 වසරින් පසු වසරේ පළමු අර්ධය තුළ පෝෂක ප්‍රදේශයන් වෙත දෙවන අඩුම ජල සැපයුමක් ලද වසර ලෙස සටහන් වේ. වසරේ දෙවන භාගය තුළ සැළකිය යුතු මට්ටමක වර්ෂාපතනයක් ලැබුණද 2019 වර්ෂය තුළ සමස්ත ජල විදුලි ජනනය හුදෙක් ගි.වො.පැ. 4,794.5 ක් පමණක් වූ අතර එය වසර තුළ සමස්ත ජනනයෙන් 30%කි. මෙම අඩු ජලවිදුලි ජනනය ප්‍රධාන කොටම දුර්වල මෝසම් වර්ෂා තත්ත්වයන් හේතුකොට ගි.වො.පැ. 900කට අඩු අගයක් ගත් වසරේ පළමු අර්ධය තුළ ලද ඉතා අඩු ජල සැපයුම හේතුකොට ඇති වූවකි. ඒ හේතුවෙන්ම, පුද්ගලික හිමිකාරිත්වය සහිත කුඩා ජලවිදුලි බලාගාරයන්ගෙන්

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

විදුලිය ජනනයද 2019 වසර තුළ පසුගිය වසර හා සාපේක්ෂව 17.9%ක අඩුවීමක් පෙන්නුම් කරයි.

මෙම තත්ත්වයන් යටතේ, රටතුළ නොකඩවා විදුලිය සැපයීමේ කාර්යය සිදුකරගෙන යාම ලං.වි.ම. ට අතිශයින්ම දුෂ්කර කර්තව්‍යයක් බවට පත්වූ අතර, රටතුළ පැවති විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස ඩීසල් බලගත විදුලිය නිෂ්පාදනය කරනු හැර අන් විකල්පයක් ලං.වි.ම. සතු නොවීය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසර තුළ (තෙල් හා ගල් අඟුරු යන දෙවර්ගයේම) ලං.වි.ම. සතු බලාගාර හා ස්වාධීන විදුලි නිෂ්පාදකයන් (IPP) සතු බලාගාර තුළින් සිදුකළ තාප විදුලි ජනනය පිළිවෙලින් ගි.වො.පැ. 7,498 ක් හා ගි.වො.පැ. 2,875ක් විය. පසුගිය වසර හා සන්සන්දනාත්මකව ගත්කල 2019 වසර තුළ ස්වාධීන විදුලි නිෂ්පාදකයන් විසින් සිදු කරන ලද තාප විදුලි ජනනය 65.2% කින් වර්ධනය වී ඇත්තේය යන්න සැලකිය යුතු කරුණකි. 2018 වසරේදී පෙන්වූ අගයට වඩා 12.5%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වසර සඳහා ගි.වො.පැ. 5,361ක දායකත්වයක් ලබා දෙමින් ජනන පිරිවැය පහළ මට්ටමක පවත්වා ගැනීම සඳහා සිය උපරිම දායකත්වය ගල් අඟුරු බලාග ාරය විසින් ලබාදෙන ලදී. මෙය වූකලි ගල් අඟුරු බලාගාරය ආරම්භ කළදා පටන් එමගින් වර්ෂයකට සටහන් කරන ලද ඉහළම විදුලි නිෂ්පාදනය විය.

අපගේ උපරිම උත්සාහයන් තිබියදී වුවද, 2019 මාර්තු හා අප්‍රේල් මාසයන් සඳහා පවත්නා ජනන ධාරිතාවය සහ ඉල්ලුම අතර හිදැස පියවීමට අපට නොහැකි වූ අතර (ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන් හැර) 2019 මාර්තු මස 18වන දින සිට 2019 අප්‍රේල් මස 10වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ චක්‍රීය පද්ධති-ව්‍යාප්ත ධාරිතා ඇණ හිටවීම් සඳහා අවසර ලබාදීමට එමගින් බල කෙරිණි. කෙසේ වුවද, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයන් සිදුවීමෙන් අනතුරුව, ජාතික ජාලය මත පැවති පීඩනය ලිහිල් කරවමින් රටෙහි විදුලි ඉල්ලුම පහත වැටිනි.

2019 වසරේ විදුලි ජනන මුහුව තුළ ගල් අඟුරු දායකත්වය 34%ක්ද, (කුඩා ජල විදුලි බලාගාරයන්ද ඇතුළත්ව) ජල විදුලි දායකත්වය 30%ක්ද, (ලං.වි.ම. සතු සහ ස්වාධීන විදුලි නිෂ්පාදකයන්ගේ) තෙල් විදුලි බලාගාරයන්හි දායකත්වය 31% ක්ද වූ අතර, ඉතිරි 5%ක ප්‍රමාණයෙහි දායකත්වය සුළං හා සෙසු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් විසින් දරන ලදී. පසුගිය වසරෙහි සමස්ත විදුලි ජනනය වූ ගි.වො.පැ. 15,374ක අගය හා සන්සන්දනාත්මකව 3.6%ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වර්ෂය තුළ සමස්ත බලශක්ති ජනනය ගි.වො.පැ. 15,922ක අගයක් පෙන්නුම් කළේය. තවද, 2019 වර්ෂය තුළ සමස්ත විදුලි පරිභෝජනය ගි.වො.පැ. 14,611 දක්වා වර්ධනය වී තිබූ අතර එය ගි.වො.පැ. 14,091ක අගයක් පෙන්නුම් කළ 2018 වර්ෂය හා සන්සන්දනාත්මකව 3.7%ක වර්ධනයක් විය.

2019 වර්ෂය තුළ විදුලි ජනනයේ සාමාන්‍ය ඒකක පිරිවැය කි.වො.පැයකට රු. 23.29ක අගයක් ගත් අතර එය 2018 අගය වූ කි.වො.පැයකට රු. 19.12 හා සාපේක්ෂව 21.8%ක ඉහළ නැගීමකි. මෙකී ඉහළ ජනන පිරිවැය නොසළකා, ලං.වි.ම. විසින් 2019 වසර තුළ කි.වො. පැයකට රු. 16.63ක සාමාන්‍ය ඒකක මිලකට ජාතිය වෙත විදුලිය සම්පාදනය කරන ලද අතර, එය වසර තුළ වාර්තාගත ඉතා ඉහළ මෙහෙයුම් අලාභයනට ප්‍රධාන හේතුව විය.

## මූල්‍ය කාර්ය සාධනය

2019 දෙසැම්බර් මස 31වන දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වූ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනයට අනුව, 2019 වර්ෂය සඳහා ලං.වි.ම.හි අලෙවි ආදායම රු. බිලියන 242.95 ක් ලෙස වාර්තා විය. මෙතුළ පසුගිය වසරේ වාර්තා වූ රු. බිලියන 229.57ක අලෙවි ආදායම හා සන්සන්දනාත්මකව රු. බිලියන 13.38ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2014 වර්ෂයේ පටන් විදුලි ගාස්තු ප්‍රතිශෝධනයක් සිදුව නොමැති බැවින් මෙකී 5.83%ක අගයක් ගත් වර්ධනය මූලික වශයෙන්ම අලෙවි වර්ධනය හේතුවෙන්ම ඇති වූවකි.

තවද, 2018 වර්ෂය තුළ පෙන්නුම් කරන ලද අලෙවි පිරිවැය (රු. බිලියන 251.96) 2019 වසරේදී රු. බිලියන 310.51 දක්වා රු. බිලියන 58.55කින් ඉහළ ගොස් ඇත. අලෙවි පිරිවැයෙහි වූ මෙකී 23.24%ක වර්ධනය වූකලි ප්‍රධාන වශයෙන්ම තාප විදුලි ජනනයෙහි 23.6%ක වර්ධනයක් ඇතිකිරීමට හේතු වූ ජල විදුලි ජනනයෙහි සිදුවූ සැලකිය යුතු පහත වැටීම හේතුවෙන් ඇතිවූ තත්ත්වයකි. සමාලෝචිත වර්ෂය තුළ වාර්තාගත රු. බිලියන 67.56ක් වූ දළ හිඟය මගින් 2018 වසර හා සාපේක්ෂව රු. බිලියන 45.17ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන්ම 2018 වසරේදී සමස්ත ජනනයෙන් 41.5%ක අගයක් ගත් ජල විදුලි දායකත්වය 2019 වර්ෂයේදී හුදෙක් 30%ක අගයකට වැටීම හේතු කොට ඇතිවූ තත්ත්වයකි. වසර තුළ 12.5%ක ජනන එකතුවක් ගල් අඟුරු බලාගාරයන් වෙතින් ලැබුණද, ඉතිරි අවශ්‍යතාවය ඉන්ධන තෙල් බලාගාර භාවිතයෙන් නිෂ්පාදනය කිරීමට සිදුවූ අතර, එම අගය 2018 වර්ෂය හා සන්සන්දනාත්මකව 38.2%ක වර්ධනයක් පෙන්නුම් කරයි. එබැවින්, වසර අවසානය වනවිට ලබාගත් සමස්ත ණය ප්‍රමාණය රු. බිලියන 334.67ක් විය.

ධාරිතා හිඟතාවයක් හේතුකොට ගි.වො.පැ. 95ක් වැනි ඉහළ බලශක්ති ප්‍රමාණයක් සේවාකරණය නොකළ තත්ත්වයක වුව, පාරිභෝගික ගිණුම් සංඛ්‍යාවෙහි වර්ධනයක්ද සමගින් වසර තුළ සමස්ත අලෙවි හා ආදායම් වර්ධනයක් වාර්තා කිරීමට ලං.වි.ම. සමත්වී ඇත. තවද, ලං.වි.ම. විසින් තවදුරටත් සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානිය 8.23% දක්වා 1.3%කින් අඩුකර ගැනීමට සමත්වී ඇත. කෙසේ වුවද, ද්‍රව ඉන්ධන පදනම්ගත තාප ජනනයේ පෘථුල භාවිතය, පෝෂක ප්‍රදේශයනට ඇද හැළුණු අවම වර්ෂාපතනය හා වසර ගණනාවක් පුරා නොගළපන ලද ගාස්තු ව්‍යුහය හේතුකොට අලෙවියෙන් ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් උත්පාදනය නොවීම යන කරුණු හේතුකොට 2019 වර්ෂාවසානය වනවිට ශුද්ධ අලාභය රු. බිලියන 85.412ක් විය.

විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම වෙනුවෙන් ලං.වි.ම. වෙත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් බලපත්‍ර හයක් ලබාදී ඇත. සම්ප්‍රේෂණ බලපත්ලාභියා විසින් සෑම හය මසකටම වරක් තොග සැපයුම් ගාස්තුද (BST), සෑම මසකටම වරක් තොග සැපයුම් ගනුදෙනු ගිණුමද (BSTA) සකස් කොට එය පවත්නා ගාස්තු ක්‍රමවේදය හා නියමයන් ප්‍රකාර ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත දැනුම් දෙනු ලබයි. 2019 වසර ඇතුළත සම්ප්‍රේෂණ බලපත්ලාභීන් විසින් ලබා ඇති මාසික තොග සැපයුම් ගනුදෙනු ගිණුම් අලාභ 2019 වසර වනවිට ලං.වි.ම.හි ශුද්ධ අලාභයෙහි සැලකිය යුතු අගයක් (රු. බිලියන 85.412) ගනී. ගාස්තු ක්‍රමවේදය හා නියමයන් ප්‍රකාර, වාර්තාගත අලාභයන් මැඩ පවත්වනු පිණිස ලං.වි.ම. වෙත සුදුසු ගාස්තු ගැළපීම් හෝ සහන ලබාදෙනු පිණිස වූ නිර්දේශද සමගින් මෙම තොරතුරු අදාළ පාර්ශ්වයන් වෙත සන්නිවේදනය විය යුතුය. ලං.වි.ම.හි බලපත්ලාභීන්හට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත හා 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යටතේ ඔවුන් වෙත පවරා දී ඇති කාර්යයන් ඉටු කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය මූල්‍ය ශක්‍යතාවයක් ඇති කරනු වස් ඊළඟ ගාස්තු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කරන තෙක් අදාළ බලධාරීන් විසින් නිසි කලට මෙසේ පළ කරන ලද නියමයනට අනුගතව කටයුතු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ.

## තාක්ෂණික කාර්ය සාධනය

රටතුළ කාර්යක්ෂම, සමායෝජිත හා පිරිමැසුම්දායී විදුලි සැපයුම් ක්‍රමයක් ගොඩනගා පවත්වාගෙන යාමේ මෙහෙවර තුළින් ලත් උද්යෝගය තුළ, 2019 වර්ෂාවසානය වනවිට සමස්ත පාරිභෝගිකයන් සංඛ්‍යාව 6,500,641ක් වන පරිදි ලං.වි.ම. විසින් එහි පාරිභෝගික පදනම (නව පාරිභෝගිකයන්) 146,360 කින් ඉහළ නංවාගෙන ඇත. වසර තුළ දවසේ පැය 24 පුරාම සිය ගනුදෙනුකරුවන් වෙත විදුලිය ලබාදීම සඳහා ලං.වි.ම. විසින් සියලු පරිශ්‍රමයන් දරන ලද අතර, එහි පාලනයෙන් බැහැර අවාසනාවන්ත තත්ත්වයන් හේතුකොට ලං.වි.ම.ට 2019 මාර්තු/අප්‍රේල් කාල වකවානුව තුළ චක්‍රීය විදුලිය ඇණ හිටවුම් පනවන්නට සිදුවිය.

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

මෙම පසුබෑස්ම පවත්නා තත්ත්වයක් තුළදී වුව, ලං.වි.ම. විසින් නොකඩවා එහි සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලයන් නවීකරණය කරන්නට වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අඩු වෝල්ටීයතා රැහැන් ප්‍රමාණය දිග කි.මී. 2,294කින් හා නව බෙදාහැරීමේ උපපොළ සංඛ්‍යාව 1,660කින් ඉහළ නංවන්නට හැකිවිය. කි.වෝ. 220 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් දිග ප්‍රමාණය නව අනුරාධපුර-මන්නාරම සම්ප්‍රේෂණ මාර්ගය මෙහෙවරෙහි යෙදීමත් සමගින් කි.මී. 125කින් වර්ධනය විය. කෙරවලපිටිය විදුලි බලාගාරය, කැළණිතිස්ස විදුලි බලාගාරය හා කොළඹ වරායේ නව උපපොළ (L උපපොළ) සම්බන්ධ කරන්නාවූ කි.වෝ. 220 භූගත රැහැන් පද්ධතියේ කටයුතු සම්පූර්ණ කිරීම 2019 වසර තුළ සම්ප්‍රේෂණ සම්පත් තුළට එක් කරන ලද තවත් ප්‍රධාන එකතුවක් විය. මෙම සංවර්ධනය මගින් ලං.වි.ම.හි සම්ප්‍රේෂණ ජාලය තුළට කි.වෝ. 220 භූගත රැහැන් කි.මී. 22ක් එක් කරන ලදී. මන්නාරම කි.වෝ. 220/132 කොටුමා උපපොළ, කොළඹ B කි.වෝ. 220/132/33 කොටුමා උපපොළ හා කොළඹ තවත් කි.වෝ. 132/11 ගෘහස්ථ කොටුමා උපපොළයන් දෙකක්ද සම්බන්ධ කටයුතු 2019 වසර තුළ සම්පූර්ණ කරන ලදී.

මෙහි බොහෝ සෙයින් අවශ්‍ය වන්නාවූ සම්ප්‍රේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙහි ලා අප වෙත නොකඩවා ලබාදුන් මූල්‍යමය සහාය වෙනුවෙන් අපගේ අරමුදල් සපයන නියෝජිතායතන වන ආසියානු සංවර්ධන බැංකුව (ADB), ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) වෙතද අපගේ කෘතවේදිත්වය පළ කළ යුතුය.

වසර තුළ සතුටුදායක ප්‍රගතියක් පෙන්වමින් මන්නාරම සුළං බල ව්‍යාපෘතිය, බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලිබල ව්‍යාපෘතිය, උමා ඔය හා මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිද යන ජනන ධාරිතා ව්‍යාප්ති ව්‍යාපෘතීන්හි ඉදිකිරීම් කටයුතු නොකඩවා සිදු කෙරිණි. හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (GDP&EEIIP), ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘතිය (NTDND&EEP), පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය (REATDP), විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP) හා පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියද (CE&NEIP) ඇතුළත් සම්ප්‍රේෂණ ව්‍යාපෘතීන්හි කටයුතුද නොකඩවා සිදුවූ අතර, ඇතැම් ව්‍යාපෘතිවල කටයුතු අවසන් අදියරට ළඟාවී ඇත.

ජාතික ජාලය වෙත සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර එක් කිරීම සඳහා ලබාදී ඇති ඉලක්ක සාක්ෂාත් කරගනු වස් ලං.වි.ම. විසින් නොකඩවා කටයුතු කරන අතර ඒවාහි බලපෑම් කොටුමා නීති මාලාව හා බෙදාහැරීමේ නීති මාලාව ප්‍රකාර කාර්යක්ෂමව හා ඵලදායීව සමනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ගද ගනු පිණිස විදුලිබල පද්ධතියේ ගුණාත්මකභාවය හා විශ්වසනීයත්වය කෙරෙහි ඉන් ඇති කෙරෙන බලපෑම හා ඒවාහි කාර්ය සාධනයද නිරීක්ෂණය කරනු ලබයි. ඉහළ කොත්මලේ ජලාශය පරිරෝධනය කිරීමෙන් වසර අටකට පසු එහි නිරීක්ෂණ කටයුතුද මෙම වසර තුළ සිදු කරන ලදී. ජල විදුලිබල ජනනයේ විශ්වසනීයත්වය තහවුරු කරනු පිණිස කුකුළේගඟ විදුලිබලාගාරයේ පරිවරණ කලා බස් කොටසෙහි අදාළ මාරු කිරීම්ද සිදු කරන ලදී.

පාරිභෝගික සත්කාරය විෂයයෙහි අති විශිෂ්ටත්වයට පත්වීමේ අඛන්ඩ ප්‍රයත්නයනට අනුව, පාරිභෝගිකයන්ට මෙන්ම විවිධාකාර පාරිභෝගික පැමිණිලි නිරාකරණය කරනු පිණිස ලං.වි.ම. කාර්ය මණ්ඩලයටද පහසුවක් වනු වස් 2019 ජූනි මාසයේදී ලං.වි.ම. CEB Assist Solutions උපයෝගිතා මෘදුකාංගයේ කොටසක් වශයෙන් CEB Care ජංගම යෙදවුම සාර්ථකව ආරම්භ කරන ලදී. 2019 වර්ෂය අවසානයේදී iOS හා Android වේදිකාවන් තුළ CEB Care යෙදවුම 80,000 වතාවක් බාගත කොට තිබුණු අතර CEB Assist සඳහා සක්‍රීය අභ්‍යන්තර පරිහාරකයන් 3,200ක් විය.

## මානව සම්පත්

සමාලෝචිත වර්ෂය තුළ ලං.වි.ම. විසින් සිය සේවක මහතුන්ගේ සේවා පරිසරය වැඩිදියුණු කරමින් ශික්ෂිත, සාඩම්බර හා සෑහීමකට පත් කාර්ය බලකායක් ස්ථාපනය කරනු වස් බොහෝ වූ ක්‍රියාමාර්ග ගෙන ඇත.

ලං.වි.ම. විසින් 2019 වර්ෂය තුළ නව සේවකයන් 718 දෙනෙකු බඳවාගෙන ඇති අතර ඒ අනුව 2019 වර්ෂාවසානය වනවිට සමස්ත ස්ථිර සේවක සංඛ්‍යාව 20,512ක් විය. පුහුණු වැඩසටහන් 100කට වැඩි සංඛ්‍යාවක් පවත්වමින් ක්ෂේත්‍ර සේවා සේවක මහතුන් 3,489 දෙනෙකු හට පුහුණුව ලබාදෙන ලදී. මෙයට අමතරව, සේවක මහතුන් 2,656 දෙනෙකු අඛන්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වලට සහභාගි විය.

ආයතනයේ ස්වර්ණ ජයන්තිය හා සමගාමීව අමාත්‍යාංශ නිලධාරීන් හා ලං.වි.ම. සේවක මහතුන්ගේද සහභාගිත්වයෙන් ආගමික හා සමාජ කටයුතු ගණනාවක් පවත්වන ලදී. පර්යේෂණ හා සංවර්ධන කාර්යයන්හි දී සේවක මහතුන්ගේ සාර්ථකත්වයන් දිරි ගන්වමින් නිසි පිළිගැනීමක් ලබාදෙනු පිණිස මෙම වසර තුළ 2017, 2018 හා 2019 නවෝත්පාදන තරග ත්‍යාග ප්‍රදානෝත්සවය පවත්වන ලදී.

## මාගේ කෘතඥතාවය

සියලු මට්ටම්හි සේවක මහතුන් දැක්වූ කැපවීම හේතුකොට ඉහත විස්තර කරන ලද බොහෝ සීමා සහිත තත්ත්වයන් තුළ පවා ලං.වි.ම. විසින් 2019 වසර තුළ එහි මෙහෙයුම්ගත, තාක්ෂණික හා මූල්‍යමය කාර්ය සාධනයක් සාක්ෂාත් කරගන්නා ලදී. ලං.වි.ම. ඉතිහාසයේ අතිශයින්ම දුෂ්කර වසරක් තුළ කටයුතු ඉදිරියට ගෙනයාම පිණිස සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් විසින් ලබාදුන් සහයෝගය හා පිටුබලය වෙනුවෙන් විශේෂයෙන් කෘතවේදී වෙමි. මාගේ පූර්වගාමීන් මෙම ධුරය ඉසිලූ සියලු දෙනා හටද මාගේ කෘතඥතාවය සනිටුහන් කළ යුතුවන්නේ ඔවුන්ගේ කැපවීම නොවන්නට ලං.වි.ම.ට එහි වර්තමාන තත්ත්වයට පත්වීම ඉතාමත් දුෂ්කර කාර්යයක් වන්නට ඉඩ තිබූ බැවිනි. ආයතනික කළමනාකාරිත්ව කණ්ඩායමේ නායකත්වයෙන් ක්‍රියාත්මක සියලු සේවක මහතුන්ද මෙම වසර තුළ ලං.වි.ම.හි සාර්ථකත්වයට දායකත්වයක් සැපයූහ. ඒ සියලු දෙනා ඉටුකළ කාර්ය භාරයද කෘතවේදීව පිළිගත යුතුය.

රටේ සෑම පුරවැසියෙකු වෙතම විදුලිය ලබාදීමේ ප්‍රතිපත්තිය පවත්වාගෙන යනු පිණිස ලං.වි.ම. වෙනුවෙන් දිගු කාලීන ජනන හා සම්ප්‍රේෂණ සැලැස්ම නිසි කලට ක්‍රියාත්මක කළ යුතුව පවතී. නිසි කලට ලං.වි.ම. වෙනුවෙන් ව්‍යාපෘති සැලසුම් අනුමත කරමින්, අරමුදල් සකස් කරමින්, ව්‍යාපෘති අනුමත කරමින් හා අවශ්‍ය ගාස්තු ගැලපුම්/සහන නිර්දේශ කොට ලබා දෙමින් අදාළ සියලු බලධාරීන් විසින් නොකඩවා ලබාදෙන ලද සහාය ලං.වි.ම.හි මෙහෙයුම්ගත, තාක්ෂණික හා මූල්‍යමය කාර්ය සාධනය උත්කෘෂ්ට තලයකට ඔසවා තැබීමට හේතුවනු ඇත. ඒ අනුව, ලං.වි.ම විසින් වර්තමානයේ මුහුණ පා සිටින සුවිශාල අභියෝගාත්මක තත්ත්වය මැඩ පැවැත්වීම පිණිස ආයතනය වෙත සහාය දක්වන ලෙස සියලු බලධාරීන් වෙත නිහතමානීව ආයාචනය කර සිටිමින් මෙම සටහන සමාප්ත කරමි.



**ඉංජිනේරු එස්.ඩී.ඩබ්. ගුණවර්ධන**
සාමාන්‍යාධිකාරී

# 2019 වසර තුළ ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය





මෙහෙයුම් සමාලෝචනය

# ජනන අංශය

උතුරු ජනනී විදුලි බලාගාරය

# ජනන අංශය

ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලු විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සිදුවනුයේ ජනන අංශය මගිනි. මෙයට අමතරව, අවශ්‍යතාවයන් ඉස්මතුවන විටදී පවත්නා විදුලි බලාගාරද ප්‍රතිසංස්කරණය කෙරේ. මෙ.වො. 1,398.9ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිත ජල විදුලි බලාගාරද, මෙ.වො. 654ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිත තෙල් බලයෙන් ක්‍රියාත්මක තාප විදුලි බලාගාරද, මෙ.වො. 900ක සමස්ත ස්ථාපිත ධාරිතාවයක් සහිත ගල් අඟුරු බලාගාරයක්ද මෙම අංශය සතුවේ. 2019 වසර අවසන් වන විට ලං.වි.ම. සතුව පැවති විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 2,593ක් විය.

## විදුලි බලාගාරයන්හි කාර්ය සාධනය

මෝසම් සමයන් දෙකම අසාර්ථක වීම හේතුකොට 2019 වර්ෂය විදුලි ජනනය පාර්ශ්වයෙන් මහවැලි සංකීර්ණයට සතුටුදායක වසරක් නොවීය. මෙම අසතුටුදායක තත්ත්වය යටතේ පවා, මහවැලි සංකීර්ණයේ විදුලි බලාගාර ගි.වො.පැ. 1,803.48ක විදුලි ජනනයක් සිදු කිරීමේ හැකියාවෙන් පැවතිණි. මෙය වූකලි ලං.වි.ම. සමස්ත ජල විදුලි ජනනයෙන් 48%ක පමණ අගයකි.

බෝවතැන්න විදුලි බලාගාරය එහි සැලසුම්ගත වාර්ෂික ජනන ඉලක්කයන් ඉක්මවා ගිය අතර, උකුවෙල හා ඉහළ කොත්මලේ විදුලි බලාගාර ඒවාහි සැලසුම්ගත ජනන ඉලක්කයන්ගෙන් 90% ක අගයට එළැඹිණි.

2019 වසරේ පළමු අර්ධය කුකුලේගඟට අතිශය වියලි කාලගුණයක් පැවති අතර, බලාගාර වෙතින් ජනනය වූ බලශක්ති ප්‍රමාණයද සැලකිය යුතු මට්ටමකින් පහත වැටිණි. කෙසේ වුවද, වසරේ දෙවන අර්ධය තුළ ඇතිවූ අඛණ්ඩ වර්ෂාපතනය පළමු අර්ධයේ පැවති හිඟ තත්ත්වය සපුරාලූ අතර අවසන, ගි.වො.පැ. 317ක් වූ වාර්ෂික ඉලක්කය ඉක්මවා යමින් ගි.වො.පැ. 322ක සමස්ත විදුලි ජනනයක් වාර්තා කරන ලදී.

ඊසානදිග මෝසම් වර්ෂාව 2018-2019 කාල සීමාව තුළ ඉගිනියාගලට සැලකිය යුතු මට්ටමින් නොලැබිණි. ජලාශ ජල මට්ටම පසුගිය වසරේ මෙන්ම පහළ මට්ටමක පැවතිණි. වසර පුරා නවීකෘත හා සීමිත රටාවකට අනුව ජලය මුදා හැරිණි. පසුගිය වසරයන් හා සන්සන්දනාත්මකව 2019 වසර තුළ විදුලිබල ජනනය පහළ මට්ටමක පැවතිණි.

ලක්ෂපාන සංකීර්ණයෙන් අපේක්ෂිත වාර්ෂික ජනනය ගි.වො.පැ. 1,550ක් විය. කෙසේ වුවද, ජනවාරි සිට ජූලි දක්වා කාල සීමාව වියළි කාල සීමාවක් විය. එබැවින්, ලක්ෂපාන සංකීර්ණයෙන් සිදුවූ විදුලි ජනනය 2019 වසර තුළ අපේක්ෂිත මට්ටමට ළඟා නොවිණි.

විදුලි බලාගාරයන්හි පැවතුම් සාධක, බලාගාර සාධක හා දෝෂ සාධක පහත දී ඇත:

### ජල විදුලි බලාගාර

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | 2019 ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) | දෝෂ සාධකය (%) |
|---|---|---|---|---|---|
| **මහවැලි සංකීර්ණය** | **816.8** | **1,803.48** | | | |
| වික්ටෝරියා | 210 | 463.23 | 99.80 | 25.26 | 0.49 |
| කොත්මලේ | 201 | 376.46 | 99.20 | 19.68 | 1.70 |
| ඉහළ කොත්මලේ | 150 | 378.88 | 99.99 | 28.95 | 0.03 |
| රන්දෙනිගල | 122.6 | 235.48 | 99.53 | 22.16 | 1.53 |
| රන්ටැඹේ | 49.5 | 123.79 | 99.67 | 29.25 | 0.80 |
| උකුවෙල | 40 | 161.34 | 99.92 | 46.10 | 0.15 |
| බෝවතැන්න | 40 | 56.94 | 99.65 | 15.68 | 1.54 |
| නිල්ලඹේ | 3.2 | 7.36 | 99.07 | 25.59 | 3.17 |
| **සමනලවැව සංකීර්ණය** | **212.25** | **652.34** | | | |
| සමනලවැව | 120 | 309.34 | 89.99 | 29.74 | 3.72 |
| කුකුලේගඟ | 75 | 321.62 | 94.79 | 52.77 | 0.43 |
| උඩවලව | 6 | 9.14 | 42.50 | 26.79 | 23.99 |
| ඉගිනියාගල | 11.25 | 12.24 | 97.60 | 12.60 | 9.20 |
| **ලක්ෂපාන සංකීර්ණය** | **369.8** | **1327.69** | | | |
| පැරණි ලක්ෂපාන අදියර I | 28.8 | 259.66 | 99.90 | 52.85 | 0.17 |
| පැරණි ලක්ෂපාන අදියර II | 25 | | 99.53 | 57.89 | 0.54 |
| නව ලක්ෂපාන | 116 | 447.64 | 98.58 | 44.09 | 1.58 |
| සමනල | 90 | 374.86 | 97.42 | 47.27 | 1.47 |
| විමලසුරේන්ද්‍ර | 50 | 113.83 | 95.12 | 26.05 | 2.55 |
| කැන්යන් | 60 | 131.70 | 90.09 | 25.15 | 2.14 |
| **ජලවිදුලි එකතුව** | **1398.8** | **3783.51** | | | |

වගුව 01 - ජල විදුලි ජනන

# ජනන අංශය (ඉතිරි කොටස)

## තාප (තෙල්) විදුලි බලාගාර

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | පවත්නා උපරිම සමස්ත ධාරිතාවය (මෙ.වො.) | 2019 දී ජනනය කළ බලශක්තිය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය(%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|---|
| සපුගස්කන්ද - A | 80 | 70 | 248.22 | 89.34 | 42.34 |
| සපුගස්කන්ද - B | 80 | 72 | 378.05 | 86.81 | 62.52 |
| කැළණිතිස්ස CCP - GT | 110 | 110 | 677.23 | 73.02 | 52.52 |
| කැළණිතිස්ස CCP - ST | 55 | 55 | | 44.81 | 39.01 |
| කැළණිතිස්ස GT - 07 | 115 | 115 | 281.31 | 74.63 | 28.32 |
| කැළණිතිස්ස Frame V GTT | 80 | 40 | 43.28 | 67.48 | 15.60 |
| උතුරු ජනනි | 24 | 22 | 100.92 | 81.00 | 50.00 |
| යාත්‍රාවක නැංවූ බලාගාරය | 60 | 62.4 | 357.15 | 84.52 | 67.51 |
| හදිසි විදුලිය - | | | | | |
| තුල්හිරිය | 1x10 | 10 | 16.27 | N/A | 18.79 |
| කොළොන්නාව | 1x20 | 20 | 21.69 | N/A | 12.56 |
| මතුගම | 1x20 | 20 | 13 | N/A | 7.67 |
| **තාප (තෙල්) එකතුව** | **654** | **596.4** | **2,137.12** | | |

**වගුව 02 තාප (තෙල්) ජනනය**

## තාප (ගල් අඟුරු) - ලක්විජය විදුලි බලාගාරය

ශ්‍රී ලංකාවේ ඇති එකම ගල් අඟුරු විදුලි බලාගාරය ලෙස, ලක්විජය විදුලි බලාගාරය (LVPP) විසින් 2019 වර්ෂය තුළ ජාතික ජාලය තුළට විදුලි බලය ගි.වො.පැ. 5361ක් මුදාහළ අතර, මේ දක්වා එහි ඉහළම වාර්ෂික දායකත්වය ඒ අනුව සටහන් කරන ලදී. 2019 වර්ෂය සඳහා ලක්විජය විදුලි බලාගාරයේ වාර්ෂික විදුලි උපයෝජ්‍යතා ඒකකය 91% ක් විය.

| | | පළමු ඒකකය | දෙවන ඒකකය | තුන්වන ඒකකය | එකතුව |
|---|---|---|---|---|---|
| දළ බලශක්ති ප්‍රමාණය | ගි.වො.පැ. | 1,533 | 2,367 | 2,017 | 5,917 |
| පිටකරන ලද ශුද්ධ බලශක්තිය | ගි.වො.පැ. | 1,381 | 2,150 | 1,830 | 5,361 |
| උපකාරක පරිභෝජනය | ගි.වො.පැ. | 152 | 217 | 187 | 556 |
| උපයෝජ්‍යතා සාධකය | % | 77 | 98 | 96 | 91 |
| ධාරිතා සාධකය | % | 58 | 90 | 77 | 75 |
| ගල් අඟුරු පරිභෝජනය | ටොන් | 590,238 | 874,217 | 744,411 | 2,208,866 |
| ඩීසල් පරිභෝජනය | ලීටර | 512,029 | 719,980 | 2,216,168 | 3,448,177 |

**වගුව 03 තාප (ගල් අඟුරු) ජනනය**

**2019 වසර සඳහා ලං.වි.ම. සතු ජල හා තාප විදුලි බලාගාරයන් මගින් සිදුවූ සමස්ත විදුලි ජනනය ගි.වො.පැ. 11,286.1 ක් විය.**

# ජනන අංශය (ඉතිරි කොටස)

**2019 වසර තුළ සිදුකරන ලද විශේෂ නඩත්තු කටයුතු**

ජනන ඒකක හා එවන් ජනන ඒකකයන්හි සෙසු අතිරේක පද්ධතිවල සිදු කරනු ලබන සාමාන්‍ය නඩත්තු කටයුතුවලට අමතරව, ජනන අංශයේ වත්කම් කළමනාකරණ ජල විදුලි/ යාන්ත්‍රික, වත්කම් කළමනාකරණ තාප විදුලි/ යාන්ත්‍රික, වේලි ආරක්ෂණ පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු සහ ආරක්ෂණ ජනන ශාඛාවන්හි කාර්ය මණ්ඩලයේ සහායෙන් සංකීර්ණයෙන් සංකීර්ණයට පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතු සිදු කරන ලදී.

## ලක්ෂපාන සංකීර්ණය

### ලක්ෂපාන විදුලි බලාගාරය

පැරණි ලක්ෂපාන විදුලි බලාගාර අදියර I හි කි.වෝ. 11/132 එකලා තරාපැවි තුනක් මාරු කරන ලදී. පැරණි ලක්ෂපාන විදුලි බලාගාරයේ තරාපැවි ආරක්ෂක ප්‍රතිචාරක නව අංකිත බුද්ධි විද්‍යුත් උපකරණ යොදමින් මාරු කරන ලද අතර ඉන්පසු පරීක්ෂාවට ලක්කොට මෙහෙවරෙහි යොදවන ලදී.

### විමලසුරේන්ද්‍ර බලාගාරය

පළමු වැනි වන ඒකකයෙහි යන්ත්‍රයේ වාර්ෂික නඩත්තු කටයුත්ත 2019 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී.

*වැල් නිවස්න සංඥා අන්තර් මුහුණත්කරණය*

වැල් නිවස්න උපකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් (SCADA) පද්ධතිය සමගින් අන්තර් මුහුණත්කරණය නොකෙරේ. එබැවින්, අවශ්‍ය උපකරණ යොදමින් වැල් අතුරු මුහුණත අතුරු මුහුණත්කරණය කිරීමට තීරණය කරන ලදී. 2019 වර්ෂය තුළ නව උපකරණ හා අබාධ විදුලි සැපයුම් (UPS) පද්ධති ප්‍රසම්පාදනය කරන ලද අතර, 2වන ඒකකයෙහි වාර්ෂික නඩත්තුව අතරතුර ඒකාබද්ධ කිරීමට සැලසුම් කොට ඇත.

### කැනියන් විදුලි බලාගාරය

*කැනියන් 2වන ඒකකයෙහි විදුලි ජනන යන්ත්‍රය හා තරාපැවි ආරක්ෂණ පද්ධතිය මාරු කිරීම*

කැනියන් 2වන ඒකකයෙහි විදුලි ජනන යන්ත්‍රය හා තරාපැවි ප්‍රතිචාරකය නව අංකිත බුද්ධිමය විද්‍යුත් උපකරණ (IEDs) යොදා මාරු කරන ලදී. ස්ථාපනය, අංකිත බුද්ධිමය විද්‍යුත් උපකරණ සමාකෘතිගතකරණය හා පරීක්ෂා කිරීම සම්පූර්ණ කරන ලදී. විදුලි බලය ඇණ හිටවුම් පැවතීම මත පදනම්ව 2020 දෙවන කාර්තුව තුළ අවසන් මෙහෙවරෙහි යෙදීම සිදු කිරීමට නියමිතය.

*මාවුස්සාකැලේ වේල්ල පරීක්ෂා කිරීම*

ලක්ෂපාන සංකීර්ණයේ හා වත්කම් කළමනාකරණ ජල විදුලි යාන්ත්‍රික (AMHM) ශාඛාවේ කාර්ය මණ්ඩලයේ සහයෝගය සහිතව පරිසර, සිවිල් නඩත්තු හා වේලි ආරක්ෂණ ශාඛාවේ (DSE&CSM) 'කාලීන වේලි පරීක්ෂාවේ' 3වන මට්ටමේ පරීක්ෂාව යටතේ 2019 ඔක්තෝබර් මස 18වන දින මාවුස්සාකැලේ වේල්ල හා ව්‍යුහය පරීක්ෂා කරන ලදී.

## මහවැලි සංකීර්ණය

### වික්ටෝරියා විදුලි බලාගාරය

*02වන ඒකකයේ යන්ත්‍රයේ ප්‍රධාන ජල පිවිසුම් වැල්වයන්හි (MIV) ටර්නියන් බෙයාරින් මාරු කිරීම*

මුද්‍රා මතුපිටයන්හි අධිකතර ගෙවීම් හේතුකොට 01වන ඒකකයේ හා 02වන ඒකකයේ යන්ත්‍රවල ප්‍රධාන ජල පිවිසුම් වැල්වයන්හි ටර්නියන් බෙයාරින් හරහා ජල කාන්දුවක් 2006 වසරේ පමණ සිට සිදුවන්නට විය. ඉන්පසු මෙම දෝෂය අලුත්වැඩියා කරනු පිණිස බොහෝ වූ ප්‍රයත්නයන් දරන ලද අතර අවසන මුල් උපකරණ නිෂ්පාදකයාගේ අනුප්‍රාප්තිකයා වෙතින් ඒවා අලුත්වැඩියා කරනු පිණිස අවශ්‍ය අමතර කොටස් ලබාගන්නා ලදී. ගෘහස්ථ පහසුකම් භාවිතයෙන් 2019 වසර තුළ 02වන ඒකකයෙහි ප්‍රධාන ජල පිවිසුම් වැල්වයෙහි දෝෂය අලුත්වැඩියා කිරීමට තීරණය කරන ලදී. අලුත්වැඩියා කටයුත්ත සති 12කට වැඩි කාලයක් පුරා සිදුකරන ලද අතර එහි සේවාවන් කිහිපයක් බාහිර සම්පත් දායකයන් වෙත භාරදෙන ලදී. මෙම අලුත්වැඩියාව මුළුමනින්ම සාර්ථක වූ අතර, බාහිර සම්පත් දායකයන් වෙත ලබාදෙන ලද ගාස්තු පිරිවැයද ඇතුළත් සමස්ත සේවාකරණ පිරිවැය ශ්‍රී ලං.රු. මිලියන 3ක් පමණ විය.



සර්වෝ මෝටර සම්බන්ධකය ගැලවීම



ටර්නියන් බෙයාරින් ඇතුලු කිරීම

*ප්‍රධාන ජල පිවිසුම් වැල්ව තලයේ මුද්‍රාව මාරු කිරීම*

02වන ඒකකයේ යන්ත්‍රයෙහි ප්‍රධාන ජල පිවිසුම් වැල්වයේ බෙයාරින් මාරු කිරීම හා සමාන්තරවම එම වැල්වයේ තල මුද්‍රා හා ගැලවුම් බද්ධයද මාරු කරන ලදී. 02වන ඒකකයේ යන්ත්‍රයෙහි ප්‍රධාන ජල පිවිසුම් වැල්වය මේවන විට සම්පූර්ණ වශයෙන් නැවත සකස් කරන ලද තත්ත්වයක පවතී.



අලුත්වැඩියා කිරීමට පෙර MIV තලයේ සමීප දසුනක්



අලුත්වැඩියාවට පෙර MIV තල මුද්‍රාව



තල මුද්‍රාව



මුද්‍රාව ගැලවීමෙන් පසු ටර්බයින පැත්තෙන් පෙනෙන ආකාරය

*වික්ටෝරියා ජලාශයේ ජල පිවිසුමෙහි ජලාශ මට්ටම් මිනුම් පද්ධතිය මාරුකිරීම*

වික්ටෝරියා ජලාශයේ විදුලි බල පිවිසුම් ද්වාරයෙහි නව ජලාශ ජල මට්ටම් මිනුම් පද්ධතියක් ස්ථාපනය කරන ලදී. මෙම පද්ධතියෙන් එන සංඥා හා සෙසු පිවිසුම් පාලන සංඥාද මේවන විට විදුලි බලාගාරය වෙත සන්නිවේදනය කෙරෙනුයේ වැඩසටහන් පාලක (PLC) මයික්‍රොවේව් පිටතල මාර්ගයක් හරහාය. ලං.වි.ම. පද්ධති පාලන මධ්‍යස්ථානයේ දර්ශකය වෙත අතුරු මුහුණත්කරණය කරනු පිණිස ජලාශ ජල මට්ටම් සංඥාවක් බලාගාර පාලන කාමරයෙහි ඇත.

# ජනන අංශය (ඉතිරි කොටස)


නව ධාරා තරාපැවි ස්ථාපනයට පෙර


ස්ථාපනය අතරතුර


ස්ථාපනයෙන් පසු

*වික්ටෝරියා ස්විච් අංගනයෙහි ධාරා තරාපැවිය (CT) මාරු කිරීම*

පූර්ව දර්ශක නඩත්තු පද්ධතිය මගින් හෙළි කරන ලද දුර්වල තත්ත්වය හේතුකොට වික්ටෝරියා වහරු අංගනයෙහි ධාරා තරාපැවි විසි හතරක් (24) මාරු කරන ලදී. පවත්නා වැඩපිළිවෙල නව දහර තරාපැවි යෝග්‍ය බවට පත් කරනු පිණිස මාරු කිරීමේදී නැඟුම් ව්‍යුරා, බැරයටි සම්බන්ධතා, පිනු රැහැන් හා රැහැන් සම්බන්ධතාවයන්හිද යම් වෙනස්කම් සිදු කරන ලදී.

*අධිකාරිගම ගොඩනැගිලි වැඩබිමෙහි ජල සත්කාර යන්ත්‍රාගාරයක් ස්ථාපනය කිරීම*

අධිකාරිගම ගොඩනැගිලි වැඩබිමෙහි පවත්නා ජලය බොහෝ සෙයින් කැල්සියම් අන්තර්ගත බැවින් බීමට සුදුසු නැත. එබැවින්, ගොඩනැගිලි වැඩබිමෙහි පදිංචිකරුවන් හට පානීය ජලය සොයාගැනීම සඳහා බොහෝ දුෂ්කරතාවයනට මුහුණ පාන්නට සිදුවිය.

දීර්ඝ අධ්‍යයනයකින් පසුව මෙම ගැටලුව නිරාකරණය කරනු පිණිස ගලන නදී ජල වර්ගයේ ජල සත්කාරක යන්ත්‍රාගාරයක් ගොඩනැගිලි වැඩබිමෙහි ස්ථාපනය කිරීමට යෝජනා කෙරිණි. ස්ථාපිත ජල පෙරුම් යන්ත්‍රාගාරය මගින් මේවන විට ගොඩනැගිලි වැඩබිමට මෙන්ම බලාගාරය වෙතද පවත්නා පානීය ජල අවශ්‍යතා සපුරාලනු ලබයි.

**කොත්මලේ විදුලි බලාගාරය**

*කොත්මලේ ස්විච් අංගනය සඳහා නව අතිරේක තරාපැවියක් ස්ථාපනය*

ස්විච් අංගනයක් අත්‍යවශ්‍ය නොවන කි.වෝ. 11/0.4, කි.වෝ.ඇ. 500 තරාපැවියක් 1984 වසරේ දී ස්ථාපනය කරන ලදී. දැනට පවත්නා අතිරේක තරාපැවි සඳහා අමතර කොටස් නොමැති වීම හා තරාපැවියෙහි පවත්නා සුළු තෙල් කාන්දුවද හේතුවෙන්, එය මාරු කිරීමට තීරණය කෙරිණි. ඒ අනුව, කි.වෝ. 11/0.4, කි.වෝ.ඇ. 500 තෙකලා, අධි වෝල්ටීයතා/මධ්‍යම වෝල්ටීයතා අන්තර්ගතයක්ද සහිත ධජ්ඝ තරාපැවියක් ශ්‍රී ලං.රු. මිලියන 1.5ක පිරිවැයකට ප්‍රසම්පාදනය කොට ස්ථාපනය කරන ලදී.


කොත්මලේ ස්විච් අංගනය සඳහා නව අතිරේක තරාපැවියක් ස්ථාපනය

*කොත්මලේ විදුලි බලාගාරයේ පිවිසුම් ද්වාරය, තලබමන ජල පිටවුම් ද්වාර, සර්ජන කුටි ද්වාරය හා ව්‍යුහයන්හි මතුපිට පිරිසිදු කිරීම හා පින්තාරු කිරීම*

මෙම ගේට්ටු වසර තිහකට වඩා පැරණි ඒවා වන අතර පැරණි පින්තාරු ක්‍රමය හේතුකොට මළ බැඳීණි. පින්තාරු පද්ධතියෙහි ජීව කාලය කල්පැන ඇති බැවින් සායම් පහසුවෙන්ම ලෝහ මතුපිටින් ගැලවී යා හැක. වර්ග මීටර 1,350කට ආසන්න ප්‍රමාණයක ගේට්ටු මතුපිට පිරිසිදු කොට Sa 2.5 හා ISO12944-1 ප්‍රමිති ප්‍රකාර පින්තාරු කරන ලදී



කොත්මලේ විදුලි බලාගාරයේ පිවිසුම් ද්වාරය, ටර්බයින ජල පිටවුම් ද්වාර, සර්ජන කුටි ද්වාරය හා ව්‍යුහයන්හි මතුපිට පිරිසිදු කිරීම හා පින්තාරු කිරීම

# ජනන අංශය (ඉතිරි කොටස)

## සමනල සංකීර්ණය

### සමනලවැව විදුලි බලාගාරය

***සමනලවැව පාලක/**අධීක්ෂක පාලන හා දත්ත උකහා ගැනුම් (SCADA) ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය*

Hydraulic Mimic Control Programmable Logic Controller මාරු කිරීමේ කටයුතු 2019 වර්ෂය තුළදී සම්පූර්ණ කරන ලදී.

*02 වන ඒකකයේ ජනන යන්ත්‍රයෙහි ස්ථායුක සකැබුම් පද්ධතිය මාරු කිරීම*

2019 වර්ෂය තුළ 02වන ඒකකයේ ජනන යන්ත්‍රයෙහි ස්ථායුක සකැබුම් පද්ධතිය සාර්ථකව ස්ථාපනය කොට මෙහෙවරෙහි යොදවන ලදී.

*අඩු පීඩන තෙල් සිසිලනයන් නැවත සකස් කිරීම.*

අඩු පීඩන තෙල් සිසිලනයන් දෙකක් නැවත සකස් කොට වසර තුළ නැවත ස්ථාපනය කරන ලදී.

### කුකුලේ ගඟ විදුලි බලාගාරය

*වාර්ෂික යන්ත්‍ර නඩත්තුව*

වසරේ පළමු කාර්තුව තුළ ඒකක හා ඒවාහි සම්බන්ධිත පද්ධතීන්හි වාර්ෂික නඩත්තුව සිදු කරන ලදී.



2වන ඒකකයේ යන්ත්‍රයෙහි වාර්ෂික නඩත්තුව - කුකුලේගඟ විදුලි බලාගාරය

### උඩවලව විදුලි බලාගාරය

*අතුරු මං ද්වාරයන්හි ආධාරක ව්‍යුහයන් ප්‍රතිසංස්කරණය*

පෙරදී මළ බැඳුණු කොටස් ජලයෙන් යටව පැවති බැවින් අතුරු මං ද්වාරයෙහි ආධාරක ව්‍යුහයට සම්බන්ධිත, බොහෝ සෙයින් මළ බැඳුණු වානේ නළය ජලාශයේ පැවති ඉහළ ජල මට්ටම හේතුකොට පිළිසකර කළ නොහැකි විය. කෙසේ වුවද, මෙම වසර තුළ, එය මාරු කොට ආශ්‍රිත වානේ ආකෘතීන්ද ඇතුළත්ව පින්තාරු කිරීමට හැකිවිය. ලක්විජය විදුලි බලාගාරයේ කිමිදුම් කණ්ඩායම විසින් සිදු කරන ලද දිය යට පරීක්ෂාව තුළදී සොයාගත් වැලි හා සුන්බුන් මගින් ජල අතුරු මාර්ග සතරම යම් පමණකට සිරවී තිබිණි. වැලි සහ සුන්බුන් ඉවත් කොට අපද්‍රව්‍ය රාක්ක අලුත්වැඩියා කොට පින්තාරු කරන ලදී.



මළ බැඳුණු වානේ නළය



වානේ නළය අළුත්වැඩියාව



මාරුකළ නව නළය



අපද්‍රව්‍ය රාක්කය අලුත්වැඩියා කිරීම

### ඉඟිනියාගල විදුලි බලාගාරය

*උමං ජලය ඉවත් කොට පරීක්ෂා කොට අලුත්වැඩියාව*



උමඟ ඇතුළත

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ලං.වි.ම.හි වේලි ආරක්ෂණ හා පරිසර ඒකකයේ සහයෝග යෙන් 2019 වසර තුළ උමඟෙහි ජලය ඉවත් කොට පරීක්ෂා කරන ලදී. උමඟෙහි තත්ත්වය නිරීක්ෂණය කොට ඇතුළත වානේ ලයිනරයෙහි නෙරා තිබූ කොටසක් අලුත්වැඩියා කරන ලදී.



උමඟට ප්‍රවේශ වීම

*වාර්ෂික පරීක්ෂාව හා නඩත්තුව*

නඩත්තුව අතරතුර ජනන ඒකක සතරම පරීක්ෂා කොට පිරිසිදු කරන ලදී. ජනන යන්ත්‍ර සතරම වසර 50කට වඩා පැරණි ඒවා වන බැවින්, එතුම් ප්‍රවේශම්කාරීව පරීක්ෂා කොට, පිරිසිදු කරන ලද අතර, නඩත්තුවට පෙර හා පසුද පරිවාරක ප්‍රතිරෝධ කියවීම් ලබාගන්නා ලදී.

# ජනන අංශය (ඉතිරි කොටස)

## තාප සංකීර්ණය

### සපුගස්කන්ද විදුලි බලාගාරය

සපුගස්කන්ද විදුලි බලාගාරය (SPS) විදුලි බල ස්ථානය A හා විදුලි බල ස්ථානය B ලෙස ස්ථාන දෙකකින් සමන්විත වේ. විදුලි බල ස්ථානය Aහි මෙ.වො. 20 ඩීසල් එන්ජින්වලින් ක්‍රියාත්මක ජනන කට්ටල 4ක් ඇති අතර, විදුලි බල ස්ථානය B හි මෙ.වො. 10 ඩීසල් එන්ජින්වලින් ක්‍රියාත්මක ජනන කට්ටල 8ක් ඇත. නඩත්තු කාල පරාසයන් හැරුණු කොට වසර පුරා පද්ධති පාලන මධ්‍යස්ථාන අවශ්‍යතාවනට අනුව පදනම් පැටවුම හෝ චක්‍රීය පැටවුම් මත මෙම එන්ජින් ක්‍රියාත්මක කරන ලදී.

*වහරු අංගනයේ කි.වෝ. 132 දහර තරාපැවිය මාරු කිරීම*



වහරු අංගනයේ දහර තරාපැවිය මාරු කිරීම

*ටර්බෝචාජර්ස් මාරු කිරීම*

එන්ජින්වල කාර්යක්ෂමතාවය වර්ධනය කරනු පිණිස අංක 06,08,09 හා 10 දරන එන්ජින්වල ටර්බෝචාජර්ස් TCA 66 නව මාදිලියේ එන්ජින් යොදා මාරු කරන ලදී.



නව TCA66 ටර්බෝචාජරය ස්ථාපනය

*ස්ථායුකය හා රොටරය පිරිසිදු කිරීම*

ඉහළ එතුම් උෂ්ණත්වය අඩු කරනු පිණිස රොටරය ඇද ඉවත් කිරීමෙන් අනතුරුව අංක 04 දරන ජනන යන්ත්‍රයේ ස්ථායුකය හා රොටරය පිරිසිදු කිරීම සිදු කරන ලදී.



අංක 04 දරන ජනන යන්ත්‍රයේ ස්ථායුක එතුම් පිරිසිදුකරණය

### කැළණිතිස්ස විදුලි බලාගාරය

*ජනන යන්ත්‍රය - 07 හා රාමුව V ජනන යන්ත්‍රයන්හි අලුත්වැඩියාවන් හා පරීක්ෂාවන්*

කැළණිතිස්ස විදුලි බලාගාරයේ යන්ත්‍ර බොහෝ පැරණි ඒවා වුවද, ඉල්ලුම සපුරාලනු වස් ඒවා මගින් පද්ධතිය වෙත ලබාදෙන දායකත්වය අතිශයින් සැලකිය යුතු මට්ටමක පවතී. ලං.වි.ම. කළමනාකාරිත්වයේ තීරණයකට අනුව, රාමුව V ජනන යන්ත්‍ර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගන්නා ලද අතර, ඒ අතරින් ජනන යන්ත්‍ර දෙකක කටයුතු අවසන් කොට මෙ.වො. 17 හා මෙ.වො. 18 ධාරිතාවයන්ගෙන් ක්‍රියාත්මක වේ. ජනන යන්ත්‍රය අංක 04 2020 මාර්තු මස පළමුවැනි සතිය තුළ මෙහෙවරෙහි යෙදීමට නියමිත අතර ඉන්පසු ජනන යන්ත්‍රය අංක 05 ප්‍රතිසංස්කරණය සඳහා ගනු ඇත. පද්ධතිය වෙත ලබාදෙන සක්‍රීය විදුලිබල දායකත්වයට අමතරව, පද්ධතියේ වෝල්ටීයතාවය හා ස්ථාවරත්වය පවත්වාගෙන යනු පිණිස රාමුව V යන්ත්‍රයන්හි අඛන්ඩ ප්‍රතිචාරක විදුලි දායකත්වය අතිශයින් ප්‍රශංසනීය තත්ත්වයක පවතී. පසුගිය වසර කිහිපය තුළ ජනන යන්ත්‍රය 07 පද්ධති අවශ්‍යතාවයන් මත යන්ත්‍රාගාර සාධක 0.65 හා 0.80 සහිතව ක්‍රියාත්මක විය. ජනන යන්ත්‍ර 07හි SEPA පාලක පද්ධතිය මාරු කිරීම 2019 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලද අතර උණුසුම් වායු මාර්ග පරීක්ෂාව (HGPI) අවසන් වූ විගස 2020 ජනවාරි මැද භාගයේදී මෙහෙවරෙහි යොදවනු ඇත. කැළණිතිස්ස විදුලි බලාගාරයේ රාමුව V ජනන යන්ත්‍රය 1 හා ජනන යන්ත්‍රය 2හි ජනන යන්ත්‍ර ආරක්ෂණ ප්‍රතිචාරකයන් වෙනුවට නව අංකිත බුද්ධි විද්‍යුත් උපකරණ යොදන ලදී. ස්ථාපනය, බුද්ධි විද්‍යුත් උපකරණ සමාකෘතිකරණය, පරීක්ෂාව, දහර තරාපැවිය විශ්ලේෂණය හා බුද්ධි විද්‍යුත් උපකරණ බලගැන්වීම යන කටයුතු සම්පූර්ණ කරන ලදී.

# ජනන අංශය (ඉතිරි කොටස)

## ලක්විජය විදුලි බලාගාරය

*01 ඒකකයෙහි B මට්ටමේ පිරිවැඩියාව*

ලක්විජය විදුලි බලාගාරයේ 01 ඒකකයෙහි B මට්ටමේ පිරිවැඩියා කටයුතු 2019 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී.



ලක්විජය විදුලි බලාගාරයේ 01 ඒකකයෙහි පිරිවැඩියාව

# ජනන අංශය (ඉතිරි කොටස)

## විශේෂ ප්‍රතිසංස්කරණ හා ව්‍යාපෘති කටයුතු

### සමනල විදුලි බලාගාර ප්‍රතිසංස්කරණ කටයුතු

නව ජනන යන්ත්‍ර මගින් බලාගාරයේ ජනන ධාරිතාවය 15%කින් පමණ ඉහළ නංවා ඇත. කාර්යක්ෂමතාවය ඉහළ නංවා නඩත්තු කටයුතු සඳහා විදුලි ඇණ හිටවීම් අවම කිරීමත් සමගින් නව ඒකකයන් විසින් අඩු මෙහෙයුම් හා නඩත්තු පිරිවැයකින් ජාතික ජාලය වෙත වැඩි විදුලි බලයක් එක් කරනු ඇත.

ව්‍යාපෘතියේ ප්‍රධාන අංග සඳහා දෝෂ දැනුම් දීමේ කාල පරිච්ඡේදය 2019 දෙසැම්බර් මාසයේදී අවසන් වූ අතර අංග ගණනාවක දෝෂ දැනුම් දීමේ කාල සීමාවන් 2020 වසර දක්වාද දීර්ඝ කෙරිණි. දීර්ඝ කරන ලද මළ බැඳුම් ආරක්ෂණය 2024 වසර තුළ කල් ඉකුත්වනු ඇත. මේවන විට ව්‍යාපෘති කණ්ඩායම ලේඛන කටයුතු සම්පූර්ණ කිරීමේ කාර්යයෙහි නිරතව සිටිති.

### වික්ටෝරියා විදුලි බලාගාරයේ 03වන ඒකකයෙහි ස්ථායුක මාරුකරණ ව්‍යාපෘතිය

2018 මාර්තු මාසයේදී නව ස්ථායුකය මාරු කොට, 2018 මැයි මාසය වනවිට කාර්යක්ෂමතාවය මැන බැලීමේ කටයුතුද සිදුකරන ලදුව, 2019 මැද භාගය දක්වා වූ සිය දෝෂ නිවේදන කාල පරිච්ඡේදය තුළ වික්ටෝරියා ඒකක 3 ක්‍රියාත්මක විය. දෝෂ නිවේදන කාල පරිච්ඡේදය ඇතුළත, ඉහළ කරවරයේ සිව් කොළ ලං.වි.ම. ඉල්ලීමට අනුව නැවත සකස් කෙරිණි. අවසන් ඇළීම් කටයුතු, මෙහෙයුම් හා නඩත්තු අත්පොත් භාර දෙනු ලැබ, 2019 තුළ ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කරන ලද බවට සැලකිණි.

### ලක්විජය විදුලි බලාගාර ගල් අඟුරු අංගනයේ පරිහරණ ධාරිතාවය නැංවීම

ගල් අඟුරු බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුගිය වසර ගණනාව පුරා ලබාගත් අත්දැකීමත් සමගින්, පවත්නා ගල් අඟුරු ගබඩා ප්‍රමාණය ඉහළ නැංවිය හැකි නම් බලාගාරයේ විශ්වසනීයත්වය තවදුරටත් වැඩිදියුණු කළ හැකි බවට හඳුනා ගන්නා ලදී. එබැවින්, අයහපත් කාලගුණය, ගල් අඟුරු සැපයීමේ පවත්නා ප්‍රමාදයන් සහ ගල් අඟුරු පරිහරණ පද්ධතීන්හි පවත්නා ගැටලු සම්බන්ධ හානිකර ප්‍රතිවිපාක වළකාලනු වස්, මෙ.ටො.මී. 1.21ක් රඳවාගත හැකි පරිදි පවත්නා ගල් අඟුරු අංගනයේ ගල් අඟුරු ගබඩාකරණ හා පරිහරණ ධාරිතාවය ඉහළ නැංවීමට තීරණය කෙරිණි.

මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත් අතර, 2019 වසරේදී චයිනා මැෂිනරි ඉන්ජිනියරින් කෝපරේෂන් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී.

### කැළණිතිස්ස විදුලි බලාගාරයේ රාමුව V වායු තලබමනය ප්‍රතිසංස්කරණය

කැළණිතිස්ස විදුලි බලාගාරයේ මෙ.වෝ.ඇ. 25 බැගින් වූ වසර 35කට වඩා පැරණි වායු තලබමන හතරක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. වෝල්ටීයතා නියාමනය, පද්ධති ස්ථාවරත්වය ඉහළ නැංවීම හා විදුලිය අක්‍රිය අවස්ථාවන්හි කොළඹ නගරය සඳහා විදුලි පුනරුත්ථාපනය මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන වාසි ලෙස හඳුනාගෙන ඇත. වායු තලබමනය 01 හා වායු තලබමනය 20 අදාළ කටයුතු මුළුමනින්ම අවසන් කරන ලද අතර අදාළ සියලු කටයුතු ලං.වි.ම.හි කාර්මිකයන් හා ඉංජිනේරුවරුන් විසින් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කටයුතු වශයෙන් තලබමන අලුත් වැඩියාව හා මාරු කිරීම, ප්‍රධාන පිවිසුම් ද්වාර වා පෙරණයන් හා සිසිලනයන් පිරිසැකැස්ම, ආරක්ෂාව හා ස්වයංක්‍රීය වෝල්ටීයතා රෙගියුලේටර සමාකෘතිගත කිරීම, ස්ථාපනය හා මෙහෙවරෙහි යෙදවීම, පාලකය නැවත වයරින් කිරීම, අලුත්වැඩියාව හා ක්‍රමාංකනය හා නව වායු පරිවරණිත අධි වෝල්ටීයතා ස්විච් ගියර (GIS) හඳුනා ගන්නා ලදී. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර, කීර්තිමත් වායු තලබමන නිෂ්පාදකයන් සහ GE හා MJB වැනි සේවා සම්පාදකයන් වෙතින් ලංසු කැඳවන ලදී. කෙසේ වුවද, ඔවුන්ගේ ලංසු ශ්‍රී ලං.රු. බිලියන 7ක පමණ අගයක් ගන්නා ලදී. ලං.වි.ම. වෙත ශ්‍රී ලං.රු.බිලියන 6ක් ඉතිරි කරමින් ශ්‍රී ලං.රු.බිලියනයකට මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කිරීමේ හැකියාවක් ලං.වි.ම. සතුවිය. අංක 04 යන්ත්‍රයේ කටයුතුවලින් 90% කට වැඩි ප්‍රමාණයක්ද අංක 05 යන්ත්‍රයේ කටයුතුවලින් 25%ක්ද සම්පූර්ණ කරන ලදී. 2019 වසර තුළ ප්‍රතිසංස්කරණය කරන ලද වායු තලබමන 1 හා 2 විසින් අර්බුදකාරී නියං සමයෙහි පද්ධතිය තුළට ගි.වො.පැ. 80කට වැඩි විදුලිය ප්‍රමාණයක් සම්පාදනය කරන ලදී.

### උඩවලවේ විදුලි බලාගාරය ප්‍රතිසංස්කරණය

මෙ.වො. 3 x 2ක ස්ථාපිත ධාරිතාවයක් සහිත උඩවලවේ විදුලි බලාගාරය, උඩවලවේ ජලාශයෙන් වාරි කටයුතු සඳහා නිකුත් කෙරෙන ජලයෙන් විදුලිය ජනනය කිරීම සඳහා 1968 වර්ෂයේදී ගොඩනගා මෙහෙවරෙහි යොදවන ලදී.

ඒකක 01 හා ඒකක 02 යන්ත්‍ර ගංගාවේ වම් ඉවුරේද, ඒකක 03 යන්ත්‍රය ගංගාවේ දකුණු ඉවුරේද ස්ථානගත කර ඇත. වම් ඉවුරේ ස්ථානගත ඒකක 01 1985 වසරේ සිට අක්‍රියව ඇත. බලාගාරය වෙතින් අපේක්ෂිත වාර්ෂික බලශක්ති ජනනය ගි.වො.පැ. 8කි. කිසිදු ප්‍රධාන පෙළේ අලුත්වැඩියාවක්, හෝ මාරු කිරීමක් හෝ පිරිවැඩියාවක් එය මුල්වරට මෙහෙවරෙහි යෙදවූ දා සිට සිදුකොට නොමැත. එබැවින්, 2019 වසර සඳහා ජනන ව්‍යාපෘති ශාඛාව යටතේ එන ප්‍රතිසංස්කරණ සැලැස්මෙහි මෙම බලාගාරය ප්‍රතිසංස්කරණය සඳහා ඉහළම ප්‍රමුඛත්වය ලබාදීමට තීරණය කර ඇත. යළි සකස් කොට, නවීකරණය කොට උඩවලවේ විදුලි බලාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල විෂය පථය අර්ථ නිරූපණය කරනු පිණිස වූ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමට තාක්ෂණික කමිටුවක් පත් කරන ලදී. තාක්ෂණික කමිටුව විසින් සකස් කරන ලද අතුරු වාර්තාවක් දැනටමත් ලං.වි.ම. කළමනාකාරීත්වය වෙත භාරදී ඇත.

### ඉඟිනියාගල විදුලි බලාගාරය ප්‍රතිසංස්කරණය

මෙ.වො. 11.25ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ඉඟිනියාගල විදුලි බලාගාරය සේනානායක සමුද්‍රයෙන් වාරි කටයුතු සඳහා මුදා හැරෙන ජලයෙන් විදුලිය ජනනය කරනු පිණිස 1952 හා 1962 ලෙස අදියර දෙකකින් ගොඩනගා මෙහෙවරෙහි යොදවා ඇත. කිසිදු ප්‍රධාන පිරිවැඩියා හෝ ප්‍රති සැකසුම් කටයුත්තක් මේ දක්වාද සිදුකොට නොමැති බැවින්, මෙය ජනන ව්‍යාපෘති ශාඛාවේ ප්‍රතිසංස්කරණ සැලැස්මේ ප්‍රමුඛතා ලැයිස්තුව තුළට ඇතුළත් කර ඇත. ඉඟිනියාගල විදුලි බලාගාරයේ ප්‍රති සැකසුම් හා නවීකරණ කටයුතු සම්බන්ධ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ප්‍රතිසංස්කරණ කටයුතුවල විෂය පථය අර්ථ නිරූපණය කරනු පිණිස දැනටමත් තාක්ෂණික කමිටුවක් පත්කර ඇත.

# ජනන අංශය (ඉතිරි කොටස)

## 2019 වසරේ ප්‍රධාන සිදුවීම්

### ඵලදායී ගබඩාකරණ ධාරිතාවය සහතික කරනු පිණිස ඉහළ කොත්මලේ ජලාශය පරීක්ෂා කිරීම

ඉහළ කොත්මලේ ජලාශය 2011 දෙසැම්බර් මාසයේදී පරිරෝධනය කරන ලදී. වසර 07ක මෙහෙයුම් කාලයකින් අනතුරුව, ජලාශයේ හා පිවිසුම් වේල්ලේ පළමු පරීක්ෂාව මෙම වසර තුළ සිදු කෙරේ. ජලාශය හිස්කර යම් දෝෂයක් පවතීද යන කරුණ විමසා බලනු පිණිස පිවිසුම් වේල්ලේ කොන්ක්‍රීට් මතුපිට පරීක්ෂා කරන ලදී. මතු යොමුගත වීම පිණිස ඡායාරූපමය වාර්තා වැඩසටහනක් සකස් කරන ලදී. රොන්මඩ රැස්වීම තක්සේරු කරනු පිණිස ඩ්‍රෝන කැමරා භාවිතයෙන් ගුවන් සමීක්ෂණයක් සිදු කරන ලදී. පිවිසුම් මාර්ගය හා අපද්‍රව්‍ය රාක්කය මුළුමනින්ම පිරිසිදු කර වසර ගණනාවක් පුරා ක්‍රියාත්මකව පැවති කාලය තුළ රැස්ව තිබූ සුන්බුන් ඉවත් කරන ලදී. මෙම පරීක්ෂා කාලය ඇතුළත පිවිසුම් මාර්ග යට ඇතුළුවන සුන්බුන් ප්‍රමාණය අවම කරනු පිණිස සුන්බුන් පාලන පද්ධතියක්ද ස්ථාපනය කරන ලදී. තවද, ජලාශ ඉවුරුවල නාය යාම් සිදු වීමේ අවදානම් පවත්නා ස්ථානයන්හි ෂීට් ටැම් ස්ථාපනය කිරීමේ හැකියාව තක්සේරු කරනු පිණිස පස් පරීක්ෂාවක් සිදු කරන ලදී.



සුන්බුන් සඳහා ඇන්කර් ඇණ ස්ථාපනය



පිවිසුම් පාලන පද්ධතිය පිරිසිදු කිරීම



ඉහළ ප්‍රවාහයෙහි රැස්වූ රොන්මඩ



පිවිසුම් වේලි කොන්ක්‍රීට් මතුපිට පරීක්ෂාව

### කුකුළේ ගඟ විදුලි බලාගාරයේ ජනන යන්ත්‍රවල පරිවරණ කළාප බස් අංශයන් (IPB) මාරු කිරීම

මෙම විදුලි බලාගාරයේ, ජනන යන්ත්‍ර මගින් නිෂ්පාදිත විදුලිය පරිවරණ කළාප බස් අංශ හරහා ජනන යන්ත්‍ර ට්‍රාන්ස්ෆෝමර දක්වා සම්ප්‍රේෂණය කෙරේ. මෙම බලාගාරය 2003 වසරේදී මෙහෙවරෙහි යොදවන ලදී. වසර දෙකක මෙහෙයුම් කාලයකින් අනතුරුව, ගින්නක් සහිතව 2වන ඒකකයේ පරිවරණ කළාප බස් අංශය ක්‍රියා විරහිත විය. මෙම හදිසි අනතුරින් පසුව, පරිවරණ කළාප බස් අංශ දෙකෙහිම එම අංශ කිහිපයක් දොළොස් වතාවක් ක්‍රියා විරහිත වූ අතර, ඒ අනුව යන්ත්‍රය ක්‍රියාත්මක කළ නොහැකි තත්ත්වයකට පත්විය. පරිවරණ කළාප බස් අංශයන්හි කෙළවර කොටස්හි පරිවරණය ක්‍රියා විරහිත වූ සෑම අවස්ථාවකම වැඩ බිමෙහි අලුත් වැඩියා කිරීමෙන් අනතුරුව ඒවා නැවත භාවිතයට ගන්නා ලදී. බලශක්ති අලාභය, යන්ත්‍රය ඇණ හිට පවත්නා කාලය හා ගිනි ගැනීමේ අවදානම ආදියද සැළකිල්ලට ගනිමින්, ශ්‍රී ලං.රු. මිලියන 38.5ක සමස්ත පිරිවැයක් දරමින් ස්විට්සර්ලන්තයේ මෝසර් ග්ලාසර්හි (MGC) වඩාත් උසස් මට්ටමේ නිෂ්පාදනයක් යොදා පරිවරණ කළාප බස් අංශ දෙකක් මාරු කරන ලදී.

සැපයුම්කාර ආයතනයේ ඉංජිනේරුවරුන් දෙදෙනෙකු විසින් ලබාදුන් කෙටි පුහුණුවකින් පසුව බලාගාර කාර්ය මණ්ඩලය විසින්ම සමස්ත ස්ථාපන කාර්යය සිදුකරන ලද බැවින් මෙය වුකලි ලං.වි.ම. විසින් අත්පත් කරගත් සුවිශේෂී සාර්ථකත්වයක් විය. පරිවරණ කළාප බස් අංශ දෙකක් මාරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, උපරිම ධාරිතාවයට යන්ත්‍ර බල පැටවුම් සීමා බාධක ඉහිල් විය. නව පරිවරණ කළාප බස් සහිතව ජනන යන්ත්‍රවලට දැන් ඒවාහි උපරිම ධාරිතාවය (මෙ.වො. 37.5) දක්වා බල පැටවුම් සිදුකළ හැක. නව පරිවරණ කළාප බස් ස්ථාපනය



කුකුළේගඟ විදුලි බලාගාරයේ පරිවරණ කළාප බස් පද්ධතිය ස්ථාපනය

කළ දින සිටම, පැටවුම් සීමා හේතුකොට අහිමි විය හැකිව තිබූ අතිරේක බලශක්තිය දැන් හසුකරගත හැක. මෙකී නව පරිවරණ කළාප බස් ස්ථාපිත දින සිට මෙලෙස හසුකරගත් බලශක්තිය ගි.වො.පැ. 3ක් වන අතර, සැළකිය යුතු අතිරික්තයක්ද සහිතව නව පරිවරණ කළාප බස් ස්ථාපනය සඳහා සිදුකළ ආයෝජනය මේවන විටද පියවාගෙන ඇත.

### ලක්විජය විදුලි බලාගාරයේ (LVPP) පරිසරය සුරැකීම සම්බන්ධ කටයුතුවල සාර්ථකත්වයන්

ලක්විජය විදුලි බලාගාරයේ පරිසරය හා සම්බන්ධ කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කරනු පිණිස 2017 වර්ෂයේදී ලක්විජය විදුලි බලාගාර පරිසර නිරීක්ෂණ ඒකකය (EMU) ස්ථාපනය කරන ලදී. පසුගිය වසර දෙක තුළ පරිසර නිරීක්ෂණ

# ජනන අංශය (ඉතිරි කොටස)



ගල් අඟුරු අංගනයේ හා අලු අංගනයේ තෙත් තත්ත්වයන් නඩත්තු කිරීම

ඒකකය විසින් බොහෝ සමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර, 2019 වසර තුළ අත්පත් කරගන්නා ලද සාර්ථකත්වයන් පරිසරය සුරැකීමෙහි ලා වැදගත් ඒවා වේ.

ගල් අඟුරු / අලු දුහුවිල්ල වූකලි නිරිතදිග මෝසම් සමයන්හි ඉස්මතුවන ප්‍රධාන පාරිසරික ගැටලුවකි. ජලය ඉසිමින් හා සුළං හැමීම පාලනය කිරීමෙන් දුහුවිල්ල මැඩ පැවැත්වීම ක්‍රියාත්මක කළ හැකි විසඳුම් වශයෙන් හඳුනාගෙන ඇත. දුහුවිල්ල පැතිරීම සමනය කරනු පිණිස ඉසීම් ක්‍රම, මිහිදුම් පිඹිනයන්, මිහිදුම් පාරු ආදී ජල ඉසින ක්‍රම ගල් අඟුරු අංගනයේ හා අලු අංගනයේ ස්ථාපනය කරන ලදී. සියලු මෙහෙයුම් ප්‍රදේශයන්හි තෙත් තත්ත්වයන් නඩත්තු කිරීම 2019 මෝසම් සමයන් තුළ සාර්ථකව සිදු කරන ලදී.



සුළං බාධකය

ගල් අඟුරු අංගනයේ බටහිර සීමාව දිගේ මීටර 460ක් දක්වා විහිදෙන දැනට පවත්නා බාධකයට අමතරව, ගල් අඟුරු අංගනයේ දක්ෂිණ හා නැගෙනහිර සීමාවන් ආවරණය වන පරිදි තවත් මීටර 1,183ක දිගින් යුත් විහිදුම් ව්‍යාපෘතියක් සම්පූර්ණ කරන ලදී. අලු අංගනයේ බටහිර සීමාව දිගේ මීටර 460ක් දිග සුළං බාධකයක්ද ස්ථාපනය කෙරෙමින් පවතී.



මෙහෙයුම් සමාලෝචනය

# සම්ප්‍රේෂණ අංශය

# සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ අංශය විසින් සියලු විදුලි බලාගාර ඇතුළත්වන පරිදි සම්ප්‍රේෂණ ජාලය සැලසුම්කරණය, මෙහෙයුම්කරණය හා නඩත්තු කිරීම සිදු කරනු ලබන අතර, එහි පද්ධති පාලන මධ්‍යස්ථාන මගින් ජාතික ජාලය වෙත සැපයෙන සමස්ත විදුලිය ප්‍රමාණය බෙදාහරිනු ලබයි. මෙයට අමතරව, මෙම අංශය විසින් සියලු ජනන හා සම්ප්‍රේෂණ දත්ත ලේඛනාගාරගත කොට නිතිපතා කළමනාකරණ තොරතුරුද ලබාදෙනු ලබයි.

දැනට පවත්නා සම්ප්‍රේෂණ පද්ධතිය තුළ කි.වෝ. 220 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් කි.මී.726ක්ද, කි.වෝ. 220 භූගත රැහැන් කි.මී. 22ක්ද, කි.වෝ. 132 උඩිස් සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 2287ක්ද, කි.වෝ. 132 භූගත රැහැන් කි.මී. 55ක්ද කොටුමා උපපොළ 75ක්ද 2019 වසර අවසානය වනවිට පැවතිණි.

## සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් ශාඛාව

පාරිභෝගිකයන් වෙනුවෙන් විශ්වසනීය හා ගුණාත්මක විදුලි සැපයුමක් සහතික කරනු පිණිස ජල, තාප හා සෙසු (සුළං, සූර්ය, කුඩා ජලවිදුලි හා ජෛවස්කන්ධ) පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ද ඇතුළත් අනාගත සම්ප්‍රේෂණ හා ජනන පද්ධති යටිතල පහසුකම් අධ්‍යයනය කොට සැලසුම්කරණය සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් ශාඛාවේ වගකීම වේ.

## ජනන සැලසුම් ඒකකය

අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LCLTGEP) වූකලි සමස්ත ජාතිය වෙත දැරිය හැකි මිලකට විශ්වසනීය හා ගුණාත්මක විදුලි සැපයුමක් ලබාදීම සඳහා විදුලිබල ජනන යටිතල පහසුකම් සංවර්ධන හා ආශ්‍රිත ආයෝජනයන් ක්‍රමාන්විතව හඳුනා ගනු පිණිස වසර 20ක සැලසුම්කරණ කාල පරිච්ඡේදයක් ආවරණය වන පරිදි සෑම දෙවසරකටම වරක් ජනන සැලසුම් ඒකකය විසින් සකස් කරනු ලබන දිගු කාලීන සමාලෝචන හා නවීකරණ සැලැස්මකි.

සම්ප්‍රේෂණ බලපත්ලාභියා සඳහාවූ රජයේ ප්‍රතිපත්ති හා ජාල නීති මාලාව නිරූපණය කරන ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායන්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සඳහා වූ විදුලි කර්මාන්තය පිළිබඳ මාර්ගෝපදේශ වැනි ප්‍රතිපත්ති ලේඛන මෙකී අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම සකස් කිරීමේදී ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගනු ලැබේ.

2020-2039 සැලසුම්කරණ අවකාශය සඳහා සකස් කරන ලද අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්මේ කෙටුම්පත තුළ, උපරිම ජල, තාප හා සෙසු පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ද සහිතව එළැඹෙන වසර 20ක කාල පරිච්ඡේදය ඇතුළත පද්ධතිය තුළට මෙ.වො. 9,675ක ජනන ධාරිතාවයක් එක් කිරීමට අපේක්ෂිතය.

දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්මට අනුපූරක ලෙස, විදුලිබල පද්ධතියේ ආරක්ෂිත හා විශ්වසනීය ක්‍රියාකාරිත්වයක් පවත්වා ගනිමින් මූලිකවම ජාලය වෙත පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන අභියෝග විමසා බලනු පිණිස 'ශ්‍රී ලංකා ජාලය තුළට පුනර්ජනනීය පදනම්ගත ජනනයන් ඒකාබද්ධ කිරීම - 2020-2030' යන සිරසින් යුත් අධ්‍යයනය සම්ප්‍රේෂණ හා ජනන සැලසුම් ශාඛාව විසින් සම්පූර්ණ කරන ලදී.

ලං.වි.ම. නියෝජනය කරන ප්‍රතිරූප/පාර්ශවකාර ආයතනයක් වශයෙන් ජනන සැලසුම් ඒකකය විසින් නියුක්තව සිටින සෙසු වැඩසටහන් හා අධ්‍යයනයන් පහත පරිදි වේ:

- ජාත්‍යන්තර පරමාණු බලශක්ති නියෝජිතායතනයේ (IAEA) සහාය සහිතව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, ලං.වි.ම., ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය (SLAEB) හා ශ්‍රී ලංකා පරමාණු බලශක්ති නියාමන සභාව (SLAERC) විසින් ඒකාබද්ධව ආරම්භ කරන ලද 'ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික විදුලිබල වැඩසටහන සඳහා මාර්ග සිතියමක් ස්ථාපනය' නමින් යුත් වැඩසටහන.
- මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය යටතේ දියත් කෙරෙන මහවැලි ජල ආරක්ෂණ ආයෝජන වැඩසටහන.
- පැරිස් ගිවිසුම (COP21) වෙනුවෙන් විදුලි අංශය පිළිබඳව ජාතික වශයෙන් නිර්ණිත දායකත්වයන් (NDCs).
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සැලකිල්ලට ගනිමින් ලං.වි.ම. හා විමෝචන අවමකරණය සඳහා වූ ලෝක බැංකු කණ්ඩායමේ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර සිදු කෙරෙන කාබන් සහයෝගිතා පහසුකම් (CPF) වැඩසටහන.
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික වශයෙන් යෝග්‍ය සමන ක්‍රියාකාරිත්ව (NAMA) වැඩසටහන.
- පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතේ එන කාලගුණික විපර්යාස පිලිබඳ ජාතික විශේෂඥ කමිටුව
- පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශයේ කාලගුණ විපර්යාස ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කරන ලද වෙළෙඳපල සූදානම්කාරිත්වය සඳහා හවුල්කාරිත්ව (PMR) වැඩසටහන

## සම්ප්‍රේෂණ සැලසුම්කරණ ඒකකය

සම්ප්‍රේෂණ සැලසුම්කරණ ඒකකය විසින් මූලිකව අනුමත අවම පිරිවැය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම මත පදනම්ව දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. මෙම සැලැස්ම වූකලි වසර දහයක කාලයක් තුළ සෑම දෙවසරකටම වරක් සමාලෝචනය කෙරෙන අඛන්ඩ සමාලෝචිත හා යාවත්කාලීන සැලැස්මකි.

දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම 2018-2027 අනුමත දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2018-2037 මත පදනම්ව සකස් කරන ලදී.

දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම 2018-2027 තුළ හඳුනා ගන්නා ලද සම්ප්‍රේෂණ ව්‍යාපෘති යෝජනා අරමුදල්කරණ නියෝජිතායතන වෙත ඉදිරිපත් කරන ලදී.

'විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය' (PSRSP) යටතේ 2021 ආසියානු සංවර්ධන බැංකු ණය පැකේජය සඳහා පහත සඳහන් ඉදිකිරීම් පිරිසැකසුම් කරමින් පවතී. ව්‍යාපෘතීන්හි සමස්ත ඇස්තමේන්තුගත මූලික පිරිවැය එ.ජ.ඩො. මිලියන 196කි.

- හම්බන්තොට - මාතර කි.මී. 85 කි.වෝ 132 මාර්ගය
- හෝමාගම කි.වෝ. 132/33 කොටුමා උපපොළ
- කොටුගොඩ කි.වෝ. 220/33 කොටුමා උපපොළ
- තිස්සමහාරාම කි.වෝ. 132/33 කොටුමා උපපොළ
- කලවාන කි.වෝ. 132/33 කොටුමා උපපොළ
- නව හබරණ - නව අනුරාධපුර කි.මී. 50 කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන නැවත ඉදි කිරීම
- මීගමුව කි.වෝ. 132/11 කොටුමා උපපොළ
- ජා-ඇල කි.වෝ. 132/11 කොටුමා උපපොළ
- බද්දේගම කිවෝ. 132/33 කොටුමා උපපොළ
- මීරිගම කි.වෝ. 220 ස්විච් ස්ථානය හා කොටදෙණියාව කි.වෝ. 220/33 ජාල උපපොළ
- ඇඹිලිපිටිය කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය
- මහනුවර නගර කි.වෝ. 132/11 කොටුමා උපපොළ
- වාරියපොළ කි.වෝ. 132/33 කොටුමා උපපොළ හා වාරියපොළ - දකුණ කි.වෝ. 220/132 ස්විච් ස්ථානය

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

තවද, කෙරවළපිටියේ යෝජිත ද්‍රව ස්වභාවික වායු (LNG) විදුලි බලාගාරයෙන් විදුලිය හිස් කරනු පිණිස එ.ජ.ඩො. මිලියන 61ක ඇස්තමේන්තුගත මූලික පිරිවැයක් දරමින් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජ්‍යායතනය (JICA) හරහා තවත් කි.වෝ. 220 භූගත රැහැන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ඉන්දියා - ශ්‍රී ලංකා අධි වෝල්ටීයතා සෘජු ධාරා (HVDC) අන්තර් සම්බන්ධතාවය සම්බන්ධ තාක්ෂණික අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර, එම අන්තර් සම්බන්ධතාවයේ ශක්‍යතාවය තක්සේරු කරනු පිණිස ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් තාක්ෂණ-ආර්ථික අධ්‍යයනයක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

## ජනන සංවර්ධන අධ්‍යයන ඒකකය

විවිධ අදියරයන් යටතේ බස්නාහිර කළාපයේ ද්‍රව ස්වභාවික වායු විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම අනුමත දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2018-2037 තුළ හඳුනාගෙන ඇත. සෙසු අදාළ රජයේ ආයතන හා සම්බන්ධව ජනන සංවර්ධන අධ්‍යයන ඒකකය විසින් ඉහත සැලසුම්ගත විදුලි බලාගාරයන් ක්‍රියාත්මක කරනු පිණිස මුතුරාජවෙල ප්‍රදේශයේ සුදුසු ඉඩමක් හඳුනාගෙන ඇත. ඉඩම තෝරා ගැනීමේදී, විවිධ තාක්ෂණික අවශ්‍යතා සැලකිල්ලට ගන්නා ලදී. ඉඩම පාරිසරිකව සංවේදී ප්‍රදේශයක පිහිටා ඇති බැවින් පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදු කිරීමෙන් අනතුරුව එය සංවර්ධනය කළ යුතුව ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සමගින් පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත. මෙයට අමතරව, ඉහත ඉඩම කල්බදුකරණය සඳහා වූ අනුමත ක්‍රියාවලියද ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

'ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන සඳහා මාර්ග සිතියමක් ස්ථාපනය කිරීම' සම්බන්ධ වැඩසටහන යටතේ ජනන සංවර්ධන අධ්‍යයන ඒකකය විසින් ජනන සැලසුම් ඒකකය හා ඒකාබද්ධව, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සහායද සහිතව දේශීය නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරනු පිණිස පාර්ශවකාර සංවිධාන සඳහා 2019 වසර තුළ වැඩමුළු හතරක් සංවිධානය කර ඇත. අවසන් ප්‍රතිඵලය වශයෙන් ඉදිරිපත් කෙරෙන සවිස්තරාත්මක වාර්තාව පාර්ශවකරුවන්ගේ අනු-කමිටු නවයක් විසින් සකස් කෙරෙමින් පවතී.

ෆවුල් පොයින්ට් විදුලි බලාගාර හා පොම්පගත ගබඩා සහිත විදුලි බලාගාර වැනි සෙසු අනාගත විදුලි බලාගාර සඳහා වැඩබිම් හඳුනාගනු පිණිස ජනන සංවර්ධන අධ්‍යයන ඒකකයේ දායකත්වය ලබාදෙනු ලබයි.

## බලශක්ති මිලදී ගැනීමේ ශාඛාව

අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම ප්‍රකාර බලශක්තිය මිලදී ගැනීමේ ශාඛාව විසින් තාප හා පුනර්ජනනීය පුද්ගලික විදුලිබල නිෂ්පාදකයන් වෙතින් විදුලිය මිලදී ගනු ලබයි. තාපය පදනම්ගත බලාගාර සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සහිත නිශ්චිත ව්‍යාපෘතිය සඳහා විශේෂ වූ ඒවා වන අතර පුනර්ජනනීය පදනම්ගත බලාගාර සඳහා වූ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් වූකලි වසර 20ක කාල පරිච්ඡේදයක් සඳහා ප්‍රමිතිගත විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම නමින් යුත් ප්‍රමිතිගත එකක් වේ.

විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් පරිපාලනය, ඒ අනුව අදාළ මුදල් ගෙවීම, පරිපාලනමය හා මෙහෙයුම්ගත ගැටලු සම්බන්ධව කටයුතු කිරීම ශාඛාවේ වගකීම් අතරින් සමහරක් වේ.

2018 හා 2019 වර්ෂයන්හි සමස්ත පුද්ගලික විදුලිය මිලදී ගැනීම් සම්බන්ධ සන්සන්දනාත්මක සාරාංශයක් පහත සටහන්ගත කර ඇත (වගුව සම්-1).

වගුව සම්-1: සමස්ත පුද්ගලික විදුලි මිලදී ගැනීම් සම්බන්ධ සන්සන්දනාත්මක සාරාංශය.

| කාණ්ඩය | 2018 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | වාර්ෂික බලශක්තිය (ගි.වො.පැ.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | වාර්ෂික බලශක්තිය (ගි.වො.පැ.) |
| ස්වාධීන පුද්ගලික බලශක්ති නිෂ්පාදකයෝ (තාප) | 03 | 533 | 1740 | 06 | 628 | 2875 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති | 230 | 610 | 1830 | 248 | 636 | 1761 |

## මෙහෙවරෙහි යොදවන ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන්හි වර්තමාන තත්ත්වය

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීමේ යෝජනාක්‍රමය 1996 වර්ෂයේදී ආරම්භ වූ අතර පුනර්ජනනීය බලශක්ති අංශය ගොඩනැංවීමට පුද්ගලික පාර්ශ්වකරුවන් හට අවසර ලබාදෙන ලදී. ආරම්භයේදී, වළකන ලද පිරිවැය පදනම්ගත අය ක්‍රමයක් ලබාදෙන ලද අතර, සුදුසු පරිදි එය කමිටුවක් විසින් කලින් කලට ප්‍රතිශෝධනය කරන ලදී. 2008 වර්ෂයේදී, පිරිවැය පදනම්ගත තාක්ෂණය විශේෂී ත්‍රි-ස්ථර අයක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර, එය කලින් කලට කමිටුවක් මගින් ප්‍රතිශෝධනය කරන ලදී. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනය පහත පරිදි ප්‍රස්ථාරයක් මගින් නිරූපණය කළ හැක (රූපය සම්-1)




රූපය සම්.1: සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශය

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ 2018 හා 2019 වර්ෂයන් අතර සන්සන්දනයක් පහත සටහන තුළ දී ඇත (වගුව 2)

| කාණ්ඩය | 2018 දී අනුමත කරන ලද | | 2019 දී අනුමත කරන ලද | | 2019 අවසානයේදී අනුමත කරන ලද සමුච්චිත අගය | |
|---|---|---|---|---|---|---|
| | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) | බලාගාර සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො.) |
| කුඩා ජලවිදුලි | 13 | 40 | 11 | 16 | 206 | 410 |
| ජෛවස්කන්ධ | 02 | 11 | 01 | 03 | 13 | 40 |
| සුළං | 0 | 0 | 0 | 0 | 15 | 128 |
| සූර්ය | 0 | 0 | 06 | 06 | 14 | 57 |
| එකතුව | **15** | **51** | **18** | **25** | **248** | **635** |

වගුව සම්.2: සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයේ සංවර්ධනය පිළිබඳ සන්සන්දනය

## සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයෙන් ජාතික බලශක්ති ඉල්ලුමට ලැබෙන දායකත්වය

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාවේ බලශක්ති ඉල්ලුමට සැලකිය යුතු දායකත්වයක් ලබාදෙනු ලබයි. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දායකත්වය සම්බන්ධයෙන් 2015, 2020 හා 2025 වර්ෂයන් වනවිට සාක්ෂාත් කරගත යුතුවන යම් කඩඉම් රජය විසින් පනවා ඇත. 2015 සඳහා වූ කඩඉම වූයේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයෙන් ජාතික බලශක්ති ඉල්ලුමෙන් 10%ක් සපුරාලීම වන අතර එය මේවන විටද සාක්ෂාත් කරගෙන ඇත. 2020 කඩඉමද සාක්ෂාත් කරගැනීමේ කාර්යයෙහි ලං.වි.ම. නියැළී සිටී.

සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයෙන් ලැබෙන වාර්ෂික බලශක්ති දායකත්ව ප්‍රතිශතය පහත රූපයෙහි නිරූපණය කර ඇත (රූපය සම්-2)

## පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්යක්ෂමතා නිරීක්ෂණ (RED& PM) ශාඛාව

පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්යක්ෂමතා නිරීක්ෂණ ශාඛාව විසින් ජාල නීති මාලාව හා බෙදාහැරීමේ නීති මාලව ප්‍රකාර පුනර්ජනනීය බලශක්තිය පදනම්ගත ජනන බලාගාර සැලසුම්කරණය, අධ්‍යයනය, ක්‍රියාත්මක කිරීම හා සංවර්ධනයද, ඒවාහි කාර්ය සාධනය, විදුලි පද්ධතියේ ගුණාත්මකභාවය හා විශ්වසනීයත්වය මත සිදු කෙරෙන බලපෑම නිරීක්ෂණයද සිදුකොට එම බලපෑම් කාර්යක්ෂමව හා ඵලදායීව සමනය කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග යෝජනා කරනු ලබයි.

තවද, මෙම ශාඛාව සංවර්ධකයන් හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම ආදී සෙසු පාර්ශවකරුවන් සමගින්ද සම්බන්ධීකරණ කටයුතු පවත්වාගෙන යයි. මෙම ශාඛාවේ කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් සම්ප්‍රේෂණ අංශයේ සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්කරණ, බලශක්තිය මිලදී ගැනීමේ හා පද්ධති පාලන ශාඛාවන්ගෙන් සහ බෙදාහැරීමේ අංශයේ සැලසුම්කරණ හා සංවර්ධන ශාඛාවන් වෙතින් ලබාගනු ලබයි.




රූපය සම්-2: සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති අංශයෙන් ලැබෙන ජාතික බලශක්ති දායකත්වය

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

2019 දෙසැම්බර් මස 31වන දින වනවිට ව්‍යාපෘතීන්හි වර්තමාන තත්ත්වය පහත දී ඇත.

| විදුලි මූලාශ්‍රය | ස්ථානය | ධාරිතාව | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| සූර්ය | චවුනතිව්, මහියංගනය, මහව, ත්‍රිකුණාමලය, හබරණ, ඇඹිලිපිටිය හා අම්පාර කොටුමා උපපොළයන් | මෙ.වො.ඇ. 7 x 1 බැගින් එකතුව මෙ.වො.ඇ. 49 | කොටුමා උපපොළ 70ක බලාගාර 70ක් සඳහා අභිප්‍රාය ලිපි නිකුත් කොට ඇති අතර විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට යෝජිතය |
| | පල්ලෙකැලේ, වවුනියා, පන්නල, වාලච්චේන හා මොණරාගල කොටුමා උපපොළයන් | මෙ.වො.ඇ. 5 x 1 බැගින් එකතුව මෙ.වො.ඇ. 25 | |
| | අනුරාධපුර | මෙ.වො.ඇ. 4 x 1 බැගින් එකතුව මෙ.වො.ඇ. 4 | |
| | ගාල්ල, මාතර, මතුගම හා බෙලිඅත්ත | මෙ.වො.ඇ. 3 x 1 බැගින් එකතුව මෙ.වො.ඇ. 12 | |
| සූර්ය | චවුනතිව් | මෙ.වො.ඇ. 10 | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට යෝජිතය |
| සූර්ය | පොළොන්නරුව | මෙ.වො.ඇ. 10 | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට යෝජිතය |
| සුළං/සූර්ය | පූනරින් | සුළං - මෙ.වො. 130<br>සූර්ය - මෙ.වො. 240 | පාරිසරික සමාජ බලපෑම් තක්සේරුව (ESIA) හා ඉඩම් අත්පත් කරගැනීම |
| සූර්ය | සියඹලාණ්ඩුව | මෙ.වො.ඇ. 100 | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් හඳුනාගත් ඉඩම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සිදු කරමින් පවතී. |
| සූර්ය | වැලිකන්ද | මෙ.වො.ඇ. 30 | ශක්‍යතා අධ්‍යයනය සම්පූර්ණ කරන ලදුව ලං.වි.ම. ව්‍යාපෘතියක් වශයෙන් ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂිතය. |
| ආගන්තුක බලශක්ති තාක්ෂණ විදුලි බලාගාර | - | - | ටෙන්ඩර් කටයුතු ආරම්භ කරන ලදී. මෙ.වො. 10ක සූර්ය ප්‍රකාශ වෝල්ටීයතාවයක් සලකා බැලෙන අතර ටෙන්ඩරය පිරිනැමීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂිතය |
| සුළං | මන්නාරම - මෙ.වො. 15<br>බෝලවත්ත - මෙ.වො. 10<br>මාදම්පේ - මෙ.වො 10<br>කප්පල්තුරෙයි - මෙ.වො. 15<br>ත්‍රිකුණාමලය - මෙ.වො. 10 | මෙ.වො.ඇ. 60 | ටෙන්ඩරය සඳහා 2019 නොවැම්බර් 28වන දින දැන්වීම පළ කරන ලදී. |
| සූර්ය | - | මෙ.වො.ඇ. 150 | කෙටුම්පත් යෝජනා ඉල්ලුම හා දැන්වීම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ගනුදෙනුකාර කමිටුව (CANC) වෙත ඉදිරිපත් කරන ලද අතර, ටෙන්ඩර් දැන්වීම පළ කරනු පිණිස අනුමැතිය අපේක්ෂිතය. |

## බලශක්ති අලෙවිකරණ ශාඛාව

බලශක්ති අලෙවිකරණ ශාඛාව සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා (TL) වෙනුවෙන් ජනන බලපත්‍රලාභීන් (GLs) වෙතින් විදුලිය මිලදී ගැනීමේ හා ලංකා විදුලි පෞද්ගලික සමාගමද ඇතුළත් බෙදාහැරීමේ බලපත්‍රලාභීන් (DLs) පස් දෙනෙකු වෙත විදුලිය අලෙවි කිරීමේ කාර්යයෙහි ඵලදායී ලෙස නිරතව සිටී. 2015 අනුමත අයකුම ක්‍රමවේදයට අනුව සෑම මාස 6කටම වරක් තොග සැපයුම් අයක්‍රමය (BST) ඉදිරිපත් කිරීමද ඇතුළත්ව නියාමනයට අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමගින් සහයෝගයෙන් කටයුතු කරයි.

එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා වෙත ලබාදෙනු ලබන බලශක්ති ප්‍රමාණය මත පදනම්ව බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත මාසික ඉන්වොයිසි සැකසීමේ හා නිකුත් කිරීමේ වගකීම බලශක්ති අලෙවිකරණ ශාඛාව විසින් දරනු ලබයි. සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා සහ එක් එක් බෙදාහැරීමේ බලපත්‍රලාභියා අතර බලශක්ති ගනුදෙනු මැන බලනු පිණිස සීමා මායිම් වටා 0.2 නිරවද්‍යතාවයෙන් යුත් බලශක්ති මනු ස්ථාපනය කර ඇත. සියලු බලශක්ති මනු අදාළ අවශ්‍යතා මත පදනම්ව ප්‍රමාණවත් පරිදි වැඩසටහන්ගත කර ඇත. බලශක්ති කියවීම් දුරස්ථව බාගත කරනු ලබයි.

ගෝලීය ජංගම පද්ධතිය (GSM) මත පදනම් වූ සාමාන්‍ය දුරස්ථ මනු සන්නිවේදන ක්‍රමයෙන් ඔබ්බට ගොස්, 2018 වර්ෂයේදී, බලශක්ති අලෙවිකරණ ශාඛාව විසින් සන්නිවේදන ශාඛාවද සමග සහයෝගීව සියලු බලශක්ති මනු දුරස්ථව ෆයිබර් ජාලය හරහා සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ පළමු අදියර දෙක 2018 වසර තුළ සම්පූර්ණ කරන ලද අතර කොටුමා උපපොළ 40ක සම්බන්ධතා සම්පූර්ණ කරමින් 2019 වර්ෂයේදී 3වන අදියර සම්පූර්ණ කරන ලදී. සම්බන්ධිත ජාලයන්ගේ මනු ගොනු බාගත කිරීම ආනියාකන්ද මනු පරීක්ෂණාගාරයේදී සිදු කෙරේ.

බලශක්ති මිනුම්හි නිරවද්‍යතාවයක් පවත්වාගනු පිණිස, වාර්ෂික මනු පරීක්ෂාවන් සිදු කෙරේ. බලශක්ති මිනුම්ගත කිරීම විෂයයෙහි ධාරා තරාපැවියන්ගේ (CTs) නිරවද්‍යතාවය පිළිබඳ සැලකිලිමත් වෙමින්, ඒ ඒ බෙදාහැරීමේ අංශයේ බලාගාර යාන්ත්‍රික ඒකකය හා සම්බන්ධ වෙමින් ධාරා තරාපැවි පරීක්ෂා කිරීම හා මාරු කිරීම සිදු කෙරේ.

සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාගේ බලශක්ති ගනුදෙනු ගිණුම්ගත කරනු පිණිස වූ තොග සැපයුම් ගනුදෙනු ගිණුම (BSTA) සැකසීමේ කාර්යය බලශක්ති අලෙවිකරණ ශාඛාව වෙත පවරා ඇත. ජනන බලපත්‍රලාභීන් වෙතින් මිලදී ගන්නා බලශක්තිය වෙනුවෙන් ගාස්තු ගෙවීම මාරු වවුචරයක් මගින් සිදු කරනු ලබයි. ලං.වි.ම. බෙදාහැරීමේ

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

බලපත්ලාභීන්ද සිය බලශක්තිය මිලදී ගැනීම් වෙනුවෙන් ගාස්තු ගෙවීම මාරු වවුචර මගින් සිදු කරන අතර ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් සිය ගෙවීම් මුදලින් සිදු කරනු ලබයි.

## පද්ධති පාලන ශාඛාව

ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යය වනුයේ පනවන ලද ජාල පරාමිතීන් ඇතුළත පවත්නා යහපත්ම ආර්ථික ජනන සැලැස්මට අඛණ්ඩ, විශ්වසනීය හා ගුණාත්මක විදුලිය සැපයුමක් පවත්වාගෙන යන අතරම ශ්‍රී ලංකා විදුලි ජාලයේ මතු කෙටි කාලීන හා මධ්‍ය කාලීන ක්‍රියාකාරිත්වය සමගින් තත් කාලීන විදුලි සැපයුම හා ඉල්ලුම තුලනය කරවීමයි. මෙකී ප්‍රධාන අරමුණ සාක්ෂාත් කරගනු පිණිස, ප්‍රශස්ත ජනන සැලැස්ම සඳහා ජනන විකල්ප විශ්ලේෂණය, අනිශ්චිත සැලසුම්කරණය සඳහා විදුලිබල ජාල විශ්ලේෂණය, ජනන ස්ථාන හා සම්ප්‍රේෂණ ජාලයෙහි දත්ත රැස් කිරීම, විවිධ ජාල කාර්ය සාධන පරාමිතීන් විශ්ලේෂණය හා වාර්තාකරණය, අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම්/බලශක්ති කළමනාකරණ පද්ධති (SCADA / EMS) නඩත්තුව හා නවීකරණය වැනි සහායක ක්‍රියාවලීන්ද පද්ධති පාලන ශාඛාව තුළ සිදු කරනු ලබයි. මෙයට අමතරව, අභ්‍යන්තර හා බාහිර පාර්ශ්වයන් විසින් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ විදුලි ජාලයට සම්බන්ධ විවිධ අධ්‍යයනයන් සඳහා සහාය හා දත්ත ලබාදීමද ශාඛාව විසින් සිදු කරනු ලබයි.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) යටතේ ක්‍රියාත්මක මෙහෙයුම් සැලසුම් ඒකකය, පද්ධති මෙහෙයුම් ඒකකය, මෙහෙයුම් විගණන ඒකකය හා පද්ධති මාදිලිකරණ ඒකකයද යන ඒකකයන්ගෙන් ශාඛාව සමන්විත වේ.

නව පොල්පිටිය කොටුමා උපපොළ, කොළඹ බල එල ෆ උපපොළයන්, කැළණිතිස්ස කි.වෝ. 33 වායු පරිවරණිත උපපොළ (GIS) හා



රූපය සම්.3: පද්ධති පාලන මධ්‍යස්ථානය

කෙරවළපිටිය කි.වෝ. 33 කොටුමා උපපොළ අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් කාර්යය 2019 වර්ෂය තුළ පද්ධති මාදිලිකරණ ඒකකය විසින් සාර්ථකව අවසන් කරන ලදී.

## විදුලිබල පද්ධති කාර්ය සාධනය

2019 වසර සඳහා වූ සමස්ත විදුලි ජනනය (ශුද්ධ) ගි.වො.පැ. 15,922.39 ක් වූ අතර 2018 වසරට සාපේක්ෂව ඉල්ලුමේ වර්ධනය 3.57%ක් විය. 2019 වසර සඳහා ස්වාධීන විදුලි නිෂ්පාදකයන් වෙතින් ලද සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති දායකත්වය සමස්ත ජනනයෙන් 10.03% ක් වූ අතර එය 2018 වර්ෂයෙහි සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනයට වඩා ගි.වො.පැ. 163.1ක අඩු වීමකි. 2019 වසර සඳහා ගෘහස්ථ වහළය මත සවි කරන සූර්ය ජනන දායකත්වය සමස්ත ජනනයෙන් 1.1%ක් විය. 2019 වසර සඳහා සමස්ත තාප ජනනය ගි.වො.පැ. 10,377.4ක් වූ අතර ඉන් ගල් අඟුරු බල විදුලි ජනන (ලක්විජය විදුලි බලාගාරය) දායකත්වය 51.66%ක් විය.

2019 වර්ෂය තුළ ලං.වි.ම. සතු බලාගාරයන් වෙතින් ජනනය කරන ලද ජල විදුලිය ප්‍රමාණය ගි.වො.පැ. 3783.5ක් වූ අතර, එය 2018 හා සන්සන්දනාත්මකව 26.53%ක අඩුවීමකි. මෙය ප්‍රධාන වශයෙන් 2019 වර්ෂයේ ඊසාන දිග මෝසම් වැසි සමයේ අවසන් කාල සීමාව (ජනවාරි සිට පෙබරවාරි දක්වා) සහ නිරිතදිග මෝසම් වැසි සමයෙහි පැවති අසාර්ථකත්වය හේතුකොට ඇති වූ තත්ත්වයකි. මෙය මෙම වසර තුළ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති, කුඩා ජල විදුලි ජනනයෙහි පහත වැටීමටද හේතුව විය.

2019 වසරේ පළමු අර්ධය තුළ, ජනන අංශයට විදුලිබල හිඟ තත්ත්වයකට මුහුණ දීමට සිදුවූ අතර, පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වාගෙන යනු පිණිස දීප ව්‍යාප්ත සැලසුම්ගත විදුලිය ඇණ හිටුවීම් කාල සීමා පනවන්නට සිදුවිය. විදුලිය ඇණ හිටුවීම 2019 මාර්තු මස 18වන දින සිට අප්‍රේල් මස 10වන දින දක්වා පවත්වාගෙන යන ලද අතර එම කාල සීමාව තුළ බෙදා නොහැර ඉතිරි කරගත් බලශක්තිය ප්‍රමාණය ගි.වො.පැ. 95.0ක් විය.

**2019 වසර සඳහා ශුද්ධ බලශක්ති ජනන මුහුව**




රූපය සම්.-4: 2019 වසර සඳහා ශුද්ධ බලශක්ති ජනන මුහුව

2019 වසර සඳහා පද්ධති බාධක හෝ ජනන හිඟතාවයන් හේතුකොට සමස්ත පද්ධතිමය නිකුත් නොකළ බලශක්තිය ගි.වො. පැ. 98.1ක් විය.

2019 වසරේ උපරිම රාත්‍රී කාර්ය බහුල වේලාව වශයෙන් 2019-05-28 දින පැය 19:15 වාර්තා වූ අතර, එම අස්ථාවේ ජනනය මෙ.වො. 2668.7ක අගයකට එළැඹිණි. එදිනම දිවා කාල කාර්ය බහුල වේලා අගය පැය 16:00ට මෙ.වො. 2316.2ක් ලෙස වාර්තා විය.

2019 වසරේ උපරිම දිවා කාල කාර්ය බහුල වේලාව වශයෙන් 2019-05-30 දින පැය 15:45 වාර්තා වූ අතර, එම අස්ථාවේ ජනනය මෙ.වො. 2327.3ක අගයකට එළැඹිණි.

අවම විදුලි ඉල්ලුම 2019.10.28 දින පැය 03:00ට වාර්තා වූ අතර අගය මෙ.වො. 886.6ක් විය.

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)




රූපව සම් 5 : වසරේ උපරිම කාර්ය බහුල වේලාව සහිත දිනයේ පැයෙන් පැය ජනන සටහන

උපරිම දෛනික ජනනය වූ ගි.වො.පැ. 49.12ක අගය 2019.05.29 දින වාර්තාවූ අතර ගි.වො.පැ. 28.06 වසර තුළ වාර්තා වූ අඩුම දෛනික ජනනය වූ අතර එම අගය 2019.10.13 දින වාර්තා විය. 2019 වර්ෂාවසානය වනවිට සාමාන්‍ය දෛනික ජනනය ගි.වො.පැ. 43.62ක් ලෙස වාර්තා විය.




රූපය සම්.-6: වාර්ෂික උපරිම රාත්‍රී කාල කාර්ය බහුල දින ධාරිතා වක්‍ර (2016 -2019)

### ජලාශ කාර්ය සාධනය

2019 වර්ෂය සමස්ත ගබඩාකළ ජලවිදුලිය ගි.වො.පැ. 887.6ක් සමගින් ආරම්භ කෙරිණි. මෙය පද්ධතියේ පූර්ණ ගබඩා හැකියාව වන ගි.වො.පැ. 1,196.6න් 74.2%ක් විය. 2019 වර්ෂය තුළ ලැබුණු සමස්ත පිවිසුම ගි.වො.පැ. 3,984ක් වූ අතර එය සාමාන්‍ය අගයට ආසන්න තත්ත්වයක් ලෙස සැලකිය හැක. වාර්තා වූ පහළම පැටවුම් ප්‍රමාණය ගි.වො.පැ. 251.7ක් (2019.07.18 දින) වූ අතර, වර්ෂාවසාන ගබඩාකරණය ගි.වො.පැ. 1,077.1ක් වූ අතර එය 2018 වසර අවසානය හා සන්සන්දනාත්මකව 21% ක වර්ධනයකි.

පළමු වර්ෂ අර්ධය (ජන.- ජුනි.) සලකන කල වසර 2019 තුළ 1990 වසරින් පසු ලද දෙවන අඩුම ජල පිවිසුම සහිත වර්ෂය ලෙස දැක්විය හැක. වර්ෂයේ දෙවන අර්ධය (ජුලි - දෙසැ.) තුළ ලද ජල පිවිසුම සාමාන්‍ය තත්ත්වය ඉක්මවූවක් විය. කෙසේ වුවද, වසරේ දෙවන අර්ධය තුළ ලද ජල පිවිසුමෙන් 42%ක් අන්තර් මෝසම් කාලය (ඔක්තෝබර් -නොවැම්බර්) තුළ ලැබිණි. උපරිම සාමාන්‍ය දෛනික ජල පිවිසුම වූ ගි.වො.පැ. 26.7 ප්‍රමාණය ඔක්තෝබර් මාසය තුළ ලැබිණි.




රූපය සම්.-7: 2019 වර්ෂය තුළ සමස්ත ගබඩා ප්‍රමාණ විචලනය

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

## සම්ප්‍රේෂණ වත්කම් කළමනාකරණ හා තත්ත්ව අධීක්ෂණ ශාඛාව

සම්ප්‍රේෂණ අංශයේ වත්කම් කළමනාකරණ හා තත්ත්ව අධීක්ෂණ (AM&CM) ශාඛාව සම්පත්වල ආර්ථික ජීව කාලය උපරිම කරමින් පද්ධතියේ විශ්වසනීයත්වය වර්ධනය කරන අතර මෙහෙයුම්ගත ඵලදායකත්වය සහතික කරනු පිණිස ලං.වි.ම. සම්ප්‍රේෂණ ජාලය තුළ පවත්නා බලාගාර හා උපකරණයන්හි උපරිම වාණිජ ප්‍රයෝජනය සාක්ෂාත් කරගැනීමේ වගකීම දරන ආයතනය වේ. මෙම ශාඛාව ද්‍රව්‍ය කළමනාකරණ ඒකකය, නඩත්තු ඉංජිනේරු ඒකකය හා නඩත්තු සැලසුම් ඒකකය නමින් යුත් ඒකක තුනකින් සමන්විත වේ.

වත්කම් කළමනාකරණ හා තත්ත්ව අධීක්ෂණ ශාඛාව විසින් ඵලදායීව හා කාර්යක්ෂමව සම්ප්‍රේෂණ අංශය තුළ සම්පත් කළමනාකරණ හා නඩත්තු කළමනාකරණ කටයුතු සිදු කරනු පිණිස පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතියක් (CMMS) හඳුන්වා දී ඇත. මෙම පද්ධතිය සම්පත් මොඩියුලය, භාණ්ඩ තොග කළමනාකරණ මොඩියුලය, නඩත්තු කළමනාකරණ මොඩියුලය හා පරීක්ෂණ කළමනාකරණ මොඩියුලය යන ප්‍රධාන මොඩියුලයන්ගෙන් සැකසී ඇත.

2019 වසර තුළ අත්පත් කරගත් ප්‍රධාන සාර්ථකත්වයන්:

- ශ්‍රී ලං.රු.මිලියන 470ක් වටිනා අමතර කොටස් හා ආම්පන්න ප්‍රසම්පාදනය කරගන්නා ලදී. මෙයට අමතරව, ශාඛාව විසින් දැනට පවත්නා තොග අතරින් ශ්‍රී ලං.රු.මි. 320ක් වටිනා අමතර කොටස් ඉල්ලීම් සපුරා ඇත.

- සියලු විදුලි තරාපැවියන්හි ද්‍රාවිත වායු විශ්ලේෂණය (DGA) 100%ක් සපුරා ඇති අතර ඇමදුම් සංඛ්‍යාත ප්‍රතිචාර විශ්ලේෂණය මගින් එහි තත්ත්ව ඇගිලි සළකුණු ලබාගැනීමේ කටයුතුද 75%ක් සපුරා ඇත. තවද, උපකරණ වැඩිදුර විශ්ලේෂණය පිණිස ඒවා අතරින් 13%ක අතිරේක දෝෂ නිශ්චය පරීක්ෂාවන්ද සම්පූර්ණ කර ඇත. මෙයට අමතරව, සෙසු ශාඛා/අංශ (ලක්විජය විදුලි බලාගාරය, බත්තල නැංවුම් විදුලි බලාගාරය, බෙදාහැරීමේ අංශය 3 හා සම්ප්‍රේෂණ ව්‍යාපෘති) වෙතින් ලද ඉල්ලීම් මත පදනම්ව තත්ත්ව අධීක්ෂණ පරීක්ෂාවන් සිදු කරන ලදී.

- සම්ප්‍රේෂණ අංශය සඳහා පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමද ආරම්භ කරන ලදී. වර්තමානයේදී මේ මගින් සම්ප්‍රදායික කඩදාසි පදනම්ගත ද්‍රව්‍ය ඉල්ලුම් ක්‍රියාවලිය පරිගණක පදනම්ගත මාර්ගගත ක්‍රමයක් දක්වා පරිවර්තනය කර ඇත. අළුතින් හඳුන්වා දෙන ලද කේතකරණ ක්‍රමයට අනුව සියලු ගබඩා අයිතමයන් සඳහා නව කේත ලබාදී ඇත.

- සම්ප්‍රේෂණ පද්ධති සම්පත්වල තත්ත්වය ප්‍රමාණගත කිරීමේ ක්‍රමවේදයක් ගොඩ නැගීමේ කාර්යය සිදු කරන ලදී. මෙහි කොටසක් වශයෙන්, විදුලි තරාපැවි සඳහා සෞඛ්‍ය දර්ශක ගණන ක්‍රමවේදය සකස් කොට තරාපැවි සෞඛ්‍ය දර්ශක දත්ත පදනමක් ක්‍රියාවෙහි යොදවන ලදී.

- ප්‍රමිතිගතකරණ කාර්යයන් සඳහා යොදාගැනීමට අපේක්ෂිත මෙ.වෝ.ඇ. 31.5, කි.වෝ. 132/33 තෙකලා තරාපැවි සඳහා පිරිවිතරයක් සකස් කිරීම හා සම්ප්‍රේෂණ ජාලය තුළ භාවිත කිරීමට නියමිත කි.වෝ. 220 හා කි.වෝ. 132 ධාරා තරාපැවි ප්‍රමිතිගතකරණය අවසන් කිරීම.

## සන්නිවේදන ශාඛාව

සන්නිවේදන ශාඛාවේ ප්‍රධාන කාර්යය වනුයේ ලං.වි.ම. ඇතුළත පවත්නා හඬ හා දත්ත සන්නිවේදන අවශ්‍යතා සපුරාලීමයි. හඬ හා දත්ත ක්‍රියාත්මක කිරීම, නඩත්තුව හා පාලනය පිණිස හා ආරක්ෂක සංඥා ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව වෙනුවෙන් මෙම ශාඛාව යටතේ සන්නිවේදන පද්ධති, සන්නිවේදන සේවා හා අංකිත දැරුම් ඒකකද පිහිටුවන ලදී.

එක් එක් ජාලය විසින් අදාළ නිශ්චිත සන්නිවේදන අවශ්‍යතා වර්ගය සපුරාලනු පිණිස ශාඛාව විසින් සන්නිවේදන ජාල ගණනාවක් මෙහෙවරෙහි යොදවා ඇත. පහත සඳහන් සන්නිවේදන තාක්ෂණයන් මේවන විට ක්‍රියාත්මකව පවතී:

- ෆයිබර් ඔප්ටික් පදනම්ගත ක්ෂණික ඇමතුම් අංකය, අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් පද්ධතිය (SCADA), ගිගාබිට් ඊතර්නෙට් ජාලය හා පරිපාලන හඬ ක්‍රමය.
- විදුලි මාර්ග ප්‍රවාහක (PLC) පදනම්ගත පාර්ශ්ව මාර්ග දුරකථන පද්ධතිය (PLTS) හා අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් පද්ධතිය.
- VHF සහ UHF ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය.

ලං.වි.ම.හි විවිධ සෙසු ශාඛාවන්හි අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් හා සෙසු සන්නිවේදන අවශ්‍යතා සපුරාලනු පිණිස සම්ප්‍රේෂණ ජාලය පුළුල් කිරීමද සන්නිවේදන ජාලය පුළුල් කිරීම හා සමාන්තරව සිදු වේ. එක් එක් ඒකකයක් විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ කාර්යයන් පහත විස්තර කර ඇත.

### සන්නිවේදන පද්ධති ඒකකය

- ලං.වි.ම.හි විවිධ ශාඛාවන්හි අධිවේගී ආරක්ෂිත දත්ත සන්නිවේදන අවශ්‍යතා සපුරාලනු පිණිස තත්පරයට ගිගාබයිට් 1ක ධාරිතාවයක් සහිතව දැනට පවත්නා ෆයිබර් ඔප්ටික් ජාලය මතින් ගිගාබිට් ඊතර්නෙට් ජාලයක් ස්ථාපනය.
- 2019 වසර තුළ ඉදි කරන ලද කොටුමා උපපොළයන්හි සන්නිවේදන උපකරණ මෙහෙවරෙහි යෙදවීම හා ලං.වි.ම. සන්නිවේදන ජාලය වෙත ඒකාබද්ධකරණය.
- දුරස්ථ මෙහෙයුම් ස්ථාන සමගින් බලාගාර පාලන මැදිරියේ සන්නිවේදන අවශ්‍යතා වැඩිදියුණු කරනු පිණිස විමලසුරේන්ද්‍ර විදුලි බලාගාරයේ හා බෝවතැන්න විදුලි බලාගාරයේ ෆයිබර් ඔප්ටික් විදුලි සංදේශ යටිතල පහසුකම් සැලසුම් කිරීම හා සකස් කිරීම.
- M, N හා C කොටුමා උපපොළයන් L කොටුමා උපපොළය වෙතින් දුරස්ථව ක්‍රියාත්මක කරනු පිණිස අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සමාකෘතිගත කිරීම හා දත්ත සම්බන්ධතා සැකසීම.

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

### සන්නිවේදන සේවා ඒකකය

- කැළණිතිස්ස කි.වෝ. 220 හා අතුරුගිරිය කි.වෝ. 132 කොටුමා උපපොළයන්හි පිහිටි දුරස්ථ පර්යන්ත ඒකක විශාලනය

### අංකිත ධාරක ඒකකය

- මෙහෙයුම් හා නඩත්තු කටයුතු හා ආරක්ෂක අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස ලක්විජය හා කුකුලේගඟ විදුලි බලාගාරයන්හි ඉතා ඉහළ සංඛ්‍යාත (VHF) ප්‍රතිසම හා අංකිත ගුවන් විදුලි සන්නිවේදන පද්ධති ස්ථාපනය.

- උතුරු පළාතේ හා වයඹ පළාතේ සන්නිවේදන ආවරණය වැඩිදියුණු කරනු පිණිස නව ඉතා ඉහළ සංඛ්‍යාත (VHF) මධ්‍ය බඳස් පුනරාවර්තන ස්ථාන ස්ථාපනය හා මෙහෙවරෙහි යෙදවීම.

- යෝජිත සීතාවක ගඟ ජල විදුලි බලාගාරයේ ටෙලිමිතික වැඩ බිම් ආවරණය කරනු පිණිස අවශ්‍ය ඉතා අධික සංඛ්‍යාතයේ (UHF) සන්නිවේදන පුනරාවර්තනයක් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවන් හා හඳුනා ගැනීම් සිදු කිරීම.

- රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති (PICS) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මං විවර කිරීමට නව ඉතා අධික සංඛ්‍යාත (UHF) ප්‍රතිසම/අංකිත ගුවන්විදුලි ප්‍රසම්පාදනය කරගනු පිණිස ඉතා අධික සංඛ්‍යාත ක්ෂේත්‍ර පරීක්ෂාවන් කොළඹ ප්‍රදේශයේ සිදු කිරීම.

- ගුවන්විදුලි සන්නිවේදන ආවරණය පුළුල් කරනු පිණිස ඉහළ කොත්මලේ හා වික්ටෝරියා විදුලි බලාගාරයන්හි නව රැහැන් රහිත ලක්ෂ්‍යාන්තර සන්නිවේදන සම්බන්ධකයන් ස්ථාපනය.

### සම්ප්‍රේෂණ පාලන හා ආරක්ෂණ ශාඛාව

සම්ප්‍රේෂණ පාලන හා ආරක්ෂණ ශාඛාව ලං.වි.ම සම්ප්‍රේෂණ ජාලය පාලනය හා ආරක්ෂාව සම්බන්ධ වගකීම දරන ආයතනය වේ. එය ඒකක තුනකින් සමන්විත වේ; ආරක්ෂණ සංවර්ධන (PD), ආරක්ෂක පද්ධති (PS) හා උපපොළ ස්වයංක්‍රීයකරණ (SAS) වශයෙනි. ඒ එක් එක් ඒකකයක ප්‍රධාන වගකීම් පහත පරිදි වේ:

ආරක්ෂක සංවර්ධන ඒකකය - සම්ප්‍රේෂණ උපකරණයන්හි දෝෂ විශ්ලේෂණය, ආරක්ෂණ පිහිටවුම් ගණනය, සැලසුම් සමාලෝචනය හා නව කොටුමා උපපොළයන්හි ආරක්ෂණ යෝජනාක්‍රමයන් මෙහෙවරෙහි යෙදවීම පිළිබඳ සාක්ෂි දැරීම ආදියයි.

ආරක්ෂක පද්ධති ඒකකය - සන්නිවේදනය හා ආරක්ෂණය (C&P) ආශ්‍රිත බිඳවැටීම් පිළිබඳ සොයා බැලීම, සන්නිවේදන හා ආරක්ෂණ ප්‍රතිචාරණයන්හි දෛනික නඩත්තු කටයුතු, ප්‍රතිචාරණ ස්ථාපන ක්‍රියාත්මක කරවීම හා ද්විතීයන පරීක්ෂාව, මූලික විත්නත්කරණයන්, ලං.වි.ම. ව්‍යාපෘතීන්හි සන්නිවේදන හා ආරක්ෂණ යෝජනාක්‍රම මෙහෙවරෙහි යෙදවීම ආදිය.

උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති ඒකකය - කොටුමා උපපොළයන්හි උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති නඩත්තුව, නව අංගන ඒකාබද්ධ කරනු පිණිස පවත්නා උපපොළ ස්වයංක්‍රීයකරණ උපපොළ පද්ධතිය ඇඳීම, සමාලෝචනය හා සාක්ෂි දැරීම

2019 වසර ඇතුළත සම්ප්‍රේෂණ පාලන හා ආරක්ෂණ ශාඛාව විසින් සම්පූර්ණ කරන ලද ප්‍රධාන කටයුතු පහත පරිදි විය.

- කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන්, බැරයටි, විදුලි තරාපැවි හා කි.වෝ. 33 පෝෂකයන් සඳහා ආරක්ෂණ ස්ථාපන ප්‍රමිතිය සකසා පළ කරන ලදී.

- ප්‍රමිතිගත ලංසු ලේඛනයේ පාලන හා ආරක්ෂණ උපකරණය සඳහා වන පිරිවිතරය නව ආරක්ෂණ දර්ශනය ප්‍රකාර පූර්ණ වශයෙන් යාවත්කාලීන කරන ලදී.

- පද්ධතිය ආරක්ෂණ ස්ථාපන ගණනය හා දත්ත පදනම් කළමනාකරණය සිදු කරනු පිණිස මධ්‍යගත වත්කම් කළමනාකරණය සඳහා වූ DIgSILENT StationWare නමින් යුත් මෘදුකාංග ක්‍රියාත්මක කරන ලදී.

ශාඛාවේ එක් ප්‍රධාන කාර්යයක් වනුයේ සම්ප්‍රේෂණ ව්‍යාප්ති හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා උපදෙස් ලබාදීම හා සහාය ලබාදීමයි. මෙතුළට නව හා ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති සඳහා වූ පාලන, ආරක්ෂණ පද්ධති හා උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති විෂය පථය හඳුනා ගැනීම, තාක්ෂණික පිරිවිතර, ආරක්ෂණ ස්ථාපන ගණනයන් සැකසීම හා කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදෙන ලද පාලන, ආරක්ෂණ හා උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති යෝජනාක්‍රම පරීක්ෂා කිරීම හා අනුමත කිරීමද ඇතුළත් වේ. මෙයට අමතරව, පරිශීලකයන් විසින් භාරගැනීම සඳහා සම්ප්‍රේෂණ හා ජනන ව්‍යාපෘතීන්හි ආරක්ෂක යෝජනාක්‍රම මෙහෙවරෙහි යෙදවීමේ කටයුතු පිළිබඳ සාක්ෂි දැරීමද සිදු කරනු ලබයි. 2019 වසර තුළ පහත සඳහන් මෙහෙවරයෙහි යෙදවීමේ ව්‍යාපෘතිවලට සහභාගි වී පිළිගන්නා ලදී.

- මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අලාභ අවමකරණ ව්‍යාපෘතිය යටතේ කොළඹ L, කොළඹ M, හා කොළඹ N, සහ කෙරවලපිටිය කි.වෝ. 220 කොටුමා උපපොළ, කැළණිතිස්ස කි.වෝ. 220 කොටුමා උපපොළ, කොළඹ E, කොළඹ ජ හා කොළොන්නාව කි.වෝ. 132 කොටුමා උපපොළයන්හි පාලන, ආරක්ෂණ හා උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධති (SAS) උපකරණ මෙහෙවරෙහි යෙදවීම.

- කැළණිතිස්ස අළුතින් ස්ථාපිත කි.වෝ. 33 කොටුමා උපපොළෙහි පාලන හා ආරක්ෂණ පද්ධති හා කොළඹ A හා I උපපොළයන්හි අලුතින් ස්ථාපිත කි.වෝ. 132/11 තරාපැවි මෙහෙවරෙහි යෙදවීම.

- හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය 2වන පැකේජය යටතේ ප්‍රතිසංස්කරණය කරන ලද ත්‍රිකුණාමලය කොටුමා උපපොළ, කටුනායක කොටුමා උපපොළෙහි පුළුල් කරන ලද කි.වෝ. 33 කොටුමා උපපොළ හා අලුතින් ඉදිකරන ලද කෙරවලපිටිය කි.වෝ. 33 කොටුමා උපපොළයන්හි පාලන හා ආරක්ෂණ පද්ධති මෙහෙවරෙහි යෙදවීම.

- නව අනුරාධපුර කොටුමා උපපොළෙහි උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධතිය නවීකරණය හා කි.වෝ. 220 මන්නාරම මාර්ගයන් ආවරණය වනු පිණිස උපපොළ ස්වයංක්‍රීයකරණ පද්ධතිය පුළුල් කිරීම

### සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ වගකීම් අතරට සම්ප්‍රේෂණ කොටුමා උපපොළයන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව සහ සම්ප්‍රේෂණ රැහැන් එළීමේ මාර්ග අවසරය පිළිබඳ නිශ්කාෂණය ලබාදීම ඇතුළත් වේ. වසර ආරම්භයේදී, සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - උතුර සහ සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණ වශයෙන් ශාඛාවන් දෙකකට ප්‍රති ව්‍යුහගත කරන ලදී.

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)




රූපය සම්-8: සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ සංවිධාන සටහන

## සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව - උතුර

### මධ්‍යම ඒකකය

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාවේ මධ්‍යම ඒකකය විසින් කොටුමා උපපොළ දහ හතරක සියලු උපකරණවල වාර්ෂික වැළකුම් නඩත්තුව සාර්ථකව අවසන් කරන ලද අතර කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 795කට අදාළ මාර්ග අවසර නඩත්තු චක්‍රය සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

එයට අමතරව, කිරිබත්කුඹුර, කෑගල්ල, තුල්හිරිය, නව පොල්පිටිය, රාගල, නාවලපිටිය හා මාලිබොඩ කොටුමා උපපොළයන්හි විවිධ අදියරයන්හි පවත්නා සැලසුම්කරණ සමාලෝචන, පරීක්ෂා කිරීමේ හා මෙහෙවරෙහි යෙදවීමේ සහ දෝෂ පිළියම් කටයුතු විෂයයෙහි දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති ගණනාවකට සහාය ලබාදෙන ලදී.



රූපය සම්.9: මාලිබොඩ ජාල පොළෙහි කි.වෝ. 33 කොටුමා උපපොළ මෙහෙවරෙහි යෙදවීම

තවද, වසර ඇතුළත පහත සඳහන් ප්‍රධාන නඩත්තු කටයුතුද සිදුකරන ලදී:

- පෙහෙවියුරු මිනුම් සැලසුම් කොට සාර්ථකව සිදුකරන ලදී.
- සියලු උපපොළයන්හි තාප රූප ගන්නා ලද අතර හඳුනාගත් තැව් ලක්ෂ්‍ය අලුත්වැඩියා කරන ලදී.
- තුල්හිරිය කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 31.5, කි.වෝ. 132/33 විදුලි තරාපැව් 02ක තෙල් පෙරීම් කටයුතු සිදු කරන ලද අතර එහිදී අඩු තෙල් බිඳුම් ශක්තියක් පැවති බව හඳුනා ගන්නා ලදී.
- උකුවෙල කොටුමා උපපොළෙහි දෝෂ සහිත ප්‍රාථමික උපකරණ මාරු කරන ලද අතර, මොණරාගල කොටුමා උප පොළෙහි 01 හි අදියර B කලාවෙහි කි.වෝ. 132 වෝල්ටීයතා තරාපැවියද මාරු කරන ලදී.
- බස්නාහිර පළාත දකුණ - නුවරඑළිය කොටුමා උපපොළ හා බදුල්ල - මහියංගනය කොටුමා උපපොළ අතර සන්නිවේදන සම්බන්ධතාවය සාර්ථකව ස්ථාපනය කරන ලදී. නුවරඑළිය ජාල පොළේ සිට බස්නාහිර පළාත දකුණ ජාල පොළෙහි දුරස්ථ මෙහෙයුම් කටයුතුද, බදුල්ල ජාල පොළෙහි සිට මහියංගනය ජාල පොළෙහි මෙහෙයුම් කටයුතුද දුරස්ථව සිදු කිරීම ආරම්භ කරන ලදී.
- තවද, ගතික ප්‍රතිරෝධය, කම්පන මිනුම්කරණයන්, දඟර ධාරා මිනුම්කරණය, ප්‍රධාන ඇමතුම් ප්‍රතිරෝධක මිනුම්කරණය වැනි අතිරේක පරීක්ෂණයන් සිදුකරනු පිණිස නව පිරි සැරිසිඳු විශ්ලේෂකයන් දෙකක්ද මිලදී ගන්නා ලදී.



රූපය සම්.10: උකුවෙල ජාල පොළෙහි කිවෝ. 132 ධාරා තරාපැවිය මාරු කිරීම

### උතුරු මැද ඒකකය

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු (උතුරු මැද) ඒකකය විසින් කොටුමා උපපොළ දහසයක (16) සියලු උපකරණ පිළිබඳ වාර්ෂික වැළකුම් නඩත්තු කටයුත්ත සම්පූර්ණ කරන ලද අතර කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන්වල කි.මී. 1,232ක මාර්ග අවසර නඩත්තු චක්‍රයද සම්පූර්ණ කරන ලදී.

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

එයට අමතරව, ක්‍රියාත්මක ව්‍යාපෘති ගණනාවක මූලික කටයුතු, පරීක්ෂණ හා මෙහෙවරෙහි යෙදවීමේ සහ දෝෂ නිරාකරණ කටයුතු සඳහා සහාය ලබාදුන් අතර එම කටයුතු නව අනුරාධපුර කොටුමා උපපොළ, පන්නල කොටුමා උපපොළ, මාදම්පේ කොටුමා උපපොළ, ඉදිරියට ක්‍රියාත්මකවන පැරණි අනුරාධපුර කොටුමා උපපොළ, කප්පල්තුරෙයි කොටුමා උපපොළ, ත්‍රිකුණාමලය කොටුමා උපපොළ හා මන්නාරම කොටුමා උපපොළ යන ස්ථානයන්හි විවිධ අදියරයන් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

තවද, වසර තුළ පහත සඳහන් ප්‍රධාන නඩත්තු කටයුතු සිදුකරන ලදී:

- මෙ.වො.ඇ. 31.5 තරාපැවියක් සීතාවක කොටුමා උපපොළෙන් ගලවා ඉවත් කොට පන්නල කොටුමා උපපොළ ගෙනගොස් සවි කරන ලදී.
- වව්නියාව කොටුමා උපපොළහි කි.වෝ. 33 බැරයටි දැඳන ඒකකයේ විසම්බන්ධක කුටියේ හා කැඩුම් කුටියේ සම්බන්ධක බුෂ් මුද්‍රකයෙන් එස්.එෆ් 6 වායු කාන්දුවක් සිදුවූ අතර එය සාර්ථකව අලුත්වැඩියා කරන ලදී.
- හබරණ ජාල පොළෙහි 2 තරාපැවියේ සියලු ගෑස්කට් මාරු කොට යම් පමණකට හෝ කාන්දු සිදුවිය හැකි ස්ථාන වේදැයි පරීක්ෂා කරන ලදී.
- හබරණ, පොළොන්නරුව හා පුත්තලම කොටුමා උපපොළවල්හි තරාපැවිවල පැටවුම් සහිත උපුටු මාරුකුරු ඒකකයන් සාර්ථකව සේවාකරණය කරන ලදී.
- මෙම කළාපයේ සියලු තරාපැවියන්හි ද්‍රාවිත වායු විශ්ලේෂණ පරීක්ෂණයන් සිදු කරන ලදී.
- හබරණ හා පැරණි අනුරාධපුර කොටුමා උපපොළයන්හි කි.වෝ. 132 පරිපථ බිඳිනයන්හි සදොස් වාතරෝධක ඒකකය සාර්ථකව අලුත්වැඩියා කොට ක්‍රියාත්මක කරවන ලදී.
- ත්‍රිකුණාමලය ජාල පොළෙහි රැහැන් සවැති උපුටු මාරුකුරුව (OLTC) ස්වයංක්‍රීය වෝල්ටීයතා නියාමකය (AVR) වෙත ටැප් තත්ත්ව පිළිසුම් ලබාදීම සඳහා භාවිත කෙරෙන නව බයිනරි කේතක දශමක (BCD) පත්‍රිකාව සැලසුම් කොට ස්ථාපනය කරන ලදී.



රූපය සම්.11: තරාපැවි නඩත්තු කටයුතු

## සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව -දකුණ සම්ප්‍රේෂණ රැහැන් නඩත්තු ඒකකය

සම්ප්‍රේෂණ රැහැන් නඩත්තු ඒකකය විසින් රටතුළ පවත්නා කි.වෝ. 132 හා කි.වෝ. 220 ජීව රැහැන් නඩත්තු කටයුතු හා සියලු බිඳ වැටීම් පිළිසකරකරණ කටයුතු සිදුකරන ලදී. 2019 වර්ෂය තුළ, සම්ප්‍රේෂණ රැහැන් නඩත්තු ඒකකය විසින් සම්ප්‍රේෂණ කුලුණු 10,076න් 4400ක පරීක්ෂාවන් සම්පූර්ණ කොට ඇත.

## බස්නාහිර උතුරු ඒකකය

අධි වෝල්ටීයතා වහරුවාරන මනා සේ ක්‍රියාත්මක වන්නේද යන්න සහතික කරගනු පිණිස බස්නාහිර උතුරු ඒකකය විසින් පහත සඳහන් වැළකුම් නඩත්තු කටයුතු සිදුකරන ලදී.

- කොටුගොඩ හා බියගම කොටුමා උපපොළයන්හි කි.වෝ. 132 වහරු අංගනයන්හි පැරණි හා තෙල් කාන්දු සහිත කි.වෝ. 132 දහර තරාපැවි මාරු කරන ලදී.
- බියගම කොටුමා උපපොළෙහි කි.වෝ. 220/132/33 තරාපැවිය 1හි පැරණි හා දුර්වල ක්‍රියාකාරිත්වයක් සහිත කි.වෝ. 220 පරිපථ බිඳිනය මාරු කරන ලදී.
- බියගම කොටුමා උපපොළෙහි කි.වෝ. 220/132/33 තරාපැවිය 1හි පැරණි හා අඩු පරිවරණිත මට්ටමක් පැවති පාලන හා ආරක්ෂණ බහනය මාරු කරන ලදී.
- බියගම කොටුමා උපපොළෙහි දෝෂ සහිත හෙළුම් සන්නායක මාරු කරන ලදී.
- සපුගස්කන්ද ජාල පොළෙහි රැහැන් සවැති උපුටු මාරුකුරුව සේවාකරණය කරන ලදී.



රූපය සම්.12: පහත හෙළුම මාරු කිරීමේ කටයුතු

ඉහත සඳහන් නඩත්තු කටයුත්තට අමතරව, මෙම ඒකකය විසින් බිඳ වැටීම් නඩත්තු කටයුතුවලද යෙදෙන ලදී. 2019 වසර තුළ ප්‍රධාන බිඳ වැටීම් දෙකක් වාර්තා විය. තවද, පාලක ගොඩනැගිලි, සීමා මායිම් වැට, මාර්ග හා ගිනි ආරක්ෂණයන් ප්‍රතිසංස්කරණය වැනි කොටුමා උපපොළයන්හි ආරක්ෂාව හා පෙනුම පවත්වාගෙන යනු පිණිස සිවිල් කටයුතු ගණනාවක්ද සිදු කරන ලදී.

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

### බස්නාහිර දකුණ ඒකකය

සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු (බස්නාහිර දකුණ) ඒකකය විසින් කොටුමා උපපොළ දහසයක (16) සියලු උපකරණයන්හි වාර්ෂික සාමාන්‍ය නඩත්තුව සම්පූර්ණ කරන ලද අතර කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් කි.මී. 175කට අදාළ මාර්ග අවසර නඩත්තු කටයුත්තද සම්පූර්ණ කරන ලදී.

සාමාන්‍ය නඩත්තු කටයුතුවලට අමතරව, පහත සඳහන් ප්‍රධාන විශේෂ නඩත්තු කටයුතුද 2019 වර්ෂය තුළ සිදු කරන ලදී.

- කැළණිතිස්ස ABB ELK-0 කි.වෝ. 145 වායු පරිවෘත වහරුපන්න (GIS) අංක 01 දරන කොලොන්නාව මාර්ග යේ දෝෂ පිළිසකර කටයුතු.
- කැළණිතිස්ස ABB ELK-0 කි.වෝ. 145 වායු පරිවෘත වහරුපන්න (GIS) අංක 01 දරන කොලොන්නාව මාර්ග යේ වාත්තු මැලියම් පරිවාරකයන් ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද නව බහන් පර්යන්තයට අනුව මාරු කරන ලදී.
- ජයවර්ධනපුර කොටුමා උපපොළෙහි වායු පරිවෘත වහරුපන්න පෝෂක 06 අංගනයෙහි පරිපථ බිඳිනය මාරු කිරීම
- කොලොන්නාව කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 31.5 කි.වෝ. 132/33 විදුලි තරාපැව්යේ සම්පූර්ණ ගෑස්කට් කට්ටලයම මාරු කිරීම
- කැළණිතිස්ස කි.වෝ. 220 වායු පරිවෘත වහරුපන්න බියගම මාර්ග අංගන 1හි ප්‍රාදේශීය පාලක කුටිය (LCC) ප්‍රතිසංස්කරණය
- පන්නිපිටිය කොටුමා උපපොළෙහි කි.වෝ. 132 රත්මලාන සම්ප්‍රේෂණ මාර්ග අංක 02 අංගනයට නව කි.වෝ. 145 SF6 පරිපථ බිඳිනය මාරු කරන ලදී.

තවද, කොටුමා උපපොළෙහි යටිතල පහසුකම් හා පෙනුම ඉහළ නංවනු පිණිස ප්‍රති සැකසුම් කටයුතු සිදුකරන ලදී.

### බස්නාහිර මධ්‍යම ඒකකය

කොළඹ නගර සීමාවන් තුළ කොටුමා උපපොළයන් හා කි.වෝ. 132 හා කි.වෝ. 220 යටිබිම් බහන් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා බස්නාහිර මධ්‍යම ඒකකය ස්ථාපනය කරන ලදී. මුලිකව මෙම ඒකකයේ ප්‍රධාන විෂය පථය වූයේ කොළඹ නගර ශාඛාවෙන් දැනට පවත්නා කොටුමා උපපොළයන්ද, ව්‍යාපෘති අංශයෙන් නව කොටුමා උපපොළයන්ද පවරා ගැනීමයි.

වසර තුළ මෙම ඒකකය විසින් කොළඹ නගර ශාඛාවෙන් කොටුමා උපපොළ A, F, C, I හා E ද ව්‍යාපෘති අංශයෙන් කොටුමා උපපොළ L, M හා N ද පවරා ගන්නා ලදී.

මෙම කොටුමා උපපොළයන්හි නඩත්තු කටයුතු වසර තුළ ආරම්භ කර ඇත.

### දක්ෂිණ ඒකකය

දක්ෂිණ ඒකකය විසින් වසර තුළ කොටුමා උපපොළ 10ක නඩත්තු කටයුතු සාර්ථකව අවසන් කර ඇත. තවද, සිංහරාජ වනාන්තරය හා උඩවලවේ ජාතික වනෝද්‍යානයද ඇතුළත්ව සම්ප්‍රේෂණ රැහැන් මාර්ග දිග කි.මී. 471ක මාර්ග අවසර නඩත්තු කටයුතුද සම්පූර්ණ කරන ලදී.

එයට අමතරව, පහත සඳහන් විශේෂ නඩත්තු කටයුතුද සිදුකරන ලදී.

- මාතර, බෙලිඅත්ත හා ගාල්ල කොටුමා උපපොළයන්හි තරාපැව් රැහැන් සවැති උපුටු මාරුකුරුව සේවාකරණය (OLTC) සිදුකරන ලදී.
- ගාල්ල කොටුමා පොළෙහි ස්ථිතික වාර හානිපූරකය (SVC) අංගනයට අදාළ වර්තමාන ධාරිතා ප්‍රවර්ධන කටයුතු සම්පූර්ණ කරන ලද අතර, මේවන විට මෙය ඕනෑම විදුලි බලාගාරයක් සම්බන්ධ කිරීම සඳහා කි.වෝ. 132 ජනන අංගනයක් ලෙස භාවිත කිරීම සඳහා සූදානම්ව ඇත.
- බලන්ගොඩ කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක 07හි පරිපථ කැඩුම් රිට මාරු කිරීම
- රත්නපුර කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක 07හි බල ආරෝපණ යාන්ත්‍රණය මාරු කිරීම
- මතුගම කොටුමා උපපොළෙහි තරාපැව් 1 හා 2හි පවත්නා සියලු තෙල් කාන්දු පිළිසකර කිරීම
- දෙනියාය ජාල පොළෙහි ආරෝපක මොඩියුලය අලුත්වැඩියා කිරීම.

තවද, ගාල්ල හා අම්බලන්ගොඩ කොටුමා උපපොළයන්හි තරාපැව් තත්ත්ව අධීක්ෂණ පරීක්ෂණයන් සිදුකරන ලදී.

### ආයතනික හා නියාමන සම්බන්ධතා ශාඛාව

ආයතනික හා නියාමන සම්බන්ධතා ශාඛාවේ වගකීම වනුයේ සම්ප්‍රේෂණ අංශයේ පවත්නා මානව සම්පත ප්‍රශස්ත අයුරින් යොදා ගනිමින් එම අංශය නිසි පරිදි ක්‍රියාත්මකවන බවට වගබලා ගැනීමයි. සම්ප්‍රේෂණ අංශය සඳහා වූ වාර්ෂික පිරිස් සැලැස්ම හා ආයතනික සැලැස්ම සකස් කිරීම ආයතනික හා නියාමන සබඳතා ශාඛාව විසින් සිදු කරනු ලබයි. සම්ප්‍රේෂණ අංශයේ වාර්ෂික වාර්තාවද මෙම ශාඛාව විසින් සකස් කරනු ලබයි.

සම්ප්‍රේෂණ අංශය විධායක නිලධාරීන් 138 දෙනෙකුගෙන්ද, විධායක නොවන නිලධාරීන් 1079 දෙනෙකුගෙන්ද සැදුම්ලත් සමස්ත සේවක මහතුන් 1217 දෙනෙකුගෙන් සමන්විත අංශයක් වේ. වසර තුළ සේවකයන් 03 දෙනෙකු විශ්‍රාම ලැබූ අතර, 26 දෙනෙකු ලං.වි.ම. බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ප්‍රකාර ඉහළ ශ්‍රේණිවලට උසස් කිරීම හෝ ඔවුන්ගේ අදාළ ඊළඟ ඉහළ වැටුප් පරිමාණය මත තැබීම සිදු කරන ලදී. වසර තුළ ශාඛාව විසින් විනය පරීක්ෂණ දෙකක් පවත්වන ලදී.

සේවක මහතුන්ගේ කුසලතා සංවර්ධන අවශ්‍යතාවයන් මත පදනම්ව කාර්ය මණ්ඩලය සඳහා දේශීය මෙන්ම විදේශීය බාහිර පුහුණු අවස්ථාවන් සම්පාදනය කරන ලදී. තවද, සම්ප්‍රේෂණ අංශයට අනුයුක්ත සියලු සේවක මහතුන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක්ද පවත්වන ලදී.

ගෘහ නිර්මාණ ශිල්පීය සැලැස්ම හා ඉදිකිරීම් අධීක්ෂණය සඳහා වූ උපදේශන ආයතනය වශයෙන් රාජ්‍ය ඉංජිනේරු නීතිගත සංස්ථාව පත් කිරීමත් සමගින් සම්ප්‍රේෂණ මූලස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් ක්‍රියාත්මක කිරීම විෂයයෙහි ප්‍රගතියක් ඇති විය.



මෙහෙයුම් සමාලෝචනය

# බෙදාහැරීමේ අංශ

# බෙදාහැරීමේ අංශ

රටතුළ විදුලිය බෙදාහැරීමේ ප්‍රධාන කොටසක් හෙවත් සමස්ත අලෙවියෙන් 90%ක ප්‍රමාණයක් ලං.වි.ම. විසින් සිදු කරන අතර ඉතිරිය ලං.වි.ම.හි අනු ආයතනයක් වන ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) ආයතනය විසින් සිදු කරනු ලබයි.

සමස්ත ලං.වි.ම. බෙදාහැරීමේ පද්ධතිය භූගෝලීය වශයෙන් බෙදාහැරීමේ අංශය 1 (DD1), බෙදාහැරීමේ අංශය 2 (DD2), බෙදාහැරීමේ අංශය 3 (DD3) හා බෙදාහැරීමේ අංශය 4 (DD4) වශයෙන් වූ අංශ හතරකට බෙදා ඇත. මෙම අංශ වෙන් කිරීම ප්‍රධාන වශයෙන්ම සිදුකර ඇත්තේ පරිපාලනයේ හා මෙහෙයුම් කටයුතුවල පහසුව හා පාරිභෝගිකයන් වෙත සිදුකරන සැපයීම්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ප්‍රමිතිගත තරගය තුළින් සාර්ථකත්වයක් අත්කර ගැනීම සඳහාය.

බෙදාහැරීමේ ජාලය කි.වෝ. 33 හා කි.වෝ. 11 මධ්‍ය වෝල්ටීයතා (MV) රැහැන්, වෝල්ට් 400 අඩු වෝල්ටීයතා (LV) රැහැන් හා දිවයින පුරා විසිර ඇති කොටුමා උපපොළයන් හරහා කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ පද්ධතීන් වෙතින් විදුලිබලය හුවමාරු කරන්නාවූ බෙදාහැරීමේ තරාපැවියන්ගෙන්ද සමන්විත වේ.

## මෙහෙයුම් ව්‍යුහය

එක් එක් අංශය ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා වෙත සෘජුවම වාර්තා කරන්නාවූ අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. බෙදාහැරීමේ අංශ පළාත්වලට බෙදා ඇති අතර ඒ ඒ පළාත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. එක් එක් අංශය යටතේ එන පළාත් පහත පරිදි වේ:

| අංශයේ නම | පළාත |
|---|---|
| බෙදාහැරීමේ අංශය 1 (බෙ.අ.1) | කොළඹ නගරය, වයඹ, උතුරු මැද හා උතුරු පළාත් |
| බෙදාහැරීමේ අංශය 2 (බෙ.අ.2) | බස්නාහිර පළාත උතුර, මධ්‍යම හා නැගෙනහිර පළාත් |
| බෙදාහැරීමේ අංශය 3 (බෙ.අ.3) | බස්නාහිර පළාත දකුණ II, ඌව හා සබරගමුව පළාත් |
| බෙදාහැරීමේ අංශය 4 (බෙ.අ.4) | බස්නාහිර පළාත දකුණ I, හා දකුණු පළාත් |

පළාතක් අදාළ ප්‍රදේශය විසින් සේවය සපයන පාරිභෝගිකයන් සංඛ්‍යාව මත පදනම්ව ප්‍රාදේශීය ප්‍රධාන ඉංජිනේරුවරුන් හෝ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවරුන් විසින් කළමනාකරණය කරනු ලබන ප්‍රදේශ ගණනාවකට නැවත බෙදා ඇත. ප්‍රදේශයක් තවදුරටත් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC) ගණනාවකට අනු බෙදුම්ගත කර ඇති අතර ඒ එක එකක් විදුලි අධිකාරීවරයෙකු යටතේ පාලනය වේ.

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 1 වයඹ, උතුරු මැද, උතුරු හා කොළඹ නගර යනුවෙන් පරිපාලන පළාත් හතරකින් සමන්විත වේ. උතුරු මැද හා උතුරු පළාත් වෙන් වෙන් වශයෙන් ප්‍රදේශ තුනකට බෙදා ඇත. වයඹ පළාත ප්‍රදේශ හතකටද, කොළඹ නගරය ප්‍රදේශ හතරකටද බෙදා ඇත

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | වයඹ | හලාවත, කුරුණෑගල, කුලියාපිටිය, වාරියපොල, වෙන්නප්පුව, පුත්තලම හා නාරම්මල. |
| | උතුරු මැද | අනුරාධපුර, කැකිරාව හා මින්නේරියගල |
| | උතුරු | යාපනය, කිලිනොච්චිය හා වවුනියාව |
| | කොළඹ නගර | කොළඹ උතුර, කොළඹ දකුණ, කොළඹ බස්නාහිර හා කොළඹ නැගෙනහිර |

බෙදාහැරීමේ අංශය 2හි මෙහෙයුම් ප්‍රදේශය විසින් ප්‍රාදේශීය කාර්යාල 22ක් මගින් සමස්ත නැගෙනහිර හා මධ්‍යම පළාත්ද බස්නාහිර හා සබරගමුව පළාත්වල කොටසක්ද ආවරණය කරයි. පළාත් තුන අතරින්, නැගෙනහිර පළාත ප්‍රදේශ හතරකටද, මධ්‍යම පළාත ප්‍රදේශ දොළහකටද බස්නාහිර පළාත ප්‍රදේශ හයකටද නැවත බෙදා ඇත.

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 2 | නැගෙනහිර පළාත | අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය හා කල්මුණේ |
| | මධ්‍යම පළාත | කෑගල්ල, මාවනැල්ල, මහනුවර නගරය, පේරාදෙණිය, කුණ්ඩසාලේ, කටුගස්තොට, ගලගෙදර, මාතලේ, දඹුල්ල, නුවරඑළිය, ගිනිගත්හේන, නාවලපිටිය |
| | බස්නාහිර පළාත උතුර | ගම්පහ, කැළණිය, මීගමුව, ජා-ඇල, දිවුලපිටිය හා වේයන්ගොඩ |

බෙදාහැරීමේ අංශය 3 මගින් බස්නාහිර පළාත දකුණ II, සබරගමුව පළාත හා ඌව පළාත ලෙස නම්කර ඇති බස්නාහිර පළාතේ කොටසක් ආවරණය කරනු ලබයි. බස්නාහිර පළාත දකුණ II ප්‍රදේශ පහකට අනු බෙදුම්ගත කර ඇත. සමස්ත රත්නපුර දිස්ත්‍රික්කයම හා කෑගල්ල දිස්ත්‍රික්කයේ කොටසක්ද ආවරණය වන පරිදි සබරගමුව පළාත ප්‍රදේශ පහකට අනු බෙදුම්ගත කර ඇත. බදුල්ල හා මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඌව පළාත ප්‍රදේශ හතරකට අනු බෙදුම්ගත කර ඇත.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 3 | බස්නාහිර පළාත දකුණ II | බණ්ඩාරගම, හෝමාගම, අවිස්සාවේල්ල, ශ්‍රී ජයවර්ධනපුර හා හොරණ |
| | සබරගමුව | රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ හා ඇඹිලිපිටිය |
| | ඌව | බදුල්ල, දියතලාව, මොණරාගල, මහියංගනය |

බෙදාහැරීමේ අංශය 4 මගින් බස්නාහිර පළාතේ කොටසක් (බස්නාහිර පළාත දකුණ I), සමස්ත දකුණු පළාතම හා සබරගමුව සහ ඌව පළාත්වල ප්‍රදේශ කිහිපයක්ද ආවරණය කෙරේ. බස්නාහිර පළාත දකුණ I මගින් ප්‍රදේශ හතරක්ද, දකුණු පළාත මගින් ප්‍රදේශ හතක්ද ආවරණය කෙරේ.

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 4 | දකුණු පළාත | අම්බලන්ගොඩ, ගාල්ල, හම්බන්තොට, මාතර, තංගල්ල, අකුරැස්ස හා බද්දේගම |
| | බස්නාහිර පළාත දකුණ I | රත්මලාන, කළුතර, දෙහිවල හා මතුගම |

පළාත්වලට අමතරව, එක් එක් අංශයේ මෙහෙයුම් කටයුතු තිරසරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහාය සේවා අධිසැර කරනු පිණිස සියලු බෙදාහැරීමේ අංශ තුළ වෙන් වෙන් වශයෙන් ශාඛාවන් තුනක් ස්ථාපනය කර ඇත. ඒවා නම්, ව්‍යාපෘති හා නඩත්තු ශාඛාව, සැලසුම් හා සංවර්ධන ශාඛාව හා වාණිජ හා ආයතනික ශාඛාව වේ. බෙදාහැරීමේ අංශය 1 ට බෙදාහැරීමේ සම්බන්ධීකරණ ශාඛාවද ඇතුළත් වේ.

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)



# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

### අංශයන්හි ප්‍රධාන අරමුණු

- අංශය තුළ වූ සියලු පාරිභෝගිකයන් වෙත ව්‍යවස්ථාපිත මට්ටම් යටතේ විශ්වසනීය විදුලි සැපයුමක් ලබාදීම.
- විදුලිය අලෙවි කිරීම හා වර්තමාන ඉල්ලුම හා අපේක්ෂිත මතු අවශ්‍යතාවයන්ද සපුරාලන අතර වියදම් පියවා ගන්නා අයුරින් සැලසුම්ගත ආදායම් උපයා ගැනීම.
- නවීන කර්මාන්තයේ ප්‍රබලතම ප්‍රමිතීන් සපුරාලන ඉහළ ගුණාත්මකභාවයේ ඵලදායී හා ආරක්ෂිත තාක්ෂණයන් සහිතව උපරිම පාරිභෝගික තෘප්තියක් සහතික කෙරෙන පරිදි සියලු දෙනා වෙත විදුලිය සැපයීම.
- පද්ධතිමය අලාභ අවම කරගනිමින් විදුලි සැපයුමේ විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගතවන තත්ත්වයට ප්‍රවර්ධනය වන පරිදි විදුලිය බෙදාහැරීමේ ක්‍රමය ගොඩනගන බවට වගබලා ගැනීම.
- නඩත්තු සේවා හා මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඒකාබද්ධකර වැඩිදියුණු කිරීම.
- විදුලිය බෙදා හැරීමේ නව තාක්ෂණයන් ගොඩනගනු පිණිස පර්යේෂණ හා සංවර්ධන කටයුතු ඒකාබද්ධකර ප්‍රවර්ධනය කිරීම.
- ආරක්ෂාකාරී, සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් පවත්වා ගනිමින් කුසලතා පූර්ණ සේවා බලකායක් බිහි කරමින් සාර්ථකත්වය අත්පත් කරගැනීම සඳහා ඔවුන් වෙත පවත්නා අවස්ථාවන් උපරිමකරණය.
- මෙහෙයුම්ගත පරිසරය ආරක්ෂා කර සංරක්ෂණය කිරීම සඳහා කැපවී සිටීම.

### බෙදාහැරීමේ අංශවල විහිදුම් පරාසය

| විස්තරය | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 |
|---|---|---|---|---|
| සේවා ප්‍රදේශය (වර්ග කි.මී.)* | 26,929 | 17,855 | 12,178 | 6,930 |
| ප්‍රදේශ (සංඛ්‍යාව) | 17 | 22 | 14 | 11 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 57 | 85 | 49 | 40 |
| ලංකා විදුලිබල මණ්ඩලය මෙහෙයවන එකතු කිරීමේ මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 15 | 19 | 12 | 28 |
| පාලන මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 3 | 0 |
| ඇමතුම් මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 4 | 3 | 2 |
| තොග පාරිභෝගිකයෝ (සංඛ්‍යාව) | 4,223 | 3,540 | 2,058 | 1,794 |
| සිල්ලර පාරිභෝගිකයෝ (සංඛ්‍යාව) | 1,871,629 | 2,226,234 | 1,318,768 | 1,072,393 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් දර්ශකය (SAIDI) (විනාඩි/වර්ෂය) | 5965 | 6957 | 6503 | 7098 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් වාර දර්ශකය (SAIFI) (වර්ෂයකට/අතුරු බිඳුම්/පාරිභෝගිකයන්) | 109 | 50 | 69 | 56 |

*විදුලි ජාලයක් නොමැති වනාන්තර හා දූපත් හැර

### බෙදාහැරීමේ යටිතල ව්‍යුහය

| විස්තරය | ඒකක | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| **බෙදාහැරීමේ රැහැන්** | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | 11,048 | 9,757 | 7,232 | 4,595 | 32,633 |
| කි.වෝ. 11 | කි.මී. | 671 | 439 | 40 | 284 | 1,434 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | 46,709 | 42,276 | 32,183 | 28,199 | 149,366 |
| **යටිබිම් බහන්** | | | | | | |
| කි.වෝ. 33 | කි.මී. | 22 | 11 | 8 | 9 | 49 |
| කි.වෝ. 11 | කි.මී. | 703 | 141 | 5 | 29 | 878 |
| අඩු වෝල්ටීයතා | කි.මී. | 717 | 72 | 6 | 8 | 803 |
| **උපපොළ** | | | | | | |
| කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ | සංඛ්‍යාව | 48 | 34 | 12 | 40 | 134 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොළ | සංඛ්‍යාව | 11,734 | 10,240 | 6,339 | 5,163 | 33,476 |
| **වෙනත්** | | | | | | |
| අටළු අංගන | සංඛ්‍යාව | 38 | 95 | 42 | 38 | 213 |
| A/R | සංඛ්‍යාව | 190 | 407 | 59 | 44 | 700 |

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

## 2019 වර්ෂයේ සුවිශේෂ කාර්යසාධනයන්

| විස්තරය | ඒකක | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| අංශය විසින් මිලදී ගත් ඒකක | ගි.වො.පැ. | 4,371 | 4,936 | 2,671 | 2,084 | 14,062 |
| අංශය තුළ අලෙවි කළ ඒකක * | ගි.වො.පැ. | 4,045 | 4,522 | 2,449 | 1,910 | 12,926 |
| අලෙවි කළ ඒකකවලින් උපයාගත් ආදායම | ශ්‍රී ලං.රු.මි. | 73,704 | 70,861 | 39,143 | 31,522 | 215,230 |
| සාමාන්‍ය විකුණුම් මිල | ශ්‍රී ලං.රු. | 18.22 | 15.67 | 15.98 | 16.50 | 16.65 |
| බෙදාහැරීමේ හානිය | % | 7.5 | 8.4 | 8.3 | 8.3 | 8.1 |
| වර්ෂය තුලදී ලබාදුන් නව සම්බන්ධතා | සංඛ්‍යාව | 43,023 | 51,692 | 29,126 | 22,519 | 146,360 |

## මෙහෙයුම් දත්ත

### අයකුම වර්ගය අනුව ගිණුම් සංඛ්‍යාව - 2019

| අයකුමය | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,596,454 | 1,943,844 | 1,164,383 | 946,771 | **5,651,452** |
| ආගමික | 13,786 | 13,820 | 7,385 | 5,733 | **40,724** |
| කර්මාන්ත | 34,266 | 14,869 | 8,616 | 6,490 | **64,241** |
| හෝටල් | 117 | 144 | 60 | 149 | **470** |
| රාජ්‍ය | 149 | 2,863 | 54 | 1,508 | **4,574** |
| පොදු කාර්ය | 231,080 | 254,178 | 140,328 | 113,536 | **739,122** |
| කෘෂිකර්ම | 0 | 56 | 0 | 0 | **56** |
| එකතුව | **1,875,852** | **2,229,774** | **1,320,826** | **1,074,187** | **6,500,639** |

**මුළු පාරිභෝගික ගිණුම් සංඛ්‍යාවේ වසර පහක ප්‍රගතිය**




| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| බෙ.අ.1 | 1,586,805 | 1,701,790 | 1,782,105 | 1,832,829 | 1,875,852 |
| බෙ.අ.2 | 1,941,025 | 2,045,063 | 2,122,740 | 2,178,082 | 2,229,774 |
| බෙ.අ.3 | 1,156,923 | 1,214,109 | 1,260,090 | 1,291,700 | 1,320,826 |
| බෙ.අ.4 | 963,377 | 1,003,230 | 1,028,194 | 1,051,668 | 1,074,187 |

### අයකුම කාණ්ඩයට අනුව ආදායම - 2019

(ගි.වො.පැ.)

| අයකුමය | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,404 | 1,631 | 918 | 823 | **4,776** |
| ආගමික | 35 | 28 | 12 | 12 | **87** |
| කර්මාන්ත | 956 | 1,910 | 987 | 540 | **4,393** |
| හෝටල් | 114 | 72 | 7 | 78 | **271** |
| රාජ්‍ය | 82 | 67 | 21 | 31 | **201** |
| පොදු කාර්ය | 1,413 | 778 | 492 | 407 | **3,090** |
| වීථි ලාම්පු | 41 | 36 | 12 | 19 | **108** |
| කෘෂිකර්ම | 0 | 0.05 | 0 | 0 | **0.05** |
| එකතුව | **4,045** | **4,522** | **2,449** | **1,910** | **12,926** |

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

**අයකුම කාණ්ඩයට අනුව ආදායම - 2019**

(ශ්‍රී.ලං.රු.මි.)

| අයකුමය | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|
| ගෘහස්ථ | 21,586 | 21,941 | 12,198 | 11,788 | 67,513 |
| ආගමික | 265 | 199 | 81 | 90 | 635 |
| කර්මාන්ත | 14,272 | 27,785 | 14,581 | 8,017 | 64,654 |
| හෝටල් | 1,950 | 1,348 | 144 | 1,386 | 4,828 |
| රාජ්‍ය | 1,488 | 1,220 | 386 | 565 | 3,658 |
| පොදු කාර්ය | 34,144 | 18,367 | 11,753 | 9,677 | 73,941 |
| වීථි ලාම්පු | - | 0.9 | - | - | 0.9 |
| කෘෂිකර්ම | 0 | 0.6 | 0 | 0 | 0.6 |
| එකතුව | 73,704 | 70,861 | 39,143 | 31,522 | 215,230 |




## ප්‍රගති මිනුම්

### විදුලියනය සඳහා වූ ප්‍රවේශය

යම් දෙනලද පළාතක සාපේක්ෂව සරල හා ස්ථාවර විදුලි ප්‍රවේශයක් සහිත ජනතා ප්‍රතිශතය අදාළ පළාතේ සංවර්ධන මට්ටමට අනුව වෙනස් වේ. පළාත් දොළහ අතරින් කොළඹ නගර, බස්නාහිර පළාත උතුර, බස්නාහිර දකුණ I හා දකුණු පළාත 100% ක විදුලි ප්‍රවේශ මට්ටමක් සාක්ෂාත් කරගෙන ඇත.

විදුලියන කාර්යයෙහි පවත්නා ප්‍රයෝජන සැළකිල්ලට ගනිමින්, ආධාරක නියෝජිතායතන, ශ්‍රී ලංකා රජය හා ලං.වි.ම. විසින් ලබාදෙන ලද මූල්‍යමය කැපකිරීම් මගින් සාර්ථකත්වයක් සාක්ෂාත් කරගනු පිණිස ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.




2018 හා 2019 වසර අවසානයේදී පැවති විදුලියනය සඳහා ප්‍රවේශය

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

### වසර අවසානය වනවිට පැවති විදුලියන යෝජනාක්‍රම හා ව්‍යාප්තීන්

| අංශය | පළාත | යෝජනාක්‍රම | | ව්‍යාප්ති | |
|---|---|---|---|---|---|
| | | සපුරන ලද කාර්යයන් ගණන | පිරිවැය ශ්‍රී ලං.රු.මි. | සපුරන ලද කාර්යයන් ගණන | පිරිවැය ශ්‍රී ලං.රු.මි. |
| බෙ.අ.1 | උතුරු | 8 | 59.28 | 87 | 97.84 |
| | වයඹ | 8 | 13.57 | 316 | 64.3 |
| | උතුරු මැද | 2 | 7.77 | 36 | 24.59 |
| | කොළඹ නගර | - | - | - | - |
| බෙ.අ.2 | බස්නාහිර උතුර | 0 | 0 | 21 | 2 |
| | මධ්‍යම | 69 | 482 | 1085 | 570.6 |
| | නැගෙනහිර | 4 | 53.79 | 145 | 146.96 |
| බෙ.අ.3 | බස්නාහිර දකුණ II | 1 | 5.14 | 2 | 3.09 |
| | ඌව | 2 | 11.41 | 72 | 110 |
| | සබරගමුව | 0 | 0 | 38 | 30.52 |
| බෙ.අ.4 | බස්නාහිර දකුණ I | 0 | - | 20 | 7.55 |
| | දකුණු | 8 | 44.59 | 28 | 39.67 |

### ඉදිකිරීම් කටයුතු කාර්ය සාධනය

| පළාත | පළාත | අධි වෝල්ටියතා (කි.මී.) | අඩු වෝල්ටියතා (කි.මී.) | බෙදාහැරීමේ උපපොළ | අඩු වෝල්ටියතා රැහැන් වලට පරිවර්තනය (කි.මී.) | පිරිවැය ශ්‍රී ලං.රු.මි. |
|---|---|---|---|---|---|---|
| බෙ.අ.1 | උතුරු | 11.91 | 0.73 | 32 | 1.38 | 94.63 |
| | වයඹ | 84 | 157 | 236 | 88 | 1137.6 |
| | උතුරු මැද | 36.8 | 67.6 | 138 | 15.6 | 659.9 |
| | කොළඹ නගර | 28.82 | 16.19 | 29 | 0 | 822.73 |
| බෙ.අ.2 | බස්නාහිර උතුර | 25.43 | 122.22 | 51 | 341.95 | 634.59 |
| | මධ්‍යම | 841.41 | 2,941.78 | 698 | 1,481.34 | 7,126.95 |
| | නැගෙනහිර | 131.30 | 174.46 | 137 | 0.52 | 1,749.10 |
| බෙ.අ.3 | බස්නාහිර දකුණ II | 2.94 | 14.09 | 98.00 | 0.30 | 318.07 |
| | ඌව | 17.90 | 70.08 | 63.00 | 163.50 | 383.30 |
| | සබරගමුව | 28.29 | 60.91 | 72.00 | 18.29 | 294.77 |
| බෙ.අ.4 | බස්නාහිර දකුණ I | 7.6 | 64.4 | 58 | 116.4 | 550.6 |
| | දකුණු | 70.8 | 153.6 | 120 | 15.5 | 884.81 |

### බෙදාහැරීමේ අංශවල වහළ මත සවිකරන සූර්ය සේයා වෝල්ටීය විදුලිබල ජනක (PV)

ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා ශුද්ධ ධන (Net Plus) නමැති යෝජනාක්‍රම තුනක් යටතේ විදුලි පාරිභෝගිකයන් හට සිය පරිශ්‍රයන් තුළ නිවසේ වහළය මත සවි කරන ජනන යන්ත්‍රයක් මගින් විදුලිය ජනනය කොට ඔවුන්ගේ ජනන යන්ත්‍ර ලං.වි.ම. පද්ධතිය හා ඒකාබද්ධ කොට, බලශක්තිය පරිභෝජනය කරමින් ඒවා ලං.වි.ම. වෙතද ලබාදීම සඳහා අවකාශ සලසා ඇත.

| අයක්‍රමය | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 | එකතුව |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික (සංඛ්‍යාව)** | | | | | |
| ශුද්ධ මානනය | 3,112 | 1,955 | 2,018 | 1,752 | **8,837** |
| ශුද්ධ ගිණුම්කරණය | 2,146 | 1,674 | 1,220 | 1,555 | **6,595** |
| ශුද්ධ ධන | 274 | 147 | 158 | 147 | **726** |
| **එකතුව** | **5,532** | **3,776** | **3,396** | **3,454** | **16,158** |
| **ධාරිතාව (කි.වො.)** | | | | | |
| ශුද්ධ මානනය | 23,262 | 13,188 | 10,884 | 12,940 | **60,274** |
| ශුද්ධ ගිණුම්කරණය | 21,898 | 11,164 | 8,408 | 12,616 | **54,085** |
| ශුද්ධ ධන | 22,571 | 34,163 | 25,806 | 20,362 | **102,903** |
| **එකතුව** | **67,731** | **58,515** | **45,098** | **45,918** | **217,262** |

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

### ජාල ප්‍රවර්ධනයන්

සමාලෝචිත වර්ෂය තුළ බෙදාහැරීමේ ජාලය ප්‍රවර්ධනය කොට වැඩිදියුණු කරනු පිණිස බෙදාහැරීමේ අංශයේ ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාවන් විසින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී:

| විස්තරය | ඒකක | බෙ.අ.1 | බෙ.අ.2 | බෙ.අ.3 | බෙ.අ.4 |
|---|---|---|---|---|---|
| කි.වෝ. 33 කුළුනු රැහැන් ඉදිකිරීම | කි.මී. | 7.8 | 43.12 | 9.92 | 2.0 |
| ස්වයං ප්‍රතිවහන සහ LBSs ස්ථාපනය | සංඛ්‍යාව | 34 | 35 | 15 | 6 |
| කි.වෝ. 33 අටළු අංගන ඉදි කිරීම | සංඛ්‍යාව | 3 | 7 | 33 | 2 |
| ප්‍රාථමික උපපොළ ඉදිකිරීම | සංඛ්‍යාව | 6 | 0 | 0 | 2 |
| කි.වෝ. 33 යටිබිම් බහන් එළීම | කි.මී. | 0 | 5.5 | 0 | 0.45 |
| මානන තරාපැවි ස්ථාපනය | සංඛ්‍යාව | 5 | 43.12 | 0 | 4 |

## විශේෂ ව්‍යාපෘති හා කාර්යයන්

### සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය (LRT)

සැහැල්ලු දුම්රිය පද්ධතියේ බහුතර මාර්ග ප්‍රමාණයක් කොළඹ නගරය හරහා ගමන් කරයි. එබැවින්, දැනට පවත්නා යටිබිම් බහන් ජාලය වෙනස් කිරීමේ කාර්යය කොළඹ නගරය වෙත පැවරේ. මේවන විට කොළඹ නගර පළාත සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතියේ සැලසුම් කටයුතුවල සක්‍රීයව නිරතව සිටී.



යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග සිතියම

### කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව සම්පූර්ණ කරනු පිණිස කොළඹ නගර ඉංජිනේරුවෝ මේවන විට සිය තාක්ෂණික සහාය මධ්‍යම වෝල්ටීයතා විදුලිය බෙදාහැරීමේ ජාලයේ නිර්මාණ/විදුලි ඇඳීම්හි සමාලෝචනය හා විකුණුම්කරු සුදුසුකම් සමාලෝචනය සඳහා ලබා දෙමින් සිටිති.

### කොළඹ ප්‍රදේශයේ ප්‍රාථමික උපපොළ විශාලනය

රජයේ විදුලි කටයුතු දෙපාර්තමේන්තුව විසින් වසර 60කට පමණ ඉහතදී ප්‍රාථමික උපපොළ D මෙහෙවරෙහි යොදවන ලද අතර, එමගින් ආරෝග්‍ය ශාලා හා අධ්‍යාපනික ආයතනද ඇතුළත් කොළඹ 07, 08 හා 09 ප්‍රදේශයන්හි ඉල්ලුම සපුරාලනු ලබයි.

ඉහත සඳහන් ප්‍රදේශයනට ලබාදෙන විදුලියෙහි විශ්වසනීයත්වය සහතික කරනු පිණිස ශ්‍රී ලං.රු. මිලියන 650ක පිරිවැයක් දරමින් කි.වෝ. 11, කි.වෝ. 33 වහරු වාරන හා උපාංග සහිත මෙ.වෝ.ඇ. 16 තරාපැවි 3ක් ස්ථාපනය කරමින් ඉහත ප්‍රාථමික උපපොළ විශාලනය කිරීමේ කටයුතු කොළඹ නගර කාර්ය මණ්ඩලය විසින් සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

කොළඹ ප්‍රදේශයේ විදුලි සැපයුමෙහි පවත්නා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට අතිරේකව, ප්‍රාථමික උපපොළ A, I හා J හි ප්‍රදේශ ධාරිතා ප්‍රවර්ධන කටයුතුද වසර තුළ අවසන් කරන ලදී.

සේවයෙහි ගුණාත්මකභාවය වර්ධනය කරනු පිණිස නව යෙදවුම් හඳුන්වා දීම

අදාළ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන් අතර පාරිභෝගික සේවාවන් වැඩිදියුණු කොට එලදායී ලෙස පාරිභෝගික සේවාවන් කළමනාකරණය කරනු පිණිස පෝලිම් කළමනාකරණ ක්‍රමය (QMS) හා පාරිභෝගික සබඳතා කළමනාකරණ ක්‍රමය (CRMS) නාරම්මල ප්‍රදේශය තුළ දියත් කරන ලදී. නාරම්මල ප්‍රාදේශීය කාර්යාලය හා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ඇතුළත එලදායී ලේඛන කළමනාකරණය සඳහා ධාරා කළමනාකරණ ක්‍රමයද ආරම්භ කරන ලදී.



නාරම්මල ප්‍රාදේශීය කාර්යාලයෙහි අලුතින් හඳුන්වා දෙන ලද පද්ධති ආරම්භ කිරීම

### ඉංජිනේරු විගණනය/ආරක්ෂණ විගණනය: ශුන්‍ය බිඳ වැටීම්

විදුලි සැපයුමෙහි, මූල්‍ය විනයෙහි, මානව සම්පත් පරිචයන්හි හා තොරතුරු තාක්ෂණ පරිචයන්හි පවත්නා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් කොළඹ නගර පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ඉංජිනේරුවරුන් හා සෙසු කාර්ය මණ්ඩලයේද සහභාගිත්වයෙන් සාර්ථකව විගණන කාර්යයන් සිදු කරන ලදී.

### දැනුම හුවමාරු කරගැනීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන්

- සේවා නියුක්තිකයන්ගේ තාක්ෂණික දැනුම, මූල්‍ය /තොරතුරු තාක්ෂණ දැනුම, කළමනාකරණ කුසලතාවයන් හා ධනාත්මක චින්තන ආකල්ප ප්‍රවර්ධනය කරනු පිණිස කොළඹ නගර පළාත විසින් පුහුණු වැඩසටහන් 35ක් සංවිධානය කරන ලදී.

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)



කොළඹ නගර වැඩබිම්ගත පුහුණු වැඩසටහන

- 'අනතුරින් තොර වයඹක්' නමැති දැක්ම යථාර්ථයක් බවට පත් කරනු පිණිස වයඹ පළාත ඇතුළත 2018 වර්ෂය තුළ ආරක්ෂක කමිටුවක් ස්ථාපනය කරන ලදී. එක් එක් ප්‍රාදේශීය කාර්යාලයක ආදර්ශ පුහුණු වැඩබිම් ඉදිකිරීම, වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත ප්‍රකාර අනිවාර්ය ආරක්ෂක පරීක්ෂණ උපකරණ සැකසුම වැනි කාර්යයන් 2019 වසර තුළ ආරක්ෂක කමිටුව විසින් සිදු කරන ලදී.
- වයඹ පළාත් කාර්ය මණ්ඩලය වෙනුවෙන් වයඹ පළාත විසින් ආකල්ප සංවර්ධන, නායකත්ව හා කණ්ඩායම් ගොඩනැගීමේ වැඩසටහන් පවත්වන ලදී.
- පහත සඳහන් මාතෘකා ආවරණය කරනු පිණිස පුහුණු සහ මෙහෙයුම් සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාවන් විසින් පවත්වන ලද වාර්ෂික වැඩසටහන්වලට අමතරව, සේවා නියුක්තිකයන් වෙතින් ගුණාත්මක නිමැවුමක් ලබාගන්නා බවට සහතික කරගනු සඳහා බෙදාහැරීමේ අංශය 2 තුළ පුහුණු වැඩසටහන් 6ක් පමණ පවත්වන ලදී:

  - බෙදාහැරීම් බිම්ගතකරණය හා ක්‍රමික නඩත්තුව
  - ගිනි ආරක්ෂණය හා හදිසි අවස්ථාවන් සඳහා සූදානම්කාරිත්වය
  - මානව සම්පත් සංවර්ධනය හා ලං.වි.ම.හි නිවාඩු හා වෛද්‍ය කාර්ය පරිපාටීන්
  - ඵලදායකත්ව ප්‍රවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම
  - ගෝලීය ස්ථානගතකරණ ක්‍රමය (GPS) හා භූගෝලීය තොරතුරු ක්‍රමය (GIS)
  - බලශක්ති සංරක්ෂණය හා බලශක්ති කළමනාකරණය



වයඹ පළාත් ආදර්ශ පුහුණු වැඩබිම්

- බෙදාහැරීමේ අංශය 2 හි වාණිජ හා ආයතනික ශාඛාව වෙත අනුයුක්ත කාර්ය මණ්ඩලය වෙත තරු පන්තියේ ශ්‍රේණිගත කිරීමට අදාළ චක්‍රලේඛයන්හි යෝජිත පරීක්ෂණ හා විගණන කියාවලිය සිදු කිරීමේ පුහුණුවක් ලබාදෙන ලදී. අංශය තුළ පවත්නා පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පරීක්ෂාවන් 84ක් සිදු කිරීමට ශාඛාවට හැකිවූ අතර, 2 මට්ටම ඉක්මවූ තරු ශ්‍රේණිගත කිරීම් ලබාගනු පිණිස දියුණු කරගැනීමට අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලදී. මූලික පරීක්ෂාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, තරු පිරිනැමීමේ ක්‍රියාවලිය ආරම්භ කළ අතර එය මේ දක්වාද සිදු වෙමින් පවතී.
- ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ තාක්ෂණික කුසලතාවයන් හා සෞඛ්‍ය හා ආරක්ෂක දැනුම වැඩිදියුණු කරනු පිණිස බෙදාහැරීමේ අංශය 3 හි සබරගමුව පළාත් සමස්ත නුපුහුණු හා කම්බිමාර්ගකරු ශ්‍රේණියේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වෙනුවෙන් පහත සඳහන් තාක්ෂණික පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

  - රැහැන් ඉදිකිරීම හා නඩත්තුව
  - උපපොළ ඉදිකිරීම හා නඩත්තුව
  - ආරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය (වෘත්තීය ආරක්ෂාව)
  - නිරවද්‍ය රැළි සැකසුම් හා එතුම් ශිල්පක්‍රම
  - කොන්ක්‍රීට් කණු ඉදි කිරීම






උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය

## මෙහෙයුම් සමාලෝචනය

# ව්‍යාපෘති අංශය

# ව්‍යාපෘති අංශය

සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති අංශය විසින් ශ්‍රී ලං.රු.බිලියන 36ක් වටිනා ව්‍යාපෘති කළමනාකරණය කරමින් ක්‍රියාත්මක කරන ලද බැවින් 2019 වසර එම අංශයට තවත් අභියෝගාත්මක වසරක් විය.

අනාගත විදුලි ජනන ව්‍යාපෘතීන් සඳහා පවත්නා විකල්පයන් පිළිබඳ බොහෝ සංවාද මණ්ඩපයන් තුළ පුළුල් ලෙස සාකච්ඡා වී ඇති අතර ගෝලීය උණුසුම් වීම හා ඒ ආශ්‍රිත සෙසු ගැටලුද හේතුවෙන් එය අන් කවරදාකටත් වඩා හරිතමය පාර්ශ්වයට නැඹුරු විය යුතු බවට බලවත් සේ පෙන්වා දෙනු ලැබ ඇත. ඒ අනුව, ලං.වි.ම. විසින් අන් කවරදාටත් වැඩියෙන් හරිතමය ව්‍යාපෘතීන් කෙරෙහි සිය අවධානය යොමු කරමින් සිටී. ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති කටයුතු පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත:

## මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතිය (MWPP)

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) විසින් ශ්‍රී ලංකාවේ පළමු මහා පරිමාණ සුළං වැඩබිම මන්නාරම් දූපතේ දකුණු වෙරළෙහි ගොඩනැගීම සඳහා ඩෙන්මාර්කයේ ලෝක ප්‍රකට සුළං ටර්බයින නිෂ්පාදනායතනයක් වන Vestas Asia Pacific AS වෙත ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ (EPC) කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. මෙම ව්‍යාපෘතිය මෙ.වො. 3.45 බැගින් වූ නවීන තාක්ෂණයෙන් යුත් සුළං ටර්බයින 30කින් සමන්විත වන අතර, මෙම සුළං වැඩබිමෙහි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 103.5ක් වේ. මෙය වූකලි ශ්‍රී ලංකාවේ ප්‍රධාන මෝසම් සුළං පද්ධතීන්ගෙන් ප්‍රයෝජන ගනිමින් මහා පරිමාණ ස්වරූපයෙන් සුළං විදුලි බලය සංවර්ධනය කිරීමෙහි ලා ලං.වි.ම. විසින් ගන්නා ලද දිගු



සිදු කෙරෙන වැඩබිම් කටයුතු - ම.සු.වි. ව්‍යා.



ස්ථාපනය ක්‍රියාත්මක වෙමින් පවතින- ම.සු.වි. ව්‍යා.

කාලීන ප්‍රයත්නයක් ඵල දැරීමකි. මෙම ව්‍යාපෘතිය තුළ, පසුගිය සියවසෙහිදී ජලවිදුලි විභවය සම්බන්ධයෙන් ලං.වි.ම. කටයුතු කළ ආකාරයටම මහා පරිමාණ ආකාරයකින් සුළඟින් විදුලිය ලබාගැනීමට ආයතනය අපේක්ෂා කරයි.

මෙම සුළං වැඩබිම හා මන්නාරම හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ඒ ආශ්‍රිත සෙසු පහසුකම් සඳහාද අවශ්‍ය කෙරෙන අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ලද ණය මුදලක් මගින් සූදානම් කර ඇත.

මුල් තෙවසරක කාලය සඳහා ඩෙන්මාර්කයේ COWI AS සමගින් අත්සන් කරන ලද උපදේශන සේවා කොන්ත්‍රාත්තුවකද වගකීමේ සහතිකකරණ මෙහෙයුම් හා නඩත්තු කොන්ත්‍රාත්තුවකද (WOM contract) සහාය මෙම ව්‍යාපෘතියට ලැබේ. සුළං බලාගාරය සඳහා වන සමස්ත ආයෝජනය ඇ.ජ.ඩො.මි. 141කට ආසන්න වේ. මෙහෙවරෙහි යෙදවූ පසු, මන්නාරම සුළං වැඩබිම මගින් ජාතික ජාලය වෙත වාර්ෂිකව පිරිසිදු විදුලිය ඒකක මිලියන 380කට වැඩි ප්‍රමාණයක් සැපයිය හැක. මෙම ව්‍යාපෘතියෙන් නිපදවන විදුලියෙහි මිල කි.වො.පැයකට ඇ.ජ.ඩො. ශත 5.00කට අඩු වනු ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන වාසියක් වනුයේ ෆොසිල ඉන්ධන පදනම්ගත විදුලිය විශාල ප්‍රමාණයක් ඉවත් කොට වාර්ෂිකව පරිසරයට එමගින් මුදා හැරෙන කාබන්ඩයොක්සයිඩ් මෙට්‍රික් ටොන් 285,000ක විමෝචනය වළකාලිය හැකි වීමයි.

සුළං මගින් නිෂ්පාදිත විදුලිය ජාතික ජාලය තුළට ලබාදීමේ කටයුතු ප්‍රශස්තකරණය කොට පාලනය කිරීමේ උසස් සුළං පුරෝකථන පද්ධතියක සහායද ලැබෙන අර්ධ වශයෙන් පිටත්කල හැකි (semi dispatchable) විදුලි බලාගාරයක් ලෙස මන්නාරම සුළං වැඩබිම ක්‍රියාත්මක වනු ඇත. මෙය වූකලි යම් ආකාරයකින් පක්ෂීන් පියඹා විත් හැපී සිදුවිය හැකි අනතුරු වේනම් ඒවා වැළැක්වීම පිණිස තෝරාගත් අවස්ථාවන්හි සුළං තලබමන ක්‍රියා විරහිත කරවන පක්ෂි නිරීක්ෂක රේඩාර් පද්ධතියකට අමතරව පවත්නා පහසුකමකි.

අදාළ ජාල සහාය පහසුකම්ද සමගින් ජාතික ජාලය වෙත මහා පරිමාණ සුළං බලාගාර ඒකාබද්ධ කිරීමේ හැකියාව සොයා බැලීමේ කඩඉම් ව්‍යාපෘතියක් වශයෙන් මන්නාරම සුළං වැඩබිම ක්‍රියාත්මක වේ.

තවද, මෙම ව්‍යාපෘතිය 2020 වනවිට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති විදුලි ජනනයෙන් 20%ක් සාක්ෂාත් කරගැනීමේ රජයේ ප්‍රතිපත්තිය හා සමගාමීව සැලසුම් කර ඇත.

ව්‍යාපෘති කටයුතු 2019 මාර්තු මාසයේදී ආරම්භ විය. සියලු මූලික වැඩබිම් සංවර්ධන කටයුතු සම්පූර්ණ කොට ඇත. සුළං තලබමන උපකරණ සැලසුම්කරණය සම්පූර්ණ කොට බලාගාරය හා උපකරණ වැඩබිම කරා රැගෙන ඒම ත්‍රිකුණාමලය හා කොළඹ වරායන් හරහා සිදු වෙමින් පවතී. සුළං වැඩබිම සිවිල් කටයුතුවලට අතිරේක වශයෙන්, නව සේවා මාර්ග ඉදිකිරීම හා දැනට ව්‍යාපෘති ක්ෂේත්‍රයෙහි පවත්නා මාර්ග ජාලය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු වෙමින් පවතී. ව්‍යාපෘතිය 2020 නොවැම්බර් මාසය වනවිට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය (BHPP)

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යනු කැලණි නදියෙහි ගොඩනැගීමට සැලසුම් කර ඇති ගලන නදී දියෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත වර්ගයේ ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ දැනට පවත්නා පොල්පිටිය විදුලි බලාගාරයේ ජල විදුලි විභවයක් සහිත පහළ ධාරා ප්‍රදේශය බලගැන්වීමයි. ව්‍යාපෘතිය තුළ මෙ.වො. 35ක ස්ථාපිත ධාරිතාවයක් පවතිනු ඇත. ව්‍යාපෘතියේ ප්‍රධාන වැඩබිම් කිතුල්ගල නගරයට ආසන්නව කොළඹ ඊසාන දෙසට වන්නට කි.මී. 90ක පමණ දුරින් පිහිටා ඇත. ව්‍යාපෘතිය තුළට ඇතුළත් ප්‍රධාන අංග වනුයේ ප්‍රධාන වේල්ල, හැරවුම් වේල්ල, ප්‍රධාන උමග, හැරවුම් උමග, මෙ.වො. 17.5 ජනන යන්ත්‍ර ඒකක දෙකක් සහිත විදුලි බලාගාරය, ස්විච් අංගනය හා සම්ප්‍රේෂණ මාර්ගයද වේ. බ්‍රෝඩ්ලන්ඩ්ස් බලාගාරය මගින් වාර්ෂිකව විදුලි බලශක්තිය

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

ගි.වො.පැ. 126ක් පමණ ජනනය කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වුවද, කිතුල්ගල ප්‍රදේශයේ දිය මත ජල පහුරු ක්‍රීඩා කිරීමේ හැකියාව ආරක්ෂා කරනු පිණිස අඛන්ඩ හා ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් මුදා හැරීමටද ලංකා විදුලිබල මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් වාර්ෂික බලශක්ති ජනනයෙහි අඩුවීමක් සිදුවනු ඇත. ජනන ප්‍රමාණයෙහි අඩුවීම අවම කරනු පිණිස කුඩා ජල විදුලි බලාගාරයක් හරහා ජලය මුදා හැරීම සිදු කෙරේ.

අනුප්‍රාප්තික කොන්ත්‍රාත්කරු විසින් සකසන ලද අරමුදල් ලබාගනිමින් සැලසුම් නිර්මිත පදනම මත ව්‍යාපෘතිය



විදුලි බලාගාරය



ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2006 වර්ෂයේදී ලබා දෙන ලදී. සාර්ථක ලංසු තක්සේරුකරණයකින් අනතුරුව, ව්‍යාපෘතියේ ප්‍රධාන කොන්ත්‍රාත්කරු වශයෙන් China National Electric Equipment Corporation (CNEEC) ආයතනය තෝරා ගන්නා ලද අතර, කොන්ත්‍රාත් ගිවිසුම 2010 අවසානයේදී අත්සන් කරන ලදී. සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය එ.ජ.ඩො. මිලියන 82කි. අරමුදල්වලින් 85%ක ප්‍රමාණයක් චීන කර්මාන්ත හා වාණිජ බැංකුව (ICBC) විසින් ලබාදෙන අතර ඉතිරි ප්‍රමාණය හැටන් නැෂනල් බැංකුව වෙතින් ලබාගන්නා ලදී. බැංකු දෙකක් සමගින් ණය ගිවිසුම 2013 වසරේදී අත්සන් කරන ලදී. කොන්ත්‍රාත් ආයතනය වැඩබිම වෙත පැමිණ 2013 වසරේ අගෝස්තු මාසයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී.

ප්‍රධාන වේල්ලේ, ප්‍රධාන උමගේ, හැරවුම් උමගේ, විදුලි බලාගාරයේ හා වහරු අංගන වැඩබිමෙහිද ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. මේවන විට එහි භෞතික ප්‍රගතිය 70%ක් වන අතර, ව්‍යාපෘතිය 2021 ජනවාරි මාසයේදී සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය වූකලී ශ්‍රී ලංකාව තුළ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණ (CDM) යටතේ ලියාපදිංචිය ලද පළමු මහා පරිමාණ ජලවිදුලි බලාගාරය වේ.

## මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය (MHPP)

මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය යනු පසුගිය වසර 30කට වැඩි කාලයක් පුරා බොහෝ සෙයින් සම්පත් ප්‍රයෝජනයට ගතහැකි ස්ථාන උපයෝගී කරගෙන ඇති බැවින් ජලවිදුලිය ඉක්මවා ගොස් ඇති පොසිල ඉන්ධනගත විදුලිබල ජනනයේ කාර්ය භාරය අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ඇති ජලවිදුලි ව්‍යාපෘති කිහිපය අතරින් එකකි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වශයෙන් විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය (MoPE&BD) කටයුතු කරන අතර එය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වනුයේ ලංකා විදුලිබල මණ්ඩලයයි (CEB). මූල්‍යාධාර සැපයෙනුයේ ආසියානු සංවර්ධන බැංකුවෙනි (ADB). ව්‍යාපෘතිය මගින් මෙ.වො. 30.5ක ස්ථාපිත ධාරිතාවයක් සහිතව වාර්ෂිකව ගි.වො.පැ. 100ක බලශක්ති ප්‍රමාණයක් ජනනය කිරීමට අපේක්ෂිතය.

පරිපූරක පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ව්‍යාපෘති අනුමත කිරීමේ අධිකාරිය වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් අනුමත කරන ලදී. ව්‍යාපෘතිය සඳහා උපදේශකවරුන් පත්කරනු ලැබ එහි සැලසුම් හා අධීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.



බලපෑම ලක්වූවන් සඳහා සාදා නිමකළ නැවත පදිංචි කිරීමේ ගම්මානය



නව සේවායෝජක කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

A1කොටස හෙවත් මූලික කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්තුව 2018 මාර්තු මස වී.වී. කරුණාරත්න සහ සමාගම වෙත පිරිනමන ලදී. කාර්යාල ගොඩනැගිල්ල හා විදුලි බලාගාරය වෙත වූ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය පිළිවෙලින් 47%ක හා 73%ක අගයක් ගන්නා අතර, සමස්ත ප්‍රගතිය 20%ක් පමණ වේ.

A2 කොටස හෙවත් ප්‍රධාන සිවිල් කටයුතු සහ B කොටස හෙවත් යාන්ත්‍රික හා විදුලි පහසුකම් සඳහා වූ ලංසු පාවෙන්නට හරින ලදී. A2 සඳහා වූ ලංසුව අවසන් කරන ලද අතර, තක්සේරු කටයුතු සිදු වෙමින් පවත්නා අතර ඊ කොටස සඳහා වූ ලංසුව 2019 මැයි මාසයේදී අවසන් කෙරෙනු ඇත.

ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයන් (PAPs) සඳහා වූ නැවත පදිංචි කිරීමේ නිවාස යෝජනාක්‍රමය ඉදි කිරීමේ පළමු අදියර අවසන් කරන ලදී.



විදුලි බලාගාර යන්ත්‍ර ශාලා බිම වර්තමාන දර්ශනය

## උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය (UOHPP)

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (UOMDP) වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය (MOIWM) මගින් ක්‍රියාත්මක කරන ලද අතර එය මේවන විට මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ (MMAI&RD) විෂය පථය යටතට වැටේ.



ටර්බයිනය ස්ථාපනය කිරීම (ඒකකය)



පුහුල්පොල වේල්ල පිටාර ගැලීම



ප්‍රධාන උමං විදුම

ව්‍යාපෘතියේ විද්‍යුත් තාක්ෂණික කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික උපදේශන සේවාවන් සම්පාදනය කරනු පිණිස ලං.වි.ම. කාර්මික කාර්ය මණ්ඩලය වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත අනුයුක්ත කර ඇත.

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය තුළට උමා ඔය හරහා වේලි දෙකක් හා වැලිමඩ අතු ගංගාවක්, අන්තර් ද්‍රෝණි හැරවුම් උමඟ, මෙ.වො. 120 ස්ථාපිත ධාරිතාවයක් සහිත භූගත විදුලි බලාගාරය ඉදිකිරීම, හම්බන්තොට හා මොණරාගල දිස්ත්‍රික්කවල ඉඩම් හෙක්ටයාර් 5000ක් පමණ වගා කරනු පිණිස හා සෙසු පහළ නදී අවශ්‍යතාවයන් සඳහා ජලය ඝණ මීටර මිලියන 145ක් පමණ හරවා යැවීම ඇතුළත් වේ. අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිෂ්පාදනය ගි.වො.පැ. 290කි. විදුලි බලාගාරය කි.මී. 22.7ක් දිග කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයක් හරහා බදුල්ල කොටුමා උපපොළ සමගින් සම්බන්ධ කෙරෙනු ඇත.

2007 නොවැම්බර් මස 27වන දින ශ්‍රී ලංකා රජය (GOSL) වෙනුවෙන් ඛනිජතෙල් හා ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා හා ඉරාන ඉස්ලාම් ජනරජය (GIRI) වෙනුවෙන් එහි බලශක්ති අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමින් (MOU) අනතුරුව, 'උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය' ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීමේ (EPC) කොන්ත්‍රාත්තුවක් වශයෙන් විදේශීය කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කිරීමට 2008 අප්‍රේල් මන 28වන දිනැති, ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන ශ්‍රී ලංකා රජයේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය (MOIWM) හා ඉරානයේ FARAB Energy and Water Projects (FC) අතර අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.

ඒ අනුව, විදේශීය කොන්ත්‍රාත් ආයතනය විසින් ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු, සවිස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම සැකසීම, ද්‍රව්‍ය, උපකරණ, යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය සහ භෞතික ඉදිකිරීම්, ස්ථාපනය, පරීක්ෂා කිරීම් හා මෙහෙවරෙහි යෙදවීමේ කටයුතුද භාර ගන්නා ලදී. සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල එ.ජ.ඩො. 529,059,198 ක් වූ අතර, කොන්ත්‍රාත්තුව 2010 මාර්තු මස 15වන දින සිට ක්‍රියාත්මක විය.

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)



නාඩුකුඩා කි.වෝ. 220 ස්විච් අංගනයෙහි ඉදිකිරීම් කටයුතු

2010 මාර්තු 15වන දින ව්‍යාපෘතිය ආරම්භ කරන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබූ දිනය 2015 මාර්තු 15වන දිනය විය. අනපේක්ෂිත ලෙස ප්‍රධාන උමග තුළට ජලය ගලා යාම හා ඉන්පසු ඇතිවූ සමාජමය බලපෑම්ද හේතුවෙන්, ව්‍යාපෘතිය අවසන් කිරීමේ (ඉදිකිරීම් හා ක්‍රියාත්මක කිරීම්) දිනය 2019 දෙසැම්බර් මස 31වන දින දක්වා දිගු කරන ලද අතර, ව්‍යාපෘති කාලය (දෝෂ හා බැරකම් කාල සීමාවද සහිතව) 2020 දෙසැම්බර් මස 31වන දින දක්වා දීර්ඝ කෙරිණි. කෙසේ වුවද, දැනට පවත්නා කාල වැඩසටහන්කරණයට අනුව, මෙහෙවරෙහි යෙදවීමේ දිනය 2020 සැප්තැම්බර් මාසයට යොදාගෙන ඇත. 2019 වසර අවසානය වනවිට ව්‍යාපෘතියේ ප්‍රගතිය 93.75% ක් විය.

## හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (දෙවන අදියර)

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (දෙවන අදියර) තුළ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍යම වෝල්ටීයතා ජාලයෙහි ධාරිතා හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා සුහුරු ජාල හා මනුකරණ නියාමන අනු ව්‍යාපෘතියක්ද ඇතුළත්ව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණයද (DSM) අන්තර්ගත වේ.

මෙම ව්‍යාපෘති විෂය පථය තුළට 2020දී අවසන් කෙරෙනු ඇත්තාවූ යෝජිත සුළං විදුලිබල ව්‍යාපෘතියෙන් ජනනය කෙරෙන බලශක්තිය සම්ප්‍රේෂණය කරනු පිණිස මන්නාරමේ කි.වෝ. 220ක සම්ප්‍රේෂණ සංවර්ධන කාර්යයක්ද, කි.වෝ. 220 පොල්පිටිය-හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය සහ හම්බන්තොට කොටුමා උපපොළ ඉදිකිරීම හා හොරණ - පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය හා හබරණ - වාලච්චේන කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ දෙවන පරිපථ එළීම, කොළඹ ඊ කි.වෝ. 132/33 කොටුමා උපපොළ ඉදිකිරීම, දෙහිවල, හොරණ, පාදුක්ක, කොළොන්නාව, මාදම්පේ, කොටුගොඩ කොටුමා උපපොළයන් විශාලනය, බියගම කොටුමා උපපොළෙහි කි.වෝ. 220/33 ධාරිතා ප්‍රවර්ධනය, අනුරාධපුර ප්‍රදේශයේ හා කුරුණෑගල ඇතුගල ප්‍රදේශයේ මැදි වෝල්ටීයතා බෙදාහැරුම් කාර්ය ප්‍රවර්ධනය, කප්පල්තුරේ-චීන වරාය, ඇඹිලිපිටිය - වැනිවරල හා මතුගම-බෙන්තොට කි.වෝ. 33 මාර්ග ඉදිකිරීම ඇතුළත් වේ. මෙතුළට රත්තනපිටිය ප්‍රාථමික උපපොළ ඉදිකිරීම හා ඇතුල් කෝට්ටේ හා බෙලිගල ප්‍රාථමික උපපොළයන් විශාලනයද ඇතුළත් වේ. ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය තුළට සුහුරු මනු ස්ථාපන කටයුතුද ඇතුළත් වේ.

ඌව පළාත හැර ශ්‍රී ලංකාවේ සියලුම පළාත් මෙම වැඩසටහනෙහි සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ අංගය ක්‍රියාත්මක කිරීම තුළින් සෘජුවම ඵල ප්‍රයෝජන ලබනු ඇත.

දෙවන වාරිකයෙහි සමස්ත පිරිවැය එ.ජ.ඩො.මි. 260කි. ආසියානු සංවර්ධන බැංකුව විසින් එ.ජ.ඩො.මි. 150ක් හා AFD විසින් එ.ජ.ඩො. මි. 30ක්ද සපයනු ඇති අතර ඉතිරිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් සපයනු ඇත. ආසියානු සංවර්ධන බැංකුව හා ලං.වි.ම. අතර ණය ගිවිසුමට 2016 දෙසැම්බර් මස 27වන දින අත්සන් තබන ලද අතර, ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට අපේක්ෂිතය. 2019 වසර අවසානය වනවිට, සියලු සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘති අංග පිරිනමනු ලැබ ඉදිකිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

## ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය (NTDND & EIP)

### ව්‍යාපෘතියේ අංග ලක්ෂණ හා අරමුදල්කරණ මූලාශ්‍රය

මෙම ව්‍යාපෘතිය සඳහා ණය අංක SLP 113 යටතේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) මගින් අරමුදල් සපයනු ලබන අතර පැකේජයන් හතරක් අන්තර්ගත වේ.

පැකේජය 01 කි.වෝ. 132/කි.වෝ. 220/කි.වෝ.400 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම සඳහා වේ. පැකේජය 02 කි.වෝ. 220/132 කිරිඳිවැල ස්විච් පොළ, කි.වෝ. 132/33 කිරිඳිවැල කොටුමා උපපොළ, කි.වෝ. 132/33 බත්තරමුල්ල ගෘහස්ථ උපපොළ ඉදිකිරීම හා දැනට පවත්නා කොටුමා උපපොළ කිහිපයක විශාලන කටයුතු සඳහාද වේ. පැකේජය 03 කි.වෝ. 132/ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම (කොත්මලේ කොටුමා උපපොළේ සිට නව පොල්පිටිය කොටුමා උපපොල දක්වා වූ කි.වෝ. 220 රැහැන හා පොල්පිටිය කොටුමා උපපොළේ සිට නව හබරණ කොටුමා උපපොළ දක්වා වූ කි.මී. 132 රැහැන) සඳහාද පැකේජය 04 දෙහිවල, ගල්කිස්ස හා බත්තරමුල්ල ප්‍රදේශයන්හි ප්‍රාථමික උපපොළ, අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම් / දත්ත උකහා ගැනුම් සහිත කි.වෝ. 11 කේබල්ද ඉදිකිරීම සඳහා වේ.

### වර්තමාන තත්ත්වය

පැකේජ 01, 02 හා 03 සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් දැනටමත් අත්සන් කොට ඇති අතර 2019 වසර අවසානය වනවිට පැකේජය 02 හා පැකේජය 03 සඳහා පැවති භෞතික ප්‍රගතිය පිළිවෙලින් 14%ක් හා 13%ක් විය. ව්‍යාපෘතියේ පැකේජය 04 සඳහා කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ යුතුව ඇත.

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

## මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සහ හානි අවමකරණ ව්‍යාපෘතිය (GCT&DLRP)

### ව්‍යාපෘතියේ ලක්ෂණ හා අරමුදල්කරණ මූලාශ්‍රය

මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය විශ්වසනීයත්වය වැඩිදියුණු කරමින්, පද්ධතිමය හානි අවම කරමින් කොළඹ නගරයේ සැලසුම් කර ඇති මහා සංවර්ධන කටයුතු හේතුකොට වර්ධනය වන විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස මහ කොළඹ ප්‍රදේශයේ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාලය බලගැන්වීම පිණිස සැලසුම් කරන ලද්දකි. ව්‍යාපෘති විෂය පථය යටතේ, නව කි.වෝ. 220 යටිබිම් සම්ප්‍රේෂණ බහන් ජාලය මගින් මහ කොළඹ විදුලිබල ජාලයේ ධාරිතාවය දෙගුණ කර ඇත. තවද, නව කොටුමා උපපොළයන් තුනක් ඉදිකිරීම, පවත්නා කොටුමා උපපොළ පහක් විශාලනය, කොටුමා උපපොළ දෙකක් පුළුල් කිරීම, යටිබිම් සම්ප්‍රේෂණ බහන් මාර්ග දිග කි.මී. 34ක් එළීම, යටිබිම් බෙදාහැරීමේ බහන් මාර්ග දිග කි.මී. 31ක් එළීම, නව කි.වෝ. 11 බෙදාහැරීමේ පැනල 88ක් ස්ථාපනයද මගින් ව්‍යාපෘතිය විසින් දැනට පවත්නා විදුලිබල ජාලය වැඩිදියුණු කරන ලදී.



කොළඹ L කොටුමා උපපොළ

එයට අමතරව, ව්‍යාපෘතිය මගින් බෙදාහැරීමේ ජාලයන්හි නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය විශේෂ වාහනද සම්පාදනය කරන ලදී.



කැළණිතිස්ස කි.වෝ. 33 GIS

### වර්තමාන තත්ත්වය

පැකේජ තුනෙහිම කාර්ය විෂය පථය සපුරා ඇති අතර මේවන විට දෝෂ වගකීම් කාල සීමාව පසුකරමින් පවතී. ගාස්තු මුදා හැරීම හ දෝෂ හෙළිකර ගැනීමේ කටයුතු සිදුවෙමින් පවතී.

## පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය (REATDP)

### ව්‍යාපෘති ලක්ෂණ හා අරමුදල්කරණ මූලාශ්‍රය

සංවර්ධනය කළ යුතුව පවත්නා බොහෝ කුඩා ජලවිදුලි බලාගාර මාලිබොඩ, දැරණියගල, බලන්ගොඩ, රත්නපුර, පදියපැළැල්ල, රජගල, නුවර එළිය හා කොත්මලේ ප්‍රදේශයන්හි ස්ථානගතව ඇත. කෙසේ වුවද, ඉහත ප්‍රදේශයන්හි ස්ථානගතව දැනට පවත්නා කොටුමා උපපොළයන් වෙත කුඩා ජල විදුලි බලාගාරයන්හි ධාරිතාවය අවශෝෂණ කටයුතු කරගැනීම දැනටමත් සීමාව ඉක්මවා ගොස් ඇත. එබැවින්, නව පුනර්ජනනීය බලශක්තිය ජාතික ජාලය වෙත අවශෝෂණය කරගැනීම සඳහා පහසුකම් සලසා මධ්‍යම හා සබරගමුව පළාත්හි වර්ධනය වෙමින් පවත්නා විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, හා රාගල ප්‍රදේශයන්හි නව කොටුමා උපපොළයන් හා ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදි කිරීමට තීරණය කර ඇත.

පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතියේ කාර්ය විෂය පථය තුළට කි.වෝ. 132/33, 2 × 31.5 මෙ.වෝ.ඇ. කොටුමා උපපොළ හතර (මාලිබොඩ, රාගල, වේවැල්පත්ත සහ නාවල) හා සම්පූර්ණ දිග කි.මී. 45ක් වන පරිදි ආශ්‍රිත කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම අතුළත් වේ. පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය Agence Francaise Development (AFD) හා ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වේ. (නිමවා භාරදෙන කොන්ත්‍රාත්කරුවන්ගෙන් තොරව) මෙම ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පහළවක් (15) සඳහා භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරමින් සෘජුවම ලං.වි.ම. විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

### වර්තමාන තත්ත්වය

2018 වසර අවසානය වනවිට කොන්ත්‍රාත් පහළවම පිරිනමා අවසන්ව ඇත. කොටුමා උපපොළයන්හි ඉදිකිරීම් කටයුතු 2018 ජනවාරි මස ආරම්භ කළ අතර සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම් කටයුතු 2018 අප්‍රේල් මස ආරම්භ කරන ලදී. කොටුමා උපපොළයන් හතරේම සිවිල් හා ඉදිකිරීම් කටයුතු මුළුමනින්ම පාහේ නිමවා ඇති අතර, 2019 අගෝස්තු මාසයේදී මෙහෙවරෙහි යෙදීමේ කටයුතු ආරම්භ කෙරිණි. සම්ප්‍රේෂණ රැහැන්හි කුලුනු අත්තිවාරම් ඉදිකිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් මාසයේදී අවසන් කරන ලදී. කුලුනු ඉදිකිරීම හා සන්නායක එළීම 2019 වසරේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘති කටයුතු 2020 වසරේ 4වන කාර්තුව තුළ සම්පූර්ණ කිරීමට නියමිතය.

## විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය (PSRSP)

### ව්‍යාපෘති ලක්ෂණ හා අරමුදල්කරණ මූලාශ්‍රය

රටෙහි සංවර්ධනය හා අනුගත වෙමින් විශ්වසනීය හා ස්ථාවර විදුලිබල පද්ධතියක් පවත්වාගනු පිණිස සම්ප්‍රේෂණ පද්ධතියේ අවශ්‍ය විදුලි ගැලුම් අවශ්‍යතා නංවාලනු පිණිස විදුලිබල පද්ධතිවල විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ කොටුමා උපපොළයන් හා සම්ප්‍රේෂණ රැහැන් ඉදි කිරීමට සම්ප්‍රේෂණ සැලසුම්කරණ ශාඛාව විසින් යෝජනා කර ඇත. ඒ සඳහා 2021 වර්ෂය තුළ ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සැපයීමට නියමිත අතර සමස්ත ණය මුදල ඇ.ඩ.ඩො.මි. 200ක් වනු ඇත.

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

එයට පහත කරුණු ඇතුළත් වේ:

1. වාරියපොල කි.වෝ. 220/කි.වෝ. 132 වහරු මහපොළක්, මීරිගම කි.වෝ. 220 වහරු මහපොළක්, කොටදෙණියාවේ හා කොටුගොඩ කි.වෝ. 220/කි.වෝ. 33 කොටුමා උපපොළයන්, තිස්සමහාරාමයේ, බද්දේගම, හෝමාගම, මීගමුව, වාරියපොල, පෑලියගොඩ, කලවාන කි.වෝ. 132/කි.වෝ.33 කොටුමා උපපොළ, මහනුවර කි.වෝ. 132/කි.වෝ.33 කොටුමා උපපොළක් ඉදිකිරීම.

2. කි.වෝ. 132/කි.වෝ. 33 ඇඹිලිපිටිය හා මාතර උපපොළයන් විශාලනය, නව අනුරාධපුර, කුරුණෑගල, මාතර හා හම්බන්තොට කොටුමා උපපොළයන්හි කි.වෝ. 132 අංගන ඉදිකිරීම.

3. මාතර-හම්බන්තොට, නව අනුරාධපුර-නව හබරණ, හම්බන්තොට - තිස්සමහාරාම, කුරුණෑගල-වාරියපොළ දකුණ, වාරියපොළ දකුණ - වාරියපොළ, වාරියපොල දකුණ - කුරුණෑගල හා කුකුලේ - කලවාන ඇතුළත්ව කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග කි.මී. 250ක් පමණ ඉදිකිරීම.

### වර්තමාන තත්ත්වය

ව්‍යාපෘතිය 2019 වසරේදී ආරම්භ වූ අතර 2023 වසර වනවිට සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. උපපොළයන් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන ඇති අතර, මේවන විට ඉඩම් ලබාගැනීමේ කටයුතු සිදු වෙමින් පවතී. මාර්ග සමීක්ෂණය, පස් පරීක්ෂාව සිදු කෙරෙමින් පවතී.

## සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව

සම්ප්‍රේෂණ ව්‍යාපෘති ශාඛාව විසින් 2019 වසර තුළ පූර්ණ වශයෙන්ම විශේෂ ව්‍යාපෘති කටයුතුවල නියැළිණි. වසර තුළ එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධ කෙටි විස්තරයක් පහත දී ඇත:

### පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය

#### අරමුදල්කරණ මූලාශ්‍රය

ආසියානු සංවර්ධන බැංකුව විසින් පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ සියලු පැකේජයන් සඳහා අරමුදල් සපයනු ලබයි. 2019 වසර තුළ නොකඩවා ක්‍රියාත්මක වූ පැකේජයන් පහත පරිදි වේ:

#### පැකේජය 1: මන්නාරම සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතිය ඉදිකිරීම

මන්නාරම සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතියේ විෂය පථය කි.වෝ. 220/කි.වෝ. 33 මන්නාරම කොටුමා උපපොළ ඉදිකර, මන්නාරම-වව්නියාව - නව අනුරාධපුර කි.වෝ. 220 කි.මී. 130 සම්ප්‍රේෂණ රැහැන් ඉදිකරමින් එය ජාතික ජාලයට සම්බන්ධ කිරීම දක්වා වෙනස් කොට ඇත. මෙම ඉදිකිරීම තුළින් මන්නාරම ප්‍රදේශයේ සුළං විදුලි බලය එහි පූර්ණ විභවතාවයෙන් සංවර්ධනය කිරීමේ හැකියාව ලබාදෙනු ඇත.

#### වර්තමාන තත්ත්වය

සියලු ඉදිකිරීම් කටයුතු 2019 වසර තුළ සම්පූර්ණ කරන ලදී.

#### පැකේජය 2: කි.වෝ. 32 සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතියේ ඉදිකිරීම 1

කි.වෝ. 132 සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතියේ විෂය පථය තුළට කෑගල්ලේ කි.වෝ. 132/33 කොටුමා උපපොළයන් ඉදිකර එය කි.මී. 22ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැනක් මගින් සම්බන්ධ කිරීම ඇතුළත් වේ. තවද, එතුළට පොල්පිටිය - නව පොල්පිටිය, අතුරුගිරිය - පාදුක්ක කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම, අතුරුගිරිය සිට කොලොන්නාව දක්වා වූ කි.මී. 15 සම්ප්‍රේෂණ මාර්ග නැවත ඉදිකිරීම හා මෙ.වෝ.ඇ. 160 ධාරිත්‍රක බැංකු දැනට පවත්නා කොටුමා උපපොළයන් 7ක ස්ථාපනයද ඇතුළත් වනු ඇත.

#### වර්තමාන තත්ත්වය

පොල්පිටිය - නව පොල්පිටිය මාර්ගය 2017 නොවැම්බරයේදී බලගන්වන ලද අතර, අතුරුගිරිය - කොලොන්නාව මාර්ගය නැවත ඉදිකිරීම් කටයුතු සඳහා මුදා නොහළ බැවින් එම මාර්ගයේ නැවත ඉදිකිරීම් කටයුතු නතරවී ඇත. අන් සියලු ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී.

#### පැකේජය 3: කි.වෝ. 220 සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ව්‍යාපෘතිය ඉදිකිරීම

කි.වෝ. 220 යටිතල පහසුකම් ව්‍යාපෘතිය පොල්පිටිය හා පාදුක්ක කි.වෝ. 220/132/33 නව කොටුමා උපපොළයන් හා පොල්පිටිය - නව පොල්පිටිය - පාදුක්ක -පන්නිපිටිය කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම යන කටයුතුවලින් සමන්විත වේ. සම්ප්‍රේෂණ පද්ධතිය මගින් බස්නාහිර පැටවුම් මධ්‍යස්ථානයන් හා ලක්ෂපාන සංකීර්ණය අතර මනා විදුලිය හුවමාරුවකට හැකියාව ලබාදෙනු ඇත.

#### වර්තමාන තත්ත්වය

පාදුක්ක හා පන්නිපිටිය කොටුමා උපපොළයන් අතර සම්ප්‍රේෂණ රැහැන එළීම හැර අන් සියලු ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදී.

### හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන (අදියර 1) කොටස 2 - සම්ප්‍රේෂණය

#### ව්‍යාපෘතියේ ලක්ෂණ හා අරමුදල්කරණ මූලාශ්‍ර

මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව විසින් (එ.ජ.ඩො.මි. 23.9) අරමුදල් සපයන අතර සම මූල්‍ය සම්පාදකත්වය AFD (එ.ජ.ඩො.මි. 30.0) විසින් දරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය, කටුනායක, නව අනුරාධපුර කි.වෝ. 132/33 කොටුමා උපපොළ හා කෙරවළපිටිය කි.වෝ. 220/33 කොටුමා උපපොළ විශාලනයන් දැනටමත් සම්පූර්ණ කොට මෙම වසර තුළ වාණිජමය වශයෙන් බලශක්තිකරණය කරන ලදී.

තවද, කප්පල්තුරෙයි, අනුරාධපුර, කළුතර හා කැස්බෑව කොටුමා උපපොළයන් ආශ්‍රිත සම්ප්‍රේෂණ රැහැන් සම්පූර්ණ කොට මෙම වසර තුළ බලශක්තිය ලබාදෙන ලදී.

#### වර්තමාන තත්ත්වය

අනුරාධපුර, කළුතර හා කැස්බෑව නව කි.වෝ. 132/33 කොටුමා උපපොළයන් හා කප්පල්තුරෙයි කි.වෝ. 220/කි.වෝ.33 කොටුමා උපපොළ ඉදි කෙරෙමින් පවතී. මෙම කොටුමා උපපොළයන් 2020 වසර තුළ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිතය.

## සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති ශාඛාව

### කොටුමා උපපොළ ඉදිකිරීම් ව්‍යාපෘති ඒකකය

කොටුමා උපපොළ ඉදිකිරීම් ව්‍යාපෘති ඒකකය යටතේ සම්පූර්ණ කරන ලද හා කටයුතු සිදු කෙරෙමින් පවත්නා ව්‍යාපෘති පහත පරිදි වේ:

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

## සපුගස්කන්ද කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂකයන් ඉදිකිරීම

### ව්‍යාපෘතියේ ලක්ෂණ

පවිත්‍ර බලශක්ති හා ජාල ප්‍රවර්ධන ව්‍යාපෘතිය - පැකේජය 02 (CENEIP – P2) මගින් සපුගස්කන්ද කොටුමා උපපොළෙහි ධාරිත්‍රක බැංකු ස්ථාපනය හා සමාන්තරව, උපපොළෙහි කි.වෝ. 33 පෝෂක අංගන දෙකක් ඉදිකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

### වර්තමාන තත්ත්වය

ව්‍යාපෘතිය 2019 පෙබරවාරි මස සම්පූර්ණ කරන ලදී.

## නව අනුරාධපුර කොටුමා උපපොළෙහි කි.වෝ. 220 රැහැන් අංගන දෙකක් ඉදිකිරීම

### ව්‍යාපෘතියේ ලක්ෂණ

මන්නාරම කොටුමා උපපොළෙහි සිට වවුනියාව කි.වෝ. 220 කොටුමා උපපොළ හරහා නව අනුරාධපුර කොටුමා උපපොළින් අවසන්වන කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම අදාළ මෙහෙයුමෙහි විශ්වසනීයත්වය හා නම්‍යශීලිත්වය ප්‍රවර්ධනය කරනු පිණිස කොටුමා උපපොළ ඉදිකිරීම් ව්‍යාපෘති ඒකකය වෙත පවරන ලදී.

### වර්තමාන තත්ත්වය

ව්‍යාපෘතිය 2019 වසර තුළ සම්පූර්ණ කරන ලදී.

## පන්නල කොටුමා උපපොළ විශාලනය.

### ව්‍යාපෘතියේ ලක්ෂණ

පන්නල කොටුමා උපපොළ විසින් මෑතක සිට පන්නල ප්‍රදේශය අවටින් වර්ධනය වන අනපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලනු පිණිස තවත් කි.වෝ. 132/33, මෙ.වෝ.ඇ.31.5 තරාපැවියක් එක් කරමින් පන්නල කොටුමා උපපොළ විශාලනය කිරීමට යෝජිතය. පන්නල අවටින් වර්ධනය වන මෙකී විදුලි ඉල්ලුම් ප්‍රධාන වශයෙන් කර්මාන්ත කළාපය තුළ ඉදිවන කර්මාන්ත ශාලාව සඳහා තොග විදුලි සැපයුම් සම්බන්ධතා හා ක්‍රියාත්මක කෙරෙන ජාතික සංවර්ධන ව්‍යාපෘති සඳහාද වේ. සමස්ත වියදම ශ්‍රී ලං.රු.මි. 65කි.

### වර්තමාන තත්ත්වය

ව්‍යාපෘතිය 2019 නොවැම්බර් මාසයේදී සම්පූර්ණ කරන ලදී.

## MVAr 100 ප්‍රතිචාරකයක් නව අනුරාධපුර කොටුමා උපපොළෙහිද MVAr 50 ප්‍රතිචාරකයකන් මන්නාරම ජාල පොළෙහිද ස්ථාපනය

### ව්‍යාපෘතියේ ලක්ෂණ

කොටුමා උපපොළ ඉදිකිරීම් ව්‍යාපෘති ඒකකය යටතේ, සම්ප්‍රේෂණ මාර්ග ආරෝපණය හේතුකොට ඇතිවන අතිරේක ප්‍රතිචාරක බලය හේතුවෙන් නිශ්චිත අගය ඉක්මවා යන කි.වෝ. 220 පද්ධතිමය වෝල්ටීයතාවය පවත්වාගෙන යනු පිණිස නව අනුරාධපුර කොටුමා උපපොළෙහි MVAr 100 ප්‍රතිචාරකයක් හා මන්නාරම කොටුමා උපපොළෙහි MVAr 50 ප්‍රතිචාරකයන්ද ස්ථාපනය ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 1,374.69කි.

## වගවත්ත කොටුමා උපපොළ ඉදි කිරීම

### වර්තමාන තත්ත්වය

මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර 2021 මාර්තු මාසයේදී අවසන් කෙරෙනු ඇත.

### ව්‍යාපෘතියේ ලක්ෂණ

බස්නාහිර පළාතේ පිහිටි වගවත්ත හා මිල්ලනිය ප්‍රදේශ මහා පරිමාණ කාර්මික සංවර්ධන ව්‍යාපෘති සඳහා උපාය මාර්ගික ස්ථාන වශයෙන් හඳුනාගෙන ඇත. වගවත්ත කර්මාන්ත කළාපය සඳහා මෙ.වෝ.ඇ. 30 විදුලි සැපයුමක්ද, මිල්ලනිය යෝජිත කර්මාන්ත කළාපය සඳහා මෙ.වෝ.ඇ.25ක විදුලි සැපයුමක්ද ලබාදෙන ලෙස ආයෝජන මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා ඇත. මෙම කර්මාන්ත කලාප එකිනෙකින් කි.මී. 15-20 පමණ දුරකින් පිහිටි බැවින්, ඉඩම් පැවතීම හා සෙසු මූලික යටිතල පහසුකම්ද සැලකිල්ලට ගනිමින් නව කොටුමා උපපොළ වගවත්ත ප්‍රදේශයෙහි ඉදිකිරීමට තීරණය කරන ලදී. වගවත්තෙහි නව කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබාදීමට ආයෝජන මණ්ඩලය එකඟ වී ඇත. නව වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම සඳහා වැයවනු ඇතැයි ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 1898කි.

### වර්තමාන තත්ත්වය

මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර එය 2021 දෙසැම්බර් මාසයේදී අවසන් වනු ඇත.

## නව පොල්පිටිය වහරු අංගනයෙහි කි.වෝ. 220 ද්විත්ව බැරයටි සම්ප්‍රේෂණ මාර්ග අංගනයන් දෙකක් ඉදිකිරීම

### ව්‍යාපෘතියේ ලක්ෂණ

හම්බන්තොට කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය නව පොල්පිටිය ජාල පොළ වෙත සම්බන්ධ කරනු පිණිස කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග අංගනයන් දෙකක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

### වර්තමාන තත්ත්වය

මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර 2020 ඔක්තෝබරයේදී අවසන් කෙරෙනු ඇත.

## රත්මලාන කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක අංගන දෙකක් (02) ඉදිකිරීම

### ව්‍යාපෘතියේ ලක්ෂණ

යෝජිත කරන්දෙනිය විදුලි ව්‍යාපෘතියේ සිට ජාතික ජාලය දක්වා මෙ.වො. 10 විදුලිය සම්බන්ධ කරනු පිණිස, රත්මලානේ කොටුමා උපපොළෙහි දැනට පවත්නා කි.වෝ. 33 වායු පරිවෘත වහරුපන්න අතිරේක අංගන දෙකක් (02)ද සහිතව පුළුල් කෙරෙනු ඇත. ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 147.9කි.

### වර්තමාන තත්ත්වය

මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු වෙමින් පවතී.

## කැළණිතිස්ස කි.වෝ. 132 ගෑස් පරිවරණිත පද්ධතිය පුළුල් කිරීම

### ව්‍යාපෘතියේ ලක්ෂණ

කැළණිතිස්ස නව වායු තලබමන ව්‍යාපෘතිය යටතේ වායු තලබමන තුනක් (03) සම්බන්ධ කරනු පිණිස කැළණිතිස්ස කි.වෝ. 132 ගෑස් පරිවරණිත පද්ධතිය පුළුල් කිරීමේ කටයුතු සිදු කරන ලදී. ඇස්තමේන්තුගත පිරිවැය ශ්‍රී ලං.රු.මි. 465කි.

### වර්තමාන තත්ත්වය

මෙම ව්‍යාපෘතියේ කටයුතු සිදු වෙමින් පවතී.

## සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති (TLCP) ඒකකය

සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති ඒකකය යටතේ සම්පූර්ණ කරන ලද හා සිදු කෙරෙමින් පවත්නා කටයුතු පහත පරිදිය.

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

## නව හලාවත - පන්නල කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදි කිරීම

*ව්‍යාපෘතියේ ලක්ෂණ*

බෝලවත්ත කොටුමා උපපොළේ සිට නව හලාවත කොටුමා උපපොළ දක්වා වූ කි.වෝ. 132 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ රැහැන බහබිං සන්නායක සහිත ඒකක් වන අතර 1963 වසරේදී ඉදිකරන ලද්දකි. රැහැනෙහි ධාරිතාවය හා විශ්වසනීයත්වය ප්‍රවර්ධනය කරනු පිණිස, නව හලාවත - බෝලවත්ත කි.මී. 22ක් වූ කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන් අංශය ද්විත්ව පරිපථ, Zebra සම්ප්‍රේෂණ රැහැන් සහිතව වැඩිදියුණු කළ යුතු බවට යෝජනා විය.



*වර්තමාන තත්ත්වය*

ඉහත ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක කරන ලදී. නව හලාවත කොටුමා උපපොළේ සිට පන්නල කොටුමා උපපොළ දක්වා වූ කි.වෝ. 132 රැහැන වන පළමු අදියර සම්පූර්ණ කොට 2018 මාර්තු මාසයේදී බලගන්වන ලදී. දෙවන අදියර වන බෝලවත්ත කොටුමා උපපොළේ සිට පන්නල කොටුමා උපපොළ දක්වා වූ කි.වෝ. 132 සම්ප්‍රේෂණ රැහැන 2019 මාර්තු 18වන දින සම්පූර්ණ කොට බලගන්වන ලදී.

## බුලත්කොහුපිටිය ප්‍රදේශයේ බියගම - කොත්මලේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැනට අදාළ නායයාම් ගැටලුවට විසඳුම

බියගම - කොත්මලේ කි.වෝ. 220 ද්විත්ව පරිපථ 2 x Zebra සම්ප්‍රේෂණ රැහැන දිගින් කි.මී. 70.5කින් යුත් අතර 1985දී මෙහෙවරෙහි යොදවන ලදී. 2017 මැයි මාසයේදී රටේ තෙත් කළාපයට අයත් බොහෝ ප්‍රදේශ සෙසු වසරයන් හා සාපේක්ෂව අධික වර්ෂාපතනයකට ලක්වූ අතර, රටෙහි ස්ථාන කිහිපයකම නාය යාමේ සිදුවීම් වාර්තා විය. බුලත්කොහුපිටියද එවන් එක් ප්‍රදේශයක් වූ අතර, ඉහත සඳහන් සම්ප්‍රේෂණ රැහැනද මෙම නාය යාමට ලක්වූ ප්‍රදේශය තුළින් ඇදෙන්නක් විය. එබැවින්, නාය යාමෙන් බලපෑමට ලක්වූ රැහැන් කොටසට අවශ්‍ය ප්‍රතිශෝධනයන් සිදු කරමින් විදුලි රැහැනට සිදුවූ හානි සමනය කිරීමේ ප්‍රතිකර්මක ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය. ක්ෂණික විසඳුමක් වශයෙන්, සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු ශාඛාව විසින් අංක 75 දරන කුලුන ඉවත් කිරීමෙන් පසු තනි පරිපථ සහිත තාවකාලික කුලුනු දෙකක් ඉදි කිරීමට තීරණය විය.



ස්ථිර විසඳුමක් වශයෙන්, TD1+27 කුලුනක් හා TD1+18 කුලුනක් ඉදිකොට බියගම - කොත්මලේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැනේ අංක 75 දරන කුලුන ආසන්නයේ රැහැන මාරු කිරීමේ කාර්යය සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති ඒකකය වෙත පවරන ලදී. සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති ඒකකයේ කාර්ය මණ්ඩලයේ කැපවීම තුළින් අතිශයින් අයහපත් කාලගුණික තත්ත්වයන් යටතේ පවා මෙම කාර්යය 2019 වසරේ සැප්තැම්බර් මාසයේදී අවසන් කරන ලදී.

## කොටුගොඩ - කෙරවලපිටිය කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැනේ හානි සිදුවූ 10වන කුලුන මාරු කිරීම

කෙරවලපිටිය - කොටුගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන 2007-2008 කාල පරිච්ඡේදය තුළ ඉදිකර ඇත. මෙම රැහැන ප්‍රධාන වශයෙන්ම මුතුරාජවෙල වගුරු බිම් මතින් ඇදෙන අතර බොහෝ කුලුනුවල අත්තිවාරමට යකඩ කූරු බස්සවා ඇත. පස් පිරවීමෙන් ගණ අපද්‍රව්‍ය පිරිසැකසුම්කරණ යන්ත්‍රාගාර සංවර්ධන ක්‍රියාවලියක් යටතේ වගුරු බිමෙහි සිදුවන අධිකතර ඉඩම් ගොඩකිරීමේ කාර්යය හේතුකොට කෙරවලපිටියේ පිහිටි



අංක 10 දරන කුලුනට (අවලම්බිත කුලුනට) හානි සිදු වී ඇත. එම ගොඩකළ ඉඩම සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගනයක් හා පිරිසැකසුම්කරණ යන්ත්‍රාගාරයක් සහ ගණ අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගනයක් ලෙසද භාවිත කිරීමට නියමිතය.

කෙරවලපිටිය - කොටුගොඩ ගිවිසුම්ගත මාර්ග හානි සිදුවූ කුලුන වෙනුවට කුලුනක් මුතුරාජවෙල ඉදිකිරීමේ කාර්යය සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති ඒකකය වෙත පවරා ඇත. මෙම කාර්යය සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීමේ ව්‍යාපෘති

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

ඒකකයේ කාර්ය මණ්ඩලයේ කැපවීම තුළින් අතිශය අයහපත් පාරිසරික තත්ත්වයන් යටතේ කසල අංගනයක් තුළ සම්පූර්ණ කිරීමට හැකිවිය.

## ද්‍රව ස්වභාවික වායු විදුලිබල ව්‍යාපෘති (LNGPP)

ඉදිකොට ක්‍රියාත්මක කොට භාරදීමේ පදනමින් මෙ.වො. 300 බහු ඉන්ධන සම්බන්ධිත චක්‍රීය විදුලිබලාගාරයක් කෙරවලපිටියේ ගොඩනැගීම සඳහා වූ යෝජනා ඉල්ලුමක්



අභිලාෂයක් සහිත ලංසුකරුවන් වෙතින් කැඳවන ලදී. බලාගාරය මුල් අවස්ථාවේදී ඩීසල් ඉන්ධනයෙන්ද පසුව ප්‍රති-වායුගත ද්‍රව ස්වභාවික වායු (RLNG) වායුවලින් ක්‍රියාත්මක කිරීම සඳහාද යෝජනා ලබාගන්නා ලදී. සාර්ථක ලංසුකරු විසින් එම විදුලි බලාගාරය වසර 20ක කාල පරිච්ඡේදයක් සඳහා ගොඩනගා, හිමිකරගෙන ක්‍රියාත්මක කරනු ඇති අතර වසර 20ක කාල පරිච්ඡේදය අවසන ලං.වි.ම. වෙත පවරා දෙනු ඇත. මෙම බලාගාරය කෙරවළපිටියේ පිහිටි ලං.වි.ම. ඉඩමෙහි ඉදි කෙරෙනු ඇත. මෙම විදුලි බලාගාරය විසින් 2021දී විවෘත චක්‍ර වාණිජ මෙහෙයුම්කරණයද, 2022දී ඒකාබද්ධ Combine Cycle මෙහෙයුම්කරණයද සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනු ලබයි.

## ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (TCPP)

එ.ජ.ඩො.මි. 500කට ආසන්න පිරිවැයක් දරමින් ඉදිකර, හිමිකරගෙන මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ (BOO) පදනමින් මෙ.වො. 500 විදුලි බලාගාරයක් සාම්පූර්හි ඉදිකිරීමට සැලසුම් කරන ලදී. පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදෙන ලදී. කෙසේ වුවද, මෙම ව්‍යාපෘතිය අත්හිටුවන ලදී.

ඒ අනුව, සාම්පූර්හි විදුලි බලාගාරයේ සිට හබරණ දක්වා වූ කි.වෝ. 400 සම්ප්‍රේෂණ රැහැන, සාම්පූර්හි කොටුමා උපපොළද ඇතුළත්ව සාම්පූර් සිට කප්පල්තුරේ දක්වා වූ කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැන හා ගල් අඟුරු බෑමේ ජැටියද වශයෙන් වූ ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතුවලට අදාළ ප්‍රසම්පාදන කටයුතුද විදුලි බලාගාරයක කටයුතු අවසන් කෙරෙන තෙක් වසර තුළ අත්හිටුවන ලදී.

කෙසේ වුවද, විදුලි පද්ධතිමය වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය වන හබරණ, වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (HVTLP) ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ සහායෙන් ක්‍රියාත්මක කරන ලදී.

හබරණ අක්කර 14ක ඉඩමක නව කි.වෝ. 220/කි.වෝ. 132/කි.වෝ. 33 කොටුමා උපපොළක් ඉදිකිරීම හා තවත් කි.වෝ. 220 අංගන දෙකක් එක් කරමින් වේයන්ගොඩ කොටුමා උපපොළ විශාලන කටයුතුද ව්‍යාපෘතියේ A කොටස ලෙස ප්‍රදානය කර ඇති අතර එම කාර්යයන් මේවන විට 70%ක පමණ සාර්ථකත්වයක් සහිතව ක්‍රියාත්මක වේ.

වේයන්ගොඩ කොටුමා උපපොළෙහි සිට නව හබරණ කොටුමා උපපොළ දක්වා කි.මී. 148ක් දිග කි.වෝ. 220 සම්ප්‍රේෂණ රැහැනක් ඉදිකිරීමේ හා ඒ ආශ්‍රිත රැහැන් හැරවීමේ කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතියේ B කොටස ලෙස ප්‍රදානය කොට ඇති අතර, එම කටයුතු දැනට 80%ක පමණ ප්‍රගතියක් සහිතව ඉදිරියට ගමන් කරමින් පවතී.

## සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර ශාඛාව

2019 වසර තුළ සිදුකරන ලද කටයුතු පහත පරිදි වේ.

සම්ප්‍රේෂණ සැලසුම් ඒකකය විසින් ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ පැකේජය I, පැකේජය II හා පැකේජය III (NT&DND &EIP), හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය (GPD&EEIPP) අදියර 2 හා පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය (REATDP) ක්‍රියාත්මක කිරීම සඳහා වූ ටෙන්ඩර් ලේඛන සකසා තිබිණි. තවද, බියගම කොටුමා උපපොළෙහි ස්ථාපනය කරනු ලබන SVC හා නව අනුරාධපුර හා මන්නාරම කොටුමා උපපොළයන්හි පිළිකුරුව ස්ථාපනයද සඳහා වූ තාක්ෂණික පිරිවිතරයන්ද අතුළත්ව ලංසු ලේඛන සැකසීමේ කටයුතු සම්ප්‍රේෂණ සැලසුම් ඒකකය විසින් සම්පූර්ණ කරන ලදී. සමාලෝචිත තාක්ෂණික පිරිවිතරයන් කොළඹ වරාය නගර සංවර්ධන උපදේශකවරුන් විසින් ලං.වි.ම. අවශ්‍යතා හා අනුකූලවනු පිණිස සකස් කරන ලදී.

සැලසුම් සමාලෝචන කාර්යයට පහත සඳහන් ව්‍යාපෘතීන් ඇතුළත් විය: CE&NEIP-P1, P2 & P3, NKBP, GPD&EEIIPP -අදියර 1, UOHPP – සම්ප්‍රේෂණ රැහැන, GCT&DLRP, REATDP, HVTP, බෝල්වත්ත නව හලාවත කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය වසර තුළ නැවත ඉදිකිරීම.

පරිසර ඒකකය වුකලි ලං.වි.ම.හි බොහෝ පාරිසරික කටයුතුවල කේන්ද්‍රීය ස්ථානය වේ. පරසර ඒකකයේ ප්‍රධාන වගකීම් අතරට ලං.වි.ම. සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික අනුමැති ක්‍රියාවලිය මෙහෙයවීම, ජාතික පාරිසරික පනත (NEA) ප්‍රකාර පරිසර ආරක්ෂණ ලේඛන සැකසීම මෙන්ම අදාළ වන්නේ නම් අරමුදල් සපයන නියෝජිතායතනයන්හි මාර්ගෝපදේශද සැකසීම, අදාළ පාරිසරික අනුමැතීන් ලබාගැනීම, හා ලං.වි.ම. සහ එහි පරදුකාරිත්ව ආයතනයන් සඳහා පාරිසරික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමද ඇතුළත් වේ.

## ඉංජිනේරු උපදේශන සේවා (EAS) ශාඛාව

වසර තුළ ජාතික හා ජාත්‍යන්තර උපදේශනායතන වෙනුවට ඉංජිනේරු උපදේශන සේවා ශාඛාව විසින් විද්‍යුත් තාක්ෂණික, ජල තාක්ෂණික, විදුලි, යාන්ත්‍රික හා උපයෝගිතා අංශයන් තුළ පහත සඳහන් ජනන ව්‍යාපෘතීන් සඳහා විශේෂඥ සේවාවන් සපයන ලදී:

- මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ සහාය.
- සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනය පැවැත්වීම සඳහා වූ උපදේශන සේවා, සවිස්තරාත්මක සැලසුම් හා ටෙන්ඩර් ලේඛන සැකසීම.

මෙයට අමතරව, ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරන ලද උපදේශකවරුන්ද සමඟින්, ඉංජිනේරු උපදේශන ශාඛාව විසින් ශ්‍රී ලංකාව තුළ විදුලිබල ජනනය සඳහා වූ ද්‍රව ස්වභාවික වායු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ශක්‍යතා අධ්‍යයනය සකස් කරන ලදී. ශක්‍යතා අධ්‍යයනය තුළ කෙරවළපිටියෙන් කි.මී. 5ක් වෙරළෙන් පිටතට වන්නට පිහිටි පාවෙන ගබඩාවක් හා ප්‍රතිවායුගතකරණ ඒකකයක් (FSRU) භාවිතයෙන් කොළඹ පදනම්ගත විදුලි බලාගාරයන් වෙත ප්‍රති-වායුගත ද්‍රව ස්වභාවික වායු (RLNG) සැපයෙනු ඇත. පිට-වෙරළත හා වෙරළත නළ මාර්ග පද්ධතියක් මඟින්

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

කෙරවලපිටියේ හා කැළණිතිස්සහි පිහිටි විදුලි බලාගාරයන් වෙත ප්‍රති-වායුගත ද්‍රව ස්වභාවික වායු යැවෙනු ඇත.

ජාත්‍යන්තර තරගකාරී ලංසුකරණ ක්‍රියාවලිය මගින් යෝජනා කැඳවනු පිණිස (i) පාවෙන ගබඩාව හා ප්‍රතිවායුගතකරණ ඒකකය ස්ථාපනය, (ii) වෙරළත හා පිට වෙරළත නළ මාර්ගය ස්ථාපනය, (iii) ද්‍රව ස්වභාවික වායු මූලාශ්‍රකරණය සඳහා වූ යෝජනා ඉල්ලුම් සකසා ඇත.

## සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය

"Technopromexport Moscow" හි සහායද සහිතව මුල්වරට 1961 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සීතාවක ගඟ විදුලිබල ජනන විභවය අධ්‍යයනය කරන ලදී. ඉන්පසු, 'ශ්‍රී ලංකාවේ විදුලි සැපයුම සඳහා වන ප්‍රධාන සැලැස්ම' යටතේ සකස් කරන ලදී ITA-14 නමින් හඳුන්වනු ලබන වාර්තාව තුළ සීතාවක ගඟ විදුලි ජනන විභවය 1988 වසරේදී තහවුරු කරන ලදී.

එවක් පටන් ව්‍යාපෘතිය සංවර්ධනය කරනු පිණිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර, 2009 වසරේදී ලං.වි.ම. අනු ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම (SLE) විසින් ව්‍යාපෘතියේ පූර්ව-ශක්‍යතා අධයයනයන් සිදුකර ඇත. 2013 වර්ෂයේදී, ප්‍රදේශයේ පවත්නා ප්‍රශස්ත ජල විභවය උපයෝජනය කරනු පිණිස ලං.වි.ම. විසින් ව්‍යාපෘතිය භාර ගන්නා ලදී. විදුලි බලාගාරය 2022 වසරේදී මෙහෙවරෙහි යෙදවීමේ අරමුණ සහිතව මෙය දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2015-2034 තුළට එක් කරන ලදී.

සීතාවක ගඟ ව්‍යාපෘතිය සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2016 සැප්තැම්බර් මාසයේදී ස්ථාපනය කරන ලදී. මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය හා ලං.වි.ම.හි ඉංජිනේරු උපදේශන ශාඛාව විසින් ඒකාබද්ධව සිදු කරන ලද සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය 2018 දෙසැම්බරයේදී සම්පූර්ණ කරන ලදී. පරිසර තක්සේරු අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවත්නා අතර, 2020 අප්‍රේල් මස අවසානයේදී සම්පූර්ණ කිරීමට නියමිතය. අධ්‍යයනයනට අනුව, ව්‍යාපෘතිය මෙ.වො. 24 බලාගාරයක් ලෙස ක්‍රියාත්මක වනු ඇති අතර ඇස්තමේන්තුගත වාර්ෂික බලශක්ති ජනනය ගි.වො.පැ. 54කි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත සමස්ත පිරිවැය එ.ජ.ඩො.මි. 79ක් වන අතර ව්‍යාපෘතියේ සැලසුම්ගත ඉදිකිරීම් කාල පරිච්ඡේදය වසර තුනකි. වර්තමාන ප්‍රගතියට අනුව, බලාගාරය 2024 වසර තුළ මෙහෙවරෙහි යෙදවීමට සැලසුම් කර ඇත.

ව්‍යාපෘති ප්‍රදේශය සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බට්ටන්ගල, අල්ගොඩ, හිඟුරලකන්ද නැගෙනහිර හා දික්ඇල්ල ග්‍රාම නිලධාරී වසම්හි සීතාවක ගඟ දිගට වන්නට පිහිටි මල්දෙනිය, දංගම්පල, රූකාසල්, හිඟුරලකන්ද, දංකොම්බුව, දිගල හා යෝගම ගම්මාන පරිශ්‍රයන් තුළට වැටෙනු ඇත.

## කැළණිතිස්ස නව වායු තලබමන ව්‍යාපෘතිය

මෙම කැළණිතිස්ස නව වායු තලබමන ව්‍යාපෘතියේ අරමුණ වනුයේ හදිසි අවස්ථාවන්හි කොළඹ නගරයට සිදු කෙරෙන විදුලි සැපයුම යථා තත්ත්වයට ගනු පිණිස කැළණිතිස්ස විදුලි බලාගාරය වෙත නව වායු තලබමනයක් දැනට පවත්නා රාමුව V වායු තලබමනය වෙනුවට සවිකොට කාර්ය බහුල අවස්ථාවන්හි විදුලිය සැපයීමයි. කෙසේ වුවද, සම්ප්‍රේෂණ අංශය යටතේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ප්‍රති-ව්‍යුහගත කොට ඇත.

## ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ (C&PC) ශාඛාව

මෙම ශාඛාව විසින් සමස්ත ව්‍යාපෘති අංශය සඳහා වූ ආයතනික කටයුතු ඉටු කරන අතරම එය තුළ වූ ව්‍යාපෘති කටයුතු සම්බන්ධීකරණයද සිදු කරයි.

ආයතනික කටයුතු යටතේ, ආරක්ෂිත හා දිරිගන්වන සුළු කාර්ය පරිසරයක්ද සමගින් ඉහළ කාර්ය සාධනයක් සහිතව හා ප්‍රශස්ත පාරිශ්‍රමික මට්ටම්හි ක්‍රියාත්මක, පූර්ණ වශයෙන් පුහුණුව ලත්, කුසලතා පූර්ණ හා වගකීමෙන් බැඳී සිටින කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයක් හා කාර්ය බලකායක් සියලු කල්හි සම්පාදනය කරමින් පවත්වාගෙන යාමේ කාර්යය එය සතුවේ. එහි විධායක නිලධාරීන් 191 දෙනෙකුද, විවිධ ශ්‍රේණිවලට අයත් සේවකයන් 571 දෙනෙකුද සිටින අතර ඒ අනුව අංශයේ සමස්ත කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත් සේවකයන්ද සමගින් 762 දෙනෙකු වේ.

ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යය යටතේ, එමගින් අවසන් කටයුතු නිසි කලට සම්පූර්ණ කරමින් අන්තර් සම්බන්ධතාවයන් නිසි කලට ක්‍රියාත්මක කෙරෙන පරිදි සියලු ව්‍යාපෘතීන්හි විදුලිය ඇණ හිටුම් සැලසුම් පද්ධති පාලනය හා අන්තර් සම්බන්ධීකරණයක් පවත්වාගනු ලබන බවට වගබලා ගැනීමේ කාර්යයෙහි නිරතව සිටී.



සීතාවක ගඟ ජලවිදුලි ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත වැඩබිම් සැලැස්ම

මෙහෙයුම් සමාලෝචනය

# වත්කම් කළමනාකරණ අංශය



ලක්විජය විදුලි බලාගාරය

# වත්කම් කළමනාකරණ අංශය

වත්කම් කළමනාකරණය යනු යටිතල පහසුකම් සංවර්ධනය වෙනස් කිරීමේ අංගයකි. මෙම අංශය ලං.වි.ම.හි ආර්ථික වෘද්ධිය, සමාජමය ප්‍රගමණය හා පාරිසරික සංවර්ධනයෙහි ලා තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි. අංශයෙහි විවිධ කාර්යයන් සිදු කරනු පිණිස අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) යටතේ ශාඛාවන් අටක් පවතින අතර ඒවා පහත පරිදි වේ:

- වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාව
- පුහුණු කිරීම් ශාඛාව
- වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව
- වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව
- සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව
- විදුලක්පාය ව්‍යාපෘතිය
- ගිණුම් ඒකකය
- ආරක්ෂක ඒකකය

## වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාව

ශාඛාවේ වගකීම වනුයේ මානව සම්පත් ප්‍රශස්ත පරිහරණය හරහා වත්කම් කළමනාකරණ අංශය නිසි පරිදි ක්‍රියාත්මකවන බවට වගබලා ගැනීමයි. සේවකයන්ගේ ආයතික කටයුතුවලට අමතරව, ශාඛාව විසින් ලං.වි.ම.හි වත්කම් කළමනාකරණයට අදාළ කටයුතුද කළමනාකරණය කරනු ලබයි. ශාඛාවේ ප්‍රධාන කාර්යයන් වනුයේ:

- ලං.වි.ම. සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ වත්කම් ලේඛනය සැකසීම හා ලං.වි.ම. ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කොට පවත්වාගෙන යාම.
- ලං.වි.ම. වෙනුවෙන් අත්පත් කරගත්, පවරන ලද හා මුළුමනින්ම විකුණා දමන ලද ඉඩම් සඳහා හිමිකාරිත්ව ලේඛන ලබාගැනීම.
- ඉඩම් හා ගොඩනැගිලි ආශ්‍රිත තක්සේරුකරණය
- කිසිදු හිමිකම් ඔප්පුවක් හෝ මිනින්දෝරු සැලැස්මකින් තොරව ලං.වි.ම. විසින් පරිහරණය කරනු ලබන ඉඩම් හඳුනාගෙන ඒ සඳහා මිනින්දෝරු සැලසුම් සැකසීම. බලහත්කාරයෙන් අල්ලාගෙන පරිහරණය කරනු ලබන හා සීමා මායිම් සම්බන්ධ ආරවුල් සහිත ලං.වි.ම. ඉඩම්වල සීමා මායිම් නැවත ස්ථාපනය කිරීම.
- ලං.වි.ම. වාහන දත්ත පදනම සංවර්ධනය කොට පවත්වාගෙන යාම.
- පාවෙන ඔරු හා බෝට්ටු සේවාවන් පවත්වා ගැනීම වැනි සංචාරක හා විනෝදාත්මක කටයුතු සඳහා කාසල්රී ජලාශ කල්බදුකරණය
- වත්කම් කළමනාකරණ අංශය විසින් ආරම්භ කරන ලද ලංසු සම්බන්ධ ලංසු කැඳවීම, ලංසු තක්සේරුව හා වෙබ් අඩවියෙහි පළ කිරීම සම්බන්ධ තාක්ෂණික සහාය.

## පුහුණු කිරීම් ශාඛාව

පුහුණු කිරීම් ශාඛාව අළුතින් පිහිටුවන ලද කලවාන හා කින්චිගුනේ පර්යන්ත පුහුණු මධ්‍යස්ථානද ඇතුළත් පහත සඳහන් කාර්මික පුහුණු මධ්‍යස්ථානයන්ගෙන් සමන්විත වේ.

- පුහුණු මධ්‍යස්ථානය, පිළියන්දල
- පුහුණු මධ්‍යස්ථානය, කාසල්රී
- පුහුණු මධ්‍යස්ථානය, කින්චිගුනේ (නව පර්යන්ත මධ්‍යස්ථානය)
- පුහුණු මධ්‍යස්ථානය, කලවාන (නව පර්යන්ත මධ්‍යස්ථානය)

### පුහුණු මධ්‍යස්ථානය - පිළියන්දල

මෙම පුහුණු මධ්‍යස්ථානය මගින් ඉංජිනේරුවරුන්, ගණකාධිකාරීවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික සේවා නිලධාරීන්, ලිපිකරු හා සමාන්තර සේවා සේවක මහතුන් හා ක්ෂේත්‍ර සේවා සේවකයන් වෙත පුහුණුව ලබාදෙනු ලබයි. වසර තුළ පවත්වන ලද CPD පුහුණු වැඩසටහන් සම්බන්ධ විස්තර පහත දී ඇත.

| | පාඨමාලාවේ නම | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූවන් |
|---|---|---|---|
| 1. | ලං.වි.ම. ජ්‍යෙෂ්ඨ විධායකවරුන් සඳහා 'කම්කරු නීතිය' | 2 | 116 |
| 2. | ලං.වි.ම. ජ්‍යෙෂ්ඨ විධායකවරුන් සඳහා 'විදුලි අංශයේ වර්තමාන තත්ත්වය හා අනාගතය හා සැලසුම්කරණ දෘෂ්ටි කෝණයන්' | 2 | 142 |
| 3. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'විදුලිබල පද්ධති ආරක්ෂාව' | 1 | 87 |
| 4. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'ශ්‍රී ලාංකික විදුලිබල පද්ධතිය, අයක්‍රම ස්ථාපනයන් හා නියාමන ව්‍යුහය පිළිබඳ හැඳින්වීම' | 2 | 177 |
| 5. | ලං.වි.ම. ඉංජිනේරුවන් හා ගණකාධිකාරීවරුන් සඳහා 'ප්‍රසම්පාදන කළමනාකරණය' | 2 | 146 |
| 6. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'මුදල් කළමනාකරණය' | 1 | 95 |
| 7. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'බෙදාහැරීමේ සැලසුම්කරණය' | 1 | 87 |
| 8. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'සම්ප්‍රේෂණ ඉදිකිරීම හා නඩත්තුව' | 1 | 75 |
| 9. | ලං.වි.ම. ඉංජිනේරුවන් සඳහා 'සම්ප්‍රේෂණ රැහැන් ඉදිකිරීම හා නඩත්තුව' | 1 | 50 |
| 10. | ලං.වි.ම. මධ්‍යම මට්ටමේ තාක්ෂණක සේවා සඳහා 'විනය කළමනාකරණය' | 1 | 91 |
| 11. | මධ්‍යම මට්ටමේ තාක්ෂණක සේවා (MLTS) සඳහා 'විදුලි අංශයේ වර්තමාන තත්ත්වය හා අනාගතය සහ සැලසුම්කරණ දෘෂ්ටි කෝණ' | 2 | 175 |
| 12. | මධ්‍යම මට්ටමේ තාක්ෂණක සේවා (MLTS) සඳහා ' විනය කළමනාකරණය' | 1 | 87 |

2019දී පවත්වන ලද වැඩසටහන් 100ක් තුළ විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන ක්ෂේත්‍ර සේවා සේවකයන් 3,489 දෙනෙකු වෙත පුහුණුව ලබාදෙන ලදී.

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)

### බාහිර ආයතනයන් තුළ ලං.වි.ම. සේවකයන් වෙත ලබාදුන් දේශීය පුහුණු

ඉංජිනේරුවරුන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවා, ලිපිකරු හා සමාන්තර සේවා සහ ක්ෂේත්‍ර සේවාද ඇතුළත් 436ක මුළු සේවක සංඛ්‍යාවක් සඳහා බාහිර පුහුණු ආයතන විසින් ඔවුන්ගේ සේවයනට අදාළව පවත්වන ලද පුහුණු ලබාගැනීමේ අවස්ථාව සලසන ලදී.

### ලං.වි.ම. සේවකයන් සඳහා ලබාදෙනු ලබන විදේශීය පුහුණුව

නිශ්චිත ක්ෂේත්‍රයන් තුළ සිය දැනුම වර්ධනය කරගනිමින් දේශීය වශයෙන් ලබාගත නොහැකි ක්‍රීඩා පුහුණුවක් ජාත්‍යන්තර වශයෙන් ලබාදෙනු පිණිස විදේශ සංචාරයන්හි නිරත වීමේ අවස්ථාව සේවකයන් 374 දෙනෙකු වෙත ලබාදෙන ලදී.

| කාණ්ඩය | සහභාගී වූවන් |
|---|---|
| ශිෂ්‍යත්ව, පුහුණු හා අධ්‍යයන වැඩසටහන් | 205 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ, සමුළු හා රැස්වීම් | 58 |
| ක්‍රීඩා කටයුතු | 58 |

### බලාගාරගත පුහුණුව

උපාධි අපේක්ෂක සිසුන්, ඩිප්ලෝමා සිසුන් හා කාර්මික හා කාර්මික නොවන විද්‍යාල සිසුන් හට ලබාදෙන ලද බලාගාරගත පුහුණුව පිළිබඳ විස්තර පහත දී ඇත:

| පුහුණු වැඩසටහන | සමස්ත පුහුණුලාභීන් ගණන |
|---|---|
| ලිපිකරු හා සමාන්තර සේවා | |
| උපනයන | 364 |
| උසස් වීමේ | 330 |
| නිපුණතා සංවර්ධනය | 489 |
| | |
| කාර්යාල කාර්ය සහායක | |
| නිපුණතා සංවර්ධනය | 58 |
| උසස් වීමේ | 32 |
| හුරු කරවීම | 78 |
| | |
| දේශීය පුහුණුව | 432 |
| | |
| කර්මාන්ත පුහුණුව | |
| උපාධි අපේක්ෂකයන් | 300 |
| ඩිප්ලෝමා | 120 |
| එකතුව | 2203 |

### පුහුණු මධ්‍යස්ථානය - කාසල්රී

ලං.වි.ම. සේවකයන් හට සිය උසස්වීමේ අවශ්‍යතා සපුරාලනු සඳහා කාසල්රී පුහුණු මධ්‍යස්ථානය මගින් පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. තවද, එමගින් ලං.වි.ම. සේවකයන්ට මෙන්ම බාහිර පුද්ගලයන් වෙතද වෘත්තීය ප්‍රගති සංවර්ධන පාඨමාලා පවත්වනු ලබයි.

2019 වසර තුළ ක්ෂේත්‍ර සේවා සේවකයන් වෙනුවෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දී ඇත.

| අනු. අ. | වැඩසටහන් | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූවන් |
|---|---|---|---|
| 1. | පුහුණුවන කණිෂ්ඨ කාර්මික සහායකයන් හා කණිෂ්ඨ කාර්මික සහායකයන් සඳහා වූ හුරුකරවීමේ පුහුණුව. | 01 | 26 |
| 2. | ජනන අංශ කාර්මික සහායකයන් | 01 | 33 |
| 3 | ජනන අංශයේ කණිෂ්ඨ කාර්මික සහායකයන් | 13 | 408 |
| 4 | ජනන අංශයේ අභ්‍යාසලාභී කණිෂ්ඨ කාර්මික සහායකයන් | 01 | 20 |
| | එකතුව | 16 | 487 |

වර්තමාන ලං.වි.ම. කාර්ය බලකාය, සේවා සම්පාදනායතනයන්හි සේවකයන් හා බාහිර පුද්ගලයන්ගේද අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පහත සඳහන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) වැඩසටහන් සංවර්ධනය කරන

- දියෙදු පද්ධති නඩත්තුව
- දියෙදු සංකේත හා පරිපථ
- අඩු වෝල්ටීයතා ගුවන් තොග සන්නායක (ABC) මාර්ග ඉදිකිරීම හා නඩත්තුව
- අඩු වෝල්ටීයතා හා මැදි වෝල්ටීයතා රැහැන් ඉදිකිරීමේ න්‍යාය හා පරිචය
- ලං.වි.ම. පද්ධති හා කාර්ය පරිපාටි
- ආකල්ප සංවර්ධනය, නායකත්ව නිපුණතා සංවර්ධනය හා කණ්ඩායම් ගොඩනැගීම
- අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන
- බෙදාහැරීමේ උපපොළ ඉදිකිරීම
- වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව
- භාවනා පුහුණුව
- යටිබිම් බහන් පද්ධතිය ස්ථාපනය හා නඩත්තුව
- විදුලි අධිකාරීවරුන් සඳහා වූ නිපුණතා ප්‍රවර්ධන පුහුණුව
- ජල විදුලි ජනනය සම්බන්ධ දැනුම බෙදාගැනීමේ සැසිය
- ශ්‍රී ලංකාවේ විදුලිබල ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම.

වසර තුළ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන සැසි අසූ හතක් පවත්වන ලද අතර සේවකයන් 2656 දෙනෙකු වෙත පුහුණුව ලබාදෙන ලදී.

## වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව

ශාඛාව විවිධ වර්ගයේ සේවාවන් සපයන මෙහෙයුම් ඒකක හතරකින් සමන්විත වේ.

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)

## විදුලි බලාගාර ඒකකය

ඒකකයේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ:

- කොලොන්නාව, මතුගම හා තුල්හිරියේ ස්ථාපිත මෙ.වො. 1 බහාලුම්ගත පැකේජ ලෙස වන ඩීසල් ජනන යන්ත්‍ර ඒකක 50ක් භාවිතයෙන් ජාතික ජාලය වෙත හදිසි විදුලිය සම්පාදනය.
- ජංගම ඩීසල් ජනන යන්ත්‍ර භාවිතයෙන් ඉහළම ප්‍රභූන් සඳහා විදුලි බලය සම්පාදනය.
- ජංගම ඩීසල් ජනන යන්ත්‍ර භාවිතයෙන් රජයේ හා බාහිර ආයතනයන් සඳහා අතිරේක හා අඛන්ඩ විදුලි සැපයුමක් ලබාදීම.
- ලං.වි.ම., ප්‍රභූ ස්ථාපිත, රජයේ රෝහල්හි, හා සෙසු රජයේ ආයතනයන්හි පවත්නා අතිරේක ජනන යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව
- බාහිර ආයතනයන් සතු ඩීසල් ජනන යන්ත්‍රවලට අදාළ ප්‍රධාන අලුත්වැඩියාවන් හා ප්‍රතිසංස්කරණ.
- බාහිර ආයතනයන් වෙත ඩීසල් ජනන යන්ත්‍ර සැපයුම හා ස්ථාපනය
- පැරණි චුන්නාකම් විදුලි බලාගාරය වෙතින් පවරා ගන්නා ලද කි.වෝ.ඇ. 6x1250 ජනන යන්ත්‍ර නවීකරණය.
- හදිසි අවස්ථාවන්හි ජාතික ජාලය / හුදෙකලා ජාලයන් වෙත විදුලි බලය සැපයීම.
- විදුලි බලාගාර වැඩපල නවීකරණය.

වසර තුළ සිදුකරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත යාකොට ඇත.

| අනු. අ. | කාර්ය කාණ්ඩය | කාර්යයන් ගණන | ඇස්තමේන්තුගත පිරිවැය (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|
| 1 | අතිරේක ඩීසල් ජනන යන්ත්‍රයේ වාර්ෂික නඩත්තුව | 70 | 98.0 |
| 2 | ඩීසල් ජනන යන්ත්‍ර අලුත්වැඩියාව / ප්‍රතිසංස්කරණය | 39 | 68.8 |
| 3 | ලං.වි.ම. අවශ්‍යතා සඳහා ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ගැනීම | 42 | 11.4 |
| 4 | ඩීසල් ජනන යන්ත්‍ර කුලියට දීම - පුද්ගලික, ජනාධිපති ආරක්ෂක අංශයේ, අගමැති ආරක්ෂක අංශයේ අවශ්‍යතා. | 300 | 83.6 |
| 5 | ඩීසල් ජනන යන්ත්‍ර ස්ථාපනයන් | 01 | 3.4 |
| 6 | වෙනත් කටයුතු | 09 | 2.4 |


කොලොන්නාව වැඩබිම - 2 හි මෙ.වො. 1 ජනන යන්ත්‍ර


කොලොන්නාව වැඩබිම - 2 හි මෙ.වො. 1 ජනන යන්ත්‍ර

## වායු සමීකරණ හා ශීතකරණ ඒකකය

වසර තුළ සිදුකරන ලද කටයුතු පිළිබඳ විස්තර පහත වගුගත කර ඇත.

| අනු. අ. | කාර්ය කාණ්ඩය | රජයේ කටයුතු | | ලං.වි.ම. කටයුතු | |
|---|---|---|---|---|---|
| | | කාර්යයන් සංඛ්‍යාව | මුදල (ශ්‍රී ලං.රු.මි.) | කාර්යයන් සංඛ්‍යාව | මුදල (ශ්‍රී ලං.රු.මි.) |
| 1 | වාර්ෂික නඩත්තුව | 32 | 244.1 | 262 | 52.2 |
| 2 | නව ස්ථාපනය | 1 | 10.1 | 37 | 28.1 |
| 3 | අලුත්වැඩියාව | 16 | 16.2 | 51 | 9.1 |
| | එකතුව | **49** | **270.4** | **350** | **89.4** |

## විදුලි සෝපාන ඒකකය

දිවයින පුරා රජයේ රෝහල්, රජයේ ආයතන හා ලං.වි.ම. මෙහෙයුම් ඒකකයන්හි ස්ථාපිත රියදු වර්ගයේ හා දියෙදු වර්ගයේ සෝපාන සඳහා විදුලි සෝපාන ඒකකය විසින් එම ආයතනයන්හි ඉල්ලීම මත පහත සඳහන් සේවාවන් සම්පාදනය කරනු ලබයි.

- විදුලි සෝපානයන්හි වාර්ෂික නඩත්තුව
- ඉංජිනේරුමය ඇස්තමේන්තු හා පිරිවිතරයන් සැලසුම්කරණය හා සැකසීම, නව සෝපාන සැපයුම හා ස්ථාපනය සම්බන්ධ ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය
- මෙහෙවරෙහි යෙදවීමේ පරීක්ෂාවන් හා මෙහෙයුම් ආරක්ෂණ පරීක්ෂාවන් සිදු කිරීම
- පැරණි සෝපාන ප්‍රතිසංස්කරණය
- නව සෝපාන ස්ථාපනය සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් සැපයීම.

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)

වසර තුළ සිදුකරන ලද කාර්යයන්හි ඇස්තමේන්තුගත පිරිවැය පහත වගුගත කර ඇත.

| අනු. අ. | කාර්ය කාණ්ඩය | රජයේ කටයුතු | | ලං.වි.ම. කටයුතු | |
|---|---|---|---|---|---|
| | | කටයුතු සංඛ්‍යාව | මුදල (ශ්‍රී ලං.රු.මි.) | කටයුතු සංඛ්‍යාව | මුදල (ශ්‍රී ලං.රු.මි.) |
| 1 | වාර්ෂික නඩත්තුව | 22 | 26.3 | 5 | 2.3 |
| 2 | නව ස්ථාපනයන් | - | - | 1 | 7.1 |
| 3 | අලුත්වැඩියාවන් | 14 | 2.8 | 3 | 0.8 |
| 4 | වෙනත් (පරීක්ෂා කිරීම හා උපදේශනය) | 02 | 0.06 | 1 | 0.02 |
| | එකතුව | **38** | **29.16** | **10** | **10.22** |

### මධ්‍යම වැඩපල හා ගරාජ ඒකකය

වසර තුළ ඒකකය විසින් සිදුකරන ලද කාර්යයන් පහත වගුගත කර ඇත.

| අනු. අ. | කාර්ය කාණ්ඩය | කාර්ය විස්තරය | කාර්යයන් සංඛ්‍යාව | මුදල (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|---|---|
| 1 | යාන්ත්‍රික | මැදු වානේ පංකාව යතුරු පෙට්ටි, වානේ ඉනිමං, වායු සමීකරණ යන්ත්‍ර සඳහා ගැල්වනයිස් කළ මැදු වානේ ආවරණ සැකසීම. | 04 | 0.2 |
| 2 | විදුලි | සපුගස්කන්ද විදුලි බලාගාරයේ සිසිලන පංකා මෝටර් නැවත එතීම | 15 | 1.8 |
| 3 | නිෂ්පාදන | බෙදාහැරීමේ අංශ සඳහා ඩී-ආවරණ, ටී-අල්ලු නිෂ්පාදනය | 19 | 10.2 |
| 4 | වාහන අලුත්වැඩියා | ලං.වි.ම. වාහන අලුත්වැඩියා, පින්තාරු හා ටින්කරින් කටයුතු | 41 | 4.4 |
| 5 | වාහන සේවා | ලං.වි.ම. වාහන සේවාකරණය | 68 | 1.3 |
| 6 | වාහන සේවා | ලං.වි.ම. වාහන ඉන්ධන පරීක්ෂාව | 01 | 0.01 |
| 7 | වෙනත් | ස්වයංක්‍රීය ගිනි පොම්ප පැනලය අලුත්වැඩියාව | 01 | 0.5 |
| | | එකතුව | | **18.41** |

### සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව

මෙම ශාඛාව විසින් රටපුරා නව ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි/කාර්යාල ප්‍රතිසංස්කරණය/පුළුල් කිරීම, හා ලං.වි.ම. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල හා සංචාරක බංගලා නඩත්තු කාර්යයෙහිද නිරතව සිටී.

සිවිල් කටයුතු හා ගොඩනැගිලි ශාඛාව, නවීනතම මෘදුකාංග භාවිතයෙන් ව්‍යුහමය සැලසුම් හා ඒ ආශ්‍රිත ඇඳීම් සිදු කිරීමේ හැකියාව ඇති එහි ව්‍යුහමය සැලසුම් ඒකකයකින්ද සමන්විත වේ.
සිවිල් කටයුතු හා ගොඩනැගිලි ශාඛාවට අනුයුක්ත පහසුකම් කළමනාකරණ ඒකකය ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ හා සංචාරක බංගලාවන්හි නඩත්තු කටයුතු සිදු කිරීමේ වගකීම දරයි.
වසර තුළ සම්පූර්ණ කරන ලද කාර්යයන්හි වර්තමාන තත්ත්වය පහත පරිදිය:

| විස්තරය | එකතු කළ අගය මත බදු රහිතව පිරිනමන ලද මුදල (ශ්‍රී ලං.රු.මි.) | එකතු කළ අගය මත බදු රහිතව 2019 වසර තුළ ගෙවීම් (ශ්‍රී ලං.රු.මි.) |
|---|---|---|
| සභාපතිතුමාගේ හා සාමාන්‍යාධිකාරීතුමාගේ කාර්යාල ප්‍රධාන කාර්යාලයේ 7වන මහලට විතැන් කිරීම | 46 | 20.5 |
| ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන පිවිසුම හා බිම් මහලේ ප්‍රවේශ ශාලාව නැවත සකස් කිරීම | 29 | 20.4 |
| ලං.වි.ම. ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලා ගොඩනැගිල්ල නැවත සකස් කිරීම | 44 | 6.93 |
| කල්මුනේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 50.6 | 5.64 |
| මින්නේරිය සංචාරක බංගලාව පුළුල් කිරීම හා නවීකරණය | 35.2 | 5.45 |
| ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය සඳහා ශේෂ ඇස්තමේන්තුව | 12 | 6.8 |
| ආනියාකන්ද වාහන වැඩපලෙහි රඳවා ගැනීමේ බිත්තිය හා බිම ඉදිකිරීම, පින්තාරු කාමරය හා බිම බදාම ඇතිරීම, බදාම ඇතිරීම හා එපොක්සි මාස්ටික් පින්තාරුකරණය | 10.2 | 6.85 |
| කොලොන්නාව මෙෂනයින් බිම කොටස්වලට වෙන් කිරීම | 5.32 | 1.8 |
| මින්නේරියේ රියැදුරු කාමරය හා සංචාරක උපකාරකයන්ගේ කාමරය රෙදි සේදීමේ කාමරයක්ද සහිතව ඉදිකිරීම | 5.1 | 0.36 |
| ලං..විම. ප්‍රධාන කාර්යාලයේ යට මාලයෙහි ඇති ලං.වි.ම. ලේඛනාගාරය තාවකාලිකව ආනියාකන්දට මාරු කිරීම | 28.6 | 26.5 |
| ලං.වි.ම. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි වහළ මත සවිකරන සූර්ය බල ඒකක ස්ථාපනය | 5.6 | 0.05 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර) කාර්යාලය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 191 | 20.4 |

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)


ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණය


නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත) කාර්යාලය අනුරාධපුරයේ ඉදිකිරීම

### ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (විදුලක්පාය)

ලං.වි.ම. සඳහා නාරාහේන්පිට ඉදිකිරීමට යෝජිත නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම හා සම්බන්ධ සම්බන්ධීකරණ හා ව්‍යාපෘති කළමනාකරණ කටයුතු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ලං.වි.ම. විසින් අරමුදල් සපයන අතර, ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 3,149කි. බිම් සවි කුරු 400ක් ඉදිකිරීම හා පරීක්ෂා කිරීම සිදුකර ඇත.

යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම විවිධ හේතු මත ප්‍රමාද විය. අවසානයේදී ලංසු ලේඛන සමාලෝචනය හා සැලසුම්කරණය, ඉදිකිරීමේ කටයුතු පරිපාලනය හා අධීක්ෂණය සඳහා වූ උපදේශන සේවාවන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) වෙත පිරිනමන ලදී. සිය කටයුතු 2020.01.01 දින සිට ආරම්භ කරනු පිණිස 2019.12.26 දින පිරිනැමීමේ ලිපිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත නිකුත් කරන ලදී.

### වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව (OH&S)

ශාඛාවේ ප්‍රධාන අරමුණ වනුයේ සිදුවන හදිසි අනතුරු හා ආපදාවන් සංඛ්‍යාව අවම කරනු පිණිස ආරක්ෂිත කාර්ය පරිසරයක් සහතික කරමින් සේවකයන් අතර ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමෙන් ආයතනය ඇතුළත ආරක්ෂක සංස්කෘතිය වැඩිදියුණු කිරීමයි.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවනු පිණිස ආරක්ෂාව නිරීක්ෂණය කරමින් හා ඒ සඳහා වූ පහසුකම් සලසමින් සියලු අංශ අතර ආරක්ෂාව පිළිබඳ ඉහළ ප්‍රමිතියක්/පරිචයක් සකස් කිරීමේ කාර්යය ශාඛාව විසින් ඉටුකර ඇත.

ශාඛාව විසින් සම්බන්ධීකරණ කටයුතු සඳහා පත්කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන් මගින් සියලු ශාඛාවන් වෙත වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධ සහාය සේවාවන්ද සලසනු ලබයි.

### පුහුණු වැඩසටහන්

වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර පහත දී ඇත

| අංකය | වැඩසටහන | සහභාගිකරු කාණ්ඩය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගිකරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව | ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සේවකයන් | 123 | 5861 |
| 02 | වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව | විදුලි බලාගාර කාර්ය මණ්ඩලය | 14 | 609 |
| | | එකතුව | 137 | 6470 |

### ප්‍රාථමික/කොටුමා උපපොළයන්හි ආරක්ෂක පරීක්ෂාව

ශාඛාව විසින් ලං.වි.ම. සේවකයන් සඳහා ආරක්ෂිත සේවා ස්ථානයක් සහතික කරනු පිණිස ආරක්ෂක විගණනයන් සිදු කරන අතර විදුලි බලාගාර, කොටුමා උපපොළ හා ක්ෂේත්‍ර කටයුතු තවදුරටත් පුළුල් කිරීමට සැලසුම් කරමින් සිටී.

වසර තුළ පවත්වන ලද ආරක්ෂක පරීක්ෂාවන් පිළිබඳ සාරාංශයක් පහත දී ඇත.

| අංකය | අංශය | ප්‍රාථමික උපපොළ සංඛ්‍යාව | අටළු අංගන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | බෙදාහැරීමේ අංශය 1 | 15 | 08 |
| 02 | බෙදාහැරීමේ අංශය 2 | 16 | 15 |
| 03 | බෙදාහැරීමේ අංශය 3 | 03 | 16 |
| 04 | බෙදාහැරීමේ අංශය 4 | 17 | 11 |
| | එකතුව | 51 | 50 |

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)

ලං.වි.ම.හි (කොන්ත්‍රාත් සේවකයන්ද සහිතව) සිදුවූ බරපතල හා වාර්තා කළයුතු මට්ටමේ හදිසි අනතුරු




නව සියවස තුළ හදිසි අනතුරු රහිත කාර්ය පරිසරයක් හා සෞඛ්‍ය සම්පන්න කාර්ය බලකායක් ඇතිකරනු පිණිස ශාඛාව ලං.වි.ම. තුළ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කිරීමට සූදානම්ව සිටී.

## ආරක්ෂක අංශය

ආරක්ෂක අංශය ආරක්ෂක කළමනාකරු යටතේ නියෝජ්‍ය ආරක්ෂක කළමනාකරුවෙකු, ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් සිවු දෙනෙකු හා ආරක්ෂක නිලධාරීන් 29 දෙනෙකු ඇතුළත් ආරක්ෂක පිරිස් 909කින් සමන්විත වේ. අනු ආරක්ෂක ඒකක 122ක් දිවයින පුරා ක්‍රියාත්මක වේ.

ලං.වි.ම. සියලු අංශයන්හි ජීවිතවල හා දේපළවල ආරක්ෂාව සම්බන්ධ වගකීම ලං.වි.ම. ආරක්ෂක අංශය සතුවේ. දීප ව්‍යාප්තව පවත්නා ලං.වි.ම. ඇතැම් පරිශ්‍රයන්හි සේවයෙහි යොදවා ඇති පුද්ගලික ආරක්ෂක සේවා හා සිවිල් ආරක්ෂක සේවයේ මෙහෙයුම් රාජකාරිද ලං.වි.ම. ආරක්ෂක අංශය විසින් අධීක්ෂණය හා නිරීක්ෂණය කරනු ලැබේ. ආරක්ෂක අංශය විසින් විශේෂ අවස්ථාවන්හි, උත්සව හා සෙසු අවස්ථාවන්හිදීද ප්‍රභූ ආරක්ෂක සේවාවන්ද සපයනු ලැබේ.

ආරක්ෂක නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවයන් ප්‍රවර්ධනය කරමින් වැඩිදියුණු කරනු පිණිස ලං.වි.ම. ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණද පවත්වනු ලැබ ඇත. එමගින් වෘත්තීයමය වශයෙන් ඉහළ ඵලදායකත්වයක් සහිතව සිය කටයුතු සිදු කිරීමේදී ඔවුන්ගේ කාර්යක්ෂමතාවය, විනය, අභිප්‍රේරණය සංවර්ධනය කිරීමටද රුකුලක් ලැබේ.

ආරක්ෂක නිලධාරීන් වෙත මෙම වසර තුළ අවි ආයුධ හුරුව, වෙඩි තැබීම, ගිනි ආරක්ෂණය, මුදල් ආරක්ෂා සහිතව රැගෙන යාම, ප්‍රභූන් ආරක්ෂිතව රැගෙන යාමේ රාජකාරි, ප්‍රථමාධාර, ආපදා අවස්ථාවන්හි සෙනග ඉවත් කිරීමේ පුහුණුව, නායකත්වය හා කළමනාකාරිත්වය පිළිබඳවද විශේෂ පුහුණු සම්පාදනය කරන ලදී. වසර තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත:

| අංකය | වැඩසටහන | පුහුණු මධ්‍යස්ථානය | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 1 | අවි ආයුධ පාවිච්චිය පිළිබඳ පුහුණුව | ලං.වි.ම. පිළියන්දල පුහුණු මධ්‍යස්ථානය හා කොළොන්නාව ආරක්ෂක මූලස්ථානය | 838 |
| 2 | ජීව උණ්ඩ සහිතව තුවක්කු පාවිච්චිය පිළිබඳ පුහුණුව | කළුතර පොලිස් පුහුණු පාසැලෙහි ගිනි අවි පුහුණු භූමිය | 404 |
| 3 | මුදල් ආරක්ෂණ වැඩමුළුව | පිළියන්දල ලං.වි.ම. පුහුණු මධ්‍යස්ථානය | 80 |
| 4 | ගබඩා ආරක්ෂක රාජකාරි | | 96 |

ලං.වි.ම. ආරක්ෂක නියාමකවරුන් විසින් විශේෂයෙන් ජාතික වෙළඳ සේවා ක්‍රීඩා තරග හා ජාතික තරගයන්හිදී මලල ක්‍රීඩා, වොලිබෝල් හා ක්‍රිකට් යන ඉසව් තුළ සිය නියෝජනය ලබාදෙන ලදී.



මෙහෙයුම් සමාලෝචනය

# ආයතනික ක්‍රමෝපාය අංශය

# ආයතනික ක්‍රමෝපාය අංශය

ආයතනික ක්‍රමෝපාය අංශය අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) යටතේ ක්‍රියාත්මකවන අතර, එය ව්‍යාපාර සහ මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව, ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව, තොරතුරු තාක්ෂණ (IT) ශාඛාව හා පර්යේෂණ හා සංවර්ධන ශාඛාව නමින් යුත් ශාඛා පහකින් සමන්විත වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ ප්‍රධානත්වයෙන් යුත් එක් එක් ශාඛාවෙහි වසර තුළ කාර්ය සාධනයන් මෙහිලා ප්‍රකාශ කෙරේ. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියද අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) ගේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

## ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව

ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව විසින් එක් එක් බලපත්ලාභියා අතර ලංකා විදුලිබල මණ්ඩලය වෙත නිකුත් කර ඇති ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ බලපත් ආශ්‍රිතව ඉස්මතුවන කරුණු සම්බන්ධීකරණය කරන අතරම බලපත්කරණ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින්ද සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. නියාමන කටයුතු සිදු කිරීමට අමතරව, මෙම ශාඛාව ලං.වි.ම. වෙනුවෙන් ආයතනික ක්‍රමෝපාය සැකසීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීමද දරයි.

නියාමන කටයුතු ඒකකය විසින් වසර තුළ සියලු ලං.වි.ම. බලපත්ලාභීන්ගේ බලපත්කරණ අවශ්‍යතා සපුරාලනු පිණිස බලපත්ලාභීන් සමගින් මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින්ද සමීපව කටයුතු කරන ලදී. විශේෂයෙන් මෙම ඒකකයේ අවධානය යොමු වූ කරුණ වූයේ බලපත්ලාභීන් විසින් විදුලිය (බෙදාහැරීමේ) කාර්ය සාධන ප්‍රමිති, විදුලිය (සම්ප්‍රේෂණ) කාර්ය සාධන ප්‍රමිති, විදුලිය (ආරක්ෂාව, ගුණාත්මකබව හා අඛන්ඩතාවය) පිළිබඳ රෙගුලාසිය හා විදුලිය (උපයෝගිතාවය මගින් මෙහෙයවන ඉල්ලුම්පාර්ශ්වීය කළමනාකරණ) රෙගුලාසිය ක්‍රියාත්මක කරනු ලබන්නේද යන්න විමසා බැලීම වූ අතර එකරුණ සාක්ෂාත් කරගනු පිණිස බොහෝ මූලාරම්භයන් ගන්නා ලදී. ඉහත කරුණට අමතරව, මාර්ග අවසර මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීමට හා විදුලි මනු ලේඛනය වෙනස් කිරීමකට ලක් කරන බවට සැක සහිත අවස්ථාවන් විමර්ශනය කිරීමේ නව මාර්ගෝපදේශ සැකසීමට නියාමන කටයුතු ඒකකය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමගින් මෙන්ම ලං.වි.ම. බලපත්ලාභීන් සමගින්ද කටයුතු කරන ලදී.

පෙර වසරේදී මෙන්ම 2019 වසරේදීද කිසිදු අවසන් පාරිභෝගික අයක්‍රම ගැලපීමක් සිදු නොවිණි. අඩු පිරිවැය සහිත ජනනයන් අත්පත් කරගනිමින් ජනන පිරිවැය අඩු කිරීමේ මෙන්ම අයක්‍රම මාර්ගයෙන් සැබෑ පිරිවැය අවසන් පාරිභෝගිකයා වෙත ගලා යාමට සැලැස්වීමේ ක්‍රම දෙකෙහිම ගැටලු නිරීක්ෂණය වූ බැවින්, ලං.වි.ම.ට ඉතිරිව පැවති එකම විකල්පය වූයේ විදුලි පිරිවැය ඉහළ කාල වේලාවන් වෙතින් විදුලි පිරිවැය අඩු කාල වේලාවන් දක්වා පරිභෝජනය විතැන් කිරීමයි. දැනටමත් සියලු තොග පාරිභෝගිකයන් පරිභෝජනය කරන වේලාව මත පදනම්වූ අයක්‍රමය මත (ToU) අනිවාර්යයෙන් ස්ථානගත කර ඇත. එනමුදු සමස්ත පාරිභෝගික පදනමින් 85% ඉක්මවූ අගයක් ගන්නා ගෘහස්ථ පාරිභෝගිකයන්ද ඇතුළත් සිල්ලර පාරිභෝගිකයන් සඳහා එවැනි බල කිරීමක් නොමැත. 2017 වසරේදී පරිහරණ කාල වේලා අය ක්‍රමය විකල්ප අයක්‍රමයක් ලෙස සියලු ගෘහස්ථ පාරිභෝගිකයන් වෙතද ව්‍යාප්ත කරන ලදී. එසේ නමුදු, පරිහරණ කාල වේලා ක්‍රමය කරා සංක්‍රමණය වීමෙහි ලා ගෘහස්ථ පාරිභෝගිකයන් විසින් දක්වන ලද ප්‍රතිචාරය දුර්වල එකක් වූ බැවින්, 2019 වසරේදී ටෙලිසිනේ රූපවාහිනී ආයතනයේ සහායද සහිතව ගෘහස්ථ පාරිභෝගිකයන් වෙත පරිහරණ කාල වේලාව පිළිබඳ දැනුවත් කිරීමේ මාධ්‍ය ව්‍යාපාරයක් ගෙනයන ලදී.

පෙර ගෙවුම් මනුකරණ විසඳුමක් දියත් කිරීම ඉලක්ක කරගනිමින් ආසියානු සංවර්ධන බැංකු අරමුදල්කරණය යටතේ ලං.වි.ම. වෙත පෙර ගෙවුම් මනුගතකරණ විසඳුමක් පිළිබඳ අධ්‍යයනයක් 2019 වසරේදී ආරම්භ කරන ලදී.

ආයතනික ක්‍රමෝපාය කාර්යය හා සමගාමීව, ශාඛාව විසින් 2019-2023 කාල පරිච්ඡේදය සඳහා වූ ලං.වි.ම ආයතනික සැලැස්ම, එම කාල පරිච්ඡේදය සඳහාම වූ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික වාර්තාව - 2018, සංඛ්‍යාති සංග්‍රහය - 2018 අලෙවි හා ජනන දත්ත පොත - 2018 කාර්ය සාධනය 2019 හා 2020 සඳහා වූ වැඩසටහන් වැනි කරුණු ඇතුළත් ලං.වි.ම. ආයතනික ලේඛන ගොනු කොට පළ කිරීමේ කාර්යයද සිදු කරන ලදී.

## ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව

ලං.වි.ම. සේවක පැතිකඩ හරහා විධායක හා විධායක නොවන නිලධාරීන් විසින් මෙහෙයුම්, කාර්ය හා පිරිස් අත්පොත් සඳහා නොකඩවා සිදු කරන ලද ඉල්ලීම් හේතුකොට, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව විසින් නව අත්පොත් නිර්මාණය කරමින් දැනටමත් භාරගත් අත්පොත් කටයුතු සම්පූර්ණ කිරීමේ ප්‍රයත්නයන්හි නොකඩවා නිරත විය. ඒ අනුව, 'මෙහෙයුම් අත්පොත - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන)', 'මෙහෙයුම් අත්පොත - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික)', 'මෙහෙයුම් අත්පොත - නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු (බෙදාහැරීම්)', 'පිරිස් අත්පොත - වැටුප් හා වේතන' හා 'මෙහෙයුම් අත්පොත - නිවාඩු, නිවාඩු දින වැටුප්, හා හිලව් නිවාඩු සහ අතිකාල' වැනි අත්පොත් සැලසුම්ගත කාලයට පෙර සම්පූර්ණ කරන ලදී. 'විනය කාර්ය පරිපාටි නියමයන්' නමැති කෘතියෙහි සිංහල පරිවර්තනය අවසන් කොට එය බෙදාහැරීම සඳහා මුද්‍රණය කරන ලද අතර, භාෂා පරිවර්තකවරයා විසින් එම කෘතියෙහි සිදුකරන ලද දෙමළ පරිවර්තනය ලං.වි.ම. නිලධාරී මණ්ඩලයක සමාලෝචනය සඳහා ගන්නා ලදී.

අත්පොත් කටයුතු අවසන් කරන ලෙස සිදු කෙරෙන ඉමහත් ඉල්ලීම් හේතුකොට සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අංශයනට අයත් ඇතැම් අත්පොත් නිර්මාණය කිරීමේ කාර්යය පිටත සම්පත් දායකයන් වෙතින් සිදුකර ගැනීමට ශාඛාව විසින් තීරණය කර ඇත.

කාලීන කටයුත්තක් වන අතරම ආයතනයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීමෙහි ලා අත්‍යවශ්‍ය කරුණක්ද වශයෙන් සලකන ලද, පිරිස් ශාඛාව හා පුහුණු ශාඛාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කාලීන ඒවා බවට හා ආයතනයේ සමස්ත කාර්ය සාධනය ප්‍රවර්ධනයෙහි ලා අත්‍යවශ්‍ය ඒවා බවටද සලකන ලද අතර, ඒවා ප්‍රතිව්‍යුහගතකරණය සඳහා ස්ථාපනය කරන ලද කමිටුවේ නිර්දේශ මත පදනම්ව සකස් කරන ලදී. පිරිස් ශාඛාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මේවන විටද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර පුහුණු ශාඛාව සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කෙටුම්පත මේවන විටද අදාළ බලධාරීන් විසින් සමාලෝචනය කෙරෙමින් පවතී.

මේ අතර, අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය) විසින් ප්‍රධානත්වය දරන කාර්ය බලකා කමිටුවක් මගින් ආයතනය ප්‍රාණවත් හා කාර්යක්ෂම ආයතනයක් බවට පරිවර්තනය කිරීම සඳහා වූ නෛතික, ව්‍යුහාත්මක හා පරිපාලනමය වෙනස්කම් සඳහා වූ යෝජනා සකස් කරනු පිණිස ලං.වි.ම.හි විවිධ අංශයන් වෙතින් සමායෝජිත ප්‍රයත්නයක් දරන ලදී. වසර අවසානය දක්වාම මෙම කමිටුව විසින් සාකච්ඡාවන් ගණනාවක් පවත්වා යම් යම් කරුණු සැලකිල්ලට ගන්නා ලද අතර, ඒ පිළිබඳ වාර්තාව සකසා අවසන් කිරීමේ කටයුතු අඛන්ඩව සිදු කරන ලදී. අවසන් වාර්තාව තවදුරටත් සාරවත් කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු පිණිස ආයතනික කළමනාකරණ කණ්ඩායම (CMT) වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

ශාඛාව විසින් නවතම අන්තර්ගතයන් පළ කෙරෙන හා බෙදා හැරෙන අවස්ථාවන්හිදීම ඒවා අඩංගුවන පරිදි චක්‍රලේඛ අත්පොත් හා ලේඛන පද්ධතිය (CMDS) වෙත එම කරුණු උඩුගත කිරීමේ (upload) කටයුතු නොකඩවා සිදුකරන ලදී. චක්‍රලේඛ අත්පොත් හා ලේඛන පද්ධතිය මේවන විට ලං.වි.ම. සේවකයන් අතර නිරන්තරයෙන්ම ප්‍රවේශ වන්නාවූ තොරතුරු මූලාශ්‍ර අතරින් එකක් බවට පත්ව ඇත. අන්තර්ගතයන් මෙසේ නොකඩවා උඩුගත කිරීමත් සමගින් පද්ධතිය අවශ්‍යතාවනට අනුව සැකසීමේ කටයුතුද නොකඩවා සිදු කෙරිණි. ආයතනික සැලැස්ම 2019 - 2023 හි

# ආයතනික ක්‍රමෝපාය අංශය (ඉතිරි කොටස)

අවශ්‍යතාවයනට අනුව, අඛන්ඩ ප්‍රවර්ධන ප්‍රතිපත්ති කෙටුම්පතද සකස් කරන ලදී. මෙයට අමතරව, විවිධ අංශයන් වෙතින් නොකඩවා වර්ධනය වන ඉල්ලුම සපුරාලනු පිණිස දැනටමත් පළ කරන ලද අත්පොත් ගණනාවක්ද නැවත මුද්‍රණය කරන ලදී.

සුදුසු කටයුතු සඳහා කළමනාකාරිත්වය, සභාපතිවරයා සහ රේඛීය අමාත්‍යාංශය වෙත අනුගතවූ ඒකාබද්ධ ප්‍රතිචාර ඉදිරිපත් කෙරෙන බවට සහතික කරනු පිණිස ලං.වි.ම. කළමනාකාරිත්වය හා අදාළ විමසුම් ඉලක්ක කරන අදාළ අංශයන්ද සමගින් සම්බන්ධීකරණ කටයුතු කරමින්, විශේෂ කාරක සභා, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE), පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ආදීන් වෙතින් එන පාර්ලිමේන්තු විමසීම්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, රජයේ ආයතන ආදියෙන් එන විමසීම්ද සඳහා ප්‍රතිචාර සංග්‍රහ කිරීමට ශාඛාව විසින් නොකඩවා කළමනාකාරිත්වයට සිය සහාය ලබාදෙන ලදී.

## ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව

ලං.වි.ම.හි ප්‍රධාන ව්‍යාපාර හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් සැකසීම, ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙහි ලා ආයතනික කාර්ය සාධනය නිරීක්ෂණය සහ ලං.වි.ම.හි ආයතනික ප්‍රතිරූපය හා ආයතනික සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවේ ප්‍රධාන කටයුතු වේ.

1969 වසරේදී පිහිටුවීමෙන් අනතුරුව ලං.වි.ම. විසින් එහි ස්වර්ණ ජයන්තිය 2019.11.01 දින පවත්වන ලදී. මෙකී වැදගත් අවස්ථාව සමරනු වස්, 2019 වසර තුළ ලං.වි.ම. විසින් උත්සව ගණනාවක් සංවිධානය කරන ලදී. මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරය සියලු මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය තුළ ඉදිරියට ගෙන යමින් ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් මෙම අභ්‍යාසයෙහි ලා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන ලදී. 2019 වසර තුළ 100%ක විදුලියන මට්ටමක් සාක්ෂාත් කරගැනීම හා බලශක්ති සංරක්ෂණය මෙම ව්‍යාපාරය පිටුපස පැවති ප්‍රධාන තේමාවන් විය. ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවේ සහායද සහිතව, 2019 වසර තුළ ලං.වි.ම. පාරිභෝගිකයන් වෙත නව ජංගම යෙදවුමක් හා ලං.වි.ම. ඉතිහාස පොත එළි දැක්වීමද සිදු කරන ලදී.

2019 වසර තුළ ව්‍යාපාර මෙහෙයුම් හා ක්‍රමෝපාය ශාඛාව සහ ලං.වි.ම. පරිසර ඒකකය විසින් ලං.වි.ම. විදුලි බලාගාර හා සෙසු පරිශ්‍රයන්හි පැළ 50,000ක් රෝපණය කිරීමේ රුක් රෝපණ වැඩසටහනක්ද ආරම්භ කර ඇත. මෙකී සියලු කරුණු සාර්ථක කරගනු පිණිස, ව්‍යාපාර මෙහෙයුම් හා ක්‍රමෝපාය ශාඛාව විසින් එහි සේවය සැළකිය යුතු මට්ටමකින් ලබාදෙනු ලබයි.

වසර 2017, 2018, 2019 තුළ නවෝත්පාදන තරගයන්හි ත්‍යාග ප්‍රදානෝත්සවයද ලං.වි.ම. 50වන සංවත්සර සැමරුම හා සමගාමීව 2019.11.01 දින පවත්වන ලදී.

පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්හි කාර්ය සාධනය ප්‍රවර්ධනය කරනු පිණිස, ලං.වි.ම. විසින් 2019 වසර තුළද තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන නොකඩවා සිදු කිරීමට තීරණය කර



ඇත. දකුණු පළාතේ සියලු පාරිභෝගික සේවා මධ්‍යස්ථානද, වයඹ පළාතේ සමහරක්ද බස්නාහිර පළාත උතුරු කොටසේ සමහරක්ද 2019 වසර අවසානය වනවිට සිය තනි තරු ශ්‍රේණිය සාක්ෂාත් කරගෙන තිබිණි. සියලු පාරිභෝගික සේවා මධ්‍යස්ථානයනට අවම වශයෙන් තනි තරු මට්ටම හෝ සාක්ෂාත් කරගැනීමට දිරිමත් කරනු පිණිස තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් ශාඛාව විසින් පවත්වා ඇත.

සිංහල හා දෙමළ මාධ්‍ය දෙකෙහිම අන්තර් පාසල් අවසාන ප්‍රහේලිකා තරගය හා ත්‍යාග ප්‍රදානෝත්සවය (2018/2019) ද ලං.වි.ම. ස්වර්ණ ජයන්තිය හා සමගාමීව 2019.10.24 දින සාර්ථකව පවත්වන ලදී. 2019 වසර තුළ සිංහල වැඩසටහන් 35ක් පමණද දෙමළ වැඩසටහන් 45ක්ද පවත්වන ලදී. මෙම වැඩසටහන් හරහා විදුලි ආරක්ෂාව හා බලශක්ති කළමනාකරණය පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීම ලං.වි.ම.හි අපේක්ෂාව විය.

පුද්ගලික චින්තන හැකියාව, ව්‍යාපාරික හා සමාජමය චාරිත්‍ර විධි පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමේ අරමුණින් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු 12ක් පවත්වන ලදී. ලිපිකරු හා සමාන්තර සේවාවන්හි ලං.වි.ම. කාර්ය මණ්ඩලය සඳහා ධනාත්මක චින්තනය, ස්වයං - අභිප්‍රේරණය හා නායකත්වය පිළිබඳ තවත් වැඩසටහන් 6ක්ද පවත්වන ලදී. පාරිභෝගික සබඳතාවය හා ලං.වි.ම.හි ප්‍රතිරූපය ඉහළ නංවනු පිණිස, 2019 වසර තුළ පාරිභෝගික සම්බන්ධීකාරකවරුන් සඳහා මහජන සබඳතා වැඩසටහන් 8ක් පවත්වන ලදී.

ලං.වි.ම. වඩාත් ප්‍රාණවත් ආයතනයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය නෛතික, ව්‍යුහාත්මක හා පරිපාලනමය විෂමතාවයන් පිළිබඳ ක්‍රමෝපාය සාකච්ඡා සංසද දෙකක් 2019 වසර තුළ පවත්වන ලදී. සාමාන්‍ය පරිදිම, 2019 වසර තුළ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වන ලද TECHNO ප්‍රදර්ශනයටද ලං.වි.ම. සහභාගි විය.



# ආයතනික ක්‍රමෝපාය අංශය (ඉතිරි කොටස)

## තොරතුරු තාක්ෂණ (IT) ශාඛාව

කාර්යක්ෂමතාවය හා පාරිභෝගික තෘප්තිය ගෙන ඒනු පිණිස සුදුසු තාක්ෂණයට ලං.වි.ම. ව්‍යාපාරික ක්‍රියාවලිය ඒක රේඛීයගත කිරීමේ වගකීම තොරතුරු තාක්ෂණ ශාඛාව වෙත පැවරේ.

වසර ගණනාවක් පුරා බොහෝ වූ තොරතුරු තාක්ෂණ විසඳුම් සංවර්ධනය කර පරිභාරක අවශ්‍යතා ප්‍රකාර නිතිපතා යාවත්කාලීන කර ඇත. පාරිභෝගිකයා නවීනතම හා ශක්තිමත් තොරතුරු කරා රැගෙන යාමේ යාන්ත්‍රණ වශයෙන්, තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් පාරිභෝගික කළමනාකරණ මධ්‍යස්ථාන, 1987 ක්ෂණික ඇමතුම් සහ ඇමතුම් මධ්‍යස්ථාන, ආයතනික වෙබ් අඩවිය, කෙටි පණිවිඩ ද්වාර සේවාවන් සඳහා පහසුකම් සැලසීම සිදු කරන අතරම, තවදුරටත් ලංකා විදුලිබල මණ්ඩලයේ 50වන සංවත්සරය වෙනුවෙන් මුදා හැරීමට නියමිත පරිභාරක හිතවාදී ජංගම යෙදවුමක් සම්බන්ධ කටයුතුද සිදු කරමින් පවතී.

තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ආයතනයේ අංකිතකරණ අවශ්‍යතාවයන් සපුරාලනු වස් ක්‍රමෝපාය සතරක් භාවිත කරනු ලබයි. ඒවා නම්, ගෘහස්ථ සංවර්ධනය, ආයතනික අවශ්‍යතා සඳහා වෙන්ව සැකසූ රාක්කගත නිෂ්පාදන, පිටත තොරතුරු ශාඛාවන් වෙතින් සංවර්ධනයන්, නවෝත්පාදනයන් උකහා ගැනීම හා පිටත සම්පත්දායක සේවා ලබාගැනීම වේ. Breakdown Assist විසඳුම වූකලි 2019 වසරේ පැවති බිඳ වැටීම් කළමනාකරණ විසඳුම අදියරගත කරනු පිණිස තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ශාඛාවෙන් පිටත ක්‍රියාත්මක කර තිබූ එක් ප්‍රධාන ව්‍යාපෘතියකි. මෙම විසඳුම ලං.වි.ම. ගනුදෙනුකරුවන් සඳහා වූ ජංගම යෙදවුමකින්, විදුලි බිඳවැටුම් කණ්ඩායම් සඳහා වූ ටැබ් යෙදවුමකින්, හා අධීක්ෂකවරුන් හා ඉදිරි පෙළ නියෝජිතවරුන් සඳහා වෙබ් පදනම්ගත පද්ධතියකින්ද සමන්විත විය. Breakdown Assist විසඳුම විසින් විදුලිය බෙදාහැරීමේ අංශයන්හි පාරිභෝගික විදුලි පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ, පැමිණිලි කළමනාකරණයේ, විදුලි බිඳවැටුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ, බිඳ වැටුම් කණ්ඩායම් කළමනාකරණයේ විෂය පථය ආවරණය කරන ලදී.

තොරතුරු තාක්ෂණ ශාඛාවේ අධීක්ෂණ, පාලන හා දත්ත උකහා ගැනුම් සහ ස්වයංක්‍රීයකරණ ඒකකය විසින් 2018 වසරේ මැද භාගයේ නවීන අංකිත තාක්ෂණයන් හා උපකරණ යොදා ගනිමින් ලං.වි.ම. අවශ්‍යතාවයනට යෝග්‍ය වන පරිදි CEBAssist Solutions නමින් යුත් ගෘහස්ථ ව්‍යාපාර උපයෝගිතා මෘදුකාංග විසඳුමක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් කරා යොමුවිය. CEBAssist Solutions මගින් CEBCare ජංගම යෙදවුම, CEBCare පිටුව, හඬ ස්වයංක්‍රීයකරණ සේවාව, අන්තර්ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරක, කෙටි පණිවිඩ හා විද්‍යුත් තැපෑල වැනි පාරිභෝගිකයාට මෙන්ම අදාළ උපයෝගිතා ආයතනයටද අදාළ කාර්යය වඩාත් පහසු එකක් බවට පත්කරනු පිණිස ස්වයං-සේවා චැනල ගණනාවක් සම්පාදනය කරනු ලබයි.




ලං.වි.ම. විසින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද උත්සවයකදී 2019 ජූනි මාසයේදී CEBCare ජංගම යෙදවුම ආරම්භ කරන ලදී. 2019 වසර අවසානයේදී, CEBCare iOS සහ ඇන්ඩ්‍රොයිඩ් යෙදවුම විසින් බාගත කිරීම් 80,000ක් සාක්ෂාත් කරගෙන තිබූ අතර, CEBAssist සතු සක්‍රිය පරිභාරකයන් සංඛ්‍යාව 3,200ක් විය. CEBAssist සංවර්ධන කාර්යය අඛන්ඩ ගමනක් වන අතර එමගින් ලං.වි.ම. අවශ්‍යතාවයන් සඳහාම නිශ්චිතව සකසන ලද විසඳුම් සම්පාදනය කරමින් ලං.වි.ම. තොරතුරු තාක්ෂණ පරිවර්තනයේදී ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කරනු ලබයි. CEBAssist – BreakdownAssist මොඩියුලය 2018 ඊ-ස්වාභිමානී අංකිත සමාජ බලපෑම් සම්මාන ප්‍රදානෝත්සවයේදී ඇගයීමට ලක්විය. මෙයට අමතරව, CEBAssist විසඳුම විසින් SLT Zero One Awards 2019 නම් වූ සම්මාන ප්‍රදානෝත්සවයේදී හොඳම අංකිත-කාර්යගත කරන ලද නිෂ්පාදනය/සේවාව නම් වූ කාණ්ඩය හා හොඳම ජංගම පරිහරණ කාණ්ඩය සඳහා වූ රන් සම්මාන දෙකක්ද දිනාගන්නා ලදී.

තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ආයතනික වෙබ් අඩවිය නවීකරණය කොට බහුවිධ ගෙවුම් ද්වාරයන්ගෙන් සමන්විතවූ, වඩා වැඩි පරිභාරක හිතවාදී තොරතුරු සැකසුම්, පාරිභෝගික දොරටුව සහ ගෙවුම් සේවාවන්ද සහිතව නව වෙබ් අඩවියක් ගොඩනගා ඇත. තවද, තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් නොකඩවා දැනට පවත්නා තොරතුරු තාක්ෂණ සේවාවන් වැඩිදියුණු කරන අතර එය උපයෝගිතා බිල්පත්කරණය, ගිණුම්කරණය, ගාස්තු ඒකරාශිකරණය, ද්‍රව්‍ය කළමනාකරණය, සේවා සම්බන්ධතා සහ මානව සම්පත් කළමනාකරණයට පමණක් සීමා නොවන පරිදි දැනට පවත්නා තොරතුරු තාක්ෂණ සේවාවන්ද නොකඩවා වැඩිදියුණු කරනු ලබයි.

ලං.වි.ම. සතු අලෙවි ස්ථාන කවුළු, වෙබ් අඩවියෙන් ණය කාඩ්පත් ගෙවුම්, විදුලි වාහන ආරෝපණ විසඳුම සහ KIOSK යන්ත්‍ර පාරිභෝගික ගෙවුම් භාරගැනීම සඳහා ක්‍රියාත්මකව පවතී. ගනුදෙනුකරුවන් හට විදුලිය ඇණහිටීම් පිළිබඳ දැනුම් දෙමින් බිල්පත් ගාස්තු ගෙවීම් පිළිබඳ සිහි කැඳවීම් හා විදුලිය විසන්ධි කිරීමේ නිවේදන යැවීම සඳහා කෙටි පණිවිඩ නිවේදන පද්ධතියක්ද ක්‍රියාත්මකව පවතී. ගනුදෙනුකරුන් හට සිය විදුලි බිඳ වැටීම් පිළිබඳ දැනුම් දීම සඳහා SMART දුරකථන යෙදවුමක්ද වැඩිදියුණු කෙරෙමින් පවතී. වර්තමානයේ කාර්ය බහුල කාල වේලාවන් තුළ අත් විඳීමට සිදුවන ඇමතුම් මධ්‍යස්ථාන තදබදය සැළකිය යුතු මට්ටමකින් විසඳීමද මෙම යෙදවුම මගින් සිදු වනු අතැයි අපේක්ෂා කෙරේ.

කර්මාන්තයේ ප්‍රමිතිගත තොරතුරු තාක්ෂණ විසඳුම් සම්පාදනයෙහි ලා තොරතුරු තාක්ෂණ හර යටිතල පහසුකම් සූදානම්ව පවත්නා ඊළඟ පරම්පරාවේ ආරක්ෂණ විසඳුමක්ද සහිත ලං.වි.ම. පුද්ගලික වළාකුළු ස්ථාපනය (cloud setup) තොරතුරු තාක්ෂණ ශාඛාව සඳහා වූ ප්‍රධාන පියවරක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආපදා ප්‍රතිකර්ම ස්ථාපනයක් හා ස්වයංක්‍රීය ව්‍යාපාර අඛන්ඩතා ක්‍රියාවලියක් සහිත මෙම කර්මාන්ත ස්ථාවර විසඳුම විසින් ලං.වි.ම.හි සියලු තොරතුරු තාක්ෂණ පද්ධතීන් ඒකාබද්ධ කරමින් අනාගත තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා සීඝ්‍ර යටිතල පහසුකම් සම්පාදනයකට අවශ්‍ය පහසුකම්ද සලසනු ඇත. මෙම ඉලක්කය සඳහා වූ ප්‍රසම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ පදනම පසුගිය වසර තුළ සකසා තිබිණි.

ලං.වි.ම.හි පුළුල් ක්ෂේත්‍ර ජාලය (WAN) සතුව කල්බදුගත දත්ත මාර්ග මගින් සම්බන්ධිත සන්නිවේදන අවසන් ලක්ෂ්‍ය (nodes) 500ක් පමණද අපගේම ෆයිබර් ජාලයක්ද ඇත. විදුලි සංදේශ සේවා සම්පාදකයන් අතර පවත්නා දැඩි තරගකාරිත්වය හේතුකොට කල්බදුගත දත්ත මාර්ග ප්‍රසම්පාදනයෙහි ප්‍රමාණවත් පිරිවැය අවමකරණයක් අත්පත් කරගෙන ඇත. ජංගම පරිභාරකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන්නාවූ පහසුකම්ද සහිතව කර්මාන්ත ප්‍රමිතියට ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලයන් (Local Area Networks) නවීකරණය කිරීමේ කටයුතු තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ආරම්භ කොට ඇත. නොකඩවා වෙනස්වන ආරක්ෂක පසුබිම දරා සිටීමට හැකිවනු පිණිස ලං.වි.ම. තොරතුරු තාක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ අදහසින් දියුණු පාලන උපකරණ ගෙන එමින් ලං.වි.ම. තොරතුරු තාක්ෂණ ජාලයේ ආරක්ෂක පාලකයන් බලගැන්වීමට කටයුතු කෙරේ.

# ආයතනික ක්‍රමෝපාය අංශය (ඉතිරි කොටස)

ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු වන පරිදි සිය සේවකයන් වෙත කර්මාන්තයට යෝග්‍ය තාක්ෂණයන්ගේද සහාය සහිත අති විශිෂ්ට කාර්ය පරිසරයක් සම්පාදනය කර දීම තොරතුරු තාක්ෂණ ශාඛාවේ දර්ශනයයි. එම දැක්මද සහිතව, ලං.වි.ම. තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් පවත්නා විද්‍යුත් තැපැල් සේවාවන් වැඩිදියුණු කරමින්, සහයෝගී හා ඒකාබද්ධ සන්නිවේදන යටිතල පහසුකම්, ඒකාබද්ධ ලේඛන කළමනාකරණ ද්වාරයක් හා සේවාදායක උපකරණ කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම් කොට ඇත.

ලං.වි.ම. ඉදිරි ගමන අංකිතකරණයේ ඊළඟ මට්ටමට ගෙන එමින් ලං.වි.ම.හි දැනට පවත්නා විදුලි වාහන ආරෝපණ ස්ථාන හතෙහි backend මෙහෙයුම් ක්‍රියාත්මක කොට කළමනාකරණය කරනු පිණිස සුහුරු මනුකරණ හා සුහුරු ජාල නියමු වයාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් පර්යේෂණ හා සංවර්ධන ශාඛාව සමගින් සහයෝගී කාර්ය භාරයක නියැළිණි.

බොහෝ යෙදවුම් සම්බන්ධයෙන් නිතිපතා පරිභාරකයන් පුහුණු කිරීමේ අවශ්‍යතාවය තොරතුරු තාක්ෂණ අංශය විසින් හඳුනාගෙන ඇත. මේ අරමුණින් පුහුණු ශාඛාව මගින් බොහෝ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. මෙයට අමතරව, ආධාරක පද්ධතීන්ගේ අවශ්‍යතාවයන් ප්‍රකාර තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය වෙත සුදුසු තාක්ෂණය සහිතව පුහුණුව ලබාදීමේ වැදගත්කමද හඳුනාගෙන ඇත. ලං.වි.ම. ආයතනික අරමුණු සාක්ෂාත් කරගනු වස් නව තාක්ෂණය ගෙන එනු පිණිස අපට විශ්වාසවන්ත හා අභිප්‍රේරිත තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයක්ද අවශ්‍ය වේ.

## පර්යේෂණ හා සංවර්ධන ශාඛාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, හා ආලෝකකරණය සඳහා වූ ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන් සමන්විත වේ.

### ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය

ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධති විබර පැතිකඩ තුළ ඉහළ සන්ධ්‍යා සම කාර්ය බහුල කාලයක් අන්තර්ගතය. පද්ධති විබර පැතිකඩ කළමනාකරණය වූකලි ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ඒකකයේ මූලික අරමුණකි. විබර විතැන් වීමේ පසුබිමෙක විකල්ප පරිහරණ කාල ගෘහස්ථ අයක්‍රමයක් හා සන්ධ්‍යා සමයේ කාර්ය බහුල වේලාවේ විබර ප්‍රමාණයේ සිට කාර්ය බහුල නොවන අවස්ථාවන් දක්වා වූ විබර පිරවීමේ වාර්ෂික විබර සාධකයද ප්‍රවර්ධනය කිරීමේ කාර්යය පැහැදිලිව වර්ධනය වන නැඹුරුවක් පෙන්නුම් කරයි. බෙදාහැරීමේ අංශය විසින් හඳුනාගත් ගෘහස්ථ පාරිභෝගිකයන් අතර LED විදුලි පහන් බෙදාහැරීමද සන්ධ්‍යා කාල කාර්ය බහුල වේලාවේ විබර අවම කරනු පිණිස ගන්නා ලද තවත් ක්‍රියාමාර්ගයකි. නැගෙනහිර පළාතෙහි පවත්වන ලද විබර පර්යේෂණ වැඩසටහනෙන් (LRP) රැස්කරගත් දත්ත විග්‍රහ කිරීමෙන් අනතුරුව තෝරාගත් පළාත්වල විබර පර්යේෂණ වැඩසටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී. ලං.වි.ම. 50වන සංවත්සරය සැමරීම සඳහා ආරම්භ කරන ලද වැඩසටහනක් වශයෙන් ඉල්ලීම් තුළින් තෝරාගත් පාරිභෝගිකයන් සඳහා ගැටලු හඳුනා ගැනීමේ බලශක්ති විගණනයන්ද ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය විසින් පවත්වන ලදී. බස්නාහිර පළාත උතුර තොග පාරිභෝගිකයන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා පාරිභෝගිකයන් අතර බලශක්ති කාර්යක්ෂමතා සංස්කෘතිය වැඩදියුණු කිරීමේ අරමුණින් බලශක්ති විගණනයන්ගෙන් බලශක්ති කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කරනු පිණිස හඳුනාගත් පොදු කරුණු හා ක්‍රියාමාර්ග සාකච්ඡා කරන ලදී. කර්මාන්තයන්හි බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සීතාවක අපනයන පිරිසැකසුම් කළාපයෙහිද පවත්වන ලදී.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ පූර්ණ පහසුකම් සැලසීම සහිතව බහු පාර්ශ්ව සුහුරු විද්‍යුත් බලශක්ති මනුවක් වැඩිදියුණු කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියකද ලං.වි.ම. පර්යේෂණ කණ්ඩායම සක්‍රීයව නියැළිණි. මූලික සැලසුම් සකසා අවසන් කොට මූලාකෘතිද නිමවන ලදී. සිය ගණනක් වූ එකලා සුහුරු විද්‍යුත් බලශක්ති මනු නිෂ්පාදනය කරන ලද අතර ඒවා ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් වෙමින් පවතී. ලං.වි.ම. ජාලය තුළ මනු-සර්වර සන්නිවේදනය සඳහා යෝග්‍ය සන්නිවේදන ක්‍රමයක් සොයාගනු පිණිස 'ගුවන්විදුලි සංඛ්‍යාත දැලැස් සන්නිවේදනය' පිළිබඳ අධ්‍යයනය ලං.වි.ම. ඉංජිනේරු කණ්ඩායමක් විසින් සිදු කරමින් පවතී.

ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල්ගත සුහුරු මනුගතකරණ නියමු ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ව්‍යාපෘතිය 2019 ජුලි මාසයේදී මෙහෙවරෙහි යොදවන ලද අතර, නියමු ව්‍යාපෘතිය යටතේ සුහුරු මනු 1,000ක් ස්ථාපනය කෙරෙනු ඇත. ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය විසින් එකී මනු වෙතින් ලැබෙන දත්ත නිරීක්ෂණය කොට විශ්ලේෂණය කරනු ඇත. මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ කටුනායක භූගෝලීය කළාපය තුළ සුහුරු මනු 10,000ක් දක්වා ව්‍යාප්ත කෙරෙනු ඇත.



නියමු ව්‍යාපෘතිය යටතේ සුහුරු මනු ස්ථාපනය

### පර්යේෂණ හා සංවර්ධන ඒකකය

ලං.වි.ම. තුළ පවත්වනු ලබන පර්යේෂණ හා සංවර්ධන කටයුතු පෝෂණය කිරීමේ අපේක්ෂාවෙන්, පර්යේෂණ හා සංවර්ධන ඒකකය විසින් හඳුනාගත් විවිධ පර්යේෂණ මාතෘකා සම්බන්ධ පර්යේෂණ සම්බන්ධීකරණය කරනු ලබයි. සූර්ය සත්කාරක ධාරිතා ගණන ආකෘතිය වූකලි අධ්‍යයනය මගින් ගොඩනගන ලද 'දේශීය සම්බන්ධක ජාලය මත වහළය මත සවිකරන සූර්ය පද්ධතීන්හි බලපෑම' නමින් ශීර්ෂගත පර්යේෂණයේ එවැනි එක් ප්‍රතිඵලයක් වූ අතර එය ලං.වි.ම. ප්‍රාදේශීය කාර්යාල අතර බෙදාහැර ඇත. මෙම මාදිලිය මගින්, යම් දෙන ලද ස්ථානයක පෝෂකයක සූර්ය සත්කාරක ධාරිතාවය පිළිබඳ මූලික තීරණ ගැනීමට පහසුකම් සැලසේ. තවද, 'බෙදාහැරීමේ ජාලය කෙරෙහි අකුණු සැරයෙන් ඇතිවන බලපෑම පිළිබඳ තක්සේරුව හා අධික ලෙස අකුණු ගැසීම් සහිත ප්‍රදේශයන් සඳහා ක්‍රියාත්මක කළ හැකි විසඳුමක් සපයා ගැනීම' හා 'සූර්ය බලශක්තිය හා වියළි කෝෂ දෙමුහුන් පද්ධති' නමැති පර්යේෂණද සාර්ථකව මෙම වසර තුළ අවසන් කරන ලදී.

ලං.වි.ම. සේවකයන් විසින් සිදුකරන ලද පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතු/නිබන්ධන ඉදිරිපත් කිරීම සඳහා වූ මාසික සම්මන්ත්‍රණ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේදී පවත්වන ලදී. බෙදාහැරීමේ, සම්ප්‍රේෂණ, ජනන හා මූල්‍ය අංශයන්ගෙන් ඉදිරිපත් කරන ලද පර්යේෂණ තිස් පහක් එම සම්මන්ත්‍රණ තුළ ගෙනහැර දක්වන ලදී. 'ඩීසල් ජනන යන්ත්‍ර ශබ්ද ආරක්ෂණය සඳහා ආවරණයක් සැකසීම' යන්න ඉහත සම්මන්ත්‍රණවල ප්‍රතිඵලයක් ලෙස ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතියකි. පාටිකල් ස්වාම් ඔප්ටිමයිසේෂන් ක්‍රමය යොදාගනිමින් මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යුත් හා විදුලි සංදේශ අධ්‍යයනාංශය විසින් මාදිලි උපරිමකරණයේ නිරවද්‍යතාවය සනාථ කර ඇත. යම් ජනන යන්ත්‍රයක් සඳහා උපරිමකරණය කළ පරාමිතීන් සහිත ආවරණය නිෂ්පාදනය කරන ලද අතර උපරිමකරණය කරන ලද ගණිත මාදිලියේ නිමැවුම මගින් ශබ්ද පීඩන මිනුම් විශ්ලේෂණය කරන ලදී. අනාගත ජනන යන්ත්‍ර කට්ටල ප්‍රසම්පාදන කාර්යයෙහිදී සලකා බලනු පිණිස අවසන් වාර්තාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වැඩපළ හා සහායක සේවා) වෙත ඉදිරිපත් කරන ලදී.

# ආයතනික ක්‍රමෝපාය අංශය (ඉතිරි කොටස)

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් බෙදාහැරීමේ උපපොළ නඩත්තුව පිළිබඳ වාර්තා වැඩසටහනක් නිර්මාණය කරන ලදී. මෙම වාර්තා වැඩසටහන බෙදාහැරීමේ උපපොළ නඩත්තුවේදී අනුගමනය කළයුතු යහ පරිචයන් පිළිබඳ දැනුම බෙදාහැරීම සඳහා යොදාගනු ඇත.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නායකත්වය යටතේ ලං.වි.ම. ඉංජිනේරුවන් කණ්ඩායමක් විසින් 'ගුණ තත්ත්වයේ ට්‍රාන්ස්ෆෝමර ස්ථලකය මත පදනම්ව වාණිජ හා ගෘහස්ථ සූර්ය විදුලිබල ස්ථාපනයන් සඳහා වූ ජාල බැඳුම් ඉන්වර්ටරයක් සැලසුම් කිරීම' නමැති කාර්යයෙහි නිරත විය.

ව්‍යාපාරය නියාමනය කරමින් විෂමතා සමකරණ ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ක්‍රියාමාර්ගයක් වශයෙන් විදුලි වාහන ආරෝපණ ස්ථාන (EVCSs) ආරම්භ කිරීමට ලං.වි.ම. විසින් තීරණය කර ඇත. ලං.වි.ම. විසින් විදුලි වාහන ආරෝපණ ස්ථාන හතක් අනුරාධපුර, මහනුවර, අවිස්සාවේල්ල, නුවර එළිය, පන්නිපිටිය හා දෙහිවල යන ස්ථානයන්හි මෙහෙවරෙහි යොදවන ලදී. තවද, 2019 වසරේදී තවත් විදුලි වාහන ආරෝපණ ස්ථාන දහයක් ප්‍රසම්පාදනයටද ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානය (RCL)

ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි වේ:

- ආලෝකකරණය මගින් සිදුවන විදුලි ඉල්ලුම අවම කරනු පිණිස විදුලි කාර්යක්ෂම, විශ්වසනීය හා පවිත්‍ර ආලෝකකරණ තාක්ෂණයන් පිළිබඳ දැනුවත්භාවය හා ඒවා දැරිය හැකි මිලකට ලබාගැනීමේ හැකියාව හා ආලෝකකරණ විදුලි ඉල්ලුම අවම කරනු පිණිස ඒවා යොදා ගැනීම වර්ධනය කිරීම.



මහනුවර විදුලි වාහන ආරෝපණ ස්ථානය



පන්නිපිටිය විදුලි වාහන ආරෝපණ ස්ථානය

- අදාළ ප්‍රදේශයේ ආර්ථික ප්‍රවර්ධනය පිණිස බලශක්ති කාර්යක්ෂමතාවය සහිත ආලෝකකරණ නිෂ්පාදන ප්‍රාදේශීය මට්ටමින් නිෂ්පාදනය උත්ප්‍රේරණය.
- බොහෝ අව වරප්‍රසාදිත පුරවැසියන් සඳහා ආලෝකකරණ උපකරණ (විදුලි බල්බ) දැරිය හැකි මිලකට ලබාගැනීමට සැලැස්වීම
- දකුණු ආසියාවේ තිරසර ආලෝකකරණයක් ඇති කරනු පිණිස ප්‍රදේශයේ අවශ්‍ය කාර්ය බලකායන් පුහුණු කිරීම හා දැනුවත් කිරීම

### නිෂ්පාදන පරීක්ෂණයට ලක් කිරීම

ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානය සතුව පූර්ණ වශයෙන් සන්නද්ධ දීප්තිමිතික රසායනාගාරයක් පවතී. එහි මී.1 හා මී.2 විෂ්කම්භයෙන් යුත් ඒකාබද්ධ ගෝල දෙකක් පවත්නා අතර ප්‍රධාන උපකරණයක් වශයෙන් ගෝනියොමීටරයක්ද පවතී. මෙය වක්‍රකලි ආලෝක වස්තූන්හි තීව්‍රතා බෙදීයාම ග්‍රහණය කරගැනීමේ හැකියාව සහිත ශ්‍රී ලංකාවේ පළමු ගෝනියොමීටරයයි.

ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානය විසින් සම්මුතික ආලෝකකරණ නිෂ්පාදනයන්හි හා ගුණ තත්ත්ව ආලෝකකරණ නිෂ්පාදනයන්හි (SSL) දීප්තිමිතික හා විදුලි පරාමිති පරීක්ෂණ සිදු කරනු ලබයි. මේවන විට, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සියලු ආනයනික සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් (CFL) සඳහා වූ ලේබල්කරණ වැඩසටහනක් බලගන්වා ඇත. සියලු සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් SLS 1231 හා SLS 1225 අවශ්‍යතා සපුරාලිය යුතුවේ. ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානය විසින් ආනයනික සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් ඉහත සඳහන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන ප්‍රමිතීන් හා අනුගත වන්නේද යන්න පිරික්සා බලනු පිණිස ඒවා පරීක්ෂා කිරීමේ කාර්යය සිදු කරනු ලබයි. තවද, ආලෝක විමෝචන දියෝඩ (LED) නිෂ්පාදන IEC 62612 ප්‍රමිතියට අනුව පරීක්ෂා කිරීම හා ආලෝක විමෝචන දියෝඩ සාම්පල SLS 1530:2016 හා අනුගත වන්නේද යන්න තහවුරු කරගැනීමට පරීක්ෂා කිරීමද, පොදු ආලෝකකරණ සේවාවන් වෙනුවෙන් ස්වයං තුලබරු සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන් සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රමිතිගත අවම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිතිය (MEPS)ද ප්‍රාදේශීය ආලෝකකරණ මධ්‍යස්ථානය විසින් පරීක්ෂා කරනු ලබයි.

### උපදේශන සේවා

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් බලශක්ති විගණනය හා ආලෝකකරණ සැලසුම්කරණයද අන්තර්ගතව ආලෝකකරණයට අදාළ පැවරුම් ඇතුළත් ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණයට අදාළ පැවරුම් සම්බන්ධ උපදේශන සේවාවන් සම්පාදනය කරනු ලබයි.

### ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණය

සමස්ත ආයතනය පුරා තොරතුරු ඒකාබද්ධකරණය කිරීමේ අදහසින් ලං.වි.ම. ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ (ERP) පද්ධතිය විසින් ව්‍යාපාර ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කරනු ඇත. පෙරදී විවිධ පද්ධති තුළට කොටස් කොට තිබූ තොරතුරු පාරිභෝගික සබඳතා කළමනාකරණය, මූල්‍යකරණය, ප්‍රසම්පාදනය, මානව සම්පත් කළමනාකරණය, වත්කම් කළමනාකරණය, නඩත්තු කළමනාකරණය ආදී විවිධ ව්‍යාපාර ක්‍රියාවලි මගින් හුවමාරු කරගැනීමට හැකිවන පරිදි සංවිධානය පුරා අඛණ්ඩව ගලායා හැක. සංවිධානයේ සියලු මට්ටම් හරහා තොරතුරු ගලායන පරිදි ජනන, සම්ප්‍රේෂණ, බෙදාහැරීමේ හා මධ්‍යගත සේවාවන්ගෙන් එන වෙන් වෙන් වූ ව්‍යාපාර ක්‍රියාවලීන් ඒකාබද්ධ කෙරෙනු ඇත.

ලං.වි.ම. ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය විසින් 2019 වසර තුළ මනා ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩී.ජ.ඩො.මි. 10ක ණය මූල්‍යකරණයක් ලබා ගැනීමට ලං.වි.ම.ට හැකිවිය. ආසියානු සංවර්ධන බැංකු අවශ්‍යතාවනට යෝග්‍යවන පරිදි ලංසු ලේඛනවලට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව, ව්‍යාවසාය සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘති ටෙන්ඩරය සඳහා 2019 නොවැම්බර් මස 07වන දින දැන්වීම් පළ කරන ලද අතර මේවන විට ලංසු තක්සේරු කෙරෙමින් පවතී. ව්‍යාපෘතියේ අදියර 01 වසර දෙකකින්ද, අදියර 02 තවත් වසරකින්ද සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය.



මෙහෙයුම් සමාලෝචනය

# පිරිස් ශාඛාව
# අභ්‍යන්තර විගණන ශාඛාව
# නීති ඒකකය
# විශේෂ විමර්ශන ඒකකය
# වෙනත් සිදුවීම්

# පිරිස් ශාඛාව

ලං.වි.ම. පිරිස් ශාඛාව ආයතනයේ විවිධ හර කාර්යයන් සඳහා සහාය වනු පිණිස ප්‍රශස්ත මට්ටමින් මානව සම්පත් බඳවා ගැනීම, පුහුණු කිරීම හා රඳවා ගැනීම සඳහා කැපවී සිටී. මෙම ඉලක්කය සාක්ෂාත් කරගනු පිණිස, පිරිස් ශාඛාව විසින් මානව සම්පත් සැලසුම්කරණය, බඳවා ගැනීම, ස්ථානගත කිරීම, උසස් කිරීම් හා ස්ථාන මාරු, විවිධ කාර්ය මණ්ඩල ප්‍රතිපත්ති සැකසීම, ප්‍රතිඵල කළමනාකරණය හා විනය කරුණු කළමනාකරණයද වැනි විවිධ මානව සම්පත් කටයුතු සිදු කරනු ලබයි.

2019 වසර තුළ ආයතනය තුළට 718 දෙනෙකු අලුතින් බඳවා ගන්නා ලදී. තවද, මෙම කාලය ඇතුළත සේවකයන් 523 දෙනෙකු විශ්‍රාම ලබා ඇති අතර ඉල්ලා අස්වීම්, මියයාම් හා සේවය අවසන් කිරීම් වැනි විවධ හේතු මත සේවකයන් 82 දෙනෙකු ආයතනය හැරගොස් ඇත.

වසර අවසානය වනවිට ආයතනයේ පැවති පිරිස් බලය පහත දී ඇත:

| සේවක කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ස්ථිර | 20,512 |
| අනියම් | 2,406 |
| කොන්ත්‍රාත් | 218 |
| සිවු වසර ආධුනිකත්ව පුහුණු යෝජනා ක්‍රමය යටතේ අභ්‍යාසලාභීන් | 2,978 |
| එකතුව | 26,114 |




රූපය 01

ඉහත සේවකයෝ වයස අවුරුදු 18 සිට 60 දක්වා විවිධ වයස් කාණ්ඩවලට අයත් වේ. 2019 වසර අවසානය වනවිට ලං.වි.ම. සේවකයන් පිළිබඳ වයස් විග්‍රහය රූපය 01හි දක්වා ඇත.

කාර්ය බලකා විවිධත්වය හේතුකොට, වසර 3කට අඩු සේවයක් සහිත සේවකයන්ගේ සිට වසර 30 ඉක්මවූ සේවයක් සහිත සේවකයන් දක්වා විහිදෙන සේවා කාල පරාස සහිත සේවකයන් ලං.වි.ම. සතුවේ. පහත දැක්වෙන ප්‍රස්ථාරය තුළ ආයතනයෙහි සේවා කාලයට අනුව සමස්ත ලං.වි.ම. කාර්ය මණ්ඩලයේ සේවා පළපුරුද්ද දක්වනු ලබයි (රූපය 02).

සේවකයන් බෙදී යාම




රූපය 02

ලං.වි.ම. සමස්ත කාර්ය බලකාය විධායක නිලධාරීන්, මැදි මට්ටමේ කාර්මික සේවය, පුහුණු කාර්මික සේවය, කණිෂ්ඨ හා නුපුහුණු කාර්මික සේවය, ලිපිකරු හා සමාන්තර සේවා සහ සෙසු තාක්ෂණික නොවන කාර්ය මණ්ඩල සේවා ශ්‍රේණි වශයෙන් තවදුරටත් කාණ්ඩගත කළ හැක. සේවා කාණ්ඩයට අනුව සේවක විග්‍රහය රූපය 03 තුළ දක්වා ඇත.

සේවකයින් ගණන




රූපය 03

## සුහසාධක ඒකකය

ලං.වි.ම. සේවකයන්ගේ යහ පැවැත්ම සඳහා අවශ්‍ය පහසුකම් සලසනු පිණිස සුභසාධක ඒකකය ස්ථාපනය කරන ලදී. මෙම අරමුණ සපුරාලනු පිණිස, මෙම ඒකකය විසින් පහත ආකාරයේ විවිධ කටයුතු ඉටු කරනු ලබයි.

- ලං.වි.ම. සංචාරක බංගලා නඩත්තුව හා පරිපාලනයග
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ලං.වි.ම. ආපන ශාලාව නඩත්තුව හා පරිපාලනය.
- සමනල අරණ, සමන් දේවාලය, වෙසක්, පොසොන්, හා නත්තල් උත්සව ආදිය

ලං.වි.ම. සුභසාධක ඒකකය සතු හා එමගින් නඩත්තු වන සංචාරක බංගලා 32ක් රටපුරා ව්‍යාප්තව පවතී. මෙම ස්ථාන වෙත යන්නාවූ සේවකයන් වෙත අමතක නොවන අත්දැකීමක් ලබාදෙනු පිණිස සත්කාරකත්ව කර්මාන්ත ප්‍රමිතීන් හා සමාන්තරව යන පරිදි මේවාහි පහසුකම්ද පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩ වැඩිදියුණු කිරීම් සිදු කර ඇත.

සියලු සේවා නියුක්තිකයන් වෙත සුහසාධක පහසුකම් ව්‍යාප්ත කරනු පිණිස, ලං.වි.ම. විසින් එහි අරමුදල් යොදා ගනිමින් දුරස්ථ ප්‍රදේශයන්හි පිහිටි සියලු විදුලි බලාගාරයන්හි මොන්ටිසෝරි පාසැල් පවත්වාගෙන යනු ලබයි.

# අභ්‍යන්තර විගණන ශාඛාව

## අභ්‍යන්තර විගණන කාර්ය සාධනය - 2019

අභ්‍යන්තර විගණන ශාඛාව ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා යටතේ ක්‍රියාත්මකවන අතර ආයතනික පාලන වගකීම් ඉටු කිරීමේදී මෙන්ම ආයතනය තුළ ඵලදායී හා කාර්යක්ෂම ව්‍යාපාරික හා මෙහෙයුම් ක්‍රියාවලීන් ප්‍රවර්ධනයේදීද අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වෙත සහාය ලබාදෙනු පිණිස 85 දෙනෙකුගෙන් සැදි සහාය කාර්ය මණ්ඩලයක්ද වෙයි.

අභ්‍යන්තර විගණනයේ විෂය පථය වනුයේ මෙම ක්‍රියාවලීන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න ස්වාධීනව තක්සේරු කොට ආයතනයේ අරමුණු හා අභිමතාර්ථ සාධනය කිරීමේ හැකියාව ලබාදෙනු පිණිස ආයතනයේ දැනට පවත්නා අවදානම් කළමනාකරණය, පාලනයන් හා පාලන ක්‍රියාවලීන්හි ප්‍රමාණවත් බව හා ඵලදායකත්වය ඇගයීමයි.

සියලු ඒකකයන්හි හා ශාඛාවන්හි විගණන කාර්යයන් සිදු කෙරෙන අතර තක්සේරු කෙරෙන අවදානම් මට්ටම හා කාර්ය මණ්ඩලයේ පවත්නා සංඛ්‍යාව මගින් කෙතරම් වාර ගණනක් එය සිදු වන්නේද යන්න තීරණය වේ. 2019 වසර තුළ, අභ්‍යන්තර විගණන ශාඛාව විසින් පහත සඳහන් විගණනයන් සිදුකරන ලදී.

| | |
|---|---|
| සිරිත්හුරු විගණන | 14 |
| ආදායම් විගණන | 19 |
| පද්ධති විගණන | 39 |
| විශේෂ විමර්ශන | 17 |
| විගණන කමිටු වාර්තා | 22 |
| එකතුව | 111 |

2019 වසර තුළ ලං.වි.ම. තුළට හඳුන්වා දෙන ලද නිශ්චිත ක්‍රම ක්‍රියාත්මකව පවත්නේද යන්න හා අදාළ නිලධාරීන් විසින් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කරනු ලබන්නේද යන්න තහවුරු කරගනු පිණිස පද්ධති විගණනයන් වෙත වැඩි අවධානයක් යොමු කරන ලදී.

## විගණන කමිටුව

පාලන ආයතනයේ අනු කමිටුවක් වශයෙන් විගණන කමිටුව වෙත ආයතනයේ පාලනය හා අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීමේ, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමේ හා අභ්‍යන්තර විගණන හා බාහිර විගණන කටයුතු සමාලෝචනය කිරීමේ ඒකාබද්ධ වගකීමක් පැවරේ.

මූල්‍ය, විගණන හා ඒ ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි පෘථුල අත්දැකීම් සහිත හා මනා කුසලතාවයන් සහිත ස්වාධීන අධ්‍යක්ෂවරුන් සිවු දෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. සාමාන්‍යාධිකාරීවරයා ප්‍රධාන විධායක නිලධාරීවරයා වශයෙන් සේවය කරන අතර අභ්‍යන්තර විගණන ප්‍රධානියා කමිටුවේ කැඳවුම්කරු ලෙස සේවය කරයි. ඒ අතර මූල්‍ය කළමනාකරු, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු හා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයෙකුද ආරාධිතව රැස්වීම්වලට සහභාගි වෙති.

2019 වසර සඳහා විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ:

| | |
|---|---|
| තිලකා ජයසුන්දර මෙනෙවිය | සභාපති |
| එස්.කේ.කන්නන්ගර මහතා | සාමාජික |
| කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා | සාමාජික |
| රූබන් වික්‍රමාරච්චි මහතා | සාමාජික |

සිය පෘථුල අත්දැකීම් හා ප්‍රවීණත්වය යොදා ගනිමින් මෙහෙයුම් හා මූල්‍ය සමාලෝචන ක්ෂේත්‍රයන්හි සිදුකරන ලද විගණනයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයන් හා බාහිර විගණනයන් විසින් ඉදිරිපත් කෙරෙන වාර්තා සාකච්ඡා කොට, ආයතනය විසින් මුහුණ පාන්නාවූ වංචා සහ දෝෂයන් සිදුවීමේ අවස්ථාවන් හා හැකියාවන් මෙන්ම මෙහෙයුම්ගත හා මූල්‍යමය අවදානම්ද අවම කරමින් පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කරනු පිණිස අවශ්‍ය තැන්හි ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයන් හා අවදානම් සමන ක්‍රමෝපායන්ද නිර්දේශ කරනු ලබයි. 2019 වසර තුළ කමිටුව විධිමත් පරිදි තෙවරක් රැස්විය.

# නීති ඒකකය

ආයතනයේ සියලු නීති කටයුතු හා නඩු කටයුතු නීති අංශය විසින් සිදු කරනු ලබයි. මෙම ඒකකය ප්‍රධාන නීති නිලධාරීගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මකවන අතර, ඔහුට සහාය සඳහා නීති නිලධාරීන් පස් දෙනෙකුගෙන් හා සෙසු කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ.

මෙම ඒකකය විසින් ආවරණය කෙරෙන ප්‍රධාන නීති අංශ දෙකකි.

පළමු කාණ්ඩය මගින් පහත කරුණු ආවරණය කරනු ලබයි:

- විදුලිය විසන්ධි කිරීමෙන් අනතුරුව හිඟ මුදල් අයකර ගැනීම/ මනු දෝෂ, අවභාවිතය ආදිය ආශ්‍රිත විදුලි බිල්පත් ප්‍රතිශෝධනය.
- ගිවිසුම්/කොන්ත්‍රාත් කඩ කිරීමෙන් ඉස්මතුවන ගැටලු
- ලං.වි.ම. දේපළ/වාහනවලට සිදුවූ හානි පියවා ගැනීම
- ලං.වි.ම. නිල නිවාස/ඉඩම් සම්බන්ධ අයිතිය පියවා කරගැනීම

දෙවන කාණ්ඩය මගින් පහත කරුණු ආවරණය කරනු ලබයි:

- විදුලිය විසන්ධි කිරීම් හා බිල්පත් ප්‍රතිශෝධනයනට එරෙහිව ගත් නීතිමය ක්‍රියාමාර්ග
- තුන්වන පාර්ශ්ව දේපළ මතින් විදුලි රැහැන් ඇදීමට එරෙහිව නිකුත් කර ඇති තහනම් නියෝග/ වාරණ නියෝග/ එකී දේපළ, ඉඩම්, ගස්/වගාවන් ආදියට සිදුවූ හානි සඳහා වන්දි ඉල්ලා සිටීම
- ටෙන්ඩර්/කොන්ත්‍රාත් කටයුතුවලදී නියමිත කාර්ය පරිපාටිය උල්ලංඝනය, කඩ කිරීමට එරෙහිව, අලාභ ඉල්ලා සිටීම
- මූලික අයිතිවාසිකම් අයැදුම්පත්, සේවය අවසන් කිරීම, සේවාදායක එරෙහිව සේවායෝජක ආදී නඩු කටයුතුවලට අදාළව කම්කරු විනිශ්චය සභා/කාර්මික අධිකරණ/ කම්කරු දෙපාර්තමේන්තු කටයුතු

2019 වසර තුළ, නීති ඒකකය විසින් පහත සඳහන් අධිකරණ කටයුතුවලට සහභාගි වී ඇත

| අධිකරණයේ නම | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 31 |
| අභියාචනාධිකරණය | 41 |
| සිවිල් අභියාචනා මහාධිකරණය හා මහාධිකරණය | 17 |
| දිසා අධිකරණය | 161 |
| කම්කරු විනිශ්චය අධිකාරිය හා කාර්මික අධිකරණය | 32 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 10 |

මෙයට අමතරව, මණ්ඩලය හා සේවකයන් අතර ආරවුල්, සේවය අවසන් කිරීමට අදාළ සේවා නියුක්තිකයන්ගේ කටයුතු, සේවය හැරයාමේ නිවේදන හා දුක් ගැනවිලි සම්බන්ධයෙන්ද පහත සඳහන් විනිශ්චයාධිකාරයන්හි පවත්නා නීතිවලට අනුව කටයුතු කරන ලදී.

- කම්කරු විනිශ්චය අධිකාරිය
- කම්කරු දෙපාර්තමේන්තුව
- මානව හිමිකම් කොමිෂන් සභාව
- කාර්මික අධිකරණය

චෝදනා පත්‍ර, ස්ථාවර කාල කොන්ත්‍රාත් සම්බන්ධ පත්වීම් ලිපි හා කම්කරු කටයුතුවලට අදාළ ලේඛනද අපේක්ෂිත ලැබුම්කරුවන් නිකුත් කිරීමට පෙර පරීක්ෂාකර බැලීමේ වගකීමද නීති ඒකකය වෙත පැවරේ.

සියලු මූල්‍ය ගිවිසුම්, වාණිජ ගිවිසුම් හා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්ද ඇතුළත්ව බාහිර පාර්ශ්වයන් සමගින් ලං.වි.ම. එළැඹෙන ගිවිසුම්/කොන්ත්‍රාත්වල නීතිමය වලංගුභාවය සහතික කිරීමේ වගකීමද මෙම ඒකකයට පැවරේ.

# විශේෂ විමර්ශන ඒකකය

නීති විරෝධී ලෙස විදුලිය ලබාගැනීම හා මනු වෙනස් කිරීම සම්බන්ධයෙන් වූ විමර්ශන කඩිනම් කරනු පිණිස කළමනාකරු - විමර්ශන ගේ ප්‍රධානත්වයෙන් 1995 වර්ෂයේදී විශේෂ විමර්ශන ඒකකය පිහිටුවන ලදී. විමර්ශන සිදු කරනු පිණිස රට පුරා කඩා පනින හමුදාවන් දහ අටක් ස්ථානගත කොට ඇත.

2019 වසර තුළ විශේෂ විමර්ශන ඒකකය විසින් කටයුතු කරන ලද සිද්ධීනට අදාළ ප්‍රගතිය පහත දී ඇත:

| අවස්ථා | සාර්ථක වූ අවස්ථා | අධිකරණ දඩය (රු.මි.) | ලං.වි.ම. අලාභය (රු.මි.) | එකතුව (රු.මි.) |
|---|---|---|---|---|
| මනුවලට අදාළ සිදුවීම් | 1825 | 5.550 | 102.96 | 108.52 |
| අයථා ලෙස විදුලිය ලබාගැනුම් | 112 | 0.425 | 2.05 | 2.47 |
| එකතුව | 1937 | 5.975 | 105.01 | 110.99 |




ඉහත කටයුතුවලට අමතරව විශේෂ විමර්ශන ඒකකය විසින් විමර්ශන ගණනාවක් පවත්වන ලදුව වරදකාරී නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන ඇත.

# වෙනත් සිදුවීම් 2019

## ජනවාරි




බෙදාහැරීමේ අංශය 2 මූලස්ථානය නව ගොඩනැගිල්ලකට ගෙනයන ලදී

අතිරේක සාමාන්‍යාධිකාරී - (බෙදාහැරීමේ අංශය 2) 2019 ජනවාරි මස 10වන දින කඩවත පිහිටි නව ගොඩනැගිල්ලකට ගෙනයන ලදී. ලං.වි.ම. මූලස්ථානයේ පළමු මහලෙහි නවීකරණ කටයුතුවලට පහසුවක් වනු පිණිස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් හා සංවර්ධන), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) සහ බෙදාහැරීමේ අංශය 2හි අතිරේක මූල්‍ය කළමනාකරුගේ කාර්යාලයන්ද එම ගොඩනැගිල්ල වෙතම ගෙනයන ලදී.



කරාපිටිය ආරෝග්‍ය ශාලාවේ පිළිකා වාට්ටුවේ ලෙඩුන් සඳහා උදේ ආහාරය සපයා දීම

මෙම කාර්යය 2019 ජනවාරි මස 10වන දින බෙදාහැරීමේ අංශය 2හි සේවකයන් විසින් සංවිධානය කරන ලදී

## මාර්තු





නැගෙනහිර පළාතේ පවත්වන ලද තොග සැපයුම් පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන

ලං.වි.ම. විසින් සැලසුම් කර ඇති සංවර්ධන කාර්යයන් පිළිබඳ ඔවුන් වෙත දැනුමක් ලබා දෙමින් ලං.වි.ම. විසින් ලබාදෙනු ලබන සේවාවන් තවදුරටත් වැඩිදියුණු කරනු පිණිස පාරිභෝගික ප්‍රතිපෝෂණයන් ලබාගැනීම සඳහා නැගෙනහිර පළාතේ තොග සැපයුම් පාරිභෝගිකයන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී. මෙම කාර්යය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත) ශාඛාවන් විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලදී. පළමු වැඩසටහන 2019 මාර්තු මස 29වන දින ත්‍රිකුණාමලයේදී පවත්වන ලදී. මෙම කාර්යය සඳහා මනා පිරිස් සහභාගිත්වයක් ලද අතර, ලං.වි.ම.ට සිය පාරිභෝගිකයන් සමගින් මනා සබඳතාවයක් ගොඩනගා ගැනීමට හැකිවිය. සහභාගිවූවන් විසින් ලං.වි.ම. ප්‍රයත්නයන් ඇගයීමට ලක් කරන ලද අතර එවන් වැඩසටහන් ඉදිරියේදීද නොකඩවා පවත්වන ලෙස ඉල්ලා සිටින ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)

## මැයි



කන්දෙකැටිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය 2019 මැයි 16වන දින විවෘත කරන ලදී.



කොල්තොට පාරිභෝගික සේවා මධ්‍යස්ථානය 2019 මැයි 23වන දින විවෘත කරන ලදී.

ඌව පළාතේ හා සබරගමුව පළාතේ ස්ථාපිත නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC)

## ජූලි



### බස්නාහිර පළාත උතුර හි තොග පාරිභෝගිකයන් වෙනුවෙන් පවත්වන ලද පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන

බස්නාහිර පළාත් උතුරු ප්ලැටිනම් පාරිභෝගිකයන් සඳහා වූ පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන පළාතේ වාණිජ ඒකකය විසින් 2019 ජූලි මස 24වන දින නයිවල සිල්ෂෙස්ටර් ග්‍රෑන්ඩ් හෝටලයේදී පවත්වන ලදී. වැඩසටහන තුළ ප්‍රධාන වශයෙන් අවධානයට ලක්වූ ක්ෂේත්‍රයන් වූයේ ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය, ගුණාත්මක විදුලි සැපයුමක වැදගත්කම, තොග පාරිභෝගිකයන් සඳහා වූ තොරතුරු තාක්ෂණ පහසුකම් හා ස්වයං-ජනන යෝජනාක්‍රමයන්ය.







### කතරගම පෙරහැර වීදියේ වීථි ලාම්පු ව්‍යාපෘතියක් අවසන් කරන ලදී.

දකුණු පළාතේ ඉදිකිරීම් ඒකකය විසින් කතරගම පෙරහැර වීදියේ වීථි ලාම්පු ව්‍යාපෘතියක් සාර්ථකව අවසන් කරන ලදී. දළ වශයෙන් අඩු වෝල්ටීයතා භූගත රැහැන් මීටර 1,556ක් පමණද, තෙකලා අඩු වෝල්ටීයතා උඩිස් රැහැන් මීටර 150ක් පමණද ඉදිකර දින 7ක් ඇතුළත මෙම ව්‍යාපෘතිය යටතේ වීථි ලාම්පු 122ක් සවි කරන ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)

## අගෝස්තු





උතුරු පළාතේ පවත්වන ලද ක්‍රීඩා උළෙල

ලං.වි.ම. උතුරු පළාත් කාර්ය මණ්ඩල සුභසාධන හා ක්‍රීඩා සමිතිය විසින් අගෝස්තු මාසයේදී ක්‍රීඩා උළෙලක් සංවිධානය කරන ලදී. මෙහිදී ලං.වි.ම. ස්වර්ණ ජයන්ති සැමරුමක්ද පවත්වන ලදී.



බෙදාහැරීමේ අංශය 4 මූලස්ථානයේ පවත්වන ලද පිරිත් පිංකම

බෙදාහැරීමේ අංශය 4 මූලස්ථානය විවෘත කිරීම හා සමගාමීව පිරිත් පිංකමක්ද 2019 අගෝස්තු මස 09වන දින පවත්වන ලදී.



දෙහිවල නව බෙදාහැරීමේ අංශය 4 මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීමේ කටයුතු අවසන් කොට මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම.

බෙදාහැරීමේ අංශය 4හි ඉදිකිරීමේ කටයුතු අවසන් කොට 2019 අගෝස්තු මස 30වන දින එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. මේවන විට බස්නාහිර පළාත දකුණ 1 හා දෙහිවල ප්‍රාදේශීය කාර්යාලය එකම වහළක් යට පවතී.

නව අලෙවි ස්ථාන (POS) කවුළු පහක් ස්ථාපනය කරන ලදී.
පාරිභෝගික සුවසෙත පිණිස නව අලෙවි ස්ථාන කවුළු පහක් ඉදිකොට කළුබෝවිල, දෙහිවල බෙදාහැරීමේ අංශය 4 සංකීර්ණය, කැස්බෑව, පානදුර හා මතුගම යන ප්‍රදේශයන්හි විවෘත කරන ලදී.



බෙදාහැරීමේ අංශය 4 මූලස්ථාන සංකීර්ණයේ නව වාහන ආරෝපණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී.

බෙදාහැරීමේ අංශය 4හි මූලස්ථාන සංකීර්ණයේ අලුතින් ස්ථාපිත වාහන ආරෝපණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු 2019 අගෝස්තු මස 30වන දින ආරම්භ කරන ලදී.



ඌව පළාතේ පවත්වන ලද ක්‍රීඩා උත්සවය
ඌව පළාත් ක්‍රීඩා උත්සවය 2019 අගෝස්තු මස 31වන දින පවත්වන ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)

## සැප්තැම්බර්

### 'විමලසුරේන්ද්‍ර දිනය' සමරන ලදී

ඉංජිනේරු ඩී.ජේ. විමලසුරේන්ද්‍රයන්ගේ 145වන ජන්ම දින සංවත්සරය සමරනු වස් 2019 සැප්තැම්බර් මස 17වන දින 'විමලසුරේන්ද්‍ර දිනය' සුභසාධක ඒකකය විසින් සංවිධානය කරන ලදී.





### කොලොන්නාව මනු පරීක්ෂණාගාරය මාලඹේ නව ගොඩනැගිල්ලකට ගෙනයන ලදී

බෙදාහැරීමේ අංශය 03හි මනු පරීක්ෂණාගාරය 2019 සැප්තැම්බර් මස 04වන දින නව ගොඩනැගිල්ලකට ගෙනයන ලදී.



### අහංගම දුගී පවුලක් සඳහා ලබාදුන් පරිත්‍යාගයන්

දකුණු පළාත් විදුලි යාන්ත්‍රික ඒකකය විසින් 2019 සැප්තැම්බර් මස 05වන දින අහංගම දුගී පවුලක් සඳහා විදුලිය, වෛද්‍ය සහාය ආදිය ලබාගනු පිණිස පරිත්‍යාගයක් සිදු කරන ලදී.

### පුගොඩ ස්ථාපිත නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2019 සැප්තැම්බර් මස 16වන දින පුගොඩ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ස්ථාපනය කරන ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)

## ඔක්තෝම්බර්





**පානදුර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හා විද්‍යුත් නගරය නව ගොඩනැගිල්ලකට ගෙනයන ලදී.**

පානදුර පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හා විද්‍යුත් නගරය පිහිටුවනු පිණිස නව ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. එහි මෙහෙයුම් කටයුතු 2019 ඔක්තෝබර් මස 04වන දින ආරම්භ කරන ලදී.



**බෙදාහැරීමේ අංශය 04හි අලෙවි අලෙවි ස්ථාන පහක් පිහිටුවන ලදී.**

කළුබෝවිල, දෙහිවල - බෙ.අ.4 සංකීර්ණය, කැස්බෑව, පානදුර, මතුගම ප්‍රදේශයන්හි පාරිභෝගික සුවසෙත පිණිස නව අලෙවි ස්ථාන පහක් පිහිටුවන ලදී.





**මතුගම නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී**

වඩා යහපත් පාරිභෝගික සේවයක් ඇති කරනු පිණිස 2019 ඔක්තෝබර් මස 11වන දින නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී.



**බදුරලිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානයට නිවහනක් ලෙස නව ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී.**

අළුතින් ස්ථාපිත බදුරලිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හා මතුගම ප්‍රාදේශීය නඩත්තු ඒකකය පවත්වාගෙන යනු පිණිස නව ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. විවෘත කිරීමේ උත්සවය 2020 ඔක්තෝබර් මස 18වන දින පවත්වන ලදී

**තොග සැපයුම් පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් නැගෙනහිර පළාතේ පවත්වන ලදී.**

නැගෙනහිර පළාතේ තොග සැපයුම් පාරිභෝගිකයන් ලං.වි.ම. විසින් සැලසුම් කර ඇති සංවර්ධන කටයුතු පිළිබඳව දැනුවත් කොට ලං.වි.ම. විසින් සම්පාදනය කරනු ලබන සේවාවන්හි තවදුරටත් වැඩිදියුණු විය යුතු අංශ කවරේද යන්න පිළිබඳ පාරිභෝගික ප්‍රතිපෝෂක ලබාගනු පිණිස තොග සැපයුම් පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.
අම්පාර වැඩසටහන 2019 ඔක්තෝබර මස 21වන දින පවත්වන ලදී.







**මඩකලපුවේ වැඩසටහනද 2019 ඔක්තෝබර් මස 21වන දින පවත්වන ලදී.**





මෙම වැඩසටහන් සඳහා මනා ජන සහභාගීත්වයක් ලැබුණු අතර, ලං.වි.ම.ට සිය පාරිභෝගිකයන් සමගින් මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකිවිය. සහභාගි වූවන් විසින් ලං.වි.ම. ප්‍රයත්නයන් අගය කරන ලද අතර, එවන් වැඩසටහන් අනාගතයේදීද නොකඩවා පවත්වන ලෙස ඉල්ලා සිටින ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)



මාවනාන කනිටු විදුහලේදී වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී.

අදාළ ග්‍රාමීය ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලං.වි.ම. ස්වර්ණ ජයන්ති සැමරුම හා සමගාමීව මාවනාන කනිටු විදුහලේදී 2019 ඔක්තෝබර් මස 25වන දින වෛද්‍ය කඳවුරක් පවත්වන ලදී.



රත්මලාන මෙහෙයුම් හා නඩත්තු මධ්‍යස්ථානය නැවත සකස් කරන ලදී.

රත්මලාන මෙහෙයුම් හා නඩත්තු මධ්‍යස්ථානය කැස්බෑව ප්‍රදේශයේ නැවත සකස් කොට 2019 ඔක්තෝබර් මස 29වන දින කැස්බෑව විද්‍යුත් නගරය (E-City) පිහිටුවන ලදී.



ලේ දන්දීමේ කඳවුරු සංවිධානය කරන ලදී

බස්නාහිර පළාත දකුණ - 1හි හා දකුණු පළාතේ සුභසාධක සංගමය විසින් ලේ දන්දීමේ කඳවුරු දෙකක් පවත්වන ලදී. බස්නාහිර පළාත දකුණ-1 කඳවුර 2019 ඔක්තෝබර් මස 29වන දිනද, දකුණු පළාත් කඳවුර 2019 ඔක්තෝබර් මස 31වන දිනද පවත්වන ලදී.

## නොවැම්බර්



අයගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය 2019 නොවැම්බර් මස පළමුවන දින විවෘත කරන ලදී.

කන්දෙකැටිය, කල්තොට හා අයගම ස්ථාපිත නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන.

නව පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ඌව පළාතේ කන්දෙකැටිය ප්‍රදේශයේද, සබරගමුව පළාතේ අයගම හා කල්තොට ප්‍රදේශයේද පිහිටුවන ලදී.



කොළඹ නගර කාර්යාලය විසින් සංවිධානය කරන ලද රුක් රෝපන වැඩසටහන

ලං.වි.ම. 50වන සංවත්සරය උදෙසා 2019 නොවැම්බර් මස පළමුවැනි දින කොළඹ නගර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය මගින් රුක් රෝපණ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

# වෙනත් සිදුවීම් 2019 (ඉතිරි කොටස)



මාලබේ මනු පරීක්ෂණාගාරයේ පවත්වන ලද පිරිත් පිංකම

ලං.වි.ම. ස්වර්ණ ජයන්තිය හා සමගාමීව අභිනවයෙන් විවෘත කරන ලද මාලබේ බෙදාහැරීමේ අංශය 3 මනු පරීක්ෂණාගාරයේදී 2019 නොවැම්බර් මස පළමුවැනි දින පිරිත් පිංකමක් සංවිධානය කරන ලදී.



ලං.වි.ම. මූලස්ථානයේ පවත්වන ලද පිරිත් පිංකම හා ලේ දන්දීමේ කඳවුර

ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු වස් ලං.වි.ම. සුභසාධක ඒකකය විසින් 2019 නොවැම්බර් මස පළමුවැනි දින ලං.වි.ම. මූලස්ථානයේදී පිරිත් පිංකමක් හා ලේ දන්දීමේ කඳවුරක් පවත්වන ලදී.



ලේ දන්දීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

ලං.වි.ම. 50වන සංවත්සරය සමරනු පිණිස ලං.වි.ම. උතුරු පළාත් කාර්යාල කාර්ය මණ්ඩල සුභසාධන හා ක්‍රීඩා සමිතිය සහ කොළඹ නගරයේ ප්‍රධාන ඉංජිනේරු (නඩත්තු) ඒකකය විසින් ලේ දන්දීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී.

කොළඹ නගර වැඩසටහන 2019 නොවැම්බර් මස පළමුවැනි දිනද, උතුරු පළාත් වැඩසටහන 2019 නොවැම්බර් මස 5වන දිනද පවත්වන ලදී.

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන ලද නවෝත්පාදන තරග සම්මාන ප්‍රදානෝත්සවය

ලං.වි.ම. 50වන සංවත්සරය හා සමගාමීව 2019 නොවැම්බර් මස පළමුවැනි දින 2017, 2018, 2019 වසරයන් සඳහා වූ නවෝත්පාදන තරගවල සම්මාන ප්‍රදානෝත්සවය පවත්වන ලදී. මෙම උත්සවය ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව විසින් සංවිධානය කරන ලදී.

නාරම්මල ප්‍රාදේශීය කාර්යාලයේ අලෙවි ස්ථාන කවුළු පිහිටුවන ලදී.

ලං.වි.ම. 50වන සංවත්සර සැමරුම හා සමගාමීව 2019 නොවැම්බර් මස 07වන දින නාරම්මල ප්‍රාදේශීය කාර්යාලයේ අලෙවි ස්ථාන කවුළුව පිහිටුවන ලදී. මෙම වැඩසටහනට සමගාමීව අඩු ආදායම්ලාභී පවුල් වෙත පාරිභෝගික ද්‍රව්‍ය ප්‍රදානයක්ද සිදු කෙරිණි.





## දෙසැම්බර්

දොම්පේ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී.

2019 දෙසැම්බර් මස 05වන දින දොම්පේ නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය පිහිටුවන ලදී.



බස්නාහිර පළාත උතුර පාරිභෝගිකයන් සඳහා සංවිධානය කරන ලද පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහන පළාතේ ප්ලැටිනම් හා රන් පාරිභෝගිකයන් සඳහා ලං.වි.ම. පර්යේෂණ හා සංවර්ධන ශාඛාව විසින් බස්නාහිර පළාත උතුර වාණිජ ඒකකය හා සම්බන්ධව 2019 දෙසැම්බර් මස 17වන දින නයිවල සිල්ෂෙස්ටර් ග්‍රෑන්ඩ් හෝටලයේදී සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන තුළ විදුලි අංශයෙහි ලං.වි.ම. විසින් පසුකළ 50 වසරක කාලය, SMART විකල්ප හා වර්තමාන විදුලිබල තත්ත්වය සහ කර්මාන්තයේ බලශක්ති කාර්යක්ෂමතාවය කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී.



සම්ප්‍රේෂණ අංශයේ සන්නිවේදන ශාඛාව විසින් සංවිධානය කරන ලද පාසැල් ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහන

2019 වසරේ වාර්ෂික සමාජ කාර්යය වශයෙන් සන්නිවේදන ශාඛාව විසින් නිග්ගහ, බුලත්සිංහල දුරස්ථ ප්‍රාථමික විද්‍යාලයක සිසුන් සඳහා පාසැල් ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2019 නොවැම්බර් මස 28වන දින සංවිධානය කර තිබිණි.




මෙහෙයුම් සමාලෝචනය

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු

## මූල්‍ය අංශය

ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක මුදල් කළමණාකරන ශාඛා නවයක් මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු වල වර්ධනයට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය කළමනාකරණය, මූල්‍ය සැලසුම්, භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය හා කලමනාකරණ වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සම්බන්ධතා අයවැයකරණය, බදුකරණය හා ආයතනික හා ව්‍යාපෘති මූල්‍යකරණය යනාදී මූල්‍ය කළමනාකරණ කටයුතු සිදුකරයි. එහි මූලික වගකීම වන්නේ ලංකා විදුලිබල මණ්ඩලය පුරා පිරිවැය කාර්යක්ෂමතාවයක් සඳහා දායක වන යහපත් නිර්නායක මත සියලු මූල්‍ය තීරණ පදනම් වී ඇති බව තහවුරු කිරීමයි.

## මූල්‍ය කාර්ය සාධනය

ලංවිම ශුද්ධ අලාභය ශ්‍රී ලංකා රුපියල් බිලියන 85.42ක් ලෙස වාර්තාවීම නිසා 2019 වර්ෂය ලංවිම සඳහා මූල්‍යමය වශයෙන් තීරණාත්මක වු අතර එය එහි ආරම්භයේ සිටම ලංවිම විසින් දරා සිටි ඉහළම මූල්‍ය අලාභය විය. අපේක්ෂිත ආකාරයට මෝසම් වැසි මඟින් ප්‍රමාණවත් වැසි නොලැබීම හේතුවෙන් සමස්ත උත්පාදනය සඳහා ප්‍රධාන ජල බලාගාර වලින් දායකත්වය 24%කට සීමාවීමෙන් අඛණ්ඩව වර්ෂය පුරාම මෙහෙයුම් පාඩු සිදු විය. දුර්වල මූල්‍ය කාර්ය සාධනය හේතුවෙන් රඳවාගත් ඉපැයුම් සෘණාත්මක ශේෂයක් දක්වා පිරිහීමට ලක්විය. ශ්‍රී ලංකා රුපියල් බිලියන 31.9ක් ලෙස වාර්තා වු 2018 වර්ෂයේ ප්‍රතිප්‍රකාශිත ශුද්ධ පාඩුව සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 85.4ක් වු ශුද්ධ පාඩුව 167% ක පසුබෑමක් විය.



රූප සටහන 1 - මූල්‍ය කාර්ය සාධනය 2018-2019

## විදුලි විකුණුම් වලින් ආදායම

2019 වර්ෂය අවසාන වන විට 99% ක මට්ටමකට විදුලි සැපයුම ලබාදීමට ලංවිමට හැකි වු අතර පෙර වර්ෂයේ 6% ට සාපේක්ෂව විදුලි ඒකක විකිණුම් වල වර්ධනය 4% කි.කෙසේ වෙතත් රජයේ තීරණ මත 2014 වර්ෂයේ සිට විදුලි ගාස්තු වැඩි නොකිරීම හේතුවෙන් විදුලි විකුනුම් වටිනාකමේ වැඩිවීමට සම්පූර්ණයෙන් හේතු වුයේ විදුලි ඉල්ලුමෙහි වැඩිවීමයි.



රූප සටහන 02 - විකුණුම් ආදායම හා ඒකක



රූප සටහන 03 - පිරිවැය ව්‍යුහය

2018 වර්ෂයට සාපේක්ෂව විදුලි ඒකක උත්පාදනයේ 4%ක වැඩිවීමට අනුරූපව සෘජු උත්පාදන පිරිවැයෙහි වැඩිවීම 32% ක් විය.දුර්වල ජල ධාරිතාව යටතේ තෙල් වලින් දහනය කරන ලද ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ තාප බලාගාර වලින් විදුලි උත්පාදනය වැඩිවීමත් භාණ්ඩවල මිල ඉහළ යාමත් හේතුවෙන් මූල්‍ය කාර්ය සාධනය දුර්වල අතට හැරුණි.

මෙම පිරිවැය වැඩිවීම විදුලි ජනන පිරිවැයට සෘණාත්මක ලෙස බලපා ඇති අතර 2019 දී විදුලි ඒකකයක (kWh) ජනන පිරිවැය රුපියල් 15.74 ක් ලෙස සටහන් විය. 2018 දී එය ඒකකයක් සඳහා රු. 12.75 කි. තවද අවසන් පාරිභෝගිකයාට විදුලිය සපයන අවස්ථාව වන විට ඒකකයක විකුණුම් පිරිවැය 2019 වර්ෂය සඳහා රුපියල් 23.29 ක් වු අතර 2018 වර්ෂය සඳහා එය රු 19.12. ඒ අනුව විකුණුම් පිරිවැය පෙර වසරට සාපේක්ෂව 22% කින් ඉහළ ගොස් තිබේ.



රූප සටහන 04 - ඒකකයක පිරිවැය

## ණය ගැනීම් හා මූල්‍යණය කිරීමේ පිරිවැය

විදුලිබල යටිතල පහසුකම් සංවර්ධනය ව්‍යාපෘති වෙනුවෙන් කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් මූල්‍යයනය කිරීම සඳහා ස්වයං සාකච්ඡා කළ ණයගැනීම් වැඩිවීමත් සමග 2019 වර්ෂයේ දී මූල්‍ය පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. තව ද මෙම මූල්‍ය ඌනතාවය ප්‍රධාන සැපයුම්කරුවන් වන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යන ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින්ට ගෙවීම් ප්‍රමාද කිරීමට හේතු වී ඇති අතර එමඟින් සැලකිය යුතු ප්‍රමාද ගාස්තුවක් ඇති වී තිබේ.

## මූල්‍ය තත්වය

බලශක්ති අංශයේ පුරෝගාමියා ලෙස ලංකා විදුලිබල මණ්ඩලය රුපියල් මිලියන 914ක් වටිනා වත්කම් දරන අතර එයින් දළ වශයෙන් 85%ක් ස්ථාවර වත්කම් වලින් සමන්විත වේ. තව ද 2019 වර්ෂයෙන් අවසන් වන ශේෂපත්‍ර දිනට රුපියල් මිලියන 48 ක අවසන් තොග අගයක් ලංවිම සතු වු අතර ස්කන්ධය තුල රජයේ දායකත්වය ඉහළ අගයක් ගනී.

මූල්‍යමය වශයෙන් දුෂ්කර වසරක් වීමෙන්, අයිරා සීමාව ශ්‍රී ලංකා රු බිලියන 9 දක්වා ඉහළ නැගීමත්, පොළී සහිත ණය සහ ණයගැනීම් සැලකිය යුතු ලෙස වැඩිවීමත් නිසා ලංකා විදුලිබල මණ්ඩලයෙහි ද්‍රවශීලතාවයට බාධා ඇති විය.

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

## වත්කම්




රූප සටහන 05- ජංගම නොවන වත්කම් සංයුතිය




රූප සටහන 06- ජංගම වත්කම් සංයුතිය

## වගකීම්




රූප සටහන 07- මුළු ස්කන්ධය සහ වගකීම් සංයුතිය

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

## මූල්‍ය අනුපාත

| අනුපාතය | 2019 | 2018 |
|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | -9% | -4% |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය | -31% | -10% |
| ස්කන්ධය මත ණය අනුපාතය | 123% | 88% |
| වත්කම් මත ණය අනුපාත | 37% | 34% |
| ජංගම අනුපාතය | 50% | 72% |
| ණය සේවා ආවරණ අනුපාතය | -1.13 | 0.29 |

## අවසාන පරිශීලක ගාස්තු නියම කිරීම (End User Tariff) සඳහා රජයේ ප්‍රතිපත්තීවල බලපෑම

පොදු අරමුණු සහ ඉහළ පරිභෝජනයක් සහිත ගෘහස්ථ පාරිභෝගිකයින් හැරුණු විට බොහෝ පාරිභෝගික ගාස්තු ඛාණ්ඩ සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් විකුණුම් අවස්ථාවේ පිරිවැයට වඩා අඩු මිලකට විදුලිය සැපයීමට ලංවීමට සිදු වී ඇත.

ඒ අනුව, රජයේ ප්‍රතිපත්තියක් ලෙස අඩු ගාස්තුවක් නියම කිරීම හේතුවෙන් ලංවිම මූල්‍ය ප්‍රකාශනයේ ශුද්ධ පාඩුව පහත පරිදි වේ.

| | 2019<br>ශ්‍රී ලංකා රු මිලියන | 2018<br>ශ්‍රී ලංකා රු මිලියන |
|---|---|---|
| රජයේ ප්‍රතිපත්ති මත පාඩුව | (104,271) | (60,431) |
| අතිරික්තය වැය කිරීම | 6,867 | 20,601 |
| ශුද්ධ පාඩුව | (97,404) | (39,830) |
| වෙනත් ආදායම් | 11,994 | 9,375 |
| | (85,411) | (30,458) |
| මූල්‍ය ප්‍රකාශය අනුව (පාඩුව) | (85,411) | (30,458) |

## භාණ්ඩාගාර කළමනාකරණය

ගෙවීම්, ලැබීම්, මූල්‍ය අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කරමින් සිය වගකීම් ඉටුකිරීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීම සඳහා ඕනෑම ව්‍යාපාරයකට භාණ්ඩාගාර කලමණාකරනය සැමවිටම වැදගත් වේ.

2016 වර්ෂයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එහි අරමුණු ඵලදායීව කළමනාකරණය කිරීමේ අරමුණින් වෙනම භාණ්ඩාගාර කළමනාකරණ අංශයක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. 2017 වර්ෂයේ දී සීමාසහිත ෆිට්ච් රේටින් ලංකා පුද්ගලික සමාගම වෙතින් ලංකා විදුලබල මණ්ඩලය AAA ශ්‍රේණිය ලබා ගන්නා ලද අතර, එතැන් සිට ආයතනයකට ලබා ගත හැකි ඉහළම ශ්‍රේණිගත කිරීමේ තත්වය පවත්වා ගනී.

පසුගිය දෙවසර තුළ සමස්තයක් ලෙස ලංවිම වෙත වඩාත් වාසිදායක අයුරින් ණය ලබා ගැනීම පිළිබඳ (බැංකුවලින් විශේෂ කාලීන ණය) සාකච්ඡා කිරීමට හැකි පසුබිමක ආයතනය පැවතුනි

2019 වර්ෂයේ දී මහජන බැංකුවේ යෝජනා සලකා බැලීමෙන් පසු එම බැංකුව තෝරා ගැනීමෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 20ක ණයකර නිකුතුවක් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කරන ලදී. මෙය ලංකා විදුලිබල මණ්ලඩලයට පමණක් නොව සමස්තයක් වශයෙන් රජය සතු ව්‍යාපරයන්හි සන්ධිස්ථානයක් වනු ඇත.

අර්ථසාධක අරමුදලේ ප්‍රධාන කාර්යයන් කළමනාකරණය කිරිම සඳහා වෙනම කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ලංවිම භාණ්ඩාගාර කළමනාකරණ අංශය විසින් යෙදී සිටී.

## රැස්කිරීම් කළමනාකරණය

විදුලි බිල් ගෙවීම වඩාත් පහසු සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා පාරිභෝගිකයන්ට පහසුකම් සැලසීම සඳහා පහත සඳහන් මුලපිරීම් වර්ෂය තුළ සිදු කරන ලදී.

- 2019 මාර්තු සිට ලංවිම මුදල් රැස්කිරීමේ කවුළු වලින් වීසා කාඩ් පත් පිළිගැනීම
- පවත්නා එකතු කිරීමේ නියෝජිතවරුන් වන ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, HDFC බැංකුව, කොමර්ෂල් බැංකුව හරහා විදුලි බිල්පත් ගෙවීම් සිදු කරන අවස්ථාවේදීම පරිභෝගික ගිණුම යාවත්කාලීන වන පරිදි ක්‍රියාත්මක කිරීම
- ආයතනික පාරිභෝගිකයන් සඳහා නව ප්‍රධාන ඉන්වොයිසි පහසුකමක් ක්‍රියාත්මක කිරීම.
- ඩයලොග් Genie App, NTB FriMi App යන මෘදුකාංග හරහා විදුලි බිල්පත් ගෙවීම ව්‍යාප්ත කිරීම
- සම්පත් බැංකුව හා කොමර්ෂල් බැංකුව හරහා ස්ථාවර නියෝග මත විදුලි බිල්පත් ගෙවීම ව්‍යාප්ත කිරීම

## ලංවිම අර්ථ සාධක අරමුදල

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිදාන යටතේ ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල පුද්ගලික අර්ථසාධක අරමුදලක් ලෙස ක්‍රියාත්මක වේ. එය පරිපාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 07 කින් සමන්විත කළමනාකරණ කමිටුවක් විසිනි.

කමිටුවේ සභාපති වන්නේ නිලබලයෙන් ලංවිම සභාපතිවරයා වන අතර නියෝජ්‍ය සභාපති වන්නේ නිල බලයෙන් ලංවිම සාමාන්‍යාධිකාරීවරයාය. මුදල් කළමනාකරු හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) අනිකුත් නිලබලයෙන් පත්වන සාමාජිකයන් වන අතර වෙනත් සාමාජිකයන් තිදෙනෙකු ලංවිම අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නම් කරනු ලබයි. දිනපතා පරිපාලන කටයතු සඳහා වගකිව යුතු වන හා අරමුදලේ භාණ්ඩාගාරික ද වන අරමුදලේ ලේකම් හා ගණකාධිකාරී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ.

2019 වර්ෂය තුළදී අරමුදල සඳහා මුළු දායකත්වය රු මිලියන 4,889 ක් වු අතර ඉන් රු මිලියන 1,956 ක් සඳහා මණ්ඩලයේ සේවයකයන් විසින් දායකත්වය දරන ලදී.

2019 වර්ෂය අවසානයට මුළු සාමාජික සංඛ්‍යාව 25,262 ක් වු අතර නව සාමාජිකයන් 692 ක් ඒ අතර විය. විශ්‍රාමයාම, ඉල්ලා අස්වීම, සේවයෙන් පහ කිරීම සහ මියයාම හේතුවෙන් වර්ෂය තුළ සාමාජිකයන් 714 ක් අරමුදලෙන් ඉවත් විය.

2019 දෙසැම්බර් 31 දිනට මුළු සමුච්චිත අරමුදල රු මිලියන 61,103 ක් වු අතර එය පෙර වර්ෂයට වඩා 9.19% ක වැඩිවීමකි.

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

වර්ෂයේ ප්‍රධාන ආදායම වූයේ ස්ථාවර තැන්පතු වලින් ලද පොලී ආදායම හා සාමාජිකයන්ට දුන් ණය වලට ලද පොලී ආදායමයි. අරමුදල එහි ආයෝජන වලින් වර්ෂය තුළ රු. මිලියන 6,822 ක ආදායමක් උපයාගත් අතර 2019 වර්ෂය සඳහා ලාභාංශ අනුපාතය 10% ක් ලෙස ප්‍රකාශ කරන ලදී. 2019 වර්ෂය තුලදී සාමාජිකයන්ට ප්‍රදාණය කරන ලද සමස්ථ ණය වටිනාකම රු මිලියන 2,896 ක් වූ අතර සේවය අවසන් කල සාමාජිකයන්ට ආපසු ගෙවන ලද මුදල රු මිලියන 4,471 ක් විය

අරමුදලේ ඉපැයීම් මත ආදායම් බදු ලෙස රු. මිලියන 500 ක මුදලක් 2018/2019 තක්සේරු වර්ෂය සඳහා ගෙවන ලදී.

වර්ෂය තුළ සේවකයන් හා අරමුදල අතර සන්නිවේදනය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව අර්ථසාධක අරමුදල් පද්ධතියට සාමාජිකයන්ට ප්‍රවේශවීමට අවස්ථාව ලබා දෙන ලදී. වර්තමානයේ දී මාසික දායකය, ඔවුන්ගේ බැරට ලබාගත හැකි මුළු ශේෂය සහ ලබාගත හැකි ණය ශේෂය යනා දී සීමිත තොරතුරු සෘජුවම අරමුදලේ දත්ත පදනමට ප්‍රවේශ වීමෙන් සේවකයන්ට දර්ශනය කර ගත හැකිය. එසේම වරකට සමගාමී සාමාජික ඇමතුම් 5ක් හැසිරවීමේ හැකියාව ඇති IVR (අන්තර් ක්‍රියාකාරී ස්වර ප්‍රතිචාර) පහසුකම සහිත PABX පද්ධතිය ද ස්ථාපිත කර ඇත. තව ද පවත්නා වාර්තා කාමරය ඩිජිටල් ස්වරූපයට පරිවර්තනය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම තුලින් කාර්යාල අවකාශය ප්‍රශස්ත කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.




රූපසටහන 08 - වර්ෂය තුළ සාමාජිකත්වය වෙනස්වීම

## ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් අරමුදල

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 (ජේ) වගන්තියේ විධිවිධාන යටතේ 1994 ජනවාරි 1 දින විශ්‍රාම වැටුප් අරමුදල ස්ථාපිත කරන ලද අතර සාමාජිකයන් 8 දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මඟින් කළමනාකරණය කෙරේ. ලංවිම සභාපතිවරයා හා ලංවිම සාමාන්‍යාධිකාරීවරයා පිළිවෙලින් එහි සභාපති සහ උප සභාපති වේ. කමිටුවේ අනෙකුත් නිළ බලයෙන් පත්වන සාමාජිකයන් වන්නේ ලංවිම මුදල් කළමනාකරු හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) වන අතර ඉතිරි සාමාජිකයන් 4 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද ලංවිම ස්ථිර සේවකයන් වේ. අරමුදලේ භාණ්ඩාග ාරික හා අරමුදලේ පාර්පාලක ලෙස අරමුදලේ ලේකම් හා ගණකාධිකාරී කටයුතු කරන අතර මෙහි කාර්යයන් භාණ්ඩාග ාර කළමණාකරන අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

2019 වර්ෂය අවසානයට මුළු ක්‍රියාකාරී විශ්‍රාමිකයන් සංඛ්‍යාව 7533 ක් වන අතර පසුගිය වර්ෂය 5 තුළ විශ්‍රාමිකයන්ගේ වැඩිවීම පහත දැක්වේ.

| වර්ෂය | විශ්‍රාමිකයන් සංඛ්‍යාව | විශ්‍රාමිකයින් වැඩිවීම | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| 2015 | 5721 | - | - |
| 2016 | 6194 | 473 | 8.3% |
| 2017 | 6622 | 428 | 6.9% |
| 2018 | 7061 | 439 | 6.6% |
| 2019 | 7533 | 472 | 6.7% |

විශ්‍රාම වැටුප් අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වන්නේ ක්‍රියාකාරී සේවකයන් වෙනුවෙන් ලංවිම දායකත්වය සහ ආයෝජන වලින් ප්‍රතිලාභයි. පසුගිය වර්ෂ 5 තුළ 50%කින් විශ්‍රාම ගෙවීම් වැඩිවීම හා විශ්‍රාමිකයන් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් අරමුදලේ හිගය වැඩි වී ඇත.

| වර්ෂය | ලංවිම දායකත්වය | පොළී ආදායම | වාර්ෂික විශ්‍රාම ගෙවීම | වර්ධනය |
|---|---|---|---|---|
| 2015 | 921 | 20 | 941 | |
| 2016 | 974 | 158 | 1132 | 20.30% |
| 2017 | 1029 | 364 | 1393 | 23.06% |
| 2018 | 1420 | 480 | 1900 | 36.40% |
| 2019 | 1405 | 499 | 1904 | 0.21% |

| වර්ෂය | ශුද්ධ වත්කම් (රු. මිලියන) | අගය වැඩිවීම (රු. මිලියන) | ප්‍රතිශතයක් ලෙස (%) |
|---|---|---|---|
| 2015 | 16,962 | | |
| 2016 | 18,211 | 1,249 | 7% |
| 2017 | 19,863 | 1,652 | 9% |
| 2018 | 21,384 | 1,521 | 7.6% |
| 2019 | 22,695 | 1,311 | 6% |

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

## දස වසරක සාරාංශය

පසුගිය වර්ෂ 10ක් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල සහ වත්කම් තත්වය පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනට | 2019 ශ්‍රී ලංකා රු. මිලියන | 2018 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2017 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2016 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2015 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2014 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2013 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2012 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2011 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2010 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් ප්‍රතිඵල | | | | | | | | | | |
| ආදායම් | 242,950 | 229,571 | 218,450 | 206,811 | 188,684 | 202,645 | 194,147 | 163,512 | 132,460 | 121,226 |
| විකුණුම් පිරිවැය | (310,511) | (251,964) | (260,273) | (222,097) | (168,781) | (213,646) | (165,509) | (222,419) | (151,448) | (116,168) |
| දළ ලාභය/(අලාභ) | (67,561) | (22,393) | (41,823) | (15,286) | 19,903 | (11,001) | 28,638 | (58,907) | (18,988) | 5,058 |
| වෙනත් ආදායම් හා ලැබීම් | 10,307 | 9,450 | 8,143 | 10,323 | 8,292 | 5,871 | 5,107 | 4,225 | 3,810 | 3,672 |
| පරිපාලන වියදම් | (7,280) | (5,832) | (5,110) | (4,965) | (4,086) | (3,146) | (2,556) | (2,997) | (1,636) | (1,851) |
| මූල්‍ය ආදායම් | 1,751 | 1,466 | 1,194 | 1,049 | 434 | 304 | 1,677 | 2,429 | 416 | 558 |
| මූල්‍ය පිරිවැය | (22,526) | (13,036) | (8,415) | (4,312) | (5,134) | (7,030) | (10,601) | (6,198) | (3,787) | (2,605) |
| ආදායම් බදු වලට පෙර ලාභය/(පාඩුව) | (85,309) | (30,345) | (46,011) | (13,191) | 19,409 | (15,002) | 22,265 | (61,448) | (20,185) | 4,832 |
| ආදායම් බදු වියදම් | (40) | (51) | (231) | (263) | (61) | (95) | - | - | - | (4,500) |
| විලම්භිත බදු (අයකිරීම) /ප්‍රතිවර්තනය | - | - | - | - | - | 996 | (1,325) | (16,198) | (830) | - |
| මුළු විස්තීර්ණ ආදායම් | (85,412) | (31,936) | (47,581) | (14,457) | 20,300 | (17,285) | 20,900 | (77,770) | (21,323) | 332 |

| දෙසැම්බර් 31 දිනට | 2019 ශ්‍රී ලංකා රු. මිලියන | 2018 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2017 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2016 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2015 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2014 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2013 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2012 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2011 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2010 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | | | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 781,977 | 747,144 | 724,068 | 704,695 | 694,415 | 681,471 | 648,130 | 621,088 | 493,050 | 491,600 |
| පරිපාලිත සමාගම් වල ආයෝජනය | 912 | 912 | 912 | 912 | 912 | 785 | 785 | 762 | 737 | 737 |
| බද්ධ ව්‍යාපාර වල ආයෝජනය | 329 | 329 | 329 | 329 | 329 | 150 | 150 | 150 | - | - |
| රක්ෂණ සංචිත අරමුදල් ආයෝජනය | 8,997 | 8,070 | 7,246 | 6,496 | 6,036 | 5,653 | 5,250 | 4,433 | 3,710 | 3,710 |
| වෙනත් මූල්‍ය වත්කම් | 9,956 | 10,204 | 8,912 | 8,983 | 3,848 | 2,291 | - | - | - | - |
| වෙනත් ජංගම නොවන වත්කම් | 1,484 | 1,242 | 961 | 949 | 896 | - | - | - | - | - |
| විකිණීම සඳහා රඳවාගත් ජංගම නොවන වත්කම් | 0 | 0 | 1 | 1,022 | 1,025 | 1,023 | 1,021 | - | - | - |
| ජංගම වත්කම් | 110,346 | 102,337 | 89,065 | 80,968 | 69,391 | 72,662 | 91,423 | 101,295 | 109,173 | 109,319 |
| මුළු වත්කම් | 914,001 | 870,238 | 831,494 | 804,354 | 776,852 | 764,035 | 746,759 | 727,728 | 606,671 | 605,366 |

# මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

| දෙසැම්බර් 31 දිනට | 2019 ශ්‍රී ලංකා රු. මිලියන | 2018 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2017 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2016 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2015 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2014 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2013 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2012 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2011 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන | 2010 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලංකා රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වගකීම් | | | | | | | | | | |
| පොළී සහිත ණය හා ණය ගැනීම | 334,672 | 296,630 | 236,129 | 220,476 | 214,299 | 221,735 | 355,043 | 345,700 | 184,243 | 184,243 |
| පාරිභෝගික තැන්පතු | 15,014 | 14,311 | 13,557 | 12,753 | 11,484 | 10,458 | 9,722 | 8,899 | 7,544 | 7,543 |
| අනෙකුත් විලම්භිත වගකීම් සඳහා ප්‍රතිපාදන | 10,482 | 10,038 | 8,622 | 7,262 | 6,116 | 6,572 | 3,236 | 3,593 | 2,930 | 2,930 |
| රජයේ ප්‍රදාන | 213 | 228 | 243 | 211 | - | - | - | - | - | - |
| විලම්භිත ආදායම් | | | | | 71,696 | 66,292 | 60,343 | 55,208 | 44,390 | 44,390 |
| ගිවිසුම් ගත වගකීම් | 89,746 | 86,335 | 82,564 | 77,628 | - | - | - | - | - | - |
| විලම්භිත බදු | | | | | | | 22,182 | 20,857 | 17,142 | |
| ජංගම වගකීම් | 191,999 | 126,974 | 123,682 | 72,661 | 43,630 | 64,147 | 69,134 | 96,171 | 84,945 | 84,945 |
| මුළු වගකීම් | 642,126 | 534,517 | 464,797 | 390,991 | 347,225 | 369,204 | 519,660 | 530,428 | 341,194 | 324,051 |
| | | | | | | | | | | |
| ස්කන්ධය | | | | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 323,194 | 302,695 | 302,695 | 302,695 | 302,228 | 289,038 | 121,708 | 110,862 | 83,311 | 83,311 |
| සංචිත | 37,110 | 34,881 | 32,783 | 30,283 | 28,463 | 27,434 | 25,999 | 24,460 | 23,436 | 316,799 |
| රඳවාගත් ඉපයුම් | (88,429) | (1,855) | 31,219 | 80,385 | 98,936 | 78,359 | 79,392 | 61,978 | 158,730 | (118,795) |
| මුළු ස්කන්ධය | 271,875 | 335,721 | 366,697 | 413,363 | 429,627 | 394,831 | 227,099 | 197,300 | 265,477 | 281,315 |
| මුළු ස්කන්ධය හා වගකීම් | 914,001 | 870,238 | 831,494 | 804,354 | 776,852 | 764,035 | 746,759 | 727,728 | 606,671 | 605,366 |

# මුල්‍ය අංශය සහ මුල්‍ය තොරතුරු (ඉතිරි කොටස)

## අගය එකතු කිරීමේ ප්‍රකාශය

ලංකා විදුලිබල මණ්ඩලයේ අගය නිර්මාණය කිරීම හා ප්‍රධාන පාර්ශවකරුවන් අතර අගය බෙදා හැරීම පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

| | 2019 ශ්‍රීලංරු. ('000) | 2018 ශ්‍රීලංරු. ('000) |
|---|---|---|
| අගය එකතු කිරීම | | |
| ආදායම | 242,950,327 | 229,571,083 |
| විකුණුම් පිරිවැය | (310,511,109) | (251,964,213) |
| විදුලිබල සැපයුම මගින් එකතු කළ අගය | (67,560,782) | (22,393,130) |
| වෙනත් ආදායම් හා ලාභ | 12,057,760 | 10,916,551 |
| අගය එකතු කිරීම | (55,503,022) | (10,403,630) |

| | 2019 ශ්‍රීලංරු. ('000) | 2018 ශ්‍රීලංරු. ('000) |
|---|---|---|
| අගය බෙදාහැරීම | | |
| සේවකයන් සඳහා | | |
| වැටුප්, වේතන හා වෙනත් ප්‍රතිලාභ | 39,708,449 | 38,090,711 |
| | | |
| රජය සඳහා | | |
| ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ | - | - |
| ආදායම් බදු | 39,529 | 50,641 |
| ගල් අඟුරු මිලදී ගැනීම වෙනුවෙන් යෙදවූ බදු | 6,111 | 5,987 |
| වෙනත් ආදායම් මත නිමැවුම් බදු | 229 | 287 |
| ලංවිම විසින් උපදවන ලද විදුලිබලය සැපයීම මත ජාතිය ගොඩනැගීමේ බදු | 4,414 | 4,520 |
| ආර්ථික සේවා ගාස්තු ගෙවීම | 1,610 | 1,845 |
| රේගු ගාස්තු සහ වෙනත් බදු | 29,446,978 | 25,476,986 |
| | | |
| බාහිර අරමුදල් සපයන්නන් සඳහා | | |
| ණය ගැනීම් මත පොළිය | 22,525,621 | 13,036,115 |
| | | |
| ව්‍යාප්ත කිරීම හා වර්ධනය සඳහා | | |
| රඳවාගත් ලාභ | (88,428,833) | (1,854,593) |
| ක්ෂයවීම සහ ක්‍රමක්ෂය | 30,953,776 | 30,388,480 |

## මුල්‍ය උද්දීපනයන්

| | (රු.බිලියන) | |
|---|---|---|
| **ආදායම** | **සමූහය** | **ලංවිම** |
| 2019 | 267 | 243 |
| 2018 | 254 | 230 |
| වැඩිවීම | 13 | 13 |
| **විකුණුම් පිරිවැය** | **සමූහය** | **ලංවිම** |
| 2019 | 324 | 310 |
| 2018 | 267 | 252 |
| වැඩිවීම | 57 | 58 |
| **මුළු විස්තීර්ණ ආදායම** | **සමූහය** | **ලංවිම** |
| 2019 | (75) | (85) |
| 2018 | (24) | (32) |
| වැඩිවීම | 51 | (53) |
| **මුල්‍ය පිරිවැය** | **සමූහය** | **ලංවිම** |
| 2019 | (24) | (22) |
| 2018 | (14) | (13) |
| වැඩිවීම | 10 | 9 |
| **ණය සහ ණය ගැනීම්** | **සමූහය** | **ලංවිම** |
| 2019 | 348 | 335 |
| 2018 | 311 | 297 |
| වැඩිවීම | 37 | 38 |



# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව
# විගණිත සමූහ මූල්‍ය ප්‍රකාශන

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49 වන වගන්තිය ප්‍රකාරව, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන තම විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ සතුටින් ඉදිරිපත් කරයි.

### මූලික කාර්යයන්

මණ්ඩලයේ මූලික කාර්යයන් වන්නේ විදුලිබල උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, එලදායී බෙදා හැරීම හා විකිණීමයි. මණ්ඩලය රටේ නීති හා රෙගුලාසි වලට පටහැනි කිසිදු කටයුත්තක නිරත වී නොමැත.

### පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර

පරිපාලිතයන් හා බද්ධ ව්‍යාපාර වල මූලික කාර්යයන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් යටතේ පිටු අංක 108 හි දැක්වේ. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ හා සමූහයේ ප්‍රධාන කාර්යයන්හි සැලකිය යුතු වෙනස්කම් සිදුවී නොමැත.

### සමූහයේ ව්‍යුහයේ වෙනස්කම්

වර්ෂය තුළ සමූහයේ ව්‍යුහයේ වෙනස්වීම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 132 සිට 134 දක්වා වන මූල්‍ය ප්‍රකාශන සටහන් 10 හා 11 යටතේ දක්වා ඇත.

### වර්ෂයේ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

පිටු අංක 12 සිට 15 දක්වා සභාපතිවරයාගේ පණිවුඩයෙහි මණ්ඩලයේ/සමූහයේ වර්ෂයේ කාර්ය සාධනය දැක්වේ. පිටු අංක 16 සිට 18 දක්වා ඇති සාමාන්‍යාධිකාරිවරයාගේ සමාලෝචනයෙහි සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් පිළිබඳ විස්තරාත්මක සටහනක් සපයා ඇත. පිටු අංක 90 සිට 96 දක්වා "මූල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු" මාතෘකාව යටතේ මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සපයයි. වාර්ෂික වාර්තාවේ අවශ්‍ය අංගයක් වන මෙම වාර්තා මණ්ඩලයේ කටයුතු පිළිබඳ සාධාරණ සමාලෝචනයක් සපයයි.

### මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

පවත්නා තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ ප්‍රතිරූපයක් ප්‍රතිබිම්බනය කරන්නා වූ මූල්‍ය ප්‍රකාශන සැකසීම අධ්‍යක්ෂවරුන් වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතාවයන්ට හා 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතයයි. පරිපාලිත සමාගම් සම්බන්ධයෙන් 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන වලට ද අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරනු ලැබේ.

### විගණකවරුන්ගේ වාර්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියේ විධිවිධාන හා 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 51 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ලංකා විදුලිබල මණ්ඩලයේ විගණකවරයා වේ. 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සහ මණ්ඩලය හා එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 178 සිට 184 දක්වා සහ පිටු අංක 163 සිට 169 පිළිවෙලින් දක්වා ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංමුවාප්‍ර) අනුකූලව සමූහය හා මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිට 108 සිට 121 දක්වා ඇත. ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබෙන වෙනස්කම් වලට අමතරව සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැත.

### මණ්ඩලය සමඟ අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම

ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති ලෙස ආර්. ජයවර්ධන මහතා 2019 ජනවාරි 30 දින පත්කර ලද අතර 2019 නොවැම්බර් 21 දින දක්වා ඔහු සේවය සලසන ලදී. එසේම ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිපාලිතයන් වන සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලවල සමාජිකයකු ලෙස ද පත්කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලය තුල දී, ලංවිම හා එන්ටීපීසී - ඉන්දියා (NTPC) බද්ධ ව්‍යාපාරය වන සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමෙහි ද (TPCL) සභාපති ලෙස සේවය කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයේ උප සභාපති ලෙස 2019 ජනවාරි 30 දින ආර්. සෙල්වරාජා මහතා පත්කරන ලද අතර ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ 2019 නොවැම්බර් 22 දක්වා සේවය කරන ලදී. සෙල්වරාජා මහතා ඔහුගේ ලංවිම සේවා කාලපරිච්ඡේදය තුළදී සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගමේ හා සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ (TPCL) අධ්‍යක්ෂවරයකු වශයෙන්ද පත්වීම් ලබා තිබුණි.

කේ. කේ. ටී. ජිනදාස මහතා ලංකා විදුලිබල මණ්ලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ක්‍රියාකාරී අධ්‍යක්ෂක වශයෙන් 2019 ජනවාරි 30 දින පත් කරන ලදුව 2019 නොවැම්බර් 25 දක්වා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන ලදී.

කර්මාන්ත හා වාණිජ කටයුතු, කල්ගත වූ අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන හා වෘත්තීය පුහුණු හා කුසලතා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, එම්. දේවසුරේන්ද්‍ර මහතා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු ලෙස 2019 සැප්තැම්බර් 09 දින පත්කර තිබුණි.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ආර්. සේමසිංහ මහතා වෙනුවට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මිය අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයකු ලෙස 2019 මැයි 08 දින පත්කරන ලදී.

අභ්‍යන්තර කටයුතු හා ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එස්. එම්. කන්නන්ගර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස 2019 ජනවාරි 30 දින පත්කරන ලදී. ඔහු 2019 වර්ෂය තුළ ලංවිම සඳහා සේවය සලසන ලදී.

රූබන් වික්‍රමාරච්චි මහතා අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයකු ලෙස 2019 ජනවාරි 30 දින පත්කරන ලද අතර ඔහු 2019 වර්ෂය තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 37 හි දක්වා ඇති හෙළිදරව් කිරීම් හැර 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂකවරුන්ට මණ්ඩලය සමඟ කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සඳහා සම්බන්ධයක් නොමැත.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)

2019 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා උප කමිටු රැස්වීම් වලට අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගිත්වය

| අධ්‍යක්ෂවරයාගේ නම | අධ්‍යක්ෂ මණ්ඩලය | විගණන හා කළමනාකරණ කමිටුව | සේවක දුක්ගැනවිලි කමිටුව | විනය අභියාචනා මණ්ඩලය |
|---|---|---|---|---|
| ආර්. ජයවර්ධන මහතා | 21 | | | |
| ආර්. සෙල්වරාජා මහතා | 20 | | 2 | 4 |
| කේ. කේ. ටී. ජිනදාස මහතා | 18 | | 2 | 5 |
| එම්. දේවසුරේන්ද්‍ර මහතා | 04 | | | |
| කේ. ඩී. එන්. රංජිත් අශෝක මහතා | 12 | 2 | | |
| ජේ. එම්. තිලකා ජයසුන්දර මිය | 10 | 3 | | |
| ආර්. සේමසිංහ මයා | 05 | 1 | | |
| එස්. කේ. කන්නන්ගර මයා | 16 | 3 | | 5 |
| රූබන් වික්‍රමාරච්චි මයා | 20 | 3 | | |

## අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 පෙබරවාරි 08 දින පහත සඳහන් උප කමිටු පත්කර තිබුණි.

- සේවක දුක්ගැනවිලි කමිටුව
- විනය අභියාචනා මණ්ඩලය
- විගණන හා කළමනාකරණ කමිටුව

## 1.0 සේවක දුක්ගැනවිලි කමිටුව

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්/හිටපු සේවකයින් පිළිබඳ දුක්ගැනිවිලි හැසිරවීමට මණ්ඩලය විසින් පත්කරන ලද උප කමිටුව සේවක දුක්ගැනවිලි කමිටුවයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සහ ලංවිම ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් මෙම දුක්ගැනවිලි කමිටුව සමන්විත වේ.

2019 වර්ෂය තුළ දී මෙම කමිටුව වාර 2ක් රැස්වී තිබූ අතර ලංවිම සේවකයින්/හිටපු සේවකයින්ගේ දුක් ගැනවිලි 14 ක් සමාලෝචනය කර සලකා බලා ඇත.

කමිටු රැස්වීම් වල සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සාමාන්‍යාධිකාරී /ලංවිම පියවර ගෙන ඇත.

2019 වර්ෂය සඳහා (2019 පෙබරවාරි 08 දින සිට) කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත දැක්වේ.

i. ටී. ජිනදාස මයා ( ක්‍රියාකාරී අධ්‍යක්ෂ - ලංවිම) - සභාපති ලෙස
ii. රජීව් සෙල්වරාජ් මයා (උප සභාපති - ලංවිම ) - සමාජිකයකු ලෙස

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම උපකමිටුවේ කැඳවුම්කරුවේ.

## 2.0 විනය අභියාචනා මණ්ඩලය

විනය අභියාචනා මණ්ඩලය අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවකි. ලංවිම සේවකයන්ගේ විනය කරුණු මෙහෙයවීම සඳහා මෙම කමිටුව ස්ථාපනය කරන ලදී. 2019 වර්ෂයේදී කමිටුව විධිමත්ව අවස්ථා 05 කදී රැස් වූ අතර කාරණා 11ක් මෙහෙයවා තිබුණි.

කමිටුවේ සටහන් අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ලංවිම සාමාන්‍යාධිකාරී විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

2019 වර්ෂය සඳහා කමිටුවේ (2019 පෙබරවාරි 08 සිට) සංයුතිය පහත පරිදි වේ.

i. එස්. කේ. කන්නන්ගර මයා, ලංවිම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, සභාපති ලෙස
ii. රජීව් සෙල්වරාජ් මයා, උප සභාපති - ලංවිම , සමාජිකයකු ලෙස
iii. ටී. ජිනදාස මයා, ලංවිම ක්‍රියාකාරී අධ්‍යක්ෂ, සමාජික ලෙස
iv. ජේ. ජී. එල්. එස්. ජයවර්ධන මයා, අධ්‍යක්ෂ, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, සමාජික ලෙස
v. පී.එස්. පතිරණ මයා විශ්‍රාමික අතිරේක කම්කරු කොමසාරිස් ජෙනරාල්, සමාජික ලෙස

අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් උප කමිටුවේ කැඳවුම්කරු වේ.

## 3.0 විගණන කමිටුව

ආයතනයේ පාලනය හා අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ අභ්‍යන්තර විගණනයේ හා බාහිර විගණනයේ කාර්යයන් පිළිබඳ විග්‍රහයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටුවක් ලෙස විගණන කමිටුවට සමස්ත වගකීමක් ඇත.

### සංයුතිය

විගණන කමිටුව මූල්‍ය විගණන හා ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි මනා කුසලතා සහ පුළුල් අත්දැකීම් ඇති ස්වාධීන අධ්‍යක්ෂවරුන් හතර දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානී කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. ප්‍රධාන විධායක නිලධාරී ලෙස සාමාන්‍යාධිකාරී, මුදල් කළමනාකරු හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු සහ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයෙකු රැස්වීමට ආරාධිතව සහභාගි වෙයි.

# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)

2019 වර්ෂය සඳහා විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

| | |
|---|---|
| තිලකා ජයසුන්දර මිය | - සභාපති |
| එස්. කේ. කන්නන්ගර මයා | - සාමාජික |
| කේ. ඩී. එන්. රංජිත් අශෝක | - සාමාජික |
| රූබන් වික්‍රමාරච්චි මයා | - සාමාජික |

මෙහෙයුම් හා මුල්‍ය සමාලෝචන ක්ෂේත්‍රයන්හි සිදුකෙරෙන අභ්‍යන්තර විගණන හා බාහිර විගණන සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සමාලෝචනය කර සාකච්ඡා කරයි. විගණන කමිටුව මෙම වාර්තා ඔවුන්ගේ පුළුල් අත්දැකීම් සහ විශේෂඥතාව භාවිතා කරමින් සමාලෝචනය කරන අතර පවත්නා අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයන් හා අවදානම් අවම කිරීමේ උපාය මාර්ග නිර්දේශ කරයි. එමඟින් වංචා හා දූෂණ සිදුවීම් අවම කෙරෙන අතර ආයතනය මුහුණ දෙන මෙහෙයුම් හා මුල්‍ය අවධානම් අවම කෙරේ. වර්ෂය තුළ කමිටුව විධිමත්ව අවස්ථා 3ක දී රැස් වී තිබුණි.

### නීති හා රෙගුලාසි වලට අනුකූල වීම

සමූහය නීති හා රෙගුලාසි වලට පටහැනිව කිසිදු කාර්යයක නිරත වී නොමැති බව අධ්‍යක්ෂවරු ඔවුන්ගේ උපරිම දැනුමෙන් හා විශ්වාසයෙන් සනාථ කරයි.

### පවතින නඩු කටයුතු

අධ්‍යක්ෂවරු/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මතය අනුව සහ මණ්ඩලයේ නීතිඥවරුන් විසින් සනාථ කරන ලද පරිදි වාර්තා කරන ලද මුල්‍ය ප්‍රතිඵල හෝ මණ්ඩලයේ ඉදිරි මෙහෙයුම් කටයුතු සඳහා දැනට මණ්ඩලයට එරෙහිව විභාග වෙමින් පවතින නඩු කටයුතු වලින් ප්‍රමාණවත් බලපෑමක් නොවනු ඇත.

### ව්‍යවස්ථාපිත ගෙවීම්

රජය සහ සේවකයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවන්හිදීම සිදුකර ඇති බව මණ්ඩලය තහවුරු කරයි.

### ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

පිටු අංක 154 හි මුල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් අංක 34 යටතේ දක්වා ඇති හෙළිදරව් කිරීම් හැරුනු විට මුල්‍ය වර්ෂය අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාල පරතරය තුළ ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන ප්‍රමාණාත්මක සිදුවීම් කිසිවක් පැන නැගී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ මතයයි.

### අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයේ සම්පත් එහි මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරුන්ගේ විශ්වාසය වේ. එබැවින් මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම අදාළ කරගෙන ඇත.

# ලාභ හෝ අලාභ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| අඛණ්ඩ මෙහෙයුම් | සටහන | සමූහය 2019 | සමූහය 2018 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| ආදායම | 3 | 267,041,265 | 254,351,728 | 242,950,327 | 229,571,083 |
| විකුණුම් පිරිවැය | | (324,453,251) | (268,342,080) | (310,511,109) | (251,964,213) |
| දළ ලාභය / (අලාභය) | | (57,411,986) | (13,990,352) | (67,560,782) | (22,393,130) |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 4 | 17,021,754 | 12,334,628 | 10,306,591 | 9,450,386 |
| බෙදාහැරීමේ පිරිවැය | | (392,610) | (186,449) | - | - |
| වෙනත් වියදම් | | (355,200) | (193,061) | - | - |
| පරිපාලන වියදම් | | (11,967,382) | (9,345,674) | (7,280,014) | (5,831,793) |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | | (53,105,424) | (11,380,908) | (64,534,205) | (18,774,537) |
| මූල්‍ය ආදායම | 5.1 | 3,848,623 | 3,354,819 | 1,751,170 | 1,466,165 |
| මූල්‍ය පිරිවැය | 5.2 | (24,103,239) | (14,364,697) | (22,525,622) | (13,036,115) |
| මූල්‍ය පිරිවැය-ශුද්ධ | | (20,254,616) | (11,009,878) | (20,774,452) | (11,569,950) |
| බද්ධ ව්‍යාපාරයේ අලාභ කොටස | 11 | (6,850) | (4,096) | - | - |
| බදු පෙර ලාභය /(අලාභය) | 6 | (73,366,890) | (22,394,882) | (85,308,657) | (30,344,487) |
| ආදායම් බදු වියදම් | 7.1 | (1,901,477) | (1,902,119) | (39,529) | (50,641) |
| විලම්බිත බදු (ගාස්තු)/ ප්‍රතිවර්ථන | 7.2 | (522,385) | 441,478 | - | - |
| අඛණ්ඩ මෙහෙයුම් මඟින් වර්ෂය තුල උපයන ලද ලාභය/(අලාභය) | | (75,790,752) | (23,855,523) | (85,348,186) | (30,395,128) |
| පාලනයට යටත් නොවන හිමිකම | | (6,059,416) | (4,402,431) | - | - |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | | (81,850,168) | (28,257,954) | (85,348,186) | (30,395,128) |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 ප්‍රතිප්‍රකාශිත | 2019 | 2018 ප්‍රතිප්‍රකාශිත |
| අඛණ්ඩ මෙහෙයුම්වලින් වර්ෂය සඳහා අලාභය | (75,790,752) | (23,855,523) | (85,348,186) | (30,395,128) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය | (65,714) | (1,567,727) | (63,710) | (1,541,726) |
| අයුගණක ලාභය/(අලාභය) මත විලම්භිත බදු වල බලපෑම | 562 | 7,280 | - | - |
| විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම් | (115,468) | 1,255,184 | - | - |
| විකුණුම සඳහා ඇති මූල්‍ය වත්කම් මත සාධාරණ අගයෙහි ලාභය | 466,166 | (518,358) | - | - |
| වර්ෂය සඳහා බදු පසු මුළු විස්තීර්ණ ආදායම | (75,505,206) | (24,679,144) | (85,411,896) | (31,936,854) |
| | | | | |
| විසර්ජනය: | | | | |
| පරිපාලන හිමි අයිතිය | (81,702,906) | (29,603,755) | | |
| පාලනයට යටත් නොවන හිමිකම් | 6,197,700 | 4,924,611 | | |
| | (75,505,206) | (24,679,144) | | |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනට

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සටහන | 2019 | සමූහය 2018 ප්‍රතිප්‍රකාශිත | 2017 ප්‍රතිප්‍රකාශිත | 2019 | මණ්ඩලය 2018 ප්‍රතිප්‍රකාශිත | 2017 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 799,576,467 | 763,195,966 | 738,983,298 | 781,869,266 | 747,016,348 | 723,922,861 |
| කල්බදු ඉඩම් සඳහා ගෙවූ වාරික | | 235,577 | 229,040 | 210,250 | - | - | - |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 499,056 | 532,736 | 527,930 | 107,719 | 127,227 | 145,211 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 10 | - | - | - | 911,813 | 911,813 | 911,813 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 11 | 36,900 | 43,750 | 47,846 | 328,606 | 328,606 | 328,606 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 12 | 19,899,441 | 9,775,319 | 8,362,533 | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 13 | 25,348,198 | 36,461,582 | 25,494,853 | 9,956,341 | 10,204,445 | 8,911,612 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 14 | 2,596,310 | 2,303,439 | 1,989,365 | 1,484,474 | 1,241,868 | 961,113 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 15 | 8,996,893 | 8,070,253 | 7,246,251 | 8,996,893 | 8,070,253 | 7,246,251 |
| මුළු ජංගම නොවන වත්කම් | | 857,188,842 | 820,612,085 | 782,862,326 | 803,655,112 | 767,900,560 | 742,427,467 |
| විකුණුම් සඳහා ඇති ජංගම නොවන වත්කම් | 16 | 76 | 76 | 655 | 76 | 76 | 655 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| භාණ්ඩ තොග | 17 | 55,622,767 | 48,309,728 | 42,488,366 | 48,023,386 | 42,712,420 | 37,504,855 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 18 | 56,491,420 | 57,740,010 | 48,619,063 | 49,126,300 | 48,362,510 | 41,122,073 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ | 19 | - | - | - | 5,984,849 | 5,139,714 | 4,986,694 |
| ලැබිය යුතු උප මූල්‍ය කල්බදු | | 21,110 | - | - | - | - | - |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 12 | 910,171 | 569,718 | 418,140 | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 13 | 27,080,350 | 19,565,483 | 23,216,050 | 3,485,735 | 3,872,290 | 3,935,551 |
| මුදල් හා බැංකු ශේෂ | 30 | 7,282,167 | 5,503,939 | 5,575,442 | 3,725,333 | 2,250,515 | 1,516,230 |
| මුළු ජංගම වත්කම් | | 147,407,985 | 131,688,878 | 120,317,061 | 110,345,603 | 102,337,449 | 89,065,403 |
| මුළු වත්කම් | | 1,004,596,903 | 952,301,039 | 903,180,042 | 914,000,791 | 870,238,085 | 831,493,525 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 20 | 323,194,038 | 302,694,797 | 302,694,797 | 323,194,038 | 302,694,797 | 302,694,797 |
| සංචිත | 21 | 50,082,923 | 44,511,162 | 41,687,158 | 37,109,569 | 34,881,040 | 32,783,235 |
| රඳවාගත් ඉපැයීම්/(අලාභ) | | (72,806,745) | 13,398,703 | 44,865,475 | (88,428,832) | (1,854,589) | 31,219,080 |
| **මව් සමාගමේ කොටස් හිමියන්ට අදාල හිමිකම** | | 300,470,216 | 360,604,662 | 389,247,430 | 271,874,775 | 335,721,248 | 366,697,112 |
| පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට අදාල හිමිකම | | 31,655,307 | 25,758,561 | 23,572,412 | - | - | - |
| **මුළු ස්කන්ධය** | | 332,125,523 | 386,363,223 | 412,819,842 | 271,874,775 | 335,721,248 | 366,697,112 |
| **ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 22 | 312,115,497 | 288,351,654 | 222,562,928 | 306,259,692 | 281,262,195 | 214,564,098 |
| පාරිභෝගික තැන්පතු | 23 | 15,013,791 | 14,311,008 | 13,556,567 | 15,013,791 | 14,311,008 | 13,556,567 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 24 | 11,788,540 | 11,257,054 | 9,682,493 | 10,482,144 | 10,038,368 | 8,622,012 |
| රාජ්‍ය ප්‍රදාන | 25 | 297,697 | 318,228 | 338,759 | 213,303 | 228,022 | 242,740 |
| ශිව්සුම් ගත වගකීම් | 26 | 94,421,389 | 90,809,989 | 86,774,090 | 89,746,084 | 86,335,217 | 82,564,453 |
| විලම්භිත බදු | 27 | 753,562 | 276,157 | 687,441 | - | - | - |
| **මුළු ජංගම නොවන වගකීම් හා විලම්භිත ආදායම්** | | 434,390,476 | 405,324,090 | 333,602,278 | 421,715,014 | 392,174,810 | 319,549,870 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 28 | 197,069,252 | 133,023,927 | 124,816,656 | 187,773,340 | 121,179,242 | 118,459,459 |
| ගෙවිය යුතු ලාභාංශ | | 2,303,807 | 2,258,669 | 2,650,768 | - | - | - |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | 29 | - | - | - | 2,955,352 | 4,524,276 | 3,557,973 |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 22 | 36,492,272 | 22,995,032 | 26,352,748 | 28,411,544 | 15,367,744 | 21,564,431 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 2,215,573 | 2,336,098 | 2,937,750 | 1,270,766 | 1,270,765 | 1,664,680 |
| **මුළු ජංගම වගකීම්** | | 238,080,904 | 160,613,726 | 156,757,922 | 220,411,002 | 142,342,027 | 145,246,543 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | 1,004,596,903 | 952,301,039 | 903,180,042 | 914,000,791 | 870,238,085 | 831,493,525 |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වගකීම දරයි. මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

| ........................ | ........................ | ........................ | ........................ |
|---|---|---|---|
| සභාපති | උප සභාපති | සාමාන්‍යාධිකාරී | මුදල් කළමනාකරු |

කොළඹ
2020-09-22

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| සමූහය | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත |
|---|---|---|---|---|
| 2018 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත) | 302,694,797 | 18,639,244 | 23,000 | 273,357 |
| වර්ෂය සඳහා ලාභය/(අලාභය) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| අනෙකුත් විසිතීරණ ආදායම් මගින් හදුනාගනු ලබන ආයෝජන වල සධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුලය සංචිත | - | 463,042 | - | - |
| මුළු විස්තීර්ණ ආදායම | 302,694,797 | 19,102,286 | 23,000 | 273,357 |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ආර්ඒච්සීපී ව්‍යාපෘතිය | - | 77,188 | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | - | - | - | 21,573 |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | 302,694,797 | 19,179,474 | 23,000 | 294,930 |
| කාලච්ඡේදය තුල කරන ලද පෙර වර්ෂය සඳහා වන ගැලපීම් | | | | |
| 2019 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත) | 302,694,797 | 19,179,474 | 23,000 | 294,930 |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| අනෙකුත් විසිතීරණ ආදායම් මගින් හදුනාගනු ලබන ආයෝජන වල සධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුලය සංචිත | - | (39,667) | - | - |
| මුළු විස්තීර්ණ ආදයම | 302,694,797 | 19,139,807 | 23,000 | 294,930 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 16,942,799 | - | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,556,442 | - | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 | - |
| ආර්ඒච්සීපී ව්‍යාපෘතිය | - | 58,045 | - | - |
| ආයෝජන සංචිතය | - | - | - | - |
| ස්ථාවර වත්කම් ප්‍රතිස්ථාපන සංචිතය | - | - | - | 17,564 |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| පාලන බලය වෙනස්වීමකින් තොරවූ හිමිකාරීත්වයේ වෙනස් වීම් | - | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය | 323,194,038 | 19,197,852 | 24,000 | 312,494 |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | සාධාරණ අගය සංචිත | සංවර්ධන සංචිත | රඳවාගත් ඉපයීම් | පාලනයට යටත් නොවන කොටස් හිමිකම | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2,334,391 | 14,350,273 | 6,066,892 | - | 45,360,277 | 23,572,412 | 413,314,643 |
| - | - | - | - | (28,257,954) | 4,402,431 | (23,855,523) |
| - | - | - | - | (1,552,651) | (7,795) | (1,560,446) |
| - | - | (256,192) | - | - | (262,165) | (518,357) |
| - | - | - | - | - | 792,142 | 1,255,184 |
| 2,334,391 | 14,350,273 | 5,810,700 | - | 15,549,672 | 28,497,025 | 388,635,501 |
| - | 883,800 | - | - | | - | 883,800 |
| - | 1,136,815 | - | - | (1,136,815) | - | - |
| - | - | - | - | - | - | 77,188 |
| 486,754 | - | - | - | (486,754) | - | - |
| - | - | - | - | (21,573) | - | - |
| - | - | - | 11,025 | (11,025) | - | - |
| - | - | - | - | - | (2,420,897) | (2,420,897) |
| - | - | - | - | - | (317,567) | (317,567) |
| 2,821,145 | 16,370,888 | 5,810,700 | 11,025 | 13,893,505 | 25,758,561 | 386,858,025 |
| | | | | (494,802) | | (494,802) |
| 2,821,145 | 16,370,888 | 5,810,700 | 11,025 | 13,398,703 | 25,758,561 | 386,363,223 |
| - | - | - | - | (81,850,168) | 6,059,415 | (75,790,753) |
| - | - | - | - | (62,901) | (2,252) | (65,153) |
| - | - | 249,829 | - | - | 216,338 | 466,167 |
| - | - | - | - | - | (75,801) | (115,468) |
| 2,821,145 | 16,370,888 | 6,060,529 | 11,025 | (68,514,366) | 31,956,261 | 310,858,015 |
| - | - | - | - | - | - | 16,942,799 |
| - | - | - | - | - | - | 3,556,442 |
| - | 1,008,138 | - | - | - | - | 1,008,138 |
| - | 1,161,346 | - | - | (1,161,346) | - | - |
| - | - | - | - | (1,000) | - | - |
| - | - | - | - | - | - | 58,045 |
| 3,109,206 | - | - | - | (3,109,206) | - | - |
| - | - | - | - | (17,564) | - | - |
| - | - | - | 6,300 | (6,300) | - | - |
| - | - | - | - | 3,037 | (20,022) | (16,985) |
| - | - | - | - | - | 2,550,207 | 2,550,207 |
| - | - | - | - | - | (2,223,548) | (2,223,548) |
| - | - | - | - | - | (607,591) | (607,591) |
| 5,930,351 | 18,540,372 | 6,060,529 | 17,325 | (72,806,745) | 31,655,307 | 332,125,523 |

# ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| මණ්ඩලය | දායක ප්‍රග්ධනය | ප්‍රග්ධන සංචිත | ණය නිදහස් කිරීමේ සංචිත | ක්ෂය සංචිත | ස්වයං රක්ෂණ සංචිත | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2018 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත) | 302,694,797 | 18,260,468 | 165,446 | 23,000 | 14,334,323 | 31,713,882 | 367,191,916 |
| වර්ෂය සඳහා ලාභය/ (අලාභය) | - | - | - | - | - | (31,936,854) | (31,936,854) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම (ප්‍රතිප්‍රකාශිත) | - | - | - | - | 883,800 | - | 883,800 |
| ස්වයං රකෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - | 1,136,815 | (1,136,815) | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය | - | 77,188 | - | - | - | - | 77,188 |
| 2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 302,694,797 | 18,337,656 | 165,446 | 23,000 | 16,354,938 | (1,359,787) | 336,216,050 |
| කාලච්ඡේදය තුල කරන ලද පෙර වර්ෂය සඳහා වන ගැලපීම් | | | | | | (494,802) | (494,802) |
| 2019 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත) | 302,694,797 | 18,337,656 | 165,446 | 23,000 | 16,354,938 | (1,854,589) | 335,721,248 |
| වර්ෂය සඳහා ලාභය/ (අලාභය) | - | - | - | - | - | (85,411,897) | (85,411,897) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - | 1,008,138 | - | 1,008,138 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 16,942,799 | - | - | - | - | - | 16,942,799 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,556,442 | - | - | - | - | - | 3,556,442 |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - | 1,161,346 | (1,161,346) | - |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය | - | 58,045 | - | - | - | - | 58,045 |
| 2019 දෙසැම්බර් මස 31 දිනට ශේෂය | 323,194,038 | 18,395,701 | 165,446 | 24,000 | 18,524,422 | (88,428,832) | 271,874,775 |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 |
| **මෙහෙයුම් කටයුතුවල වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභ/(අලාභ) | (73,366,890) | (22,394,882) | (85,308,657) | (30,344,487) |
| ගැලපීම් | | | | |
| ක්ෂය-වර්ෂය සඳහා අයවීම | 32,564,416 | 31,720,823 | 30,933,953 | 30,388,490 |
| පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | (3,975,636) | (3,761,916) | (3,594,603) | (3,399,660) |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම් | (20,531) | (20,531) | (14,718) | (14,718) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභ/(අලාභ) | 13,234 | 205,730 | (3,131) | 194,929 |
| මූල්‍ය පිරිවැය | 15,758,216 | 9,094,576 | 14,177,340 | 7,804,132 |
| යල්පැන ගිය භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | (12,887) | 144,035 | 61,228 | 94,137 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | (958,460) | (1,306,224) | (958,460) | (1,306,224) |
| ණයකරුවන් හානිකරණය වීම සඳහා ප්‍රතිපාදන | 1,657,181 | 506,140 | 938,432 | 484,293 |
| බොල් ණය කපාහැරීම | 11,165 | 34,637 | 11,165 | 34,637 |
| විද්‍යුත් වාහන ආරෝපණ ආදායම | (3,782) | - | (3,782) | - |
| බද්ධ ව්‍යාපාරවල කොටස් ලාභ/(අලාභ) | 6,850 | 4,097 | - | - |
| අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | 39,722 | 22,140 | 19,823 | - |
| මූල්‍ය ආදායම | (3,848,624) | (3,354,599) | (1,751,170) | (1,465,945) |
| ලාභාංශ ආදායම | (8,609,571) | (2,590,424) | (2,746,968) | (2,273,532) |
| විදේශ මුදල් ලාභ හෝ අලාභ | 650,805 | (1,674,033) | - | - |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු සඳහා අදායම් බැරකම් | 887,365 | 1,143,933 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 1,299,692 | 1,216,239 | 1,106,619 | 1,038,358 |
| විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය | 212,058 | (339,757) | 212,058 | (339,757) |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 982,972 | - | 982,972 | 687,485 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | (36,712,705) | 8,649,984 | (45,937,899) | 1,582,138 |
| භාණ්ඩ තොග (වැඩිවීම)/අඩුවීම | (5,373,657) | (4,347,583) | (3,391,351) | (3,679,994) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | 611,495 | (9,173,846) | (1,798,544) | (8,503,837) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 63,078,675 | 6,582,480 | 64,076,630 | 2,034,688 |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | 21,603,808 | 1,711,035 | 12,948,836 | (8,567,005) |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (12,190,937) | (9,082,145) | (10,610,061) | (7,791,701) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (1,045,981) | (869,620) | (938,612) | (823,970) |
| ගෙවූ ආදායම් බදු | (2,543,303) | (2,059,527) | (39,529) | - |
| **මෙහෙයුම් කටයතු වල (යෙදවූ)/කටයතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 5,823,587 | (10,300,257) | 1,360,634 | (17,182,676) |
| **ආයෝජන කටයතු වල (යෙදවූ) /කටයතු වලින් ජනනය වූ ශුද්ධ ප්‍රවාහය** | | | | |
| දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (69,395,632) | (57,333,643) | (66,868,244) | (55,028,051) |
| උප සමාගම් ලැබිය යුතු මූල්‍ය කල්බදු අත්පත් කර ගැනීම | (13,449,665) | (44,390) | - | - |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (20) | (90,708) | - | - |
| රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය | (926,640) | (824,002) | (926,640) | (824,002) |
| රක්ෂණ සංචිත අරමුලෙන් ලද පොලී | 1,008,138 | 832,939 | 1,008,138 | 832,939 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | 3,289,048 | (6,591,168) | - | - |
| පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම | 2,569,179 | - | - | - |
| විදේශ ආයෝජන මත ආදායම | (5,218) | - | - | - |
| ලද ලාභාංශ | 8,609,571 | 2,590,423 | 2,636,334 | 1,978,872 |
| ලද පොලී | 2,864,461 | 2,666,167 | 767,007 | 777,041 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 7,541 | 46,419 | 3,131 | 37,404 |
| ගෙවූ ලාභාංශ | (2,825,529) | (3,184,309) | - | - |
| **අයෝජන කටයතු වල (යෙදවූ)/කටයතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (68,254,766) | (61,932,272) | (63,380,274) | (52,225,797) |
| **මුදල් යෙදවීමේ කටයතු වල (යෙදවූ) /කටයතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | | | |
| පාරිභෝගික දායකත්වය | 8,534,901 | 9,449,113 | 7,953,334 | 8,821,722 |
| විදුලි වාහන සඳහා ඊ-කාර්ඩ් පෙර ගෙවීම් | 4,458 | 429 | 4,457 | 428 |
| එච්ආර්සීපී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම් | 58,045 | 77,188 | 58,044 | 77,188 |
| පාරිභෝගික තැන්පතු ආපසු ගෙවීම් | (205,990) | (238,049) | (205,990) | (238,049) |
| පාරිභෝගික තැන්පතු ලැබීම් | 908,773 | 992,490 | 908,772 | 992,490 |
| කල්බදු ණයකරු ශුද්ධ සංචරන/(කල්බදු ගෙවීම්) | (16,917) | (61,904) | (107,645) | (61,904) |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලත් මුදල් | 124,553,253 | 87,375,002 | 111,822,169 | 83,767,342 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම් | (74,819,796) | (23,188,489) | (62,299,277) | (19,970,497) |
| වරණීය කොටස් නිකුත් කිරීමෙන් ලැබෙන අදායම | - | 2,991,520 | - | - |
| වරණීය කොටස් නිදහස් කිරීම | (679,297) | (3,195,407) | - | - |
| **මුදල් යෙදවීමේ කටයුතු වල (යෙදවූ)/ කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | 58,337,430 | 74,201,893 | 58,133,864 | 73,388,720 |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | (4,093,749) | 1,969,364 | (3,885,776) | 3,980,247 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (3,961,167) | (5,930,531) | (5,426,611) | (9,406,858) |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (8,054,916) | (3,961,167) | (9,312,387) | (5,426,611) |

පිටු අංක 108 සිට 162 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

## 1.0 ආයතනික තොරතුරු

### 1.1 පොදු

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය

මණ්ඩලය

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, සඵලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

#### 1.2.1 පරිපාලිතයන්

අ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම හා එසේ මිලදී ගත් විදුලිය ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුවේ පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහාශ්‍රිත හා කාර්මික පාරිභෝගිකයන්ට සිල්ලරට විකිණීමයි.

ආ) සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනය කිරීම හා අපනයනය කිරීම සහ සමූහයට අයත් සමාගම්හි ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගික ආයෝජනයන් සිදු කිරීමයි.

ඇ) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා ගෙන්දගම් ප්‍රමාණය අඩු උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

ඈ) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ ව්‍යාපාර කටයුතු වල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලිබල බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම හා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම යි.

#### 1.2.2 බද්ධ ව්‍යාපාරය

සීමාසහිත ත්‍රිකුණාමල විදුලබල සමාගම

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික පද්ධතියට විදුලිබලය උත්පාදනය කර විකිණීමේ අරමුණ සහිතව සමාගම ස්ථාපිත කරන ලදී. සමාගම විසින් ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය දැනට අත්හැර දමා ඇත.

### 1.3 පරිපාලකය සහ මණ්ඩලයෙහි අවසන් භාරකාරීත්වය

මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. අධ්‍යක්ෂවරුන්ගේ මතය අනුව, ශ්‍රී ලංකා ආණ්ඩුව, ලංකා විදුලිබල මණ්ඩලයේ මවු අස්ථිත්වයත්, අවසන් පාලන පාර්ශවයත් වනු ඇත.

### 1.4 නිකුත්කුව සඳහා බලය පැවරනු ලැබූ දිනය

2019 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2020.09.22 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව අනුමැතිය ලබාදී අත.

## 2.0 පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම් කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ අගය මත ගනනය කරනු ලබන මූල්‍ය වත්කම් වන ආදායම් ප්‍රකාශනය තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හා විස්තීරණ අදායම තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හැරුනු විට සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර)/ හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි ඇතැම් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවේ. තවද ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාවලියේදී, කළමණාකාරීත්වය විසින් තම විනිශ්චයන් භාවිතා කිරීම සිදු කරයි.

#### 2.1.1 අනුකූලතා ප්‍රකාශනය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයනය සමන්විත වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ අදායම් ප්‍රකාශනය මූල්‍ය තත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලවය

#### 2.1.2 සංසන්දනාත්මක තොරතුරු

ශ්‍රී.ල.ගි.ප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යන ප්‍රමිතියට අනුව පෙර මූල්‍ය වර්ෂවල යොදාගත් ගිණුම්කරණ ප්‍රමිතීන් සමූහය විසින් අඛණ්ඩව යොදාගෙන තිබේ. මූල්‍ය ප්‍රකාශන වඩා හොද ඉදිරිපත් කිරීමක් සඳහාත් වත්මන් වර්ෂයේ වටිනාකම් සමග සැසඳීමට හැකිවන ලෙසත් පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අදාල ඉදිපත් කිරීම් හා වර්ගීකරණය සංශෝධනය කර ඇත.

#### 2.1.3 ඒකාබද්ධ කිරීමේ පදනම

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) හා එහි පරිපාලිතයන්ගේ (සමූහය) මූල්‍ය ප්‍රකාශනවලින් සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. පරිපාලිතයන්ගේ තොරතුරු පහත දැක්වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට | ආයතනය සතු ප්‍රතිශතය |
|---|---|---|
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් | ශ්‍රී ලංකාව | 63% |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) | ශ්‍රී ලංකාව | 55.2% |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) | ශ්‍රී ලංකාව | 60% |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම (SLE) | ශ්‍රී ලංකාව | 100% |
| බද්ධ ව්‍යාපාරයේ නම | සංස්ථාගත කරන ලද රට | ආයතනය සතු ප්‍රතිශතය |
| සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම (TPCL) | ශ්‍රී ලංකාව | 50% |

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ පහත සඳහන් උප පරිපාලිත සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කර ඇත.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට |
|---|---|
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම | සිංගප්පූරුව |
| සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත මැකරිගාඩ් හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම | නේපාලය |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච් ගියර් (පුද්ගලික) සමාගම | ඉන්දියාව |
| ෆෙනී ලංකා පුද්ගලික සමාගම | බංගලාදේශය |

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මාස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යන සමාගම් වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේ. කෙසේ වුවද එම සමාගම්වල දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ පරමාර්ථය මත විගණක වරුන් විසින් සහතික කර පිලියෙල කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල මුළු ලාභ/අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශන වල ඇතුළත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකරුවන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී, බාහිර කොටස්කරුවන්ට අදාළ ලාභ හො අලාභ අනුපාතිකයන් පාලනයට යටත් නොවන හිමිකම යන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වල සියලු වත්කම් හා වගකීම්, මූල්‍ය තත්වය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාගම්වල බාහිර කොටස් හිමියන්ට අදාළ වත්කම් ඒකා බද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පාලනයට යටත් නොවන හිමිකම් ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ඉවත් කරණු ලැබේ.

පාලනය ගිලිහීයාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදු වන වෙනස් වීමක් ස්කන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරණු ලැබේ. පරිපාලිත සමාගමක පාලනය සමූහයෙන් ගිලිහී ගියහොත්,

- පරිපාලිත සමාගමෙහි (කීර්තිනාමය ද ඇතුළු) වත්කම් සහ වගකීම් තවදුරටත් ගිණුම්වල හඳුනා නොගැනේ.
- පාලනයට යටත් නොවන හිමිකම් හී ධාරණ අගය තවදුරටත් ගිණුම්වල හඳුනා නොගැනේ.
- ස්කන්ධය තුල වාර්ථා කර ඇති සමුච්චිත පරිවර්ථන වෙනස්කම් තවදුටත් ගිණුම්වල හඳුනා නොගැනේ.
- ලද ප්‍රතිශ්ධාවේ සාධාරණ අගය ගිණුම්වල හඳුනා ගැනේ.
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හඳුනා ගැනේ.
- ලාභ/අලාභයන්හි අතිරික්ත/ඌණතා හඳුනා ගැනේ.
- වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනා ගෙන ඇති මව් සමාගමේ කොටස් සුදුසු පරිදි ලාභ/අලාභ යටතේ හෝ රඳවාගත් ඉපැයීම් යටතේ නැවත වර්ගීකරණය කෙරේ.

සමූහයේ සහ එහි පරිපාලිතයන්හි 2019 දෙසැම්බර් මස 31 දිනට අදාළ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් ඒකාබද්ධ සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට හෝ ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ආයෝජකයා කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව තුළින් ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව යන සාධක මත පාලනය බලය ලබා ගත හැකිය. විශේෂයෙන් සමූහය සතුව පහත දැක්වෙන බලය ඇති විට පමණක් ආයෝජක පාලනය කෙරෙයි.

- ආයෝජක සම්බන්ධයෙන් අයිතියක් තිබේ නම් (එනම්, ආයෝජකගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීමට ප්‍රවර්තන හැකියාව ලැබෙන පවත්නා අයිතීන්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා අදාල විචල්‍ය ප්‍රතිලාභ වලට අනාවරනය හෝ අයිතීන් ආවේදනය කිරීම සම්බන්ධයෙන් වන අයිතීන්
- එහි ලාභයන්ට බලපෑම් කිරීම සඳහා ආයෝජක කෙරෙහි සමූහයට ඇති හැකියාව

සාමාන්‍යයෙන් බහුතරයට ඡන්දය දීමේ අයිතීන් තිබීම මගින් පාලනයක් පවත්වා ගෙන යා හැකි බවට පූර්ව නිගමනයක් පවතී. මෙම පූර්ව නිගමනය තහවුරු කිරීමට සහ ආයෝජකයෙකු සතු ඡන්දය දීමේ හෝ වෙනත් සමාන අයිතිවාසිකම් වඩා අඩු ප්‍රමාණයක් සමූහයට ඇති විට සමූහයට:

- වෙනත් ඡන්ද හිමියන් සමග වන ආයෝජකගේ ගිවිසුම් ගත විධිවිධාන
- වෙනත් ගිවිසුම්ගත විධිවිධාන තුලින් පැන නගින අයිතීන්
- සමූහයේ ඡන්ද අයිතීන් හා විභව ඡන්ද අයිතීන්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

පාලනයට අදාල අංග තුනෙන් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් තිබේ දැයි කරුණු හා හේතූන් මගින් පෙන්නුම් කරන්නේ නම්, ආයෝජක පාලනය කරනවා ද නැද්ද යන්න සමූහය විසින් නැවත තක්සේරු කරණු ලබයි. පාලිත සමාගම ඒකාබද්ධ කිරීම ඇරඹෙනුයේ පාලිතය කෙරෙහි සමූහය විසින් පාලනය ලබා ගන්නා විට වන අතර, පාලිත සමාගම කෙරෙහි පාලනය සමූහයට අහිමි වන විට එය නවතී. සමූහය විසින් පාලනය ලබා ගන්නා දිනයේ සිට සමූහය විසින් පාලිත සමාගම පාලනය කිරීම නවතින තෙක්, වසර තුළදී ලබාගත් හෝ බැහැර කළ පාලිත සමාගමක වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වේ.

පාලනයේ නිරත නොවන පාර්ශවයට ඌන ශේෂයක් තිබුන ද, ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සෑම අංගයක්ම ආරෝපණය කරනුයේ සමූහයේ මව් සමාගමේ සම කොටස් දරන්නන් හා පාලනය නොකරන පාර්ශවයන් මතය. ඒකාබද්ධ කිරීමේදී සමූහය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ නම්, සමූහයේ සාමාජිකයින් අතර ගනුදෙනු වලට අදාළ වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම්, වියදම් හා මුදල් ප්‍රවාහ ගැන මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය විට ගලපනු ලැබේ. පාලනයේ අහිමිවීමකින් තොරව පරිපාලිත සමාගමේ අයිතිවාසිකම් ලැදියාවේ වෙනසක් ගිනුම් ගත කරනුයේ ස්කන්ධ ගනුදෙනුවක් වශයෙනි.

පාලිත සමාගමක් සම්බන්ධයෙන් පාලනය සමූහය වෙතින් ගිලිහී ගියහොත්, එය විසින් අදාළ වත්කම් (කීර්ති නාමය ඇතුලුව), වගකීම්, පාලනය නොවන ලැදියාවන් හා සමකොටස් වල වෙනත් අංගයන් පිළිගනු ලබන අතර, ලාභයක් හෝ පාඩුවක් වශයෙන් වූ ඕනෑම ප්‍රතිපලයක් ලාභයක් හෝ පාඩුවක් වශයෙන් පිළිග නු ලැබේ. රඳවා ගන්නා යම් ආයෝජනයක් සාධාරණ වටිනාකමක් මත පිළිගනු ලැබේ.

### 2.1.4 අඛණ්ඩ පැවැත්ම

අඛන්ඩ පැවැත්මක් ලෙස සමූහය නොකඩවා පවත්වා ගෙන යෑමේ හැකියාව ගැන අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරුවක්කර තිබෙන අතර, පහත සඳහන් කරුණු හැර ඈවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු නැවැත්වීමට ඔවුහු අදහස් නොකරයි.

#### අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙලදනවි සමාගම

සීමාසහිත හෙලදනවි සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්සන් කරන ලද 2009 මැයි මස 09 දිනැති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් මස 08 දින කල් ඉකුත් වි තිබුණි. ආයතනයේ දෘෂ්ඨි කෝණය අනුව ගිවිසුම කල් ඉකුත්වීමත් සමග ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑම ගැන සැළකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවයක් තිබේ.

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමේ ආයතනයේ හැකියාව ගැන වාර්තා කරන දිනය වන විට තක්සේරුවක් අධ්‍යක්ෂකවරුන් විසින් කර තිබෙන අතර, ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමට අස්ථිතියට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් තිබෙන බව ඔවුහු තීරණය කර තිබේ. එම නිසා හෙලදනවි සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුව කටයුතු කිරීම උචිත නොවේ.

කෙසේ නමුත් සීමාසහිත හෙලදනවි සමාගමේ දේපල පිරියත හා උපකරණ ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කර ඇති නිසා සමූහයේ ව්‍යාපාර කණ්ඩායම් මට්ටමින් එම වත්කම් පවරා ගැනීමට අපේක්ෂා කෙරේ.

#### අඛණ්ඩ පැවැත්ම - ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ස් ඉංජිනියරින් (පුද්ගලික ) සමාගම

2015 නොවැම්බර් මස 01 දින සිට මෙහෙයුම් නවත්වා සීමාසහිත එල් ටී එල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම වෙත සිය මෙහෙයුම් පැවරීමට අධ්‍යක්ෂකවරුන් තීරණයකර තිබේ. එම නිසා සීමාසහිත එල් ටී එල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපක්ලපනය අනුග මනය කර නොමැත.

## 2.2 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

### 2.2.1 බද්ධව පාලනය කෙරෙන ආයතන

බද්ධ ව්‍යාපාරයක් යනු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් සම්බන්ධයෙන් බද්ධ පාලන අයිතිවාසිකම් ඇති බද්ධ සංවිධාන වර්ගයකි. බද්ධ පාලනයක් යනු අදාල ක්‍රියාකාරකම් ගැන එලබෙන්නාවූ තීරණ සම්බන්ධයෙන් පාලනය බෙදා හදා ගන්නා පාර්ශවයන් අතර ඒකමතික කැමැත්තක් අවශ්‍ය වන්නාවූ ගිවිසුම්ගත එකගතාවයක් පවතින සංවිධානයක් වේ. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සාමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලය හා NTPC සමාගම අතර වූ බද්ධව පාලනය වන ආයතනයකි. බද්ධ පාලනය පිලිබඳ තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු පරිපාලිත සමාගම් පාලනය කෙරෙහි ගනු ලබන තීරණයට සමානය.

සිය බද්ධ ව්‍යාපාරය තුල මණ්ඩලයේ ආයෝජනය ගණනය කරනුයේ සම කොටස් ක්‍රමවේදය යොදා ගනිමිනි.සමකොටස් ක්‍රමවේදය යටතේ බද්ධ ව්‍යාපාරය ආයෝජන මුලදී හදුනාගන්නේ පිරිවැය මතය. අත්පත් කර ගැනීමේ දිනයේ සිට පවතින්නා වූ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් වලින් මණ්ඩලයේ කොටස් වල වෙනස්කම් හඳුනා ගැනීම පිණිස ආයෝජනයේ ධාරණ වටිනාකමට අදාළ (carrying amount) ගැලපීම් කරනු ලැබේ.බද්ධ ව්‍යාපාරයට අදාල කීර්ති නාමය ආයෝජනයේ ධාරණ වටිනාකමෙහි අඩංගු අතර හානිකරන පරීක්ෂාව සඳහා තනි තනිව පරීක්ෂා නොකරේ.බද්ධ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලවල මණ්ඩලයේ කොටස අදායම් ප්‍රකාශයේ පිලිඹිබු වේ .ආයෝජකයාගේ වෙනත් විස්තීරණ අදායම් වෙනස්කම් මණ්ඩලයේ වෙනත් විස්තීරණ අදායම් කොටස් වශයෙන් ඉදිරිපත් කරේ.

මෙයට අමතරව බද්ධ ව්‍යාපාරයේ සමකොටස් වල සෘජුව හඳුනාගන්නා වෙනසක් සිදුව ඇත්නම් සමකොටස් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශයේ වෙනස්වීම්වලට සිය කොටස මණ්ඩලය විසින් අදාල පරිදි හදුනා ගනී. මණ්ඩලය සහ බද්ධ ව්‍යාපාරය අතර ගනුදෙනු හේතුවෙන් ඇති වන උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ බද්ධ ව්‍යාපාරයේ හිමිකමේ ප්‍රතිශතය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන තුලින් ඉවත් කරනු ලැබේ. සමස්ථ මණ්ඩලයට අදාල බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස ලාභ හෝ පාඩු ලාභ ප්‍රකාශනයේ පෙන්නුම් කරන අතර කොටස් හිමියන්ගේ බද්ධ ව්‍යාපාරයට ඇති ලැදියාව නියෝජනය කරමින් ලාභ පාඩු ප්‍රකාශණයේ මුහුණත පෙන්නුම් කරයි.

### 2.2.2 විදේශ විනිමය ගනුදෙනු පරිවර්ථනය

අ). ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

මූල්‍ය ප්‍රකාශ වල ඇතුලත් අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාකාරි වන මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාර මුදල් යොදා ගනමින්ය. (ව්‍යවහාරික මුදල්). මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙන්නේ ආයතනයේ ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මුදල් වශයෙන් සැලකෙන ''ශ්‍රී ලංකා රුපියල්'' වලිනි.

### ආ).ගනුදෙනු හා ශේෂයන්

විදේශ විනිමය ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ගනුදෙනු සිදු වන දිනයන්හි බල පවත්නා විනිමය අනුපාත යොදා ගනිමින් ව්‍යවහාරික මුදලින් වාර්තා කරයි.එවැනි ගනුදෙනු පියවීමෙන් හා මූල්‍ය වත්කම් හා බැරකම් වල වසර අවසාන විනිමය අනුපාත මත පරිවර්තන තුල ඇති වන විදේශ ව්‍යවහාර මුදල් වලින් නම් කර තිබෙන විදේශ විනිමය ලාභ හා පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හදුනා ගනු ලැබේ.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වගන්තියේ 06 වන උපවගන්තිය යටතේ විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රාග්ධනය හා ණය මත පොලිය සම්බන්ධයෙන් විනිමය උච්චාවචන වලින් ඇති වන ලාභ හෝ පාඩු ලංකා විදුලිබල මණ්ඩලය ගිණුම් ගත නොකෙරෙනුයේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන බැවිනි. ආපසු ගෙවිය යුතු නොපියවූ ණය තක්සේරු කරනුයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ පැවති එකග වූ විනිමය අනුපාතය මතය.

### ඇ).විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම්

විදේශීය මෙහෙයුම් වන මෙරටින් බැහැර පාලිත සමාගම් වල මූල්‍ය තත්ව ප්‍රකාශය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පහත දැක්වෙන පරිදි සමූහයේ පිළිගැන්වෙන ව්‍යවහාර මුදලට පරිවර්ථනය කළ යුතුය.

- වත්කම් හා බැරකම් පරිවර්ථනය කරනුයේ ශේෂ පත්‍රයේ දිනට බලපෑ විනිමය අනුපාතය අනුවය.
- විදේශීය ව්‍යාවහාර මුදලකින් සාධාරණ තක්සේරුවක් මත මනින ලද මූල්‍ය නොවන අයිතම පරිවර්ථනය පරිවර්ථනය කරනුයේ සාධාරණ තක්සේරුව තීරණය කරන දිනයට අදාළ විනිමය අනුපාතය අනුවය.
- මෙම සාමාන්‍ය අනුපාතය ගනුදෙනු දිනයේ බලපෑ අනුපාතයට සාධාරණ ආසන්න අනුපාතයක් නොවුන හොත් මිස, ආදායම් හා වියදම් පරිවර්තනය කරනුයේ කාලසීමාව සඳහා සාමාන්‍ය විනිමය අනුපාතය මත වන අතර, එවැනි අවස්ථා වලදී ආදායම් හා වියදම් පරිවර්තනය කරනුයේ ගනුදෙනු දිනයේ බලපෑ අනුපාතයටය.
- ඒකාබද්ධ කිරීමට අදාල ගනුදෙනු වලින් ඇති වන විනිමය වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායමේදී හඳුනා ගැනේ.

## 2.2.3 බදුකරණය

### අ). ප්‍රවර්තන බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම්, ප්‍රවර්තන බදු සහ විලම්භිත බදු වලින් සමන්විත වේ. පවත්නා හා පෙර කාලසීමාවන් සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් ගෙන් ලැබීමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මතය. මුදල් ප්‍රමාණය ගණන් බැලීමට යොදා ගන්නා බදු අනුපාතය හා බදු නීතිය වනුයේ සමාගම ක්‍රියාත්මක හා බදුවලට යටත් ආදායම් ජනනය කරනු ලබන රටේ පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ ප්‍රමාණවත් ලෙස පන වන ලද ඒවාය.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ බදු හඳුනා ගැනේ; වෙනසකට ඇත්තේ වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට අරෝපණය කළ හැකි වෙනසක් වෙනත් විස්තීර්ණ ආදායම් වල ද සෘජුව හඳුනා ගැනීමයි. හිමිකම් වලදී සෘජුව හඳුනා ගත් අයිතම වලට අදාළ ප්‍රවර්තන ආදායම් බදුහිමිකම් හඳුනා ගන්නේ හිමිකම් වලදීමිස ආදායම් ප්‍රකාශය තුළ නොවේ.

අදායම් බදු සදහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති පරිදි අදායම් හා වියදම් වල අගයක් මත වන අතර 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන හා එහි සංශෝධන අනුව ගණනය කර ඇත.

### ආ) විලම්භිත බදුකරණය

වත්කම් හා බැරකම් වල බදු පදනම් අතර පැනනගින තාවකාලික වෙනස් වීම් හා මූල්‍ය වාර්තා වල ඔවුන්ගේ ධාරණ වටිනාකම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්භිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත.

ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක හෝ බැරකමක මුල් හඳුනා ගැනීමකදී විලම්භිත ආදායම් බදු වගකීම් හට ගන්නා අවස්ථාවක ද ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදු වන අවස්ථාවකදී ද හැර ගිණුම්කරණ ලාභය හෝ බදු වලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් විලම්භිත ආදායම් බදු බැරකම් පැන නැගීමේදී හැර බදුවලට යටත් සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්භිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලැබිම සහ ගනුදෙනු කරන ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කල හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

අඩු කළහැකි සියලුම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිතයට නොගත් බදු වත්කම් හා භාවිතයට නොගත් බදු පාඩු සඳහා බදුවලට යටත් ලාභ තිබීමේ හැකියාවක් පවතින තාක් විලම්භිත ආදායම් බදු වත්කම් පිළිගනු ලැබේ. මෙයින් අඩු කළහැකි තාවකාලික වෙනස්කම් හා භාවිතයට නොගත් බදු බැර හා භාවිතයට නොගත් බදු පාඩුවල ඉදිරියට ගෙනයෑම් උපයෝගී කර ගත හැකි වනුයේ එය ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවකදී ගනුදෙනු කාලය තුළදී හා එම ගනුදෙනු කාලය තුලදී ගිණුම්කරණ ලාභය හෝ බදුවලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් නොකළ යුතු ගනුදෙනුවකදී වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීම තුළින් පැන නගින අඩු කළහැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්භිත ආදායම් බදු වත්කම්ය.

විලම්භිත බදු වත්කම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් වාර්තා කරණ සෑම දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර විලම්භිත ආදායම්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

බදු වත්කම මුලුමනින්ම හෝ අඩක් වශයෙන් යොදා ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු වලට යටත් ලාභයක් තිබේ දැයි තවදුරටත් හැකි නොවනතාක් ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල, ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ආයෝජන තුළින් ඇති වන තාවකාලික වෙන්සකම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී ප්‍රත්‍යාවර්ති නියම කිරීම් හැර අනෙතුත් තාවකාලික වෙනස්කම් පාලනය කළ හැකි අතර එම තාවකාලික වෙන්ස්වීම් නුදුරු අනාගතයේදී ප්‍රත්‍යාවර්තනය නොවනු ඇත.

වාර්තා කරනු ලබන සෑමදිනයකදීම හඳුනානොගත් විලම්බිත ආදායම් බදු වත්කම් නැවත ඇගයන අතර අනාගත බදුවලින් විලම්බිත ආදායම් බදුවත්කම් ආපසු ලබා ගැනීමට යටත් ලාභ වලින් ඉඩ ලැබෙන බව හඳුනා ගැනෙයි.

පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාර වල ලැදියාවන්ට සම්බන්ධ අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගැනෙන්නේ නුදුරු අනාගතයේදී තාවකාලික වෙනස්වීම් ආපසු හැරීමේ හා තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදුයටතේ ලාභයක් ලැබීමේ හැකියාවක් තිබෙනතාක් පමණ.

විලම්භිත ආදායම් බදු වත්කම් හා බැරකම් මනිනුයේ වත්කම උපලබ්ධි වන හෝ බැරකම නිරවුල් කරණු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතයන් (හා බදුනීති) පදනම් වූ බදු අනුපාත මතය. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ස්කන්ධ ප්‍රාග්ධකයට සෘජුව පිළිගන්නා ලද අයිතම වලට පාදක ගනුදෙනුවට සහ සම්බන්ධව අදාළ විලම්බිත බදු පිළිගනු ලැබේ. ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදුබැරකම් වලට හිලව් කිරීමට නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් හා විලම්බිත බදු අදාළ වන්නේ බදුවලට යටත් එම ආයතනයට හා එම බදුකරණ බලධාරියාටම නම් විලම්බිත බදුවත්කම් හා විලම්බිත බැරකම් හිලව් කරනු ලැබේ.

## 2.2.4 ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරණ පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ. ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීමට සූදානම් වීම පිණිස අවශ්‍ය සැලකිය යුතු කාල සීමාවක් ගත වෙන යෝග්‍ය වන වත්කම් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ හැකි පොදු හා නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් සාරානුකූලව ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීම පිණිස සාරානුකූලව සූදානම් කෙරෙන තුරු එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකූත් ණය ගැනීමේ සියලුම පිරිවැය, වියදම් දරන ලද කාලසීමාව තුළ වියදම් ලෙස හදුනා ගනු ලැබේ.

## 2.2.5 භාණ්ඩ තොග

යල්පැන ඇති හා මන්දගාමී චලනය වන අයිතම සදහා වෙන් කිරීමෙන් පසු තොග තක්සේරු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මතය. ශුද්ධ උපලබ්ධි වටිනාකම අවසන් කිරීමේ හා විකිණීම කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කළ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකිණිය හැකි මිල ගණන්ය. භාණ්ඩ දැනට ඇති ස්ථානයට ගෙන ඒමට හා වත්මන් තත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදි ගනණය කෙරේ.

| | |
|---|---|
| **සීමාසහිත ලංකා විදුල (පුද්ගලික) සමාගම** | |
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | -බර තබන ලද සාමාන්‍යය පදනමින් තත්‍ය පිරිවැය මත |
| සංක්‍රාන්ති භාණ්ඩ හා වෙනත් පිරිවැය | -තත්‍ය පිරිවැය මත |
| **සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම** | |
| අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලැබේ | -ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් |
| නිම්භාණ්ඩ හා නිමකෙරෙමින් ඇති භාණ්ඩ | -සෘජු ද්‍රව්‍ය පිරිවැය, සෘජු වැටුප් හා ස්ථාවර නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සමානුපාතය මත |
| පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් | -ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් පදනමින් තත්‍ය පිරිවැය මත |
| සංක්‍රාන්ති භාණ්ඩ | -තත්‍ය පිරිවැය මත |

### ලංකා විදුලිබල මණ්ඩලය

වැඩි වශයෙන් පාවිච්චියට ගන්නා හා වාර්ෂික මිල ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ තක්සේරු කරනුයේ බෙදාහැරීම් අංශ වල සම්මත මිල අනුව වන අතර පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් ඒවා (ජනන හා සම්ප්‍රේෂණ අංශ වල)ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කෙරෙන ක්‍රමයමතය. එසේ වුවද සම්මත මිල අනුව තක්සේරුකර තිබෙන භාණ්ඩ වල උපලබ්ධි ලාභය මගින් දක්වා ඇති පිරිවැය පහත හෙළීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය විසින් සලසා ඇත.

## 2.2.6 මුදල් හා මුදල් හා සමවන වෙනත් දේ

මුදල් හා මුදල් හා සමාන වෙනත් දේ ලෙස විග්‍රහ කර ඇත්තේ, අත තිබෙන මුදල්, ඉල්ලුම් තැන්පතු හා ඉක්මණින් හා පහසුවෙන් නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි හා අගය වෙනස් වීම පිළිබඳව අල්ප අවදානමකට ලක් වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්ය. සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් වලට සමානදේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ ප්‍රමාණයෙන් සමන්විවේ. කෙටි කාලීනව කල්පිරෙණ ආයෝජන එනම් පවරා ගැනීමෙන් පසු තුන් මසක් ඇතුළත හෝ එයට අඩු කාලයකින් පරිණත වන කෙටි කාලීන ආයෝජනයන් ද මුදල් සමානදේ ලෙස සලකනු ලැබේ.

## 2.2.7 දේපල, පිරියත හා උපකරණ

### අ) පිරිවැය හා අගැයීම

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් වූයේ නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැය වටිනාකමටය. දේපල, පිරියත හා උපකරණ වල උපාංග කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය හා පිළිගැනීමේ නිර්ණායක සපුරා තිබේ නම් දීර්ඝ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළ ණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් ය. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන විට ප්‍රතිස්ථාපිත වූ කොටසේ ශුද්ධ පොත් වටිනාකම සමූහය විසින් හඳුනා නොගන්නා අතර එයට අදාළ ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය වීම් සහිත වන කොටස පමණක් හඳුනා ගැනේ. එලෙසම ප්‍රධාන පරීක්ෂණයක් ඉටු කළ විට පිළිගැනීමේ නිර්නායක සපුරාලන්නේ නම් එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනේ.

දේපල, පිරියත හා උපකරණ අයිතම පසුව නැවත තක්සේරු කරනු ලබන්නේ නම් එවිට එවැනි සමස්ත වත්කම් ඛණ්ඩයම නැවත තක්සේරු කෙරේ. නැවත තක්සේරු කිරීමේ යම් අතිරික්තයක් ඇත්නම් වත්කම් නැවත තක්සේරු කිරීමේ සංචිතයේ විස්තීර්ණ ආදායම් හා සමුච්චිත සමකොටස් වල එය හඳුනා ගනු ලැබෙයි. යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේ නම් එය වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාෂණයේ එම වත්කම්වර්ගයට අදාළ වෙනත් විස්තීරණ අදායමට පෙර ගලපන ලද ප්‍රත්‍යාගණන අලාභයේ ප්‍රමාණය දක්වා හදුනාගන්නා අතර යම් ප්‍රත්‍යාගණන අලාභයක් වේ නම් එම වත්කමටම අදාලව වෙනත් විස්තීරණ අදායම් ප්‍රකාශණයට කලින් ගලපන ලද ප්‍රත්‍යා ගණන අතිරික්තය දක්වා හදුනා ගැනේ.

නැවත තක්සේරු කිරීමේ දිනට සමුච්චිත ක්ෂයවීම් වත්කමේ දළධාරක මුදලට අදාළව ඉවත් කෙරෙන අතර ශුද්ධ මුදල වත්කමේ නැවත තක්සේරු කළ මුදලට පුනස්ථාපනය කෙරේ. බැහැර කිරීමේදී විකුණන වත්කමට අදාල යම් නැවත තක්සේරු කිරීමේ සංචිතයක් ඇත්නම් එය රඳවා ගත් ඉපැයීම් වලට මාරු කෙරේ.

## ආ)දැනට සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්

සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ප්‍රකාශයට පත් කරනුයේ පිරිවැයමතය. මේවා දීර්ඝ කාලීන මූල්‍ය ව්‍යාපෘති වල ඉදිකිරීම් කාර්යයන්ට සෘජුව ඇතළත් මූලධන ස්වභාවයකින් යුත් වියදම්ය. ව්‍යාපෘති අවසන් වන තෙක් හා අදාළ වත්කම් භාවිතයට ලබා ගත හැකිවන තෙක් හා ඒ ආශ්‍රිත වත්කම් පරිහරණය සඳහා ලබා ගත හැකි වන තෙක් මූලධන ස්වභායෙන් යුත් වියදම් ගිණුම් ගත කරනුයේ සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් වශයෙනි.

## ඇ)හඳුනා ගත් වත්කම් පොත් වලින් ඉවත් කිරීම

දේපළ, පිරියත හා උපකරණ වල අයිතමයක ධාරණ අගය අපහරණයේ දී හෝ එය භාවිතයෙන් අපේක්ෂිත අනාගත ආර්ථික වාසි නොලැබෙන විට ඒවා භාණ්ඩ ලේඛනයන් ගෙන් ඉවත් කෙරේ. දේපල, පිරියත හා උපකරණ අයිතමයක් භාණ්ඩ ලේඛනයෙන් ඉවත් කළ පසු ඇති වන වාසියක් හෝ පාඩුවක් එම අයිතමය පිළිගැනීමෙන් ඉවත් කිරීමේද එම වර්ෂයේ ලාභ හා අලාභ ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

දේපල, පිරියත හා උපකරණ විෂයයක ධාරන අගය ආදේශක පිරිවැයෙහි හඳුනා ගන්නා විට ඉතිරි ධාරණ අගය ප්‍රතිස්ථාපිත කොටස් වල හඳුනා ගැනේ. ප්‍රධාන පෙල පරීක්ෂා පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එවැනි සෑම ප්‍රාග්ධනයකදිම පෙර පරීක්ෂා වල පිරිවැයේ ඉතිරි ධාරණ අගය පොත්පත් වලින් ඉවත් කෙරේ.

## ඈ)විකිණීම සදහා තබා ඇති ජංගම නොවන වත්කම්

අඛණ්ඩව භාවිතා කිරීමට වඩා වාර්තා ගත වටිනාකම මුලික වශයෙන් ම විකිණීම මගින් අයකර ගතහැකි නම් සමුහය විසින් ජංගම නොවන වත්කම් අපහරණය කරේ. අපහරණය සදහා වර්ගීකරණය කර ඇති එකී ජංගම නොවන වත්කම් ඒවායේ පොත්වල අගය හා සාධාරණ අගයෙන් විකුන්ම් වියදම් අඩු කල පසු අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරේ.

කළමනාකරණ (අධ්‍යක්ෂක මණ්ඩලය) විසින් ප්‍රධාන කරනු ලබන අනුමැතිය මත ඉහල විකුණුම් සම්භාවිතයක් ඇති යන නිර්ණායක මත විකිණීම සදහා දැරීම යන වර්ගීකරණය කරනු ලැබේ. වර්ගීකරණයෙන් අනතුරුව මාස 6ක කාලය ඇතුලත කළමනාකරණය විසින් අපේක්ෂිත අලෙවිය සදහා කැප විය යුතුය.

විකණීම සදහා යන වර්ගීකරණය කිරීමෙන් පසු දේපල පිරියත හා උපකරණ ක්ෂය ප්‍රතිපාදන අත්හිටුවයි.අපහරණය සදහා වර්ගිකරණය කල වත්කම් සහ වගකීම් මුල්‍ය තත්වය පිළිබද ප්‍රකාශයේ ජංගම අයිතිමයන් වශයෙන් වෙනම දක්වනු ලැබේ.

එවැනි වත්කමක් විකිණීම සදහා ඇති ජංගම නොවන වත්කම් ලෙස හදුනාගත් පසු එය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මාස 06 ක් ඇතුලත බැහැර කල යුතුය. බැහැර නොකළහොත් දේපල පිරියත උපකරණ (PPE) යටතේ නැවත වර්ගීකරණය කල යුතු අතර ක්ෂය නතර කරන ලද කාලය සදහා ක්ෂය ගැලපිය යුතුය.

## ඉ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය

කාර්ය සාධනයේ මුල් තක්සේරු ප්‍රමිතියේ අනාගත ආර්ථික වාසි මුලින් පැවති තත්වයට ගෙන ඒමට හෝ පවත්වාගෙන යාම සදහා දේපල පිරියත හා උපකරණ අලුත්වැඩියව හෝ නඩත්තු කිරීම සදහා දරණ ලද වියදම් වියදම් වියදම දරණ ලද අවස්ථාවේ වියදම් ලෙස හදුනා ගනී.

## ඊ) ක්ෂය වීම

සින්නක්කර ඉඩම් හැර වෙනත් වත්කමක් පාවිච්චිය සඳහා යොදා ගත හැකිව තිබෙන විට වත්කමෙහි සඵල පිවිත කාලය තුළ සරල රේඛා පදනම යොදා ගනිමින් ක්ෂයවීම් ගණනය කරනු ලැබේ. බදු ඉඩම් වල ගොඩනැගිල වල ක්ෂය ගණනය කරනුයේ වත්කමෙහි ඇස්තමේන්තු ගත සඵල පිවකාලය හා කල්බදු වාරිකයත් යන දෙකෙන් අඩු අගයටය.

වත්කම් වල සඵල ආයුකාල ඇස්තමේන්තු කරනුයේ පහත දැක්වෙන අයුරිනි:

### ලංකා විදුලිබල මණ්ඩලය

| | |
|---|---|
| සින්නක්කරගොඩනැගිලි හා බදුඉඩම් හා ගොඩනැගිඩි | වසර 40 |
| සිවිල්වැඩ: | |
| වාන් දොරටු හා වේලි | වසර 100 |
| වානේ ජලනල හා කොටු දොර | වසර 40 |
| උප පොල හා ස්විච්චි අංගනය | වසර 35 |
| උත්පාදන යන්ත්‍ර: | |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ජලවිදුලි) | වසර 35 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (තාප) | වසර 25 |
| පිරියත ඇතුලු විදුල බලාගාර (ඩීසල්) | වසර 15 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගෑස් ටර්බයින්) | වසර 12 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | |
|---|---|
| පිරියත ඇතුලු විදුලිබලාගාර (ගල් අඟුරු) | වසර 30 |
| පිරියත ඇතුලු විදුලිබලාගාර (සුළං) | වසර 15 |
| සම්ප්‍රේෂණ මාර්ග කිවො220, කිවො132, කිවො66 | වසර 35 |
| බෙදා හැරීමේ මාර්ග: | |
| අධි සැරයටිබහන් - 33 | වසර 50 |
| අධි සැරයටිබහන් - 132 | වසර 50 |
| අධි සැරයටිබහන් - 11 | වසර 40 |
| අධි සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර භූගත | වසර 40 |
| අඩු සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර පෝෂණ කණුව | වසර 35 |
| පාරිභෝගික උප පොල | වසර 35 |
| අධිසැරස්විච්චිපන්න | වසර 35 |
| ප්‍රාථමික හා ජාලක උප පොල | වසර 35 |
| සේවානඩත්තු පොදු කාර්යන් | වසර 35 |
| සේවා ගාස්තු භූගත | වසර 40 |
| SCADA (මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ | වසර 15 |
| මෝටර් වාහන | වසර 07 |
| මෝටර් බෝට්ටු | වසර 07 |
| යන්ත්‍ර හා මෙවලම් | වසර 05 |
| කාර්යාලීය උපකරණ | වසර 05 |
| ලිබඩු හා සවිකිරීම් | වසර 05 |

### සීමාසහිත එල්ටීඑල්හෝල්ඩිංස් (පුද්)සමාගම

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 25-50 අධික |
| පිරියත හා යන්ත්‍ර | වසර 8-20 අධික |
| බලාගාරය | වසර 10-20 අධික |
| කම්හල් උපකරණ | වසර 10 අධික |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | වසර 10 අධික |
| ගිනිනිවීමේ උපකරණ | වසර 10 අධික |
| කාර්යාලීය උපකරණ | වසර 03 - 10 අධික |
| ලිබඩු හා සවිකිරීම් | වසර 03 - 10 අධික |
| මෝටර් වාහන | වසර 04 අධික |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් | තත්‍ය භාවිතය |
| තාප ප්‍රතිසාධනවීකකය | වසර 15 අධික |

### සීමාසහිත ලංකාවිදුලි (පුද්)සමාගම

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| බදු ඉඩම් | බදුකාලය ඉක්මවා |
| යටිතල පහසුකම් සැපයීම | |
| පලාත් පාලන ආයතන හා ලංවිම වෙතින් භාරගත් උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 10 |
| ලෙකෝ සමාගමෙන් ඉදි කළ උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 20- 25 |
| මෝටර් වාහන | වසර 05- 07 |
| පරිඝණක | වසර 03- 05 |
| කාර්යාලීය උපකරණ | වසර 03- 07 |
| පිරියත හා යන්ත | වසර 03- 04 |

### සීමාසහිත ලංකාකෝල් (පුද්)සමාගම

| | |
|---|---|
| ලිබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 04 |
| මෝටර් වාහන | වසර 04 |
| පරිඝණක | වසර 04 |
| කල්බදු වැඩි දියුණු කිරීම | වසර 02 |

### සිමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම

| | |
|---|---|
| ලිබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 05 |
| ලැප්ටොප් හා පරිඝණක | වසර 03 |

රු 15,000 දක්වා වැය වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කෙරේ

## 2.2.8 කල්බදු

### 2019 ජනවාරි 1 සිට අදාළ වන ප්‍රතිපත්ති

කොන්ත්‍රාත්තුවක් ආරම්භයේ දී, මණ්ඩලය විසින් එය කොන්ත්‍රාත්තුවක් ද හෝ එහි කල්බදු ගිවිසුමක් තිබේ ද යන්න තක්සේරු කරයි. කොන්ත්‍රාත්තුවක් වන්නේ හෝ අඩංගු වන්නේ සලකා බැලීම සඳහා හුවමාරුවක් වශයෙන් යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුව මඟින් ලබා දෙන්නේ නම් මේ හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුව මඟින් ලබා දී ඇත් දැයි තක්සේරු කිරීම සඳහා ශ්‍රීලංමුවාප්‍ර 16 හි අර්ථ දැක්වීම මණ්ඩලය විසින් භාවිතා කරයි.

මෙම ප්‍රතිපත්තිය 2019 ජනවාරි 1 දින හෝ ඊට පසුව ගිවිසුම්ගත කොන්ත්‍රාත්තු සඳහා අදාළ වේ.

### 2.2.8.1 කල්බදු ලෙස සමුහය

කොන්ත්‍රාතුව ආරම්භයේ දීම එය කල්බදු ද හෝ කල්බදු අඩංගු ද යන්න ලංවිම විසින් තක්සේරු කරයි. එය නිශ්චිත වත්කමක් මත රඳා පවතී ද යන්න එම වත්කම් භාවිතා කිරීමෙන් ලංවිම විසින් සියළු ආර්ථික ප්‍රතිලාභ සාරානුකූල ලෙස ලබාගන්නේ ද යන්න සහ වත්කම් භාවිතය මෙහෙය වීමට ලංවිම සඳහා අයිතියක් තිබේ ද යන්න පිළිබඳව මෙම තක්සේරුවට ඇතුළත්වේ.

කල්බදු කාලය තුළ සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශනයේ වැය කරනු ලබන මාස 12 හෝ ඊට අඩු කෙටිකාලීන කල්බදු හැර ලංවිම විසින් කල්බදු ආරම්භක දිනයේ වත්කම් භාවිතා කිරීමේ අයිතිය හා කල්බදු වගකීම හඳුනාගනී.

ආරම්භක දිනයේ නොගෙවනු ලබන කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම ආරම්භකව මනිනු ලබන අතර කල්බදු වල ගම්‍ය වන පොළී අනුපාත යොදා ගනිමින් වට්ටම් කරනු ලැබේ. මෙම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැක්කේ නම්, ලංවිම විසින් වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරයි. කල්බදු සඳහා ස්ථාවර ගෙවීම් ඇතුළත් විය හැකිය. ආරම්භක දිනයේ දන්නා දර්ශකයක් හෝ අනුපාතකයක් මත රඳා පවතින විචල්‍ය ගෙවීම් ක්‍රියාත්මක කිරීම සඳහා ලංවිම සාධාරණ යැයි නිශ්චිත නම් දිගු විකල්ප ගෙවීම් හෝ මිල දී ගැනීම් විකල්ප, කල්බදු ගෙවීම් වලට ඇතුළත් කළ හැකි සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට කල්බදු වගකීම පසුව මනිනු ලබන අතර නැවත සාකච්ඡා කිරීමේ දී, ඉදිරි කල්බදු ගෙවීම් වල වෙනස්වීමක් තිබෙන විට, දර්ශකයක හෝ අනුපාතයක වෙනස්වීම් හෝ විකල්පයන් යළි තක්සේරු කිරීමක දී වෙනස් වු විට (අදාළ භාවිතා කිරීමේ අයිතිය සහිත වත්කම් වලට අනුරූප ගැලපුමක් ලෙස) නැවත ගණනය කරනු ලැබේ.

ආරම්භයේ දීම භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, බදුකරුවන් විසින් ලබා දුන් යම් දිරිගැන්වීම් අඩු කිරීමෙන් පසු ආරම්භක කල් බදු වගකීම, ආරම්භක සෘජු පිරිවැය සහ වත්කම් නවීකරණය කිරීම සඳහා බැඳීම් වලින්

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සමන්විත වේ. භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් කෙටි කාල සීමාවට හෝ පාදක වූ වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට ක්ෂය කරනු ලැබේ.

අයිතිය ඇති වත්කම් සඳහා මෙන් හානිකරණය සඳහා දැන්වීමක් තිබේ නම් භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම හානිකරණය සඳහා පරීක්ෂණයට යටත් වේ.

භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, දේපල, පිරියත හා උපකරණ ශීර්ෂය යටතේ ඇතුළත් කරන අතර කල්බදු, වගකීම්, ජංගම හා ජංගම නොවන පොලී සහිත ණය හා ණයගැනීම් ශීර්ෂ යටතේ ඇතුළත් කරනු ලැබේ.

### 2.2.8.2 සමූහය බදු කරු ලෙස - එල්ටීඑල්

#### මෙහෙයුම් කල්බදු

වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙසින් නොපවරන ජලවිදුලි, වායු බල හා තාප බල බලාගාර වර්ග කරනුයේ මෙහෙයුම් කල්බදු වශයෙනි. සියලුම බලාගාර වලින් ලැබෙන ආදායම් බලශක්ති නිපැයුම මත ආදායම් ප්‍රකාශයේ පිළිගැනෙන්නේ බදුදුන් වත්කම් වලින් ඉපදෙන භාවිතයේ ප්‍රතිලාභ අඩු වන කාල රටාව වැඩියෙන් නියෝජනයවන කාල සීමාවේ බලශක්ති නිපැයුම මතය. බදු ආදායම ඉපයීමේදී දරන ලද ක්ෂයවීම් ඇතුලු පිරිවැය වියදමක් වශයෙන් පිළිගැනේ. ක්ෂයවීමට යටත් බදු වත්කම් වල ක්ෂය වීමේ ප්‍රතිපත්තිය සමානවත්කම් සඳහා සමූහයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට ගැලපේ.

පහත සඳහන් නිර්නායකයන්ගෙන් සෑහීමකට පත්වීම හේතුවෙන් සීමාසහිත රාජ් ලංකා විදුලිබල සමාගම හා බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය සහ සීමාසහිත ලක්දනව් බංගලා පවර් සහ බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය  අතර ඇති විධිවිධාන IFRIC 4- එකඟවීමට කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම සහ “ශ්‍රීලංගිප්‍ර -  16 කල්බදු” යටතේ කල්බදු ලෙස ගිණුම් ගැන කළ යුතුය යන විෂය පථයට අයත්බව සමුහයේ අදහසයි.

- විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම යටතේ ඇති විධිවිධානය සපුරාලීම රඳා පවතින්නේ බංගලාදේශයේ හි පිහිටි සමුහයේ නිශ්චිත බලාගාරයේ සුවිශේෂී භාවිතය මතය.
- බලාගාරය ක්‍රියාත්මක කිරීමට හෝ බලාගාරයේ සමස්ත නිෂ්පාදනය පාලනය කරන අතරම එය තීරණය කරන ආකාරයට බලාගාරය ක්‍රියාත්මක කිරීම අන්‍යයන්ට යොමු කිරීමට බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලයට අයිතියක් ඇත.
- සමාගමේ විදුලි බලාගාරය මඟින් උත්පාදනය කරන ලද විදුලිබල නිමැවුම, බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය හැර වෙනත් පාර්ශවයකට ලබාගත නොහැකි අතර බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය විසින් ගෙවනු ලබන ඒකකයකට ධාරිතා ගාස්තුව නැමැවුම මත පදනම් නොවේ.

සමුහයේවිදුලිබලාගාරයේනෛතිකහිමිකාරිත්වයටආනුපාතික සියලු අවදානම් සහ ප්‍රතිලාභ බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලයට වෙත මාරු කර ඇති හෙයින් සී/ස රාජ් ලංකා සමාගම හා සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම බදුකරු ලෙසත්, බංගලාදේශ බලශක්තී සංවර්ධන මණ්ඩලය බදුගන්නා ලෙසත් ශ්‍රීලංගිප්‍ර -  16 කල්බදු යටතේ මුල්‍ය කල්බදු ලෙස විධිවිධානය ගිණුම්ගත කෙරේ.

#### 2019 ජනවාරි 1 දිනට පෙර අදාළ වන ප්‍රතිපත්තිය

කල්බදු අයිතමය පිළිබඳ හිමිකාරිත්වයට අදාළ වන සියලු විධිවිධාන කල්බදු ආරම්භයේ දීම කල්බදු දේපලෙහි සාධාරණ අගයට හෝ අඩුනම් අවම කල්බදු ගෙවීම් වල වර්තමාන අගයට ප්‍රග්ධනිත කෙරේ. වගකීම්වල ඉතිරි ශේෂය මත නියත පොළී අනුපාතයක් ලබා ගැනීම සඳහා මුල්‍ය කල්බදු ගාස්තු හා කල්බදු වගකීම අඩුකිරීම අතර කල්බදු ගෙවීම් බෙදී යයි. මුල්‍ය ගාස්තු අයකර ආදායම් ප්‍රකාශනයේ නිරූපණය කෙරේ.

කල්බදු කාලය අවසානයේ දී මණ්ඩලය විසින් හිමිකාරිත්වය ලබාගන්නා බවට සාධාරණ විශ්වාසයක් නොමැති නම්, ප්‍රග්ධනික කරන ලද කල්බදු වත්කම් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලය හා කල්බදු කාල සීමාවේ කෙටි කාලය තුළ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය විස්තර කර ඇති පරිදි හිමිකාරිත්වය ඇති ක්ෂය කළ හැකි වත්කම් සඳහා අනුරූප වේ.

කල්බදු කාල සීමාව තුළ සරල මාර්ග ක්‍රමය මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් වියදමක් ලෙස මෙහෙයුම් කල්බදු ගෙවීම් හඳුනාගැනේ.

### 2.2.9 අස්පෘශ්‍ය වත්කම්

වෙන් වෙන් වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේ පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ අත්කර ගන්නා දිනයේදී ඒවායේ පවත්නා සාධාරන වටිනාකමය. මූලික හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ සමුච්චිත හානිකරණයක් වෙතොත් අදාළ පරිදි පාඩු අඩු කර අස්පෘශ්‍ය වත්කම් පිරිවැය ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනිත කළ සංවර්ධණ පිරිවැය හැර අභ්‍යන්තරිකව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරන අතර වියදම දරන ලද වසරේ ආදායම් ප්‍රකාශයේ අදාළ වියදම පිළිඹිබුවේ. අස්පෘශ්‍ය වත්කම් වල සඵල ආයුකාලය තක්සේරු කරනුයේ පිරිමිත හෝ අපිරිමිත  වශයෙනි.

පිරිමිත පීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් ඒවායේ සඵල ආර්ථික ආයුකාලය ඔස්සේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට ලක් විය හැකි බවට සංඥාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම හානි වූ ලෙස තක්සේරු කෙරේ. පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය ක්‍රමවේදය හා ක්‍රමක්ෂය කාලසීමාව අවම වශයෙන් වාර්තා කරන  සෑම කාලසීමාවකදීම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත සඵල ජීව කාලයේ වෙනස් වීම් හෝ වත්කමෙහි  ඇතුළත්ව තිබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව ගිණුම් ගත කරනුයේ අදාළ පරිදි ක්‍රමක්ෂය ක්‍රමවේදය හෝ ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීමෙන් වන අතර ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ආයු කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම් වල කාර්ය භාරයට අනුකූල වියදම් ප්‍රභේදයන් යටතේය.

අසීමිත සඵල ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකෙරෙන අතර තනි තනිව හෝ මුදල් ජනනය කරන ඒකකයේ මට්ටමින් හානි කරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙනුයේ අසීමිත ජීව කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතී දැයි යන්න තීරණය කිරීමටයි. එසේ නොමැති නම් ජීවකාලය අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා අනාගතය සඳහා බලපවත්න පරිදි වෙනස් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

අස්පෘශ්‍ය වත්කමක් පිළිගැනීම තුළින් පැන නගින ලාභ හෝ පාඩු මනින්නේ බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කම් වල ඉදිරියට ගෙනයන ප්‍රමාණය අතර වෙනස වශයෙන් වන අතර වත්කම පිළිගැනීමෙන් බැහැර කළ විට එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

### පරිඝණක මෘදුකාංග

අත්කර ගැනීමේ හෝ සංවර්ධනය කිරීමේ දිනයේ සිට වසර 4 ක කාලයක් තුළ පරිඝණක මෘදුකාංග ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 2.2.10 මූල්‍ය උපකරණ - මූලික හඳුනා ගැනීම හා පසුකාලීන මිනුම්කරණය

### 2.2.10.1 මූල්‍ය වත්කම්

#### අ) මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

මූලික වශයෙන් හඳුනාගැනීමේ දී, මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI), ණය ආයෝජන, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම, හිමිකම් ආයෝජන හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVTPL) ආදී වටිනාකම් මත වර්ගීකරණය කෙරේ.

මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සදහා සමූහය සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කරන්නේ නම් මිස මූල්‍ය වත්කම් ඔවුන්ගේ මූලික පිළිගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය නොකරේ. එවැනි අවස්ථාවකදී බලපෑමට ලක් වු සියලුම මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියේ වෙනස් වෙනස් වීමෙන් පසු පළමු වාර්තාකරණ කාල පරිච්ඡේදයේ පළමු දිනයේ නැවත වර්ගීකරණය කරනු ලැබේ.

පහත සඳහන් කොන්දේසි දෙක සපුරාලීම මත සහ ක්‍රමක්ෂය පිරිවැය මත මුල් වත්කම් අගය කෙරෙන අතර ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකම නියම නොකෙරේ(FVTPL) .

- ගිවිසුම් ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම සඳහා වත්කම් වල හිමිකාරත්මය දැරීමේ ව්‍යාපාරික ආකෘතිය ඇතුළත සහ
- එය හුදෙක්ම ගෙවිය යුතු මූලික මුදල සහ මූලික මුදල සඳහා වූ පොලිය වශයෙන් වූ ගෙවීම් පිළිබඳ මුදල් ප්‍රවාහයන් සඳහා නිශ්චිත දිනයන් දක්වනු ලබන එහි ගිවිසුම්ගත කොන්දේසි

  ක්‍රමක්ෂය පිරිවැය යටතේ වර්ගීකරණය කරනු ලබන සහ මනිනු ලබන මූල්‍ය වත්කම් එහි වෙළඳ ණයගැතියන්, කාර්ය මණ්ඩලයට සහ පාරිභෝගිකයින්ට දෙනු ලබන ණය අදාළ පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු දෑ කෙටි කාලීන ආයෝජන සහ මුදල් හා මුදල් සමාන දෑ වලට සීමා වේ.

  පහත කොන්දේසි සපුරන්නේ නම්, ණය ආයෝජනයක් අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකමයටතේ මණිනලබන අතර, එය

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමෙන් සහ මූල්‍ය වත්කම් විකිණීමෙන් යන දෙආකාරයෙන්ම තම අරමුණු සාක්ෂාත් කරගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ එය පවතියි සහ
- එය හුදෙක්ම ගෙවිය යුතු මූලික මුදල සහ මූලික මුදල සඳහා වූ පොලිය වශයෙන් වූ ගෙවීම් පිළිබඳ මුදල් ප්‍රවාහයන් සඳහා නිශ්චිත දිනයන් දක්වනු ලබන එහි ගිවිසුම්ගත කොන්දේසි

වෙළඳ නාම සඳහා නොපවතින හිමිකම් ආයෝජනයක් පිළිබඳ මූලික හඳුනාගැනීමකින් පසු සමූහය විසින් ආයෝජනයේ සාධාරණ වටිනාකමේ වූ අනුගාමී වෙනස්වීම් ඉදිරිපත් කිරීම සඳහා ආපසු හැරවිය නොහැකි ලෙස ධක්ෂ තෝරාගනු ලැබේ. මෙම තේරීම ආයෝජනය විසින් ආයෝජනය පදනම මත සිදුකරනු ලබයි.

ඉහත විස්තර කළ පරිදි ක්‍රමක්ෂය පිරිවැය හෝ අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම යටතේ මනින ලද ලෙස වර්ගීකරණය නොකරන ලද සියලු මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම යටතේ මනිනු ලබයි. සියලුම ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් මීට ඇතුළත් වේ. මූලික හඳුනාගැනීමෙන් පසු, මූල්‍ය වත්කමක්, ගිණුම්කරණ නොගැලපීම් ඉවත් කරන්නේ නම් සැළකිය යුතු ලෙස අඩුකරන්නේ නම්, ක්‍රමක්ෂය යටතේ අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම යටතේ හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම යටතේ පරිදි මැනීම සඳහා වූ අවශ්‍යතා සපුරාලන්නේ නම් සමූහය විසින් මූල්‍ය වත්කමක් ආපසු හැරවිය නොහැකි සේ නම් කරනු ලැබේ.

හිමිකම් ආයෝජනය තුළ වූ සමූහයේ ආයෝජන ධක්ෂ තුළින් වූ සාධාරණ වටිනාකම ලෙස වර්ගීකරණය කරනු ලබයි.

### මූල්‍ය වත්කම් - ව්‍යාපාර ආකෘති තක්සේරුව

ව්‍යාපාරය කළමනාකරණය කරනු ලබන ආකාරය සහ කළමනාකරණය කරනු ලබන ආකාරය සහ කළමනාකරණය වෙත සපයනු ලබන තොරතුරු වඩාත් හොඳින් නිරූපණය කරනු ලබන බැවින් ,මූල්‍ය වත්කම් කලාප මට්ටමින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ පරමාර්ථ පිළිබඳව සමූහය විසින් තක්සේරුවක් සිදුකරනු ලබයි. සලකා බලනු ලබන තොරතුරු සඳහා පහත කරුණු ඇතුළත් වේ.

- කළඹ සම්බන්ධයෙන් වූ ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ පරමාර්ථ සහ ප්‍රායෝගිකව එම ප්‍රතිපත්ති ක්‍රියාවට නංවන ආකාරය , ගිවිසුම්ගත පොලී ආදායම ඉපයීම, නිශ්චිත පොලී අනුපාත කළඹක් පවත්වාගෙන යාම, මූල්‍ය වත්කමක කාල පරාසය ඕනෑම අදාල වගකීම් හෝ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හී කාල පරාසයට ගැලපීම හෝ වත්කම් විකිණීම තුළින් මුදල් ප්‍රවාහයන් ලබාගැනීම යන කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ උපාය මාර්ග කේන්ද්‍රගත වන්නේ ද යන මේ තුළ අන්තර්ගත වේ.
- කළඹ පිළිබඳ කාර්ය සාධනය අගයනු ලබන්නේ කෙසේ ද යන්න සහ එය සමූහයේ සමාගම් කළමනාකරණය වෙත වාර්තා කරන්නේ කෙසේ ද යන්න,
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය සාධනයට බලපානු ලබන අවධානම් (සහ එහි ව්‍යාපාර ආකෘතිය තුළ පවතින මූල්‍ය වත්කම්) සහ එම අවධානම් කළමනාකරණය කරන්නේ කෙසේ ද යන වන,
- ව්‍යාපාරයේ කළමනාකරුවන් වෙත හිමිකම් ප්‍රදානය කරන්නේ කෙසේ ද යන්න - උදා: හිමිකම, කළමනාකරණය කරන ලද වත්කම්වල සාධාරණ වටිනාකම හෝ එකතු කරන ලද ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම්වද යන්න සහ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

- පෙර කාල පරිච්ඡේදයන්හී දී මූල්‍ය වත්කම් විකුණුම්වල වාර ගණන ධාරිතාව සහ කාලය , එවැනි විකුණුම් සඳහා හේතු වූ කරුණු සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්

සමූහය විසින් වත්කම් අඛණ්ඩව පිළිගැනීමට අනුකූලව, හඳුනාගැනීම සඳහා සුදුසුකම් නොලබන ගනුදෙනු වලදී මූල්‍ය වත්කම් තෙවන පාර්ශව වෙත පැවරීම මෙම අරමුණු සඳහා විකුණුම් ලෙස නොසැලකේ. වෙළඳාම සඳහා පවතින හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ වටිනාකම් පදනම මත කාර්ය සාධනය ඇගයීමට ලක්කරන මූල්‍ය වත්කම් FVTPL යටතේ මණිනු ලැබේ.

## මූල්‍ය වත්කම් - ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හුදෙක්ම මූලික වටිනාකම සහ පොලිය ගෙවීම් පමණක් ද යන තක්සේරු කිරීම.

මෙම තක්සේරු කිරීමේ පරමාර්ථය උදෙසා මූලික වටිනාකම යන්න මූලික හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම ලෙස අර්ථ දක්වනු ලබයි. ලාභ ආන්තිකයක් මෙන්ම මුදලේ කාල වටිනාකම, සහ යම් නිශ්චිත කාල පරාසයක් තුළ ගෙවිය යුතු මූලික වටිනාකම හා සබැඳි ණය අවධානම සහ වෙනත් මූලික ණය දීමේ අවධානම් සහ පිරිවැයන් (උදා: ද්‍රවශීලතා අවධානම් සහ පරිපාලන පිරිවැයන්) සඳහා වූ ප්‍රතිෂ්ඨාව පොලිය ලෙස අර්ථ දක්වනු ලැබේ.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හුදෙක්ම මූලික වටිනාකම සහ පොළිය ගෙවීම් පමණක් ද, යන්න තක්සේරු කිරීමේ දී සමාගම /සමූහය විසින් උපකරණයට අදාළ ගිවිසුම් කොන්දේසි පිළිබඳ සලකා බලනු ලැබේ. මෙම කොන්දේසිය සපුරාලිය නොහැකි වන පරිදි ගිවිසුම් ගත මුදල් ප්‍රවාහයන්ගේ වේලාව හෝ වටිනාකම වෙනස් කළ හැකි ගිවිසුම් කොන්දේසියක් මූල්‍ය වත්කමෙහි ඇතුළත්වේ ද යන්න තක්සේරු කිරීම මෙයට ඇතුළත් වේ. මෙම තක්සේරුව සිදු කිරීමේදී සමාගම විසින්,

- මුදල් ප්‍රවාහන්හී වටිනාකම සහ වේලාව වෙනස් කරන අවිනිශ්චිත සිදුවීම්
- ගිවිසුම්ගත සලාක අනුපාතය වෙනස් කරන විචල්‍ය අනුපාත අංගයන් ඇතුළු කොන්දේසි
- කලින් ගෙවීම් සහ දිගු විශේෂාංග සහ
- යම් නිශ්චිත ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා සමාග මේ /සමූහයේ හිමිකම සීමාකරන කොන්දේසි (උදා: ප්‍රතිසාධන නොවන විශේෂාංග) පිළිබඳ සලකා බලනු ලැබේ

ගිවිසුම කලින් අවසන් කිරීම සඳහා වූ අමතර හිමිකමක් ඇතුළත් විය හැකි පෙර ගෙවීම් වටිනාකම ගෙවිය යුතු මූලික වටිනාකමෙන් සහ ඊට අදාළ පොලියෙන් නොගෙ වූ වටිනාකම් ප්‍රමාණවත් පරිදි නිරූපණය කරන්නේ නම්, හුදෙක් මූලික වටිනාකම සහ පොළී ගෙවීම් පමණක් පෙර ගෙවීමකට අන්තර්ගත වේ. පෙර ගෙවුම් අංශයේ සාධාරණ අගය මූලික හඳුනාගැනීමේදී නිශ්චිත නොවන්නේ නම් මීට අමතරව මූල්‍ය වත්කමෙන් එහි ගිවිසුම්ගත සම වටිනාකමට වට්ටම් අගයකට හෝ අධි මිළකට අත්පත් කරගන්නා මූල්‍ය වත්කමක් සඳහා ගිවිසුම්ගත සම වටිනාකමට එකතු කරන ලද (නමුත් නොගෙවන ලද) උපචිත ගිවිසුම්ගත පොළිය (කලින් අවසන් කිරීම සඳහා සාධාරණ අමතර වටිනාකමක් ද ඇතුළත් විය හැකි) ප්‍රමාණවත් පරිදි නියෝජනය කරනු ලබන වටිනාකමක පෙර ගෙවීමක් සඳහා අවසර දෙනු ලබන හෝ අවශ්‍ය කරන විශේෂාංගයක් මෙම නිර්ණායකයට අනුකූල

## ආ) පසුකාලින ගිණුම්කරණය

මූල්‍ය වත්කම් වලට අදාළ පසුකාලින ගිණුම්කරණය ඒවා පහත සඳහන් පරිදි වර්ගීකරණය කිරීම මත පදනම් වේ.

| | |
|---|---|
| ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් | මෙම වත්කම් පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂයට මණිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැයේ පාඩු මඟින් අඩුකරනු ලැබේ. පොලී ආදායම, විදේශ විනිමය, ලැබීම් සහ පාඩු සහ වැගැරීම් ලාභ හෝ පාඩු තුළ හඳුනාගනු ලැබේ. අවලංගු කිරීමෙන් ලැබෙන ඕනෑම ලැබීමක් හෝ පාඩුවත් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ. |
| විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම (FVOCI) ට හිමිකම් ආයෝජන | මෙම වත්කම් පසුකාලින සාධාරණ අගයට මනිනු ලැබේ. ආයෝජන පිරිවැයේ කොටසක් අයකර ගැනීමක් ලෙස පැහැදිලිව නියෝජනය නොකරන්නේ නම්, ලාභාංශ ලාභ හෝ අලාභ තුළ ආදායමක් ලෙස හඳුනාගැනේ. අනෙකුත් ශුද්ධ ලාභ හෝ පාඩු ලෙස නැවත වර්ගීකරණය නොකරේ. |

## අ) බැහැර කිරීම

හඳුනා ගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත් පත් වලින් ඉවත් කරනුයේ පහත අවස්ථාවලදීය:

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය අවසන් වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් මාරුකර තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලත් මත තෙවන පාර්ශ්වයකට ලැබී ඇති මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් භාර ගෙන තිබෙන විට; සහ පහත කරුණු දෙකෙන් එකක්:

(අ) වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හරවත් ලෙස මාරු කර තිබෙන විට හෝ

(ආ) සමූහය විසින් වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ තබා ගැනීමක් නොකර වත්කමේ පාලනය මාරු කර තිබෙන විට

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් පවරා තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලකට එළඹ තිබෙනවිට හා වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් නොකර වත්කමේ පාලනය ද මාරු කර නොතිබෙන විට ඒ ගැන සමාගම පවත්වා ගෙනයන අඛණ්ඩ සම්බන්ධයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා වගකීම් පිළිඹිඹු වන පදනමක් මත මනිනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

ඇප ප්‍රතිඥාවක ස්වභාවයක් ගන්නා මාරු කරන ලද වත්කම කෙරෙහි වූ අඛණ්ඩ සහභාගිත්වය මනිනුයේ වත්කමේ මුල්ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගටය.

### 2.2.10.1.1 මූල්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබෙන වාර්තා කරණ සෑම දිනයකදීම සමූහය විසින් එම වත්නම් අගැයීමට ලක් කෙරේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයවී තිබෙන බවට සලකණු ලබන්නේ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිද්ධියක හෝ සිද්ධි කීපයක ප්‍රතිපලයක් වශයෙන් (දරණ ලද පාඩු සිද්ධියක්) වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් ඇති කළ විටය. පාඩු සිද්ධියෙන් ඇති කරණ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසුහානිකරණය වන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබේ නම් පමණි. ණය කරුවන් හෝ ණය කරුවන් සමූහයක් සැලකිය යුතු අන්දමින් මුදල් දුෂ්කරතා, ණය නොගෙවීම් හෝ පොලිය හෝ ප්‍රාග්ධන ගෙවීම් වල දී අදාල පැහැර හැරීම් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන් වස්තුභංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ප්‍රවේශ වීමේ භව්‍යතාවයක් සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් අති වීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීම ද (එනම් හිඟවීම් වල වෙනස්වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් අතපසුවීම් සමග සම්බන්ධතාවක් ඇති බව) හානිකරණ සාක්ෂි වලට අයත් විය හැකිය.

### 2.2.10.2 මූල්‍ය බැරකම්

#### අ) මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 39 විෂය පථය තුළ මූල්‍ය බැරකම් එලෙස වර්ග කරනුයේ මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය, ණය හ ණය ගැනීම වෙනත් මූල්‍ය බැරකම් මගින් හෝ අදාළ පරිදි සඵල ආරක්ෂකයක් (hedge) වශයෙන් නම් කළ ව්‍යුත්පන්නයන් වශයෙනි. සිය මූල්‍ය වගකීම් වල වර්ග කිරීම සමූහය විසින් තීරණය කරණු ලබන්නේ මුල් හඳුනා ගැනීමේදීය. සියලුම මූල්‍ය බැරකම් මුලදී හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය හා අතමාරු සහ වෙනත් මූල්‍ය බැරකම් වලට අදාල වක්‍රම ක්ෂය පිරිවැයමතය. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයමෙහි අඩංගුය. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගණන්, බැංකු අයිරා, ණය ලබා ගැනීම් හා අතමාරු සහ වෙනත් මූල්‍ය බැරකම් සමූහයේ මූල්‍ය බැරකම් වලට ඇතුළත් වේ.

#### අ) පසුකාලීන මිනුම්කරණය

පහත දැක්වෙන පරිදි මූල්‍ය බැරකම් වල මිනුම් රඳාපවතිනුයේ වර්ගකිරීම මතය.

##### ණය හා ණය ගැනීම්

මුල් හඳුනා ගැනීමෙන් පසු පොලී සහිත ණය හා අතමාරු ලබා ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂක පිරිවැය මත පසුකාලීනව මනිනු ලැබේ. බැරකම් හඳුනා ගත් විට පමණක් නොව සඵල පොලී අනුපාත ක්‍රමය මත ක්‍රමක්ෂය ක්‍රියාවළිය මගින්ද ආදායම් ප්‍රකාශයේ ලාභ හඳුනා ගනු ලැබේ. ක්‍රමක්ෂය කළපිරිවැය ගණනය කරනු ලබන්නේ අත්කර ගැනීමේදී අදාළ වූ වට්ටම් හෝ අධි මිල හා සඵල පොලී අනුපාත ක්‍රමයේ ඇතුළත් කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵල පොලී අනුපාත ක්‍රම ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයයටතේ අඩංගුය.

#### ඇ) බැහැර කිරීම

මූල්‍ය බැරකමක් පොත්පත් වලින් ඉවත් කරනුයේ අදාළ වගකීම යටතේවූ බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විටය. සාරානුකූලව වෙනත් නියමයන් යටතේ එම ණය හිමියාටම අදාළවූ බැරකමකින් එය ප්‍රතිස්ථාපනය වනවිට, හෝ පවත්නා බැරකමේ නියමයන් සැලකිය යුතු ආකාරයෙන් වෙනස් වුවහොත්, එවැනි හුවමාරුවක් හෝ වෙනස්වීමක් සලකනු ලබන්නේ මුල් බැරකමේ පිළිගැනීම ඉවත් කිරීමක් හා නව බැරකමක පිළිගැනීමක් වශයෙන් වන අතර, අදාළ ධාරණ ගණන්වල වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

### 2.2.10.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනුයේ පිළිගත් ගණන් හිලව් කිරීමට දැනට බලාත්මකව පවත්නා ක්‍රියාත්මක කළ හැකි නීතිමය අයිතියක් හා ශුද්ධ පදනමක් මත පියවීමේ හෝ වත්කම් උපලබ්ධි කර බැරකම් සමගාමීව බැඳියාවන් පියවීමට අභිප්‍රායක් තිබෙන විට පමණි.

### 2.2.10.4 මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

වාර්තා කරන සෑමදිනක් තුළ සක්‍රිය වෙළඳපලෙහි වෙළදාම් වන මූල්‍ය උපකරණ වල සාධාරණ අගය තීරණය වන්නේ ගනුදෙනු පිරිවැය සඳහා කිසිදු අඩුකිරීමකින් තොරව ප්‍රකාශිත වෙළඳපල මිල ගණන් වලට හෝ ගනුදෙනුකරුවන්ගේ මිල ගණන් ප්‍රකාශ වලට අදාළවය. පැවරුම් මිල

සම්බන්ධයෙන් කිසිදු අඩු කිරීමකි නොමැතිව (අඩු මිලට ගෙන වැඩිමිලට විකිණීම (long position) පිණිස ලංසු මිල හා වැඩි මිලට ගෙන අඩු මිලට විකිණීම (short position) පිණිස මිලක් ඉල්ලා සිටීම (ask price). ක්‍රියාකාරී වෙළඳපලක ගනුදෙනු නොවන මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය තීරණයවනුයේ උචිත අගැයුම් ශිල්පක්‍රම භාවිතා කරමිනි. මෑත ස්වාධීන වෙළඳපල ගනුදෙනු යොදා ගැනීම, විද්‍යා මානවන ආකාරයෙන් එය මවන වෙනත් උපකරණයක පවත්නා සාධාරණ අගයට සමවන සේ මිල නියම කිරීම, වට්ටම් කළ මුදල් ප්‍රවාහ විශ්ලේෂණ හෝ වෙනත් අගැයුම් මාදිලි එවැනි ශිල්පක්‍රම වල අඩංගු විය හැක.

### 2.2.10.5 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් වටිනාකම අඩු වන බවට වාර්තාකරණ සෑම දිනයකදීම එසේ වන බවට යම් සංඥාවක් තිබේ දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් සංඥාවක් තිබේ නම්, හෝ වත්කමක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳව වාර්ෂික පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍යවේ නම්, වත්කමේ ආපසු අයකර ගත හැකි මුදල සමූහය විසින් ඇස්තමේන්තු කරනු ලබයි. වත්කම වෙනත් වත්කම් හෝ වත්කම් සමූහවලට බොහෝදුරට ස්වාධීනව මුදල් ප්‍රවාහයන් ජනනය නොකරන එකක් නම් හැර තනි වත්කමක් සඳහා තීරණය කරණු ලබන වත්කමක ආපසු අයකර ගැනීමේ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

මුදල වනුයේ, විකිණීමටයන පිරිවැය හා පාවිච්චියේදී එහි අගය අඩු කර වත්කමක් හෝ මුදල් ජනනය කරණ ඒකකයක් යන දෙකෙන් වැඩිවටිනාකමක් ඇති සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කළ විට ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකෙන් වඩා වැඩි අගයටය. වත්කමක ධාරණ අගය එහි ආපසු අය කර ගැනීමේ මුදල ඉක්මවා කරන්නේ නම්, වත්කම හානිකරණය වූ බවට සලකා එහි ආපසු අයකර ගත හැකි අගය දක්වා අඩුකරනු ලැබේ. ප්‍රයෝජන අගය තක්සේරු කිරීම පිණිස, මුදල් වල කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව හා වත්කමට විශේෂිත අවදානම් පිළිබිඹු වන බදු අයකර ගැනීමට පෙර වට්ටම් අනුපාතයක් යොදා ගනිමින් ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්, ඒවා යේ වත්මන් අගය දක්වා වට්ටම් කරණු ලැබේ.

කලින් නැවත ඇතුලත්ව තක්සේරුකර වෙනත් විස්තීර්ණ ආදායම් වලට ඇතුළත්ව ඇති ප්‍රත්‍යා ගණන අතිරික්තයක් ඇති දේපල හැර, දිගටම පැවතෙන මෙහෙයුම් වල හානි කරණ අලාභ ආදායම් ප්‍රකාශයේ වියදම්, වත්කමේ කාර්ය භාරයට අනුරූප ප්‍රවර්ග වල හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී පූර්ව ප්‍රත්‍යා ගණනයක ගණන දක්වා වෙනත් විස්තීර්ණ ආදායම් වල ද හානිකරණය හඳුනා ගැනේ.

වාර්තා කරණ දිනය වන විට ධාරක අගය හානිකරණය වී ඇති බවට කරුනු දක්නට ඇති විට වාර්ෂිකව හානිකරණය සඳහා කීර්ති නාමය පරීක්ෂා කරණු ලැබේ. කීර්ති නාමය අදාළ වන මුදල් (මුදල් උපයන ඒකක වල (CGU)) ආපසු අයකර ගැනීමේ ගණන තක්සේරු කිරීමෙන් කීර්ති නාමයට හානි සිදුවී ඇති ද යන්න තීරණය කෙරේ. මුදල් උපයන ඒකක ආපසු අය කර ගැනීමේ ගණන එහි ධාරක ගණනට අඩු නම්, හානිකරණ පාඩුවක් ඇති බව පිළිගැනේ. කීර්ති නාමයට අදාළ හානිකරණ පාඩු අනාගත කාලසීමා වලදී ප්‍රතිවර්තනය කළ නොහැක.

කලින් පිළිගෙන තිබුන හානිකරණ පාඩුවක් ප්‍රතිවර්තනය කළ හැක්කේ, අවසාන හානි කරණ පාඩුව හඳුනා ගැනීමෙන් පසු වත්කමේ ආපසු අය කර ගැනීමේ ගණන තීරණය කිරීම පිණිස යොදා ගන්නා ලද ඇස්තමේන්තු වල වෙනසක් සිදු වී ඇත්නම් පමණි. ප්‍රතිවර්තනය සීමාවන්නේ වත්කමේ ධාරණ ගණන එහි ආපසු අය කර ගැනීමේ ගණන අති ක්‍රමණය නොවන පරිදි සහ පෙර වසර වලදී වත්කම සඳහා හානිකරණ පාඩුවක් හඳුනා ගෙන නොතිබුනේ නම් ක්ෂයවීම් වලින් තොරව තීරණය කරන්නට ඉඩ තිබුන ගණන අති ක්‍රමණය නොවන පරිදිය. වත්කම් නැවත තක්සේරුකරණ ලද ගණනකට ධාරණය කර නැතොත් එවැනි ප්‍රතිවර්තනයක් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. එවැනි අවස්ථා වලදී ප්‍රතිවර්තනය ප්‍රත්‍යාගණන වර්ධනයක් වශයෙන් සැලකේ.

## 2.2.11 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් සමූහයට ප්‍රවර්තන බැඳීම් (නීතිමය හෝ සමප්‍රයුක්තව) තිබෙන විට ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරණ සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතීනම් සහ බැඳීයාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. උදාහරණයක් වශයෙන් රක්ෂණ ගිවිසුමකට අදාළ වන ආකාරයෙන් මෙන් ප්‍රතිපාදනයේ මුළු මුදලම හෝ ඉන්කොටසක් ප්‍රතිපූරණය වීම සමූහය විසින් අපේක්ෂා කරණු ලැබුවහොත් ප්‍රතිපූරණය වෙනම වූ වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ. එසේ කරනුයේ ප්‍රතිපූරණය ලැබීම සැබැවින්ම ඒකාන්ත නම් පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වූ වියදම් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලබන්නේයම් ප්‍රතිපූරණයකින් තොරවය. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් වන්නේ නම් මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිත වූ ආදායම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයන් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදනියම කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කිරීමේ දී කාලයත් සමග ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

## 2.2.12 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීයාවන්

### අ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාදක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභ ගණන අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මගින් අර්ථ නිරූපනය කෙරෙයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම සමන්විත වන්නේ 1983 අංක 12 දරණ පනතෙන් ප්‍රතිපාදිත පාරිතෝෂිකයෙනි. පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභයන්හි ප්‍රවර්තන අගය සමූහය විසින් මනිණු ලබන අතර එම අගය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUB) මත පාදක වූ ආයු ගණක තක්සේරු ක්‍රමවේදය භාවිතයට ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයු ගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික බැඳියාව සඳහා අරමුදල් බාහිරව ලබා නොගැනේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අනෙකුත් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේග

### ආ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳීයාව

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාදක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳාපවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, අර්ථ දක්වන ප්‍රතිලාභ සැලැස්ම් මගින් අර්ථ නිරූපනය කරයි.

ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගෙන තිබෙන බැරකම වන්නේ, සැලසුම් කළ වත්කම් වල සාධාරණ අගය අඩු කර, පිළිනොගත් පැරණි සේවා පිරිවැය වෙනුවෙන් ගැලපීම් සහිතව, වාර්තා කරණු ලබන කාල සීමාව අවසානයේ තිබුන අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගයයි. ස්වාධීන අයුගණකයින් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කරති. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගය තීරණය වන්නේ ඉහල ප්‍රමිතිව්‍යාප්ත සංයුක්ත බැඳුම් කර වෙළඳපලක් ශ්‍රී ලංකාවේ නොමැති නිසා, ඇස්තමේන්තු කළ අනාගත මුදල් පිටත ප්‍රවාහ රජයේ බැඳුම්කර වල පොලී අනුපාතය යොදා ගනිමින් වට්ටම් කිරීමෙනි. රජයේ බැඳුම් කර නාමනය කරණුයේ අදාළ විශ්‍රාම වැටුප් බැරකමේ නියමයන්ට සමාන වන පරිදි කල්පිරිය යුතු ප්‍රතිලාභ ගෙවනු ලබන්නා වූ ව්‍යවහාර මුදල් වලිනි.

අත්දැකීම් ගැලපුම හා ආයුගණක උපකල්පන ශාස්ත්‍ර වලින් ඇති වන ආයුගණක ලාභ හා පාඩු, ඒවා පැන නගින කාලසීමාව තුළදී වෙනත් විස්තීර්ණ ආදායම් වල ස්කන්ධයට හර හෝ බැර කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

නිශ්චිත කාල සීමාවක් (පැවරුම් කාල සීමාව) තුළ සේවයේ යෙදී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මේ වෙනස්වීම් කොන්දේසි සහ ගත නොවන්නේ නම්, අතීත සේවා පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේදී වහාම හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී, අතීත සේවා පිරිවැය පැවරුම් කාලය ඔස්සේ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂය කරණු ලැබේ.

### ඇ) අර්ථ දැක්වූ දායකත්ව සැලැසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවානියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලැබීමට සේවකයෝ සුදුසුකම් ලබති. ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 3% ක් සමූහය විසින් අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදලට දායකවේ.

## 2.2.13 ස්වයං රක්ෂණ සංචිතය

සෑම වසරකදීම වසර අවසානයේ දළ වශයෙන් නැවත තක්සේරු කළ ස්ථා වර වත්කම් වලින් 0.1% ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ස්වයං රක්ෂණ සංචිතයකට මාරු කරයි. ලංකා විදුලිබල මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ වල පාඩු හා හානි රක්ෂණ සංචිතයට හර කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් සපුරා ගන්නේ බැංකුවක වෙනම ගිණුමක ආයෝජනය කර තිබෙන මුදල් වලිනි.

## 2.2.14 රජයේ ප්‍රධාන

රජයේ ප්‍රධාන මූලික වශයෙන්ම සාධාරණ අගයට හඳුනා ගැනෙන අතර, එකී ප්‍රධාන ලැබෙනු ඇති බවට සාධාරණව තහවුරු කොට ඇති විටක, එකී ප්‍රධාන ආශ්‍රිත කොන්දේසි වලට සමාගම අනුගතවනු ඇත. සමූහය විසින් දරන ලද වියදම් සඳහා වන්දියක් වශයෙන් එකී ප්‍රධාන ලැබෙන අවස්ථාව කලාභ අලාභ ප්‍රකාශයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ ආදායම හඳුනා ගන්නා ලද එකී කාලපරිච්ඡේදය සඳහා ක්‍රමානුකූල පදනම මත අනෙකුත්ආදායම් වශයෙන් හඳුනා ගැනේ. වත්කම් පිරිවැය වශයෙන් සමූහයට ගෙවන ලද ප්‍රධාන එකී වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමානුකූල පදනම මත ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

## 2.2.15 පාරිභෝගිකයන් සමඟ වූ ගිවිසුම වෙතින් ආදායම

පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් වශයෙන් සමූහය අපේක්ෂා කරන වටිනාකමට පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීමේ දී සමූහය විසින් ආදායම හඳුනාගනු ලැබේ.

ඒ අනුව සමූහය පහත පරිදි ආදායම හඳුනා ගනියි.

### අ) විදුලිය /සේවා සහ භාණ්ඩ අලෙවිය සපයන ලද සේවා

විදුලිය /සේවා සහ භාණ්ඩ අලෙවිය සපයන ලද සේවා සම්බන්ධතාවයන් හරහා පාරිභෝගිකයන් විසින් විදුලිය පාරිභෝජනය කිරීමේදී විදුලිය අලෙවි කිරීමේ ආදායම සමූහය විසින් හඳුනාගනියි. අයකිරීම් කාණ්ඩය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගැසට් කරන ලද ගාස්තු මත පදනම්ව ආදායම හඳුනාගන්නා මිළ තීරණය කරනු ලැබේ.

### ආ) පාරිභෝගික දායකත්වය

සමූහය විසින් සපයන ලද වත්කමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා විසින්, සමස්ත කාලය පුරා විදුලිය පරිභෝජනය කිරීමේ දී සමාන්තරව ලබාගැනීම සහ පරිභෝජනය සිදුකරන බැවින්, විදුලිය සැපයීම උදෙසා වූ වත්කම් සකස් කිරීම සඳහා පාරිභෝගිකයා වෙතින් ආරම්භයේ දී ලැබෙන ප්‍රතිෂ්ඨාව සමස්ත කාලය පුරාම හඳුනාගනු ලැබේ. එබැවින් ලැබෙන ප්‍රතිෂ්ඨාව වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා ආදායම වශයෙන් හඳුනාගනු ලැබේ.

### ඇ) විද්‍යුත් වාහන ආරෝපන ආදායම

මණ්ඩලය විසින් පිහිටුවන ලද විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථානවලදී, පාරිභෝගිකයා විසින් තම වාහන ආරෝපණය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන විදුලිය සඳහා මණ්ඩලය විසින්ම සපයන ලද පෙර ගෙවුම් කාඩ්පත් මඟින් ගෙවීමේ දී, වාහන ආරෝපනයෙන් පසුව ආදායම හඳුනාගනු ලැබේ.

### ඈ) ගිවිසුම් වගකීම්

සමූහය වෙත දැනටමත් ප්‍රතිෂ්ඨාවක් ගෙවා ඇති පාරිභෝගිකයකු වෙත සේවාව ලබාදීම සඳහා වූ බැඳීඹ ගිවිසුම් වගකීමක් වේ. එබැවින් විද්‍යුත් වාහන ආරෝපණය සඳහා වූ විද්‍යුත් කාඩ්පතෙහි ඉතිරිව පවතින පෙර ගෙවුම් ශේෂය සහ සේවා සම්බන්ධතාවයන් සඳහා වූ පාරිභෝගික ගෙවීම්වල ක්‍රමක්ෂය නොවූ අගය සමූහයේ ගිවිසුම්ගත වගකීම් ලෙස සැලකේ.

### ඉ) වෙනත් ආදායම් සහ ලැබීම්

#### පොළිය

එකතු කරගැනීමේ හැකියාව සැක සහිත වන තාක් පොලී ආදායම උපචිත පොලිය ලෙස හඳුනා ගැනේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, සුදුසු පරිදි මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලයක් හරහා මූල්‍ය වත්කමේ හෝ වගකීමේ ශුද්ධ ධාරිත වටිනාකමට වට්ටම් කරනු ලබන, ඵලදායී පොලී අනුපාතය භාවිතයෙන්, ක්‍රමක්ෂය යටතේ මනිනු ලබන සියළු මූල්‍ය වත්කම් සඳහා වූ පොලී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ. පොලී ආදායම සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ මූල්‍ය ආදායම යටතේ අන්තර්ගත වේ.

#### ලාභාංශ

ලාභාංශ ආදායම් හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලබා ගැනීමට කොටස්කරුවන්ට ඇති අයිතිය තහවුරු වූ පසුය.

#### වෙනත්

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනමක් මතය. දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුලු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් පැනනගින ආදායම් ස්වභාවයකින් යුත් ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම් ගත කර තිබෙනුයේ, වත්කම්වල ධාරක ගණන හා ආශ්‍රිත විකිණුම් වියදම්, බැහැර කිරීම්වලට අදාල ලැබීම්වලින් අඩු කළ පසුවය. ප්‍රධාන ආදායම් ජනනය කෙරෙන ක්‍රියාකාරකම් වලට ආනුෂංගිකවූ ක්‍රියාකාරකම් වලින් පැන නගින සහ වැදගත් නොවන සමාන ගනුදෙනු සමූහයකින් පැන නගින ලාභ හා පාඩු ශුද්ධ පදනමක් මත එකතු කර, වාර්තාකර ඉදිරිපත් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

## 2.3 සැලකිය යුතු ගිණුම්කරණ උපකල්පන, තීන්දු හා ඇස්තමේන්තු

සමූහයේ ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාවළියේදී, ඇස්තමේන්තු කිරීම් වලට සම්බන්ධ කරුණු හැර, මූල්‍ය ප්‍රකාශ වල පිළිගෙන තිබෙන ගණන් පිළිබඳව ඉතාමත් සැලකිය යුතු බලපෑමක් ඇති කරණ තීන්දු ගැනීම කළමනාකරණයෙන් අපේක්ෂා කරණු ලැබේ. තවද, අනාගතය ගැන වැදගත් උපකල්පනයන් හා ශේෂ පත්‍ර දිනයට ඇස්තමේන්තු කිරීමේ අඩමානය ගැන වත්කම් වල හා බැරකම් වල ධාරණ ගණන් වලට ඊළඟ මුදල් වර්ෂයේදී වැදගත් ගැලපීම් යෙදීමේ සැලකිය යුතු අවදානමක් තිබෙන වෙනත් ප්‍රධාන ප්‍රභවයන් ගැන කළමනාකරණය විසින් සලකා බැලීම අවශ්‍ය වන අතර, ඒවා පහත සාකච්ඡා කෙරේ. වත්කම් වල හා බැරකම් වල අදාළ ධාරණ ගණන් මූල්‍ය ප්‍රකාශ වලට ආශ්‍රිත සටහන් වල දක්වා ඇත. එ වැනි ප්‍රධාන අයිතම පහත සාකච්ඡා කෙරේ.

### කල්බදු

ඒකඟත්වයක් යනු බද්දක් හෝ බද්දක් අඩංගු දෙයක්ද යන්න තීරණය කරනුයේ ආරම්භක දිනයේ ඒකඟත්වයේ හරය, ඒකඟත්වය සාක්ෂාත් කිරීම රඳාපවතින්නේ විශේෂිත වත්කමක් හෝ වත්කම් මතද, නැත හොත් එම අයිතිය ඒකඟත්වයක ඉපැහැදිලිව නිශ්චිත කර නොතිබුනද, වත්කම පාවිච්චි කිරීමේඅයිතියක් ඒකඟත්වය හිමිකරයිදයන්න මතය. ඒ අනුව, වත්කම් වල අයිතියට අදාළ සියලුම අවදා නම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙස මාරු නොකරන තාප බලාගාර, මෙහෙයුම් බදු වශයෙන් වර්ග කෙරේ. බද්දක් මූල්‍ය බද්දක් ද නැතහොත් මෙහෙයුම් බද්දක් ද යනුවෙන් තනිව හෝ එකා බද්ධ වනම් කෙරෙන නිර්ණායක තීරණය කිරීමේදී සමූහය විසින් සැලකිය යුතු විචාර බුද්ධියක් මෙහෙයවා ඇත

### මූල්‍ය උපකරණ වල සාධාරණ අගය

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සටහන්ව තිබෙන මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වල සාධාරණ අගය ක්‍රියාත්මක වෙළඳපල වලින් ලබාගත නොහැකි විට, ඒවායේ සාධාරණ අගය තීරණය කරනුයේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය ඇතුලු තක්සේරු ක්‍රම ශිල්ප යොදා ගනිමිනි. නිරීක්ෂණය කළ හැකි වෙළඳපල වලින් මෙම ක්‍රම වලට අදාළ යෙදවුම් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, මෙසේ කිරීම ඵලදායි නොවන විට සාධාරණ අගයන් ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍යවේ.

ද්‍රවශීලතා අවදානම හා වෙළඳපලේ පවත්නා අවිනිශ්චිත භාවය වැනි සලකා බැලීමේ නිර්ණායකයන් (considerations) විනිශ්චයන්ට ඇතළත්ය. මෙම සාධක සම්බන්ධයෙන් වන උපකල්පනයන්හි වෙනස්වීම් මගින් මූල්‍ය උපකරණ වල වාර්තා කළ සාධාරණ අගයට බලපෑමක් ඇති කළ හැකිය.

### මූල්‍ය නොවන වත්කම් වල හානිවීමෙන් සිදුවන පාඩු සමාලෝචනය කිරීම

වත්කම් වලට හානි සිදුවී තිබේ දැයි සමූහය විසින් තීරණය කරණු ලබන්නේ හානි පිළිබඳ සමාලෝචනයක් කිරමෙනි. මේ සඳහා මුදල් ජනනය කරණ ඒකක වල පාවිච්චියේදී අගය (value in use) ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. පාවිච්චියේදී අගය ඇස්තමේන්තු කිරීම සඳහා මුදල් ජනනය කරණ ඒකක වලින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වල ඇස්තමේන්තුවක් කළමනාකරණය විසින් සකස් කිරීමද, අදාළ මුදල් ප්‍රවාහ වල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරා ගැනීමද අවශ්‍යය. මෙම තක්සේරුව අනුව අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ හා වට්ටම් අනුපාත පිළිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කිරීම අපේක්ෂිත බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයක් ගනී.

### වෙළඳ හා වෙනත් ලැබියයුතු අයිතම හානිකරණයෙන් සිදු වන පාඩු

තනි තනිව අගැයීමට ලක් කර හානි වීමේ අවදානමක් නොමැති බව සොයා ගත් වෙළඳ හා වෙනත් ලැබිය යුතු අයිතම සහ තනිව වැදගත් නොවන ලැබිය යුතු අයිතම ඉන්පසු සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩ අනුව, අදාළ ප්‍රතිඵල තවම ප්‍රත්‍යක්ෂ නොමැති විෂය මූලික සාක්ෂි තිබෙන සිදුව ඇති පාඩු සිද්ධි සඳහා වෙන් කිරීම් කළ යුතු දැයි තීරණය කිරීම පිණිස සාමූහිකව තක්සේරු කරණු ලැබේ. ලැබිය යුතු එකතුවෙන් ලැබෙන (හිග මුදල් මට්ටම්, ණය උපයෝගී කර ගැනීම් යනාදී) දත්ත, අවදානම් සංකේන්ද්‍රණයේ ප්‍රතිඵල හා ආර්ථික දත්ත (විරැකියා මට්ටම්,නිශ්චල දේපල මිල දර්ශක, රටට අදාළ අවදානම හා විවිධ තනි කාණ්ඩායම් වල කාර්ය සාධනය ඇතුලු) සම්බන්ධයෙන් තීන්දු සාමූහික තක්සේරුව විසින් සැලකිල්ලට ගනු ලැබේ.

### අයබදු

ආදායම් බදු හා වැට් ඇතුලු වෙනත් බදුගෙවනු ලැබීමට සමූහය යටත්ය. මූල්‍ය ප්‍රකාශ වල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුගතවීම පිණිස පිළිපැදිය යුතු බදු උපදෙස් මාලව ලැබෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විචාර බුද්ධියක් අවශ්‍යය. බදු මාර්ග ෂුවක නිකුත් කරණ තෙක් බදු පැනවීමේ කාර්යය සඳහා බදු වලට යටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරණ අවස්ථාවේදී බදු නීති අදාළවීම ගැන අර්ථ නිරූපන සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි. ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු ගෙවිය යුතු වන්නේද යන්න ගැන ඇස්තමේන්තු මත සමූහය විසින් වත්කම් හා බැරකම් හඳුනා ගඳුනා ගන්නා ලදී. මෙම කරුණු වල අවසාන බදු ප්‍රතිඵලය මුලදී සටහන්කරණ ලද ගණන් වලට වෙනස් නම්, එම වෙනස්කම් හේතු කොට ගෙන තීරණය ගනු ලබන කාලසීමාවේ ආදායම්, විලම්බිත හා බදු වලට බලපෑමක් ඇති කරයි.

### දේපල, පිරියත හා උපකරණ වල ඵලදායී ආයුකාලය

සමූහය විසින් වත්කම් වල අවශේෂ වටිනාකම්, සඵල ආයුකාල හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම වාර්තා කරණ දිනයකදීම සමාලෝචනය කරණු ලබයි. මෙම වටිනාකම්, අනුපාතය හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන් යොදා ගනු ලබයි.

### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම- පාරිතෝෂිකය

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය තීරණය කරණු ලබන්නේ අයුගණක තක්සේරුව ශිල්ප ක්‍රම භාවිතයෙනි. වට්ටම් අනුපාත, වත්කම්වලට අදාළ අපේක්ෂිත ප්‍රතිලාභ හා අනාගත වැටුප් වැඩි කිරීම් සම්බන්ධයෙන් උපකල්පනයන් සකස් කිරීමට අයුගණක තක්සේරු ශිල්පක්‍රම යොදා ගැනේ. මෙම සැලසුම්වලට දිගු කාලින ස්වභාවය නිසා ඇතැම් ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතවයන්ට යටත් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| 3. ආදායම | සමූහය 2019 | සමූහය 2018 | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 |
|---|---|---|---|---|
| විකුණුම් | 267,041,265 | 254,351,728 | 242,950,327 | 229,571,083 |
| | 267,041,265 | 254,351,728 | 242,950,327 | 229,571,083 |

| 3.1 ආදායම් බාණ්ඩ | සමූහය 2019 | සමූහය 2018 | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 |
|---|---|---|---|---|
| විදුලිය විකිණීම | 247,691,324 | 235,036,611 | 242,950,327 | 229,571,083 |
| භාණ්ඩ විකිණීම | 5,020,136 | 6,280,872 | - | - |
| ගැල්වනයිස් කිරීමේ මෙහෙයුම | 1,158,558 | 895,380 | - | - |
| තැනීම් සේවා | 441,596 | 774,217 | - | - |
| විදුලි බලාගාර කුලියට දීමෙන් ලද ආදායම | 6,796,748 | 6,228,186 | - | - |
| මූල්‍යමය කල්බදු හා බලශක්ති ජනනය | 1,940,163 | 1,714,288 | - | - |
| විදුලි බලාගාර මෙහෙයුම් සහ නඩත්තු සේවා | 3,891,310 | 3,072,522 | - | - |
| වෙනත් මෙහෙයුම් | 101,430 | 349,652 | - | - |
| | 267,041,265 | 254,351,728 | 242,950,327 | 229,571,083 |

| 4. වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | සමූහය 2019 | සමූහය 2018 | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 |
|---|---|---|---|---|
| විදේශ ආයෝජන වලින් ලද ආදායම් | - | 1,765,926 | - | - |
| ලාභාංශ ආදායම | 8,609,571 | 2,590,424 | 2,746,968 | 2,273,532 |
| විදුලි පරිභෝජනය මත දඩ මුදල් | 7,001 | 8,021 | 7,001 | 8,021 |
| පාරිභෝගික අයකිරීම් | 363,970 | 360,025 | - | - |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමේ ලාභ | 299,638 | 210,168 | 316,003 | 220,978 |
| පාරිභෝගික දායකත්වය මත ක්‍රමක්ෂය | 3,975,636 | 3,761,916 | 3,594,603 | 3,399,660 |
| රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 20,531 | 20,280 | 14,718 | 14,718 |
| විවිධ ආදායම් | 1,401,454 | 1,224,469 | 1,283,345 | 1,140,078 |
| රාජ්‍ය ප්‍රදාන ආදායම් | 3,736 | 861 | 3,736 | 861 |
| රජයේ දෙපාර්තුමේන්තු ආදායම් | 355,690 | 388,883 | 355,690 | 388,883 |
| ඈවර හානි | 158,620 | 193,440 | 158,620 | 193,440 |
| අළු විකිණීම | 622,996 | 658,718 | 622,996 | 658,718 |
| ටෙන්ඩර් ගාස්තු/ආපසු නොගෙවන තැන්පතු ඇප තැන්පතු අහිමි කිරීම | 69,685 | 79,954 | 69,685 | 79,954 |
| පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනීමේ කාර්යයන් මත ආදායම | 575,864 | 589,323 | 575,864 | 589,323 |
| සේවා රැහැන් අයදුම්පත් ගාස්තු | 6,839 | 6,479 | 6,839 | 6,479 |
| විදුලි බිල මත අයභාර | 550,405 | 475,727 | 550,405 | 475,727 |
| විද්‍යුත් වාහන බලශක්ති කාඩ්පත් විකිණීම | 118 | 14 | 118 | 14 |
| | 17,021,754 | 12,334,628 | 10,306,591 | 9,450,386 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

## 5.1 මූල්‍ය ආදායම

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 |
| තැන්පතු මත පොලී ආදායම | 2,074,303 | 1,827,753 | - | - |
| රාජ්‍ය සුරැකුම්පත් මත පොලී ආදායම | - | 458 | - | - |
| ආයෝජනවලින් ලද පොලී ආදායම | 12,102 | 7,208 | 12,102 | 7,208 |
| කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම | 1,444,692 | 1,116,973 | 1,421,142 | 1,056,057 |
| සමෘද්ධි ණය මත පොලී ආදායම | 268,670 | 368,261 | 268,670 | 368,261 |
| සම්බන්ධිත පාර්ශවයන්ට දුන් ණය මත පොලී ආදායම | - | - | 400 | 473 |
| වෙනත් පාරිභෝගික ණය මත පොලී ආදායම | 48,856 | 34,166 | 48,856 | 34,166 |
| | 3,848,623 | 3,354,819 | 1,751,170 | 1,466,165 |

## 5.2 මූල්‍ය පිරිවැය

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 |
| අයිරාවන් මත පොලී වියදම | 1,007,048 | 566,568 | 716,948 | 373,299 |
| ණය සහ ණය ගැනීම් මත පොලී වියදම | 11,018,377 | 8,499,038 | 9,893,113 | 7,418,401 |
| ව්‍යාපෘති ණය මත පොලී වියදම | 3,556,443 | - | 3,556,443 | - |
| කල්බදු පොලී වියදම | 45,923 | 13,109 | 10,836 | 12,431 |
| විදුලි මිලදී ගැනීම් සඳහා ගෙවීම් මත අයකල ප්‍රමාද ගාස්තු | 4,024,272 | 1,558,878 | 4,024,272 | 1,558,878 |
| ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ප්‍රමාද ගාස්තු | 4,297,312 | 3,622,725 | 4,297,312 | 3,622,725 |
| පාරිභෝගික ණය සඳහා ලබාගත් ණය මත පොලී වියදම | 75,532 | 90,699 | 26,698 | 50,381 |
| පාරිභෝගික තැම්පතු මත පොලී වියදම | 78,332 | 13,680 | | |
| | 24,103,239 | 14,364,697 | 22,525,622 | 13,036,115 |

## 6. බදු පෙර ලාභය/(අලාභය)

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 |
| ගාස්තු අයකිරීමට/(බැර කිරීම)ට පසු ප්‍රකාශ | | | | |
| විගණන සේවා ගාස්තු (ප්‍රවර්තන වසර සඳහා) | 17,813 | 20,163 | 7,127 | 9,515 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 162,957 | 88,961 | 4,149 | 5,326 |
| ක්ෂය | 32,564,416 | 31,720,823 | 30,933,953 | 30,388,490 |
| කාර්ය මණ්ඩල පිරිවැයට ඇතුළත් වන | | | | |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 1,299,692 | 1,216,239 | 1,106,619 | 1,038,358 |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය - (EPF & ETF) | 3,723,045 | 3,591,949 | 3,365,903 | 3,234,308 |
| - වෙනත් කාර්ය මණ්ඩල පිරිවැය | 38,507,692 | 36,964,413 | 35,231,778 | 33,818,045 |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීම (ලාභය)/අලාභය | 13,234 | 205,730 | (3,131) | 194,928 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 39,722 | 40,125 | 19,823 | 17,984 |
| මහජන සබඳතා හා දැන්වීම් ප්‍රචාරණය | 320,984 | 78,362 | 281,037 | 49,905 |
| ආධාර | 1,169 | 1,548 | - | - |
| රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | (20,531) | (20,531) | (14,718) | (14,718) |
| අභාවිත හා සෙමින් චලනය වන භාණ්ඩ හානිකරණ සඳහා වෙන් කිරීම් | (12,887) | 144,035 | 61,228 | 94,137 |
| ණය ගැතියන් හානිකරණය සඳහා වෙන්කිරීම් | 1,657,181 | 506,140 | 938,432 | 484,293 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

| 7. ආදායම් බදු වියදම් | සමූහය 2019 | සමූහය 2018 | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 |
|---|---|---|---|---|
| **7.1 වර්තමාන ආදායම් බදු** | | | | |
| වසරේ සාමාන්‍ය කටයුතු සඳහා ආදායම් බදු වියදම් | 2,154,716 | 1,927,718 | 39,529 | 53,747 |
| ඉකුත් වසර සඳහා ආදායම් බදුවල උණ / (අධි) බදු ප්‍රතිපාදන | (253,239) | (25,599) | - | (3,106) |
| | 1,901,477 | 1,902,119 | 39,529 | 50,641 |
| **7.2 විලම්භිත බදු** | | | | |
| විලම්භිත බදු අයකිරීම් ප්‍රතිපාදන/(ප්‍රතිවර්ථනය)-සටහන් අංක 27 | 522,385 | (441,478) | - | - |
| ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ ආදායම් බදු වියදම් | 2,423,862 | 1,460,641 | 39,529 | 50,641 |

| | සමූහය 2019 | සමූහය 2018 | මණ්ඩලය 2019 | මණ්ඩලය 2018 |
|---|---|---|---|---|
| **7.3 ප්‍රවර්තන බදු වියදම් හා ගිණුම්කරණ ලාභය** | | | | |
| **අතර සැසඳුම** | | | | |
| බදු ගෙවීමට පෙර ලාභය | (73,366,890) | (22,394,882) | (85,308,657) | (30,344,487) |
| බදු ගෙවීම පිණිස අනුමත කළ නොහැක වියදම්/(ආදායම්) | 33,629,715 | 32,317,864 | 31,273,904 | 30,844,384 |
| විශ්‍රාම වැටුපේ ශුද්ධ බලපෑම | 212,057 | (339,756) | 212,057 | (339,756) |
| බදු ගෙවීම පිණිස අනුමත කළ හැකි වියදම්/(ආදායම්) | (34,798,530) | (30,543,489) | (32,032,522) | (29,499,294) |
| ව්‍යාපාරික නොවන ආදායම/නිදහස් කළ ආදායම | (13,286,252) | (8,420,011) | (3,050,297) | (2,685,649) |
| **වසර සඳහා ව්‍යාපාරික පාඩුව** | (88,909,345) | (32,024,802) | (88,905,515) | (32,024,802) |
| **බදු සඳහා බදු ගෙවිය යුතු ව්‍යාපාරික ලාභය** | 4,035,245 | 4,922,155 | - | - |
| අනෙකුත් ප්‍රභවයන් ගෙන් ලද ආදායම් | 10,466,952 | 2,878,317 | 1,327,777 | 1,187,468 |
| **මුළු ව්‍යවස්ථාපිත ආදායම** | 14,502,197 | 7,800,472 | 1,327,777 | 1,187,468 |
| වසර තුළ උපයෝජනය කළ බදු පාඩුව | (1,379,448) | (1,230,633) | (1,327,777) | (1,187,468) |
| **බදු ගෙවිය යුතු ආදායම** | 13,122,749 | 6,569,839 | - | - |
| පහත අනුපාත ආදායම් බදු වියදම් | | | | |
| 28% බගින් සංයුක්ත බද්ද | 1,640,684 | 1,342,583 | - | - |
| සහනදායි බදු අනුපාත | 375,780 | 21,044 | - | - |
| 14% බගින් වූ ලාභාංශ බද්ද | 138,252 | 564,091 | 39,529 | 53,747 |
| **ප්‍රවර්තන බදු වියදම** | 2,154,716 | 1,927,718 | 39,529 | 53,747 |

සමූහයේ බදු වියදම් ගණනය කර ඇත්තේ සමූහය තුළ තනි සමාගම් වශයෙන් උපයන ලද බදු ගෙවිය යුතු ආදායම පදනම් කර ගෙනය.

### 7.3.2 බලාත්මක ආදායම් බදු අනුපාත

පූර්ණ හෝ අර්ධ වශයෙන් නිදහස් කිරීම් හා සහන භුක්ති විඳින පාලිත සමාගම්වල පහත දැක්වෙන ව්‍යාපාර හැර නේවාසික සමාගම්වල බදු වගකීම් ගණනය කරණු ලබන්නේ 28% වූ සම්මත අනුපාතය මතය.

| පරිපාලිත/උප පරිපාලිත සමාගම | ව්‍යාපාර මෙහෙයම් | බදු අනුපාතය |
|---|---|---|
| සීමාසහිත නිවිදු (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14% |
| සීමාසහිත නිවිදු අසුපිනිඇල්ල (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14% |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්) සමාගම | ශ්‍රම සැපයුම | 14% |
| සීමාසහිත ඉන්ෆ්‍රා ඇන්ඩ් ඉංජිනියරින් (පුද්) සමාගම | විදේශීය ඉදිකිරීම් හා යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති | 14% |
| **විදේශීය උප පරිපාලිත සමාගම** | | |
| සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම | විදුලිබල උත්පාදනය-බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත ලක්දනවි බංගලා පවර් සමාගම | විදුලිබල උත්පාදනය-බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විච් ජියර් (පුද්) සමාගම | ස්විච් ජියර් විකිණීම-ඉන්දියාව | 33% |
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්) සමාගම | බලාගාර මෙහෙයුම් හා විදුලිබල උත්පාදන සහායක සේවා සැපයීම-සිංගප්පූරුව | 17.5% |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## 8 දේපළ පිරියත හා උපකරණ

### 8.1 සමූහය

#### 8.1.1 සින්නක්කර වත්කම්

| දළ ධාරණ අගය පිරිවැයට | 2019.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් /මාරු කිරීම් /පවරා ගැනීම් | විකුණුම් /මාරු කිරීම් | ගැලපීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 10,789,668 | 277,080 | - | (15,782) | 11,050,966 |
| කල්බදු ඉඩම් | 1,702 | - | - | (1,702) | - |
| ගොඩනැගිලි | 18,978,113 | 419,090 | (2,116) | (118,934) | 19,276,153 |
| සිවිල් වැඩ | 233,821,875 | - | - | 493 | 233,822,368 |
| යන්ත්‍ර හා පිරියත | 1,741,419 | 3,216,205 | (137,324) | 106,941 | 4,927,241 |
| ජනන විදුලි බලාගාර | 278,790,979 | 2,563,711 | - | - | 281,354,690 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් රැහැන් | 579,508,653 | 17,856,867 | (941,933) | (21,688) | 596,401,899 |
| මෝටර් වාහන | 11,526,380 | 1,269,496 | (152,434) | 61,194 | 12,704,636 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 22,454,165 | 1,434,651 | (79,303) | - | 23,809,513 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 3,760,739 | 154,959 | (33,440) | 17,602 | 3,899,860 |
| ලී බඩු හා සවිකිරීම් | 462,813 | 582,810 | (629) | (6,456) | 1,038,538 |
| යන්ත්‍ර හා මෙවලම් | 7,479,992 | 743 | (82) | (14,654) | 7,465,999 |
| බහාලුම් අංගන | 6,744 | - | - | - | 6,744 |
| සූර්ය බල PV පිරියත | 114,781 | 2,075 | - | - | 116,856 |
| | 1,169,438,023 | 27,777,687 | (1,347,261) | 7,014 | 1,195,875,463 |

#### 8.1.2 ව්‍යාපෘති වත්කම්

| දළ ධාරණ අගය පිරිවැය මත | 2019.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් /මාරු කිරීම් /පවරා ගැනීම් | විකුණුම් /මාරු කිරීම් | ගැලපීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 111,634 | 18,076 | - | - | 129,710 |
| ගොඩනැගිලි | 5,864 | 507 | - | - | 6,371 |
| සිවිල් වැඩ | - | 873,206 | (873,206) | - | - |
| මෝටර් වාහන | 1,368,555 | 90,724 | (109,002) | - | 1,350,277 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 90,061 | 9,507 | (3,520) | 76 | 96,124 |
| ලී බඩු හා සවිකිරීම් | 27,453 | - | - | 72 | 27,525 |
| යන්ත්‍ර හා මෙවලම් | 48,772 | 4,421 | (43) | (29) | 53,121 |
| | 1,652,339 | 996,441 | (985,771) | 119 | 1,663,128 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

## දේපළ පිරියත හා උපකරණ

| 8.1.3 කල්බදු වත්කම් | 2019.01.01 දිනට ශේෂය | එකතු කිරීම් /මාරු කිරීම් /පවරා ගැනීම් | විකුණුම් /මාරු කිරීම් | ගැලපීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| මෝටර් වාහන | 229,014 | - | (229,014) | - | - |
| | 229,014 | - | (229,014) | - | - |
| ක්ෂය කළ හැකි වත්කම් වල මුළු වටිනාකම | 1,171,319,376 | 28,774,128 | (2,562,046) | 7,133 | 1,197,538,591 |

| 8.1.4 ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් අගය | 2019.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුළ වැඩිවීම් | දේපල පිරියත උපකරණ වලට /මාරු කිරීම් | ප්‍රතිවර්ගීකරණය /මාරු කිරීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| කෙරී ගෙන යන ප්‍රාග්ධන කාර්යයන් | 110,772,583 | 65,299,346 | (23,127,642) | (594,561) | 152,349,726 |
| මුළු දළ ධාරක වටිනාකම | 110,772,583 | 65,299,346 | (23,127,642) | (594,561) | 152,349,726 |

| 8.1.5 ක්ෂයවීම | 2019.01.01 දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය සඳහා අයකිරීම් | විකුණුම් /මාරු කිරීම් | ගැලපීම් | 2019.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|
| සින්නක්කර වත්කම් | | | | | |
| කල්බදු ඉඩම් | 1,604 | - | - | (1,604) | - |
| ගොඩනැගිලි | 6,772,564 | 492,229 | (101) | (2,321) | 7,262,371 |
| සිවිල් වැඩ | 75,863,484 | 3,586,147 | - | - | 79,449,631 |
| පිරියත හා යන්ත්‍ර | 1,136,742 | 314,003 | (136,806) | (490) | 1,313,449 |
| ජනන විදුලි බලාගාර | 159,132,071 | 10,243,754 | - | - | 169,375,825 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම් රැහැන් | 243,796,003 | 15,125,434 | (352,624) | (3,368) | 258,565,445 |
| මෝටර් වාහන | 8,274,114 | 1,160,713 | (80,734) | 45,670 | 9,399,763 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 14,710,301 | 635,301 | (52,539) | - | 15,293,063 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 2,815,857 | 366,426 | (11,187) | (2,904) | 3,168,192 |
| ලී බඩු හා සවිකිරීම් | 332,719 | 44,283 | (366) | (4,200) | 372,436 |
| යන්ත්‍ර හා මෙවලම් | 4,775,169 | 724,928 | (58,805) | (2,403) | 5,438,889 |
| බහාලුම් අංගන | 6,744 | - | - | - | 6,744 |
| සූර්ය බල PV පිරියත | 9,652 | 6,715 | - | - | 16,367 |
| | 517,627,024 | 32,699,933 | (693,162) | 28,380 | 549,662,175 |

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන උපාය මාර්ගිකක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එමගින් ලැබිය යුතු දෑ ඉතා සමීපව අධීක්ෂණය කර කාල පරාසය අවම කර ගැනීමට කටයුතු කෙරේ. විකුණුම්කරුවන් ප්‍රවේශමෙන් අගැයීම හා ප්‍රසම්පාදන උපාය මාර්ග තුලින් ලබා ගැනීම තහවුරු කරනු ලබන අතර උපරිම ණය කාල සීමාවක් ලබාගැනීමෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනේ.

මෙහෙයුම් හා වෙනත් මූල්‍යන අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෙටි හා මධ්‍ය කාලීන මූල්‍ය උපකරනයන්හි ආයෝජනය කිරීම මගින් සමූහය විසින් සිය ද්‍රවශීලත්වය පවත්වා ගෙන යයි. සහනධායී පොලී අනුපාත මත අයිරා සීමාවන් වැඩි කර ගැනීම පිණිස බැංකුව සමග වන කතිකාවන් තුළින් කෙටි කාලීන ද්‍රවශීලතා ගැටළු ලිහිල් කරගනු ලැබේ. ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා වත්කම් නොතිබීම තුලින් සමූහයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑමක් ඇති කල හැකි අතර එමගින් ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුවන්ගේ විශ්වාසය පළුදු වී තරඟකාරිත්වය දුර්වල විය හැකිය.

## 38.5 වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු වෙළඳපල මිල ගණන්වල වෙනස්වීම් නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්හි සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවධානම මුදල් අවධානම හා පොළී අනුපාත අවධානමෙන් සමන්විත වේ. වෙළඳපොල අවධානමෙන් බලපෑමට ලක්වන මූල්‍ය උපකරණවලට පොළී සහිත ණය ගැනීම්, තැන්පතු හා විකිණීමට තිබෙන ආයෝජන ඇතුළත් වේ.

### 38.5.1විදේශීය ව්‍යවහාර මුදල් අවදානම

ව්‍යාපාර සමූහයට අයත් ආයතනයන් හී භාවිතයේ පවත්නා අදාල ව්‍යවහාර මුදල් වලට ඇතුලත් නොවන යම් ව්‍යාවහාර මුදලකින් සිදු කෙරෙන විකුණුම් / මිලදී ගැනීම් වලදී සමූහය ව්‍යවහාර මුදල් අවදානමට අනාවෘතවේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් හෝ යුරෝ ව්‍යවහාර මුදල් මගින් නියම කෙරේ. යම් කාලපරාසයක් තුල සිදුවන විනිමය අනුපාත ගනුදෙනුවලට එරෙහිව අභ්‍යන්තර වශයෙන් ආරක්ෂක පියවර ගනිමින් එම ව්‍යාපාර සමූහය විසින් ව්‍යවහාර මුදල් කෙරේ ඇති අවධානම අවම කෙරේ. ගෙවීම් කිරීමට අවශ්‍ය වන එසේ ගෙවීමට සිදුවන විට එම ගෙවීම සිදු කිරීම සඳහා උපයෝගී කර ගැනීම පිණිස අනාගත ගෙවීම් වලට සමාන වන මුදල් ප්‍රමාණයක් කෙටිකාලීන ආදායම් උත්පාදන මෙවලම් වලට යොදනු ලබයි.

### 38.5.2පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු වෙළඳපල පොලී අනුපාතයන්හි වෙනස්වීම නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් අදාළ වන්නේ පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දීර්ඝ කාලීන ණය බැඳීම්වලටය. සමූහය විසින් ලබා ගන්නා ණය මුදල්වල පොලී අවදානම සමූහය මගින් කළමනාකරණය කරනුයේ, ස්ථාවර හා පාවෙන පොළී අනුපාත වලින් සම්මිශ්‍රණයවූ ණය ලබාගැනීමේ මෙන්ම තැන්පතු ද පවත්වා ගෙන යාමෙන් වන අතර එමගින් වෙළඳපොල පොළී අනුපාත උච්චාවචනයෙන් ආවරණය කෙරේ. පොලී අනුපාතයන් අවම කිරීම පිණිස රජයේ ආයතනයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාසිදායක පොලී අනුපාත සඳහා බැංකුව සමග කතිකාවත් පවත්වයි.

## 39 සධාරණ අගය

වර්ථමාන ගණුදෙනුවකදී මිනුම්කරණ දිනයට පෙළඹවීමකින් හෝ බලහත්කාරයෙන් තොරව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර මූල්‍ය වත්කම් පැවරීමට හෝ වගකීම් බේරුම් කිරීමට ගෙවන වටිනාකම මඟින් මූල්‍ය වත්කම් හා වගකීම් වල සධාරණ අගය සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රම සහ උපකල්පන භාවිතා කරන ලදී:

අ) මුදල් හා මුදල් සමාන දෑ, වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු, බැංකු අයිරා සහ අනෙකුත් ජංගම වගකීම් වල පවතින කෙටිකාලිනව කලිපිරීම් ස්භාවය හේතුවෙන් ඒවා ධාරණ අගටය මිනුම් කිරීමට කළමණාකරණය කටයුතු කරන ලදි.

ආ) පොලී අනුපාත, නිශ්චිත අවධානම් සාධක, එක් එක් ගනුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතියේ අවදානම වැනි සාධක මත පදනම්ව සමූහය විසින් දිගු කාලීන ස්ථාවර අනුපාත යටතේ සහ විචල්‍ය අනුපාත යටතේ ලැබිය යුතු දේ අගයකරනු ලැබීය. එසේ කරනු ලැබූ ඇගයීම මත පදනම්ව ලැබිය යුතු දේවල අපේක්ෂිත අලාභ සඳහා දීමනා සැලකිල්ලට ගනී. ඒ අනුව 2019 දෙසැම්බර් 31 වන විට, එවැනි ලැබිය යුතු දේ, සහ ශුද්ධ දීමනාවල ධාරණ අගය ඒවායේ ගණනය කරන ලද සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවීය.

## 39.1 සධාරණ අගයට මිණුම්කරණය කරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර

සධාරණ අගයට මිණුම්කරණය කරන ලද පහත දැක්වෙන මූල්‍ය කාර්යසාධන පත්‍ර සමූහය සතුවේ
මූල්‍ය වත්කම්
වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 13)
ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 13)

## 39.2 සධාරණ අගයට මිණුම්කරණය නොකරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගයට මිණුම්කරණය කර දක්වා නොමැති මූල්‍ය කාර්යසාධපත්‍ර වල ධාරණ අගය හා සධාරණ අගය අතර සැසදීමක් පහතින් දක්වා ඇති අතර එහි ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගයට සමාන වන කාර්ය සාධන පත්‍රවල වල තොරතුරු ඇතුලත් නොවේ. තවද මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගයද මේ සඳහා

| | ධාරණ අගය | | සාධාරණ අගය | |
|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 40,738 | 44,029 | 40,738 | 44,029 |
| ස්ථිර තැන්පතුවල ආයෝජන | 20,586,150 | 25,156,979 | 20,586,150 | 25,156,979 |
| ප්‍රති මිලදී ගැනීම්වල ආයෝජන | 303,278 | 422,376 | 303,278 | 422,376 |
| වෙනත් තැන්පතුවල ආයෝජන | 2,413,602 | 1,211,287 | 2,413,602 | 1,211,287 |
| සමාගම් නිලධාරීන්ට ණය | 10,719,041 | 10,068,073 | 10,719,041 | 10,068,073 |
| පාරිභෝගිකයින්ට ණය | 4,195,879 | 5,389,639 | 4,195,879 | 5,389,639 |
| ණයකර සඳහා ආයෝජනය කිරීම | 202,063 | 203,479 | 193,170 | 196,769 |
| | 38,460,751 | 42,495,862 | 38,451,858 | 42,489,152 |

සැලකිලල්ට ගෙන නොමැත.

## 39.3 සාධාරණ අගය ධූරාවලිය

ලයිස්තුගත මිළ ගනන් හෝ නිරීක්ෂණය කළ හැකි මිළකරන ක්‍රමයන් භාවිතා කරමින් සාධාරණ අගයන් තීරණය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම් හෝ වලංගු කිරීම් ලබා ගනී. ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳ මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වයන් තුළ, සමූහය මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා වඩාත් අදාළ හා විශ්වාසදායක යැයි සැලකෙන තොරතුරු වලට වැඩි බරක් ලබා දෙමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

පහත දැක්වෙන අනුපිළිවලට සධාරණ අගය නිර්ණය කරනු ලබයි
පියවර 1 :සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය වෙළඳපලවල ලයිස්තුගත මිල ගණන් (සකස් නොකළ)
පියවර 2 : වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල හැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම
පියවර 3: වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල නොහැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරිය)

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

(සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත)

2019 දෙසැම්බර් 31 දින වන විට සමූහය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුල සාධාරණ අගයට හඳුනාගෙන ඇති මූල්‍ය උපකරණ පහත පරිදිවේ

| සධාරණ අගයට මිනුම්කරණ ලද වත්කම් | තක්සේරු දිනය | 2019 | පියවර 1 | පියවර 2 | පියවර 3 |
|---|---|---|---|---|---|
| වෙනත් විස්තීරණ ආදායම් යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් | | | | | |
| ලයිත්තුගත නොකරන ලද ස්කන්ධ ප්‍රග්ධනය | 31-දෙසැ-19 | 13,719,210 | - | - | 13,719,210 |
| ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම් | | | | | |
| ප්‍රග්ධන සුරකුම්පත් වල ආයෝජන | 31-දෙසැ-19 | 248,587 | 248,587 | - | - |
| ක්‍රමක්ෂය පිරිවැය- මූල්‍ය වත්කම් | | | | | |
| මූල්‍ය කාර්යසාධනපත්‍ර වල ආයෝජන | 31-දෙසැ-19 | 23,343,768 | - | - | 23,343,768 |
| පාරිභෝගිකයන්ට හා සේවකයන්ට ලබාදුන් ණය | 31-දෙසැ-19 | 14,914,920 | - | - | 14,914,920 |
| සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම් | | | | | |
| ණයකර වල ආයෝජන | 31-දෙසැ-19 | 193,170 | 193,170 | - | - |

### සාධාරණ අගය විස්තීර්ණ ආදායම තුලින් ගලපනු ලබන මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් නිරීන්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ විස්තර

### ලංකා විදුලි(පුද්ගලික) සමාගම

ලයිස්තුගත නොකල කොටස් වල ආයෝජනවල සාධාරණ වටිනාකම වෙළඳපල බහුවිධ ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කර ඇත. මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරයේ අපේක්ෂිත අනාගත ඉපයීම් සුදුසු ගුණිතයක් භාවිතයෙන් ගුණකර එය ව්‍යාපාරයේ වටිනාකම ලෙස ප්‍රග්ධණිතකරයි. සමාගම පොළී හා බදු පෙර ලාභය ඉපැයීමේ පදනම ලෙස භාවිතා කරයි. වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාග මේ සාධාරණ වටිනාකම සමාලෝචනය කිරීමේදී එක හා සමාන ව්‍යාපාර ස්භාවයක් ඇති ආයතන අධ්‍යනය කිරීමට අවධානය යොමු කරන ලදි. එහිදි ආසියානු කලාපයේ පොසිල ඉන්ධන භාවිතා කරමින් විදුලිය සැපයීමට සම්බන්ධ ලැයිස්තුගත සමාගම් විශ්ලේෂණය කරන ලද අතර මෙහෙයුම් වල ස්වභාවය සහ ආයතනවල විශාලත්වය මත පදනම්ව මෙම තක්සේරු කරීම් සිදුකරන ලදී.

වෙස්ට් කෝස්ට් පවර් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සුළු කොටස් අයිතියක් පැවතීම හේතුවෙන් කළමනාකරණයට ව්‍යාපාරයේ අභ්‍යන්තර තොරතුරු සදහා සෘජුවම ප්‍රවේශ විය නොහැක. කෙසේ වෙතත්, කර්මාන්තයේ ස්වභාවය සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ පොදු ලක්ෂණ සලකා බැලීමේදී, වත්කම් හා වගකීම්වල වෙළඳපල වටිනාකම් 2019 දෙසැම්බර් 31 දිනට වාර්තා කර ඇති ධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ.

### එල්ටීඑල් හෝල්ඩිංග්ස් (ඵුද්) සමාගම

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ලයිස්තුගත නොකරන ලද සමාන්‍ය කොටස්වල සාධාරණ අගයන් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා පුරෝකථනය කල මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතය ආදිය පිළිබද උපකල්පන කළමණාකරනය විසින් සිදුකරනු ලැබේ. පරාසයක් තුළ ඇති විවිධ ඇස්තමේන්තු වල සම්භාවිතාව සාධාරණ ලෙස තක්සේරු කරමින් කළමනාකරණය ඇස්තමේන්තුගත සාධාරණ ආයෝජනය වටිනාකම් නිර්ණය කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

පීඕර්/සී/සීඊබී/සීඑෆ්ඒ/1/19/18 2020 දෙසැම්බර් 08 දින

සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිතයන්හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

## 1. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ "ලංකා විදුලි බල මණ්ඩලය" (ලංවීම) හා එහි පරිපාලිතයන්හි ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දැක්වෙන කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1.1 සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ (TPCL) විගණක විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත කරුණ කෙරෙහි අවධාරණය කර තිබුණි.

සාම්පූර්හි මෙගාවොට් 500 ක ගල් අඟුරු ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ හුදු අරමුණු සහිතව මෙහෙයුම් කරන ලද සමාගම එම විදුලිබල පිරියතෙහි සංවර්ධන කාර්යයන් නවත්වා ඇති අතර පෙර ප්‍රාග්ධනිත කරන ලද වියදම් 2018 වර්ෂයේදී ලියා හැර තිබුණි. සාම්පූර්හි ගල් අඟුරු විදුලිබල පිරියත ඉදිකිරීම වෙනුවට සීමාසහිත ත්‍රිකුණාමලය විදුලි බල සමාගම (TPCL) විසින් මෙගාවොට් 50 ක සූර්ය විදුලි බල පිරියතක් එම ඉඩමෙහි ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. තවද, කෙරවළපිටිය මෙගාවොට් 500 ක එල්එන්ජී විදුලිබල පිරියතක් සංවර්ධනය කිරීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද ඉහත විදුලි බල පිරියතයන් සංවර්ධනය පිළිබඳ කිසිඳු සංවර්ධන කාර්යයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදුකර නොතිබුණි. ඒ අනුව, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු අන්දමේ සැකයක් ඇති කරවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් එයින් නිරූපණය විය.

1.2.1.2 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් තත්ත්වාගණනය කළ මතයන් ප්‍රකාශ කරන ලදී.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

## (අ) සීමාසහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගම

i. දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං ගි ප්‍ර 16) හි 51 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයට වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කළ යුතු අතර පෙර ඇස්තමේන්තුවලින් අපේක්ෂණයන් වෙනස් වන්නේ නම්, එම වෙනස්වීම් ශ්‍රී ලං ගි ප්‍ර 08 ට අනුකූලව ගිණුම්ගත කළ යුතුවේ. කෙසේ වුවද, තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහනවල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි

ii. ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (ශ්‍රී ලං ගි ප්‍ර 12) හි 88 ඡේදය ප්‍රකාරව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු වලට අදාළව රු.159,549,619 ක තක්සේරුව හා ඒ සඳහා පනවන ලද රු.75,461,644 ක දඩ මුදල් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුළු ආර්ථික සේවා ගාස්තුව රු.579,179,232 ක් විය. නිසි පරිදි සංශෝධනය කරන ලද 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 6 වගන්තිය අනුව, ආර්ථික සේවා ගාස්තු බැරකම කාර්තුව අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 20 වන දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුය. කෙසේ වුවද, සමාගම විසින් මෙම වාර්තාවේ දිනය දක්වා ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගෙවා නොතිබුණි.

iii. ආදායම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය (ශ්‍රී ලං ගි ප්‍ර 18) හි 14 ඡේදය ප්‍රකාරව, භාණ්ඩ විකුණුම්වලින් ආදායම හඳුනාගෙන නොතිබුණි. ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු කටයුතු සඳහා වටිනාකම නිශ්චය කිරීමේදී මතිමාත්‍ර ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක් වටිනාකමට එකතු කර තිබුණි. කෙසේ වුවද, රු.3,804,035,310 ක් වූ එම සියයට 10 ක මතිමාත්‍ර මුදල ආදායමට එකතු කර පසුව සමාගම විසින් ණය ගැතියාට වට්ටමක් ලෙස එම මුදල ලබා දී විකුණුම් පිරිවැයට අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාන මුදලකින් විකුණුම් පිරිවැය හා ආදායම වැඩියෙන් දක්වා තිබුණු අතර ඒ සඳහා අතිරේක ආර්ථික ගාස්තුවක් ගෙවීමට සිදුවී තිබුණි.

iv. 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුල ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශ නොකිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් සමාගමට රු.205,000,000 ක අහිමි කිරීමේ දඩ මුදලක් පනවා තිබුණි. සමාගම විසින් රු.155,426,118 ක් ශ්‍රී ලංකා රේගු එකතු කළ අගය මත බදු ගිණුමට, රු.39,970,418 ක් එකතු කළ අගය මත බදු පාලන ගිණුමට හා රු.9,603,464 ක් සීමා සහිත ලංකා නැව් සංස්ථාවේ බැරකම් ගිණුමට මෙම දඩ මුදල් ගෙවීම සාවද්‍යව හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.205,000,000 කින් වියදම් අඩුවෙන් දක්වා තිබූ අතර වත්කම් රු.195,396,536 කින් වැඩියෙන් හා වගකීම් රු.9,603,464 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාගම විසින් රු.126,956,898 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස හා රේගුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු ලෙස ලෙජරයේ එකතු කළ අගය මත බදුවලට අදාළව සටහන් කර තිබුණි. කෙසේ වුවද, මෙම වටිනාකම පරීක්ෂා කිරීම සඳහා උපකාරක ලියකියවිලි හා පැහැදිලි හේතූන් ඉදිරිපත් කර නොතිබුණි.

v. නැව්ගත කිරීම් බිල්පත්‍ර නිරවුල් කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබී තිබුණු අරමුදල් iv කොටසේ සඳහන් කර ඇති දඩ මුදල් ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ නොමැතිව සමාගම විසින් යොදාගෙන තිබුණු අතර ඉහත පාඩු සඳහා වගකිව යුතු පුද්ගලයින් හඳුනාගැනීම සඳහා විධිමත් විමර්ශනයක් සිදුකර නොතිබුණි.

vi. අඩුවෙන් සපයන ලද ගල් අඟුරු තොග වලට අදාළව සීමා සහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා සීමාසහිත ටෝරියන් අයර්න් ස්ටීල් සමාගමෙන් (TISCL) ලැබිය යුතු රු.539,192,079 ක් වූ ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. සීමා සහිත ටෝරියන් අයර්න් ස්ටීල් සමාගම/ සීමා සහිත ලංකා නැව් සංස්ථාව මෙම ශේෂය සනාථ කර නොතිබුණු අතර, ලැබිය යුතු හිඟ ශේෂය වර්ෂ 7 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණද, හානිකරණය සඳහා ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

vii. පෙර වර්ෂ විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි වූ ඉදිරියට ගෙන එන ලද රු.894,151 ක් වූ ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC), රු.77,719 ක් වූ ලැබිය යුතු රඳවා ගැනීම් බදු (WHT) රු.65,474,540 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු, රු.3,371,326 ක් වූ ලැබිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ රු.12,758,801 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) පෙර වර්ෂ ගැලපීමක් ලෙස 2018 වර්ෂයේ රඳවාගත් ඉපැයුම්වලට එරෙහිව අයකර තිබුණි. මෙම ගැලපීම් නිවැරදි කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සමාගම අපොහොසත් වී තිබුණි.

viii. ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවන ලද බත්තල් ගාස්තු එකතු කළ අගය මත බදු (VAT) වලට (නැව්ගත කිරීම් අංක 151 සිට 154 දක්වා) අදාළව සීමා සහිත ලංකා නැව් සංස්ථාවට (CSCL) ගෙවිය යුතු රු.15,870,104 ක මුදලක් සීමා සහිත ලංකා නැව් සංස්ථාවට ගෙවා හෝ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු අත්තිකාරමක් ලෙස හෝ දක්වා නොතිබුණි. තවද, ගාස්තුව නිරවුල් කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයෙන් සමාගම විසින් අරමුදල් ලබාගෙන තිබුණද, සීමා සහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ඉහත කී බත්තල් ගාස්තුවල එකතු කළ අගය මත බදු සමාගම විසින් ගිණුම් ගත කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ix රු.1,109,063 ක් වූ ගෙවිය යුතු ගිණුම්, රු.180,416,885 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු අවසාන එකතු කළ අගය මත බදු හා වෙනත් ලැබිය යුතු ශේෂ, රු.578,678,686 ක්වූ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු, රු.6,813,692 ක් වූ ලංවිම සඳහා ගෙවිය යුතු ශේෂ, රු.28,347,444 ක් වූ සීමා සහිත ලංකා නැවි සංස්ථාවට ගෙවිය යුතු පැරණි ශේෂය, රු.18,075,801 ක් වූ විවිධ ණයගැතියන්, රු.4,677,509 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල්, රු.7,750,000 ක් වූ වෙළඳ ණයගැතියා (ලංවිම) ස්ටීම් කෝල්, රු.1,760,500 ක් වූ ලංකා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් ශේෂ, රු.1,115,987 ක්වූ සීමා සහිත නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පීටීඊ සමාගමෙන් ලැබිය යුතු ශේෂ හා රු.85,887,776 ක්වූ වෙළඳ ණය හිමියන් - සීමාසහිත නෝබල් රිසෝසස් ඉන්ටර්නැෂනල් පීටීඊ සමාගම පිළිබඳ සත්‍යාපනය සඳහා අදාළ ශේෂ සනාථ කිරීම් හා සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

x ප්‍රතිපූර්ණ වියදම් මත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT), එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු බැරකම සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

xi සැපයුම්කරුට ගෙවිය යුතු ලෙස හෝ සීමා සහිත ලංකා නැවි සංස්ථාවට ගෙවිය යුතු ලෙස හෝ මේ සම්බන්ධයෙන් ලෙජර ගිණුමේ බැරකමක් නොමැතිව සීමාසහිත ලංකා නැවි සංස්ථාව (CSCL)මගින් රු.4,000,000 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද, සීමා සහිත ලංකා නැවි සංස්ථාවට ගෙවිය යුතු ශේෂයෙන් මෙම මුදල සමාගම විසින් සාවද්‍යව අඩුකර ගෙන තිබුණි. එබැවින් බැරකම් සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

xii ලේඛනවට අනුව තථ්‍ය එකතු කළ අගය මත බදු මුදල රු.106,969,404 ක් වුවද, අංක 123 දරන නැව්ගත කිරීම් සඳහා ලේඛන එකතු කළ අගය මත බදු ලෙස රු.136,236,370 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබුණි. එබැවින් වැඩිපුර ගෙවා ඇති මුදල රු.29,266,965 ක් වූ අතර එය මූල්‍ය ප්‍රකාශනවල රු.26,507,084 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ලෙස දක්වා තිබුණි. එබැවින් මෙම ශේෂයන් දෙක අතර රු.2,759,882 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

xiii සමාගම විසින් රු.5,218,271 ක මුදලක් සීමා සහිත ලංකා නැවි සංස්ථාවේ ගෙවිය යුතු ගිණුමට හර කර තිබුණි. කෙසේ වුවද, මෙම මුදල පරීක්ෂා කිරීම සඳහා උපකාරක ලියකියවිලි සහ එයට හේතු ඉදිරිපත් කර නොතිබුණි. තවද, සීමා සහිත ලංකා කෝල් (පුද්ගලික) සමාගමේ ශේෂයන් හා සීමාසහිත ලංකා නැවි සංස්ථාවේ වැය ගිණුමේ ශේෂයන් අතර වූ රු.31,916,562 ක වෙනස සමාගම විසින් සසඳා නොතිබුණි.

xiv දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 04 දිනැති ඔවුන්ගේ ලිපිය මඟින් බදු ගෙවීම් පැහැර හැරීම වෙනුවෙන් පනවන ලද රු.500,546 ක් වූ ආර්ථික සේවා ගාස්තු (ESC) මත දඩ මුදල්, රු.10,134,113 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මත දඩ මුදල් (NBT) රු.1,900,938 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) දඩ මුදල්, ගෙවිය යුතු දඩමුදල් ලෙස හෙළිදරව් කිරීමෙන් තොරව ගෙවිය යුතු බදු යටතේ ගිණුම්ගත කර තිබුණි

## (ආ) සීමා සහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

i. පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 07 - ඡේද 08,31,33
- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 15 - ඡේදය 01
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 - ඡේද 79, 113, 117
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2- ඡේදය 37
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 - ඡේදය 20
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 12 - ඡේදය 80 (ආ)
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 - ඡේද 57, 140, 141
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 - ඡේදය 17
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 - ඡේදය 118 (අ,ආ)

ii. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2(2) වගන්තිය (සංශෝධිත) අනුව, අස්ථිත්වයක පිරිවැටුම කාර්තුවකට රු.මිලියන 12.5 ඉක්මවන්නේ නම් (කාර්තුවකට සීමාව) ආර්ථික සේවා ගාස්තු සඳහා වගකීමට යටත් වේ. සමාගමේ පිරිවැටුම රු.මිලියන 396 (මුළු පිරිවැටුම) ක් වුවද, 2019 වර්ෂය සඳහා සමාගම ආර්ථික සේවා ගාස්තු ගෙවා නොතිබුණි. එබැවින් ආර්ථික සේවා ගාස්තු වගකීම රු.1,983,064 කින් අඩුවෙන් දක්වා තිබුණි.

iii. සමාගමේ කාර්ය මණ්ඩලය විසින් පරිපාලිතයන්ගේ පරිපාලන කාර්යයන්ද කිසිදු කළමනාකරණ ගාස්තුවක් අයකිරීමෙන් තොරව සිදුකර තිබුණි. එබැවින් රු.24,847,325 ක්වූ සමූහයේ කාර්ය මණ්ඩල වියදම් සාවද්‍ය ලෙස සමාගමට අයකර තිබුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

1.2.2 ලංකා විදුලි බල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මු වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) තැපැල් කාර්යාල කවුන්ටර් ගෙවීම හා තැපැල් කාර්යාල කොමිස් මුදලට අදාළ ණය හිමියන්ට එරෙහිව ණයගැතියන්ගේ රු.30,609,836 ක ශේෂය මණ්ඩලය විසින් හිලව් කර තිබුණි. ඒ හේතුවෙන් විවිධ ණය ගැතියන් හා ණය හිමි ශේෂය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) හරිත විදුලිබල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘතිය සඳහා ණය විය පැහැදම් මුදල වූ රු.1,262,503,405 ක් සුළං විදුලි බල ව්‍යාපෘතියේ වියපැහැදමක් ලෙස සටහන් අංක 24.2.1 හි දක්වා තිබුණි.

(iii) ලබාගත් රු.බිලියන 83 ක් සඳහා ණය සැකසුම් ගාස්තු ලෙස ගෙවා තිබුණු රු.මිලියන 25 ක මුදල මූල්‍ය පිරිවැය ලෙස ඉදිරිපත් කරනු වෙනුවට පරිපාලන වියදම් යටතේ වෙනත් වියදම් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 2 - ඉන්වෙන්ට්‍රි සහ ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

ලංකා විදුලි බල මණ්ඩලය විසින් එහි ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් වෙනුවෙන් ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය අගය කිරීම සඳහා ඉහත ප්‍රමිතිවල විධිවිධාන ප්‍රකාරව තථ්‍ය පිරිවැය යොදා ගනු වෙනුවට ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එකතුව රු.6,409,494,526 ක් වූ හිතකර මිල විචලනය සහ ශ්‍රම හා පොදු කාර්ය රේට විචලනයන් සහ ඒ නිසා ඇති වූ අහිතකර ගබඩා මිල විචලනය රු.2,428,128,229 ක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ ඉහළ මූල්‍යමය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම්, වගකීම් සහ ස්කන්ධය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද, එම ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ තොරතුරු නොමැතිවීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා දෝෂ
ලංකා විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව තවදුරටත් භාවිතයට ගනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් පිරිවැය රු.32,241,176,427 ක් හා රු.3,918,235,311 ක් වූ පිළිවෙලින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද බලාගාර 4 ක් සහ මෝටර් වාහන 1,683 ක සංඛ්‍යාවක් තථ්‍ය ජීව කාලය ඇස්තමේන්තු කිරීමකින් තොරව තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ
සම්ප්‍රේෂණ අංශයේ රු.172,019,335,924 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ භෞතිකව පරීක්ෂා කර නොතිබුණි.

1.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු.3,535,799,151 ක හර ශේෂයක් (තොග ඌනතාවය) හා රු.90,343,073 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව තොග ගැලපීම් ගිණුමේ පැවතුණි.

(ආ) අංක 10/2434/423/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ලක් විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු.159,184,187,965 ක ණය මුදල සහ ඒ සඳහා පොලිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ප්‍රදාන බැංකුවට එම ණය සඳහා පොලිය වශයෙන් 2018 දෙසැම්බර් 31 දක්වා රු.25,247,801,891 ක් ගෙවා තිබුණද, ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉහත ගෙවීම් සිදුකර නොතිබූ අතර ඒ සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයන් හෝ සිදුකර නොතිබුණි.

පොලිය සඳහා ප්‍රතිපාදනය නොකිරීම හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයුම් රු.25,247,801,891 කින් අඩුවෙන් දක්වා තිබුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

(ඇ) අංක පීඊඩී/1/සීඊබී/2/11(i)දරන ලිපිය මත භාණ්ඩාගාරයේ ඉල්ලීම පරිදි 2019 ඔක්තෝබර් 17 දින හිමිකම් සඳහා වාර්තා කර ඇති රු.3,556,442,931 ක මුදල සමාලෝචිත වර්ෂයේ පොලී වියදම වශයෙන් ආදායම් ප්‍රකාශනයට අයකර ඇත. තවද, මෙම මුදල ලංවීම විසින් වැය දරා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද රු.41,816,415 ක් වූ වියදම් ප්‍රතිපූර්ණය කිරීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ලංවීම විසින් 2013 වර්ෂයට පෙර කාලපරිච්ඡේදය සඳහා රජයේ ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, විදුලි සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම යන කාර්යයන් සිදුකිරීම ඒවායේ ඉන්වොයිස් වටිනාකමට කාර්යයන් පදනම් කරගෙන ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැයට අගය කර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. ඒහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු මුදල් හා රඳවාගත් ඉපැයුම් රු.66,987,761 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු.බිලියන 5 කින් රු.මිලියන 500 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ ගාස්තු ගෙවීමක් ලෙස වර්ගීකරණය කර ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබූ අතර රු.බිලියන 1 ක් සඳහා පෙර වර්ෂ ගැලපීමක් සිදුකර තිබුණි. ඉතිරි රු.බිලියන 3.5 ක මුදල හිමිකම් ප්‍රකාශනයට අයකරනු වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයෙන් කිසිදු කළමනාකරණ සේවාවක් ලංවීම විසින් ලබා ගෙන නොතිබුණි. එබැවින් වර්ෂය සඳහා පාඩුව රු.මිලියන 500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) උප ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.2,495,574,443 ක්වූ පොලිය ලංවීම විසින් ගෙවා නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයක් හෝ කර නොතිබුණි.

(ඌ) භාණ්ඩාගාරයෙන් සියයට 10 ක ලාභාංශ බදු ලෙස නම් කරන ලද රු.4,200,000 ක මුදලක් මූලස්ථාන කාර්යාල පොත්වල හඳුනානොගත් වෙනත් ණයගැතියෙකු ලෙස පවතින අතර මෙම මුදල සඳහා ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

(එ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ප්‍රමාද පොලී රු.31,119,302 ක මුදලක් ගිණුම් පොත්වලින් අත්හැර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) රු.734,574,801 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් බෙදාහැරීම් අංශ 1 හි වත්කම්වලට මාරු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. එම වත්කම්වලට අදාළ ක්ෂය ආදායම් ප්‍රකාශනයට අයකර නොතිබුණි.

(ඔ) මොරගහකන්ද විදුලි බල පිරියතයෙන් විදුලි බල මිලදී ගැනුම් සඳහා ගෙවිය යුතු රු.128,264,040 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්පොත්වලින් අත්හැර තිබුණි. එබැවින් වර්ෂය සඳහා පාඩුව එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) 2012 වර්ෂයේ නිම කරන ලද ඉහළ කොත්මලේ විදුලි බල පිරියතයට අදාළ කෙරීගෙන යන වැඩ රු.944,030,864 ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා මාරු කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙලින් රු.26,972,310 කින් හා රු.161,833,862 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2014 වර්ෂයේදී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු විදුලි බල ව්‍යාපෘතියට අදාළ කෙරීගෙන යන වැඩ රු.603,573,159 ක මුදලක් ස්ථාවර වත්කම්වලට මාරුකර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙලින් රු.20,119,105 කින් හා රු.100,595,526 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) අන්තර් අංශ ශේෂයන්ට හිලව් කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට රු.367,390,040 ක බැර ශේෂයක් අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පැවතුණි.

(ජ) සමාලෝචිත වර්ෂය තුළ වැයකරන ලද රු.මිලියන 999.03 මුදල වාර්තා කර නොතිබුණි. එබැවින් වගකීම් හා කෙරීගෙන යන වැඩ ශේෂය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

### 1.2.2.3 නොසැසඳූ වෙනස්කම්

(අ) 2019 දෙසැම්බර් 31 දිනට ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වෙන ශේෂය හා එදිනට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දැක්වෙන අනුරූපී ශේෂය අතර රු.764,717,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

කෙසේ වුවද, මෙම කරුණ 2013 වර්ෂයේ සිට අඛණ්ඩව විගණන වාර්තාවල නැවත නැවත දක්වා තිබුණද, මෙම මතභේදය 2019 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) බිල් කිරීමේ පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂයන් අත්හැරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට 01, 02, 03 හා 04 යන බෙදාහැරීම් අංශවල බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග වෙළඳ ණයගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී මුදල අතර එකතුව රු.31,813,455 ක නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, 2012 වර්ෂයේ සිට රු.423,764.624 ක මුදලක් හඳුනා නොගත් ලෙස පැවතුණි.

(ඇ) 2005 ජූලි 26 දින අ.මූ.ක. (බෙ.අ.1) විසින් නිකුත් කරන ලද උපදෙස් ලිපිය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට හර හා බැර ලෙස රැස්කිරීම් පාලන ලෙජර් ගිණුමේ පවතින රු.4,073,824,173 ක හා රු.129,863,150 ක ශේෂය සඳහා සැසඳීමක් කර නොතිබුණු අතර එම ශේෂයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් රැස්කිරීම් පාලන ගිණුමේ පවතින ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඈ) අවිනිශ්චිත ශේෂයට අදාළ රු.79,512,030 ක මුළු වටිනාකමින් සියයට 66 ක් සඳහා හා නිරවුල් කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක් පැවති රු.70,306,494 කට අදාළව කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලංවිප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය, අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

# විගණකාධිපති වාර්තාව
# සමූහ මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී  අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතාකරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ  අයුරින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුලත් වේ.

- තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට සමූහය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii)  වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමූහය  විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- මෙම වාර්තාවේ ඡේද අංක 1.2.1, 1.2.2.1 (ආ),(ඇ)(ඈ), 1.2.2.2(අ)(ආ)(ඈ)(ඉ)(ඊ)(උ) 1.2.2.3(අ)(ආ) හි දැක්වෙන විගණන නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලනයන්හි 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කල මතය

දැනගැනීම සඳහා

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1.1 සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ (TPCL) විගණක විසින් එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත කරුණු අවධාරණය කර තිබුණි

මෙගා වොට් 50ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය හා මෙගා වොට් 500ක එල්එන්ජී විදුලිබල පිරියතයන් සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම (TPCL) විසින් සාම්පූර්හි ගල් අඟුරු විදුලිබල පිරියත සඳහා වෙන්කර තිබුණු ඉඩම මෙගා වොට් 50ක සූර්යබල ශක්ති ව්‍යාපෘතිය සඳහා යොදා ගැනීමට තීරණය කර ඇත. පසුගිය කාල පරිච්ඡේදයන් තුළ දී සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල දී ඉහත කී කරුණ අඛණ්ඩව සාකච්ඡා කර තිබුණ අතර, සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගමේ සූර්යබල ශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් එම සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය සංශෝධනය කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ලංවිම හා නැෂනල් තර්මල් පවර් කම්පණි ලිමිටඩ් ඉන්දියා සමාගම (NTPC) අතර 2020 වර්ෂය තුළ දී බද්ධ ව්‍යාපාර ගිවිසුමක් අත්සන් කිරීම සඳහා සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සාමාග මේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබේ. කෙසේ වුව ද බද්ධ ව්‍යාපාර ගිවිසුම අත්සන් කිරීමට පෙර අවශ්‍ය නීතිමය නිෂ්කාශණය නිතිපතිවරයාගෙන් ලබා ගත යුතුය.

ලංවිම සහ නැෂනල් තර්මල් පවර් කම්පණි ලිමිටඩ් සමාගම (NTPC) අතර සිදුකරන ලද සාකච්ඡා මාලාවෙන් පසු කෙරවළපිටිය එල්එන්ජී විදුලිබල පිරියත සංවර්ධනය කිරීම සඳහා 2019 ඔක්තෝම්බර් 25 දින බද්ධ ව්‍යාපාර ගිවිසුමක් දෙපාර්ශවය විසින් අත්සන් කරන ලදී.

කොවිඩ් - 19 බලපෑම හේතුවෙන් වැඩිදුර සාකච්ඡා අත්හිටුවා ඇති අතර TPCL අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරි කාල පරිච්ඡේදයන් තුළ දී යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ඇතැයි යන මතයේ සිටී.

1.2.1.2 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් තත්වා ගණනය කළ මතයන් ප්‍රකාශ කරන ලදී.

(අ) සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම (LCC)

i. දේපල, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං ගි ප්‍ර 16) හි 51 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයට වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය කළ යුතු අතර පෙර ඇස්තමේන්තු වලින් අපේක්ෂණයන් වෙනස් වන්නේ නම් එම වෙන්ස්වීම් ශ්‍රීලංගිප්‍ර 08ට අනුකූලව ගිණුම් ගත කළ යුතු වේ.

ලංකා ගල්අඟුරු සමාගමට අයත් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වාහන 3ක් සඳහා සහතික කළ තක්සේරුවක් ලබා ගන්නා අතර 2020 මූල්‍ය වර්ෂය තුළ දී අවශ්‍ය ගැලපීම් සිදුකරනු ලැබේ.

ii. ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර 12) හි 88 ඡේදය ප්‍රකාරව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු වලට (ESC) අදාලව රු. 159,549,619 ක තක්සේරුව හා ඒ සඳහා පනවන ලද රු. 75,461,644 ක දඩ මුදල් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබීම.

ආර්ථික සේවා ගාස්තු නිරවුල් කිරීම පිළිබඳ කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා දේශිය අදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යොමු කරන ලද අතර ආර්ථික සේවා ගාස්තු සමථයකට පත් කිරීම සඳහා සුහද ගිවිසුමක් ඇති කර ගන්නා තෙක් මේ සම්බන්ධයෙන් සමාගමට එරෙහිව අයකර ගැනීමේ කිසිදු ක්‍රියාමාර්ගයක් හෝ බද්දක් පැනවීමෙන් වළකින ලෙස ද ඉල්ලීමක් කරන ලදී.

iii. අදායම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රිලංගිප්‍ර 18) හි 14 ඡේදය ප්‍රකාරව භාණ්ඩ විකුණුම් වලින් අදායම් හඳුනාගෙන නොතිබුණි.

ලංවිම සඳහා වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේ දී පිරිවැය සඳහා රේගු ආන්තිකයක් එකතු කිරීම සඳහා දේශීය ආදයම් දෙපාර්තමේන්තුව විසින් ලංකා ගල් අඟුරු සමාගමට නිර්දේශ ලබා දී තිබුණි. දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ නිළධාරියකුගේ සහභාගිත්වය සහිතව 2018 ජුනි 28 දින අප ආයතනයේ පැවති රැස්වීමට අනුව මෙම මිල නියම කිරීමේ යාන්ත්‍රණය යොදා ගන්නා ලදී. දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් වාර්තා සටහන් කරමින් කියා සිටියේ වැට් ඉන්වොයිසි සඳහා ලංකා ගල්අඟුරු සමාගමේ මූලික වටිනාකම රේගු කාර්යය සඳහා ලංවිම සඳහා වන වැට් ඉන්වොයිසි වටිනාකමට වඩා අඩුවිය නොහැකි බවයි. එබැවින් 10%ක් එකතු කරන ලද්දේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිළධාරීයාගේ මඟ පෙන්වීම මතයි. එදින සිට එම නියෝගය සඳහා ලංවිම විසින් අභියෝග කර 2018-09-07 දරණ ලිපියෙන් ලිඛිතව දැනුම් දී ඇති අතර ඒ සඳහා ප්‍රතිචාර තවම ලැබී නැත. එහෙත් අප විසින් 10%

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

රේගු ආන්තිකය ඉන්වොයිසි සඳහා එකතු කළ නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ නිකුත් කිරීමට ඇති හෙයින් කිසිදු නිමැවුම් වැට් අතිරික්තයක් ප්‍රේෂණය නොකෙරේ. එබැවින් මෙම ආකාරයට ආදායම වැඩියෙන් දැක්වීම සඳහා එය හේතු වී ඇත.

iv. 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශ නොකිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් සමාගමට රු. 205,000,000 ක දඩ මුදලක් පනවා තිබීම.

ශ්‍රී ලංකා රේගුව විසින් සිදුකරන ලද විමර්ශනයට අනුව 2016-09-19 සිට 2018-04-09 දක්වා කාල පරිච්ඡේදය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ලංකා ගල් අඟුරු සමාගම විසින් ප්‍රකාශ කර නොතිබුණි.

එම කාලය තුළ දී එක් නැව්ගත කිරීමකට රු. 1,000,000.00ක ගාස්තුවක් යටතේ රේගු ප්‍රකාශනයක් සකස් කිරීමේ කාර්යය සම්පූර්ණයෙන්ම කරන ලද්දේ ලංකා නැව් සංස්ථාව විසිනි. ඉහත සාවද්‍ය ප්‍රකාශයන් මත රු. 205,000,000 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුව විසින් ලංකා ගල් අඟුරු සමාගම වෙත පනවා තිබූ අතර, ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් විසින් මෙම ගෙවීමෙන් පසු කිසිදු අවසාන එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමක් නොමැති බව ලංකා ගල් අඟුරු සමාගමේ නිලධාරීන්ට දන්වා තිබුණි.

අදළා නැව්ගත කිරීම් සඳහා එකතුකල අගය මත බදු ලෙස ඒ වන විටත් රු.37,574,744ක මුදලක් ලංකා ගල් අඟුරු සමාගම විසින් ගෙවා තිබූ අතර ගල් අඟුරු නැව්ගත කිරීම පිළිබඳ නිෂ්කාශණයන් ශ්‍රී ලංකා රේගුව විසින් නවතා තිබූ බැවින් ලංවිම විසින් ලබාදෙන අරමුදල් යොදා ගනිමින් රු. මිලියන 205 ක මුදලක් නිරවුල් කිරීමට සිදුවුනි.

කෙසේ වුවද ඉහත කී අහිමි කිරීමේ මුදල අත්හැර දැමීම සඳහා ඉල්ලීම් කරමින් ලංකා ගල්අඟුරු සමාගම විසින් රේඛීය අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යවරයාට මෙම කරුණ පිළිබඳව ලිඛිතව දන්වන ලද අතර එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. එහෙත් ලංවිම සහ ලංකා නැව් සංස්ථාව සම්බන්ධයෙන් වූ අමාත්‍යාංශවල ලේකම්වරුන් දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් (නෙම්මවත්ත කමිටුව) මඟින් මෙම කරුණ විමර්ශනය කෙරෙමින් පවතින අතර මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි ඉදිරිපත් කිරීමක් සිදු කිරීම සඳහා ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී

v. නැව්ගත කිරීම් බිල්පත් නිරවුල් කිරීම් සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබී තිබුණු අරමුදල් iv ඡේදයේ සඳහන් කර ඇති දඩ මුදල ගෙවීම සඳහා සමාගම විසින් යොදා ගෙන තිබීම.

ගල් අඟුරු නැව්ගත කිරීම් පිළිබඳ නිෂ්කාශණය ශ්‍රී ලංකා රේගුව විසින් නවතා දැමූ බැවින් ලංවිම විසින් දෙන ලද අරමුදල් යොදා ගනිමින් ලංකා ගල් අඟුරු සමාගම විසින් මෙම ගෙවීම් සිදුකිරීමට විය. ලංවිම සහ ලංකා නැව් සංස්ථාව සම්බන්ධයෙන් වූ අමාත්‍යාංශවල ලේකම්වරු දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් (නෙම්මවත්ත කමිටුව) මඟින් මෙම කරුණ විමර්ශනය කෙරෙමින් පවතින අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී.

vi. අඩුවෙන් සපයන ලද ගල් අඟුරු තොග වලට අදාළව සීමාසහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා සීමාසහිත ටොරියන් අයන් ස්ටීල් සමාගමෙන් ලැබිය යුතු රු.539,192,079 ක් වූ ශේෂය අයකර ගැනීම සදහා සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සම්බන්ධ ගැටළුව නිරවුල් කිරීම උසස් මට්ටමේ කමිටුවක් මඟින් මෙහෙයුම් කරන ලදි. එම මුදල් බොල් ණය ලෙස කමිටුව විසින් නිගමනය නොකරන අතර ගල් අඟුරු සැපයීමෙන් අයවිය යුතු මුදල් පියවීමට ගැනුම්කරු පවා එකඟ වී ඇත. අප සතුව ඇති තොරතුරු අනුව, අදාල නිරවුල් කිරීමේ යොජනාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ලංකා නැව් සංස්ථාවෙන් (ටොරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පණි ලිමිටඩ්) ලැබිය යුතු හිඟ මුදල පිළිබඳ වර්තමාන තත්ත්වය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම සමග සාකච්ඡා කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් භාණ්ඩාගාරය (සභාපති), ලංකා නැව් සංස්ථාව, ලක්විජය විදුලිබලාගාරය හා ලංකා ගල් අඟුරු සමාගමේ සාමාජිකයන් 4 දෙනෙකුගෙන් සැඳුම්ලත් කමිටුවක් පත්කරන ලදී. තව ද කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය මඟින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස අමාත්‍ය මණ්ඩලය උපදෙස් දී ඇති අතර එය සිදුකිරීමට නියමිතව ඇත.

vii. පෙර වර්ෂ විගණනයේ දී සත්‍යාපනය කළ නොහැකි වූ ඉදිරියට ගෙන එන ලද රු. 894,151 ක්වූ ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC) රු.77,719 ක් වූ රඳවා ගැනීම් බදු (WHT) රු. 65,474,540 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු රු.3,371,326 ක්වූ ලැබිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ රු. 12,758,801 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) පෙර වර්ෂ ගැලපීමක් ලෙස 2018 වර්ෂයේ රඳවාගත් ඉපැයුම් වලට එරෙහිව අයකර තිබීම.

ආර්ථික සේවා ගාස්තු/රඳවා ගැනීම් බදු (ESC/WHT)

ආපසු අයකර ගත නොහැකි ආර්ථික සේවා ගාස්තු හා රඳවා ගැනීම් බදු රු. 971,868 ක දිගු කාලීන හිඟහිටි සනාථ නොකළ බදු ශේෂයන් කපා හැරීම සඳහා මණ්ඩලයෙන් ලැබුණු අනුමැතියෙන් කොටසක් වේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

ආදායම් බදු

14/15 හා 13/14 වර්ෂ සඳහා හිඟ හිටි ආදායම් බදු පිළිවෙලින් රු.2,049,484 ක් හා රු.3,590,678 ක් පමණක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලිඛිතව තහවුරු කර ඇත. එබැවින් තවදුරටත් අවශ්‍ය නොවන රු.11,703,151ක ගෙවිය යුතු බදු 2018-07-26 දින පැවති රැස්වීමේ දී ලැබුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ගලපන ලදී.

ආදායම් බදු සඳහා රු.65,474,540 ක තවදුරටත් අතිරේක ප්‍රතිපාදනයක් පැවතුණි. ඉහත කරුණට අදාලව දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු ආදායම් බදු වගකීම පිළිබඳ ලිඛිත තහවුරු කිරීමට අනුව ගෙවිය යුතු මුදල් වලින් බැහැරවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ඇතිව අතිරික්ත ප්‍රතිපාදන ප්‍රතිවර්තනය කරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු (NBT)

පෙර කාල පරිච්ඡේදයේ දී සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එය 2017 වර්ෂය අවසානයේ දී රු.3,371,326 ක් විය. ලංකා ගල් අඟුරු සමාගම ගල් අඟුරු ආනයනකරුවෙකු හා වෙළඳාමේ යෙදෙන්නෙකු වශයෙන් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු ආපසු ලබා ගැනීමට හිමිකමක් නොමැත. එබැවින් ඉහත ශේෂය ශේෂ පත්‍රයේ ගැලපීම් කිරීම සඳහා 2018-07-26 දින පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

එකතු කළ අගය මත බදු (VAT)

2017 වර්ෂය අවසානය වන විට ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණු යෙදවුම් බදු රු.12,758,801 ක් නිවැරදි මූල්‍ය තත්ත්වය නිරූපණය කිරීම සඳහා ගැලපීම් කරන ලදී.ගෙවන ලද එකතු කළ අගය මත යෙදවුම් බදු ආපසු ලබා ගැනීමේ හැකියාව අප විසින් දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ලියා විමසන ලදී. සමාගම විසින් ගෙවන ලද යෙදවුම් බදු 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 (5) වගන්තිය ප්‍රකාරව ආපසු නොගෙවන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2018-06-14 දිනැති ඔවුන්ගේ ලිපියෙන් පැහැදිලි කර තිබුණි. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ 2018-07-26 දින පැවති රැස්වීමේ දි අනුමැතිය ලබා ගෙන ඉහත ලැබිය යුතු ශේෂය ගැලපීම් කරන ලදී.

viii. ලංවිම විසින් ගෙවන ලද බත්තල් ගාස්තු සඳහා - එකතු කළ අගය මත බදු (VAT) වලට අදාළව (නැව්ගත කිරීම් 151 සිට 154 දක්වා) සීමාසහිත ලංකා නැව් සංස්ථාවට (CSCL) ගෙවිය යුතු රු.15,870,104 ක මුදලක් ලංකා නැව් සංස්ථාවට ගෙවා හෝ ලංකා විදුලිබල මණ්ඩලයේ ලැබුණු අත්තිකාරමක් ලෙස හෝ දක්වා නොතිබීම.

අංක 151 සිට 154 දක්වා නැව්ගත කිරීම් සඳහා රු. 15,870,104.32ක බත්තල් ගාස්තු සඳහා එකතු කළ අගය මත බදු ලංකා ගල් අඟුරු සමාගම විසින් නොගෙවා තිබීමට හේතුවුයේ බත්තල් ගාස්තු සදහා එකතු කල අගය මත බදු 0% බවට දේශීය ආදයම් දෙපාර්තමේන්තුව විසින් තීරණය කර තිබු හෙයිනි. මෙම ලැබීම 124 සිට 142 නැව්ගත කිරීම් 11ක් සඳහා අවසාන වැට් තක්සේරුව නිරවුල් කිරීම සඳහා යොදා ගන්නා ලදී. මේ සඳහා බැර පතක් 2020 වර්ෂයේ දී නිකුත් කර ඇත.

ix. ගිණුම් සත්‍යාපනයට අදාළ ශේෂ සනාථ කිරීම් හා සාක්ෂි

ගෙවිය යුතු ගිණුම් - රු. 1,109,063

2020 වර්ෂයේ දී ශේෂ නිවැරදි කරනු ලැබේ.

අවසාන එකතු කළ අගය මත බදු හා ලංවිමයෙන් ලැබිය යුතු වෙනත් ලැබීම්: රු.180,416,885

අංක 123 සිට 155 දක්වා නැව්ගත කිරීම් පිළිබඳ අවසාන එකතු කළ අගය මත බදු හා විනිමය පාඩුව සඳහා මෙය ලැබිය යුතු මුදලක් වන අතර එය ශ්‍රී ලංකා රේගුවට කරන ලද රු. මිලියන 205 ක ගෙවීම් වලට අදාළ වේ. ලංවිම හා ලංකා නැව් සංස්ථාවේ ලේකම්වරුන් දෙදෙනෙකු විසින් පත්කරන ලද විශේෂ කිමිටුවක් මඟින් මෙම කරුණ විමර්ශනය කෙරෙමින් පවතින අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී. ඉහත වාර්තාවට අනුව සටහන් තබනු ලැබේ.

ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු රු. 578,678,686

ආර්ථික සේවා ගාස්තු නිරවුල් කිරීම පිළිබඳ දින දිර්ඝ කිරීමක් ඉල්ලුම් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු මුදල් - රු. 6,813,692

තීරක (Umpire) නියැදි සහතික වල වෙනස්කම් මත M/s' Trafigura ආයතනයෙහි වියදම් හා මිල අඩුවීම් ගැලපීමෙන් පසුව එම ආයතනය විසින් සිදුකල නැව්ගත කිරීම් වල ප්‍රමාද ගාස්තු වල ඉතිරි මුදල මෙම වටිනාකමට ඇතුලත්ය.

සීමාසහිත ලංකා නැව් සංස්ථාව - පැරණි ගෙවිය යුතු ශේෂ - රු. 28,347,444

මෙම ශේෂය සීමාසහිත ලංකා නැව් සංස්ථාවෙන් තහවුරු කර ඇත. නොහාර රක්ෂණ ගෙවීම් පිළිබඳ ඉන්වොයිසි හා ලදුපත් ලංකා ගල් අඟුරු සමාගම විසින් දැනටමත් ඉදිරිපත් කර ඇති බැවින් ලංකා නැව් සංස්ථාව විසින් නිවැරදි සටහන් ඇතුළත් කර ගත යුතුවේ.

විවිධ ණයගැතියන් - රු. 18,075,802

රේගුවට කරන ලද වැඩිපුර ගෙවීම් වලින් මෙම මුදල සමන්විත බව මුලික විමර්ශන වල දී අනාවරණය වී ඇත. කෙසේ වුව ද නිවැරදි ලැබිය යුතු ශේෂය හඳුනාගැනීම සඳහා තවදුරටත් විශ්ලේෂණය කෙරෙමින් පවතී.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.4,674,041

ශේෂයේ ස්වභාවය විමර්ශනය කරනු ලබන අතර ඒ අනුව නිවැරදි කරනු ලැබේ.

වෙළඳ ණයගැතියා (ලංවිම) වාෂ්ප ගල් අඟුරු රු.7,750,000

M/s Mercator හට සිදුකරන ලද ගෙවීමකින් මෙම ශේෂය සමන්විත වේ. ලංවිම හා ලංකා නැව් සංස්ථාවට අදාළ අමාත්‍යාංශවල ලේකම්වරු දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් (හෙම්මවත්ත කමිටුව) මඟින් මෙම කරුණ ද විමර්ශනය කෙරෙමින් පවතින අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී.

ලංකා විදුලිබල මණ්ඩලයෙන් වෙනත් ලැබිය යුතු මුදල් - රු.1,760,500

ශේෂයේ ස්වභාවය විමර්ශනය කර ඒ අනුව ඉදිරියේ දී නිවැරදි කරනු ලැබේ.

වෙළඳ ණයහිමියන් නෝබල් රිසෝසස් රු.85,887,776

ණයවර ලිපියේ වලංගු කාලය ඉකුත්වීම හේතුවෙන් නෝබල් රිසෝසස් පීවීටී ලිමිටඩ් ආයතනය මඟින් අඩුවෙන් ලබාගන්නා ලද මුදලින් මෙම ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වේ.

නොබල් රිසෝසස් වෙතින් ලැබිය යුතු මුදල් රු.1,115,987

ඉහත රු.85,887,776 ක නෝබල් රිසෝස් වෙළඳ ණය හිමි ශේෂයට එරෙහිව මෙම ණයගැති ශේෂය ඉදිරියේ දී නිරවුල් කරනු ලැබේ.

x. රු. 8,280,994 ක් වූ ප්‍රතිපූර්ණ වියදම් මත ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT) එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එකතු කළ අගය මත බදු බැරකම සමාන මුදකින් අඩුවෙන් දක්වා තිබීම.

විගණන විමසුම පරිදිම මෙය ලංකා ගල් අඟුරු සමාගමට අයත් බිල්පත්‍ර වල ප්‍රතිපූර්ණය කිරීම් වේ. අපගේ සේවාවන් සඳහා කිසිදු ආන්තිකයක් එකතු කර නොමැත. අපගේ බදු උපදේශකට අනුව, ප්‍රතිපූර්ණ වියදම් එකතු කළ අගය මත බදු සඳහා වගකීමට යටත් නොවේ.

xi. සැපයුම්කරුට ගෙවිය යුතු ලෙස හෝ සීමාසහිත ලංකා නැව් සංස්ථාවයට ගෙවිය යුතු ලෙස හෝ මේ සම්බන්ධයෙන් ලෙජර් ගිණුමේ වගකීමක් නොමැතිව සමාගම විසින් සීමාසහිත ලංකා නැව් සංස්ථාව මඟින් සැපයුම්කරුට රු. 4,000,000 ක මුදලක් ගෙවා තිබීම.

මෙම ශේෂයේ ස්වභාවය ඉදිරියේ දී විමර්ශනය කර ඒ අනුව නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

xii. රේගුවට අනුව සත්‍ය එකතු කළ අගය මත බදු මුදල රු. 106,969,404 ක් වුවද අංක 123 දරන නැව්ගත කිරීම සඳහා රේගුවේදී එකතු කළ අගය මත බදු ලෙස රු. 136,236,370 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබීම.

2020 මූල්‍ය වර්ෂයේ දී මෙම ශේෂය නිවැරදි කර ඇත.

xiii. සමාගම විසින් රු. 5,218,271 ක මුදලක් සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ ගෙවිය යුතු ගිණුමට හරකර තිබුණි. කෙසේ වුවද මෙම මුදල පරීක්ෂා කිරීම සඳහා උපකාරක ලියවිලි හා හේතු ඉදිරිපත් කර නොතිබීම.

2020 මූල්‍ය වර්ෂයේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සටහන් සිදු කරනු ලැබේ.

xiv. රු.500,546 ක්වූ ආර්ථික සේවා ගාස්තු (ESC) රු.10,134,113 ක්වූ ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ රු.1,900,938 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) සඳහා දඩ මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණි.

දඩ මුදල් ඉවත් කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා සිදු කරන ලදී. එබැවින් අවශ්‍ය හෙළිදරව් කිරීම් 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශවල සිදු කරනු ලැබේ.

(b) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

i. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විම.

2020 වර්ෂය සිට ඉදිරියට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව හොඳම පරිචයන් පිළිපැදීමට අවශ්‍ය විධිවිධාන යොදනු ලැබේ.

ii. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 (2) වගන්තියට (සංශෝධිත) අනුව අස්ථිත්වයක පිරිවැටුම කාර්තුවකට රු. මිලියන 12.5 (කාර්තුවකට සීමාව) ඉක්මවන්නේ නම් ආර්ථික සේවා ගාස්තු සඳහා වගකීමට යටත් විම.

ඉදිරියේ දී අවශ්‍ය පරිදි සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම විසින් එයට අනුකූලව කටයුතු කරනු ලැබේ.

iii. සමාගමේ කාර්ය මණ්ඩලය විසින් කිසිදු කළමනාකරණ ගාස්තුවක් අය කිරීමෙන් තොරව පරිපාලිතයන්හි පරිපාලන කාර්යයන් ද සිදු කර තිබුණි. එබැවින් රු.24,847,325 ක්වූ සමූහයේ කාර්ය මණ්ඩල වියදම් සාවද්‍යව සමාගමට අය කර තිබීම.

වර්ෂය තුළ පරිපාලිතයන් විසින් ප්‍රමාණවත් අතිරික්තයක් උත්පාදනය කර නොතිබූ බැවින් කළමනාකරණ ගාස්තු අය කිරීමේ මූලධර්මය ක්‍රියාත්මක නොකල අතර 2020 මූල්‍ය වර්ෂය සිට ඉදිරියට පිළිපැදීමට කටයුතු කරනු ලැබේ.

1.2.2 ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිරීක්ෂණ

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමුවාප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවීම.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) මණ්ඩලය විසින් විවිධ ණයගැතියන් ශේෂය වූ රු.30,609,836 ක් ණය හිමියන්ට එරෙහිව හිලව් කර තිබීම.

ප්‍රමාද දෝෂයකින් වූ සටහන 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(ii) හරිත විදුලිබල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ලාබදුන් ණය රු.1,262,503,405 ක මුදල

ප්‍රමාද දෝෂයකින් වූ සටහන 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත..

(iii) රු. බිලියන 83ක් වූ ලබාගත් ණය සඳහා ණය සැකසුම් ගාස්තු වෙනුවෙන් ගෙවන ලද රු. මිලියන 25ක මුදල, මූල්‍ය පිරිවැය ලෙස දක්වනු වෙනුවට පරිපාලන වියදම් යටතේ වෙනත් වියදම් ලෙස ඉදිරිපත් කර තිබීම.

වියදම් වර්ගීකරණය නිවැරදි කර ඇත.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 2 - තොග සහ ශ්‍රීලංගිප 16 - දේපල, පිරියත හා උපකරණ

ලංවිම විසින් ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය අගය කිරීම් සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලැබීම.

ශ්‍රී ලං ගි ප්‍ර 2 හි 21 ඡේදය ප්‍රකාරව තොග අගය කිරීම සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය නිර්දේශ කෙරේ. ඒ අනුව තොග, කෙරීගෙන යන වැඩ හා දේපල,පිරියත හා උපකරණ අගය කිරීම සඳහා සත්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවය හේතුවෙන් ලංවිම විසින් ප්‍රමිත මිල යොදා ගනු ලැබේ. තොග පිළිබඳ ප්‍රමිත මිල තීරණය කිරීම සඳහා පත්කරන ලද කමිටුව, තොග වල සත්‍ය මිල ගණන් වලට ඉතා ආසන්නව නිරවද්‍ය හා සාධාරණ තක්සේරුවක් නිශ්චය කර ගැනීම සඳහා දුෂ්කර කාර්යයන් සිදුකරන ලදී. කෙසේ වුව ද, තාක්ෂණික සංකීර්ණතාව සහ විශාල තොග පරිමාව හේතුවෙන් සත්‍ය මිල හා ප්‍රමිත මිල අතර පරතරයක් පවතී. ඒකාබද්ධ ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දුන් පසු මෙම කරුණ විසදෙනු ඇත.

ප්‍රමිත මිල ගණන් හා සත්‍ය මිල ගණන් අතර පරතරය අවම කිරීම සඳහා ලංවිම විසින් පහත සඳහන් කාර්යයන් ආරම්භ කර ඇත.

- බෙදා හැරීම් අංශ 4 (DD4) හා බෙදා හැරීම් අංශ 3(DD3) ශ්‍රම අනුපාත විචලනය 2019 වර්ෂයේ ගිණුම් වලින් ඉවත් කර ඇත. 2020 වර්ෂයේ දී අනෙක් අංශ දෙක සඳහා ද එසේ සිදු කළ හැක.
- තොග අගය කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශය පරිදි, තොග අගය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය මිළ ක්‍රමය අනුගමනය කිරීමත් සමග මූල්‍ය ප්‍රකාශනවල ද්‍රව්‍ය මිල විචලනයන් හි බලපෑම ඉවත් කිරීමට හැකිවනු ඇත. දැනට වැඩිදියුණු කරමින් පවතින ව්‍යවසායකත්ව සැලසුම් පද්ධතිය (ERP System) තුළ මෙය විසඳනු ලබන බැවින් ERP ක්‍රමය ක්‍රියාත්මක වූ වහාම මෙම ගැටළුව විසදෙනු ඇත.
- කෙරීගෙන යන වැඩ වලින් මාරු කරන ලද බෙදා හැරීම් අංශ වලට අයත් වත්කම් හැරුණු විට අනෙක් සියළුම දේපල, පිරියත සහ උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ) ශ්‍රීලංගිප්‍ර හි නිර්දේශයන්ට අනුකූල වන පරිදි සත්‍ය පිරිවැයට අගය කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම හා දෝෂ

ලංවිම විසින් අඛණ්ඩව භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය

(i) පිරිවැය රු. 3,918,235,311 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන 1,683 ක සංඛ්‍යාව

මෝටර් වාහන වල ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳව අදාල අංශවලින් දත්ත එක්තු කර ඇති අතර ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරමින් පවතී. සංශෝධිත ඵලදායී ජීවකාලය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීම සඳහා නිර්දේශ කිරීමට හැකිවේ.

(ii) රු.32,241,176,427 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද විදුලි බලාගාර 04

ජනන අංශයේ විදුලිබල පිරියත ලංවීමට අනන්‍ය වූ සංකීර්ණ වූ ස්වභාවයක් ගනී. විදුලි ජනන යන්ත්‍රවල ඵලදායී ජීව කාලය මුල් නිෂ්පාදකයාගේ නිර්දේශය මත පදනම්ව නිගමනය කෙරේ. විදුලිබල පිරියතවල ඵලදායී ජීව කාලය නැවත බැලීම සඳහා කමිටුවක් පත් කරනු ලැබේ. ලංවිම විසින් විදුලිබල පිරියත හා විදුලි ජනන යන්ත්‍ර හොඳින් නඩත්තු කරනු ලබන බැවින් නිෂ්පාදකයාගේ (OEM) අපේක්ෂිත ජීව කාලයෙන් ඔබ්බට ඵලදායී ජීව කාලය ක්‍රියාත්මක වේ.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 16 දේපල, පිරියත හා උපකරණ

සම්ප්‍රේෂණ අංශයේ රු.172,019,335,924 ක් වූ ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබීම.

සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් වල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් වාර්ෂික භෞතික සත්‍යාපනයක් සිදුකිරීම සඳහා අදාල උපදෙස් නිකුත් කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

1.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු. 3,535,799,151 ක හර ශේෂයක් (තොග ඌනතාවය) හා රු.90,343,073 බැර ශේෂයක් (තොග අතිරික්තය) වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව තොග ගැලපුම් ගිණුමේ පැවතීම.

2020 වර්ෂයේ දී සිදුකළ හැකි අවශ්‍ය ගිණුම් සටහන් සිදු කිරීමට අදාළ අංශ විසින් කටයුතු කරන අතර නීතිමය ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි හිඟ ශේෂයක් නිරවුල් කරනු ලැබේ.

(ආ) අංක 10/2434/423/034 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ලක්විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු. 159,184,187,965 ක ණය මුදල සහ ඒ සඳහා පොළිය ලංවිම විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතු වීම.

ලංවිම ද්‍රවශීලතා තත්ත්වයේ ප්‍රමාණාත්මක බව සැලකිල්ලට ගනිමින් 2018 වර්ෂය දක්වා ආපසු ගෙවීම මහා භාණ්ඩාගාරය විසින් අවශෝෂණය කරගෙන ඇත. කෙසේ වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය පරිදි, 2019 කාල පරිච්ඡේදය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද රු. 3,556,442,931.30 ක් වූ පොලී ගෙවීම ලංවිම පොත්වල ගැලපීම් කරන ලදී. තව ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට යටත්ව 2020 වර්ෂයේ සිට ගැලපීම් සිදුකළ යුතුවේ.

(ඇ) PED / 1 / CEB / 2/11 (i) ලිපිය මඟින් භාණ්ඩාගාරයේ ඉල්ලීම පරිදි ස්කන්ධය යටතේ ගිණුම්ගත කර ඇති රු 3,556,442,931 ක මුදල 2019 ඔක්තෝම්බර් 17 වන දින ආදායම් ප්‍රකාශයට පොළී වියදමක් ලෙස අය කර තිබීම.

ශ්‍රී ලං ගි ප්‍ර 23 (ණය ගැනීම් පිරිවැය)ට අනුව, වත්කම් වාණිජකරණයෙන් පසුව දරන ලද රු.3,556,442,931.30 ක පොළී වියදම ප්‍රාග්ධනිත කළ නොහැක. ඒ අනුව 2019 කාල පරිච්ඡේදය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද පොළිය ආදායම් ප්‍රකාශනයට අය කරන ලදී. එබැවින් ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මණ්ඩලයේ පාඩුව වැඩියෙන් දැක්වීමක් නොමැත.

(ඈ) ලංවිම විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද රු. 41,816,475 ක් වූ වියදම් ලැබිය යුතු මුදල් ලෙස සැලකීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබීම.

අංක 1321/18 දරන 2003 දෙසැම්බර් 31 දිනැති සාමාන්‍ය ගැසට් නිවේදනය යටතේ ප්‍රසිද්ධ කරන ලද අර්ථ සාධක අරමුදල් රීති 20 (1) වගන්තිය අනුව, ආයෝජන මිල දී ගැනීම සහ විකිණීම සඳහා සෘජුවම ආරෝපණය වන වියදම් ඇතුළුව අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ වියදම් වරින් වර මණ්ඩලය විසින් තීරණය කරනු නොලැබුව හොත් හැර එය මණ්ඩලයේ වියදමක් වේ.

එබැවින් ලංවිම අර්ථසාධක අරමුදලට අදාළ වියදම්ක් වූ රු.41,421,524.00 ක් ලංවිම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීම ඉහත කී ලංවිම අර්ථසාධක අරමුදල් රීති වලට අනුකූලවීමකි. එබැවින් අර්ථසාධක අරමුදල් වියදම් ලැබිය යුතු ලෙස ලංවිම මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීම අවශ්‍ය නොවේ.

(ඉ) ලංවිම විසින් 2013 වර්ෂයට පෙර කාල පරිච්ඡේදය සඳහා රජයේ ආයතන වලට විදුලි ජනක යන්ත්‍ර, විදුලි සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම හා අලුත් වැඩියා කිරීම යන කාර්යයන්ට අදාලව ඉන්වොයිස් වටිනාකමට ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැයට අගය කර ඒ අනුව ගිණුම්ගත කර තිබීම.

2013 වර්ෂයට පෙර ණයගැතියන් ගිණුම්ගත කරනු ලැබුවේ මුදල් පදනම මත වන අතර කාර්යයන්හි සත්‍ය පිරිවැය ගනුදෙනුකරුගෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇත. විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල්, රෝහල් වලින් ලැබිය යුතු මුදල් හා ලංවිම සභාපතිගේ උපදෙස් මත ලංවිම විසින් සිදුකරන ලද කාර්යයන්ගෙන් ලැබිය යුතු මුදල් වලින් එම අය කර නොගත් ශේෂ සමන්විත වේ.

ඇස්තමේන්තු වටිනාකම මත පදනම්ව අයකරගත නොහැකි ශේෂ ඉන්වොයිස් කිරීම විචක්ෂණශීලි නොවන අතර, ඒ සඳහා එකතු කළ අගය මත බදු ගෙවීම ලංවිම සඳහා අනවශ්‍ය පාඩුවක් වේ. එබැවින් අයකර ගත යුතු මුදල ලෙස සත්‍ය පිරිවැය දක්වා ඇත.

මෙම ගැටළුව කිහිප වතාවක් විගණකවරුන්ට දන්වා ඇති නමුත් එම ගැටලුවම නැවත නැවත දක්වා ඇත. එසේම ලංවිම විසින් එම අයකරගත නොහැකි ලැබිය යුතු ශේෂ සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් කර ඇත. 2013 ට පෙර සත්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත වටිනාකම අතර විචලනයේ වර්තමාන අගය (2020 ජුනි 30 දිනට) රු. 53,052,302.10 ක් වේ.

සටහන :- විගණකාධිපති වාර්තාවේ සඳහන්ව ඇති මුදල වන රු.66,978,761 වෙනුවට රු. 53,052,302.10 ලෙස නිවැරදි විය යුතුය.

(ඊ) 2016 වර්ෂයේ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු. බිලියන 5කින් රු. මිලියන 500ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ ගාස්තු ගෙවීමක් ලෙස වර්ගීකරණය කර ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබූ අතර රු. බිලියන 1ක් සඳහා පෙර වර්ෂ ගැලපීමක් සිදු කර තිබීම.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

2019.10.16 දිනැති අංක පීඩීඊ/I/සීඊබී/2/11/(iii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව, මෙම ගෙවීම 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරයට"කළමනාකරණ ගාස්තු" ගෙවීමක් ලෙස සලකන ලද අතර 2017 වර්ෂයේ සිට වර්ෂ 10ක කාලයක් තුළ ක්‍රමක්ෂය කර ඇත.

ලංවිමේහි විධිමත් ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය කටයුතු සම්පාදනය කිරීමට භාණ්ඩාගාරය විසින් මණ්ඩලය වෙත පහසුකම් සලසන බවද තවදුරටත් අවධාරණය කෙරේ.

(උ) උප ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු. 2,495,574,443 ක් වූ පොළිය ලංවිම විසින් ගෙවා නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයක් හෝ කර නොතිබීම.

උප ණය ගිවිසුම් මත පොළිය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලංකා විදුලිබල මණ්ඩලයට උපදෙසක් හෝ නියෝගයක් කර නොතිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් ලංවිම විසින් කිසිදු ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඌ) භාණ්ඩාගාරයෙන් 10% ක ලාභාංශ බදු ලෙස නම් කරන ලද රු. 4,200,000 ක මුදලක් මූලස්ථාන කාර්යාල පොත්වල හඳුනා නොගෙන වෙනත් ණයගැතියකු ලෙස පැවතුණි.මෙම මුදල සඳහා ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

2005/2006 වර්ෂය සඳහා රු. 42,000,000 ක දළ ලාභාංශ ගෙවීමේ දී සීමාසහිත ලංකා ට්‍රාන්ස්පෝමර්ස් විසින් අඩුකළ 10%ක ලාභාංශ බද්ද එම මුදලින් නියෝජනයවේ. මෙය 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(එ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ප්‍රමාද පොළී රු.31,119,302 ක මුදලක් ගිණුම් පොත් වලින් අත්හැරී තිබීම.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාද පොළී සටහන් කිරීම සඳහා පියවර ගෙන ඇත.

(ඒ) රු.734,574,801 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් බෙදා හැරීම් අංශ 1 හි වත්කම් වලට මාරු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතීම.

විගණන විමසුමේ දක්වා ඇති මුදලට වඩා වැඩි රු. මිලියන 714 කින් උතුරු මැද පළාතේ ශේෂය වැඩි වන බැවින් ඉහත ශේෂය රු. මිලියන 1,448ක් ලෙස නිවැරදි විය යුතුය. කෙසේ වුවද ඉහත දිගු කාලීනව පැවති කෙරීගෙන යන වැඩ ශේෂයෙන් 25% ක් 2020 මුදල් වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ සඳහා දැනටමත් මාරු කර ඇති අතර ඉදිරිපත් කර ඇති වැඩ නිම කිරීම් වාර්තා මත පදනම්ව උතුරු පළාතේ කෙරීගෙන යන වැඩ ශේෂය දේපල, පිරියත හා උපකරණ වලට මාරු කිරීමට 2020 වර්ෂයේ දී කටයුතු කර ඇත.

සියළු පළාත් විසින් කෙරීගෙන යන වැඩ ශේෂය පිළිබඳ සාමාන්‍යයෙන් කාලීන සාමාලෝචනයක් හා අධීක්ෂණයක් සිදුකර ගෙන යනු ලබන අතර  එම ක්‍රියාවලියේදී  නිම කරන ලද කාර්යයන් වැඩ නිම් අවස්ථාවේ දීම දේපල,පිරියත හා උපකරණ ගිණුමට  මාරු කරනු ලැබේ.

(ඔ) මොරගහකන්ද විදුලිබල පිරියතයෙන් විදුලිය මිලදී ගැනුම් සඳහා ගෙවිය යුතු රු.128,264,040 ක මුදල වර්ෂයේ ගිණුම් පොත් වලින් අත්හැරී තිබීම.

මොරගහකන්ද විදුලි බලාගාරයට අදාල සියළු හිඟ ඉන්වොයිසි 2020-07-31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ගිණුම් පොත්වලට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර  සියළු ඉන්වොයිසි කඩිනමින් සටහන් කිරීමට පියවර ගනු ලැබේ.

(ඕ) 2012 වර්ෂයේ ආරම්භ කරන ලද ඉහළ කොත්මලේ විදුලිබල පිරියතට අදාළ කෙරීගෙන යන වැඩ රු.944,030,864 ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා මාරු කර නොතිබීම.

මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර අදාල අංශ වලට ප්‍රථම වරට වත්කම් මාරු කිරීම 2014 වර්ෂයේ දී සිදු කරන ලදී. කෙසේ වුව ද ප්‍රථමවර වත්කම් මාරු කිරීමෙන් පසු රු. 944,030,864ක් වූ වියදම 2019-12-31 දින දක්වා කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිතව පැවතුණි. මෙම වියදම ප්‍රධාන වශයෙන් සේවක වියදම් බේරුම්කරණය සඳහා නෛතික ගාස්තු හා ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් යනාදියෙන් සමින්විත වේ. ඉතිරි පිරිවැය ප්‍රවර්තන වර්ෂය ඇතුළත අදාල අංශවලට මාරු කිරීම සඳහා පියවර ගනු ලැබේ.

(ක) 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලද පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතියට අදාළ කෙරීගෙන යන වැඩ රු.603,573,159 ක මුදලක් ස්ථාවර වත්කම් වලට මාරු කර නොතිබීම.

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ දී අවසාන කරන ලද අතර අදාළ අංශවලට ප්‍රථම වරට වත්කම් මාරු කිරීම 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුවද, ප්‍රථම වරට වත්කම් මාරු කිරීමෙන් පසු රු.603,573,159 ක්වූ වියදම 2019.12.31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිතව පැවතුණි. ඉතිරි පිරිවැය ප්‍රවර්තන වර්ෂය ඇතුළත අදාළ අංශවලට මාරු කිරීම සඳහා පියවර ගනු ලැබේ.

(ග) අන්තර් අංශ ශේෂයන්ට හිලව් කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට රු. 367,390,040 ක බැර ශේෂයක් අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පැවතීම.

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ දී මෙම ශේෂයෙන් රුපියල් මිලියන 352 ක් නිවැරදි කර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ච) සමාලෝචිත වර්ෂය තුල විසර්ජනය කරන ලද රු. මිලියන 999.03 ක මුදලක් ගිණුම් පොත් වල වාර්තා වී නොමැත. එබැවින් වගකීම් සහ කෙරීගෙන යන වැඩ ප්‍රමාණය එම අගයෙන් අඩුවෙන් දක්වා ඇත.

ඉහත සඳහන් වෙනස ණය අංක 3146 සහ 3147 හා සම්බන්ධ වේ. හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ, අධියර -1 හි කොටස් කිහිපයක් සඳහා ණය අංක 3146 භාවිතා කරනු ලැබේ. ඉහත වාර්තා නොකළ බෙදාහැරීම් වලින් වැඩි කොටසක් මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියට අදාළ වේ. ලංවිම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී ඊආර්ඩී ප්‍රකාශය මෙම විසර්ජනයන් සමඟ යාවත්කාලීන කර නොතිබීම නිසා මූල්‍ය ප්‍රකාශන යාවත්කාලීන කිරීමට නොහැකි විය. එබැවින් 2020 මූල්‍ය වර්ෂයේදී ගිණුම් ප්‍රකාශ යාවත්කාලීන කරනු ලැබේ.

1.2.2.3 නොසැසඳු වෙනස්කම්

(අ) 2019 දෙසැම්බර් 31 දිනට ලංවිම මූල්‍ය ප්‍රකාශවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වෙන ශේෂය හා එදිනට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දැක්වෙන අනුරූපී ශේෂය අතර රු.764,717,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

වාර්තා නොකළ ප්‍රමාද වු පොළී ගාස්තු ගිණුම් සැසඳීමකින් පසුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) බිල්පත් පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂයන් අත්හැරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට 01, 02, 03 හා 04 යන බෙදා හැරීම් අංශවල බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග වෙළඳ ණයගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණවල දැක්වෙන අනුරූපී මුදල අතර රු.31,813,455ක නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විම. තව ද 2012 වර්ෂයේ සිට රු. 423,764,624 ක මුදලක් හඳුනා නොගත් ලෙස පැවතීම.

ලංවිම බිල්පත් පද්ධතියහි ගනුදෙනු සටහන් කිරීමේ ක්‍රියාවලිය හා ගිණුම් වාර්තා සකස් කිරීමේ ක්‍රියාවලිය මත එම ශේෂයන් කිසිවිටකත් සමාන නොවේ. එසේ හෙයින් එම ශේෂයන් අතර සැසඳුම් ප්‍රකාශනයක් සකස් කරනු ලබයි.

තොග සැපයුම් ණයගැති ලෙජර ශේෂයන්හි සක්‍රිය ණයගැතියන් හා අවසාන ණයගැතියන් අඩංගු වේ. කෙසේ වුවද තොරතුරු තාක්ෂණ ශාඛවෙන් උපුටාගත් බිල් කිරීම් වාර්තාවේ සක්‍රිය ණයගැති ශේෂයන් පමණක් ඇතුළත්වේ. එබැවින් තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් උපුටාගත් බිල් කිරීම් වාර්තාවේ ශේෂය හා ලෙජර ශේෂය අතර වෙනසට ප්‍රධාන වශයෙන් අවසාන ණයගැතියන් හේතු වී ඇත. කෙසේ වුවද ණයගැතියන් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය මූල්‍ය ප්‍රකාශනවල ඇත.

(ඇ) රැස් කිරීම් පාලන ලෙජර් ගිණුමේ පවතින රු. 4,073,824,173 ක් හා රු. 129,863,150 ක් වු පිළිවෙළින් හර හා බැර ශේෂයන් සඳහා සැසඳීමක් කර නොතිබුණු අතර එම ශේෂයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබීම.

සාමාන්‍ය සැපයුම් බිල් කිරීම් අවසන් දිනය හා මූල්‍ය ගිණුම් වර්ෂයේ අවසන් දිනය අතර පවතින විෂමතාවය හේතුවෙන් මෙම වෙනස්කම් පැන නගී. එබැවින් සාමාන්‍ය සැපයුම් බිල් කිරීම් දිනය හා මූල්‍ය වර්ෂයේ අවසන් දිනය සමාන කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

(ඈ) රු. 79,512,030 ක් වු අවිනිශ්චිත ගිණුමේ ශේෂයෙන් 66% කට අදාලව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබීම හා රු.70,306,494 ක අගයක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක් පැවතීම

හදුනාගත් පාරිභෝගික ගෙවීම් අදාළ පාරිභෝගික ගිණුම් වලට බැර කිරීම සඳහා අඛණ්ඩ වෑයමක් දරා ඇත. ඉහත දැක්වෙන බොහෝ ශේෂයන් පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබෙන තෙක් ලංකා විදුලිබල මණ්ඩලයට හඳුනා ගත නොහැකිය. මෙම ශේෂයන් නිරන්තරයෙන් දැඩි අධීක්ෂණයට යටත්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

දැනගැනීම සඳහා

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

දැනගැනීම සඳහා

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

දැනගැනීම සඳහා

**ඉංජිනේරු. විජිත හේරත්**
සභාපති
ලංකා විදුලිබල මණ්ඩලය

**ඉංජිනේරු. ඩී.ඩී.කේ. කරුණාරත්න**
සාමාන්‍යාධිකාරී
ලංකා විදුලිබල මණ්ඩලය

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } පීඕඊ/සී/සීඊබී/එෆ්ඒ/1/19/14 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ඔක්තෝබර් 08 දින

සභාපති

ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මු වා ප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල වීම

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) තැපැල් කාර්යාල කවුන්ටර් ගෙවීම හා තැපැල් කාර්යාල කොමිස් මුදලට අදාළ ණය හිමියන්ට එරෙහිව ණයගැතියන්ගේ රු.30,609,836 ක ශේෂය මණ්ඩලය විසින් හිලව් කර තිබුණි. ඒ හේතුවෙන් විවිධ ණය ගැතියන් හා ණය හිමි ශේෂය සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) හරිත විදුලිබල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘතිය සඳහා ණය විය පැහැදම් මුදල වූ රු.1,262,503,405 ක් සුළං විදුලි බල ව්‍යාපෘතියේ වියපැහැදමක් ලෙස සටහන් අංක 24.2.1 හි දක්වා තිබුණි.

(iii) ලබාගත් රු.බිලියන 83 ක් සඳහා ණය සැකසුම් ගාස්තු ලෙස ගෙවා තිබුණු රු.මිලියන 25 ක මුදල මූල්‍ය පිරිවැය ලෙස ඉදිරිපත් කරනු වෙනුවට පරිපාලන වියදම් යටතේ වෙනත් වියදම් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 2 - ඉන්වෙන්ට්‍රි සහ ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

ලංකා විදුලි බල මණ්ඩලය විසින් එහි ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් වෙනුවෙන් ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදුකාර්ය පිරිවැය අගය කිරීම සඳහා ඉහත ප්‍රමිතිවල විධිවිධාන ප්‍රකාරව සත්‍ය පිරිවැය යොදා ගනු වෙනුවට ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එකතුව රු.6,409,494,526 ක් වූ හිතකර මිල විචලනය සහ ශ්‍රම හා පොදු කාර්ය රේට විචලනයන් සහ ඒ නිසා ඇති වූ අහිත කර ගබඩා මිල විචලනය රු.2,428,128,229 ක් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ ඉහළ මූල්‍යමය සම්බන්ධය හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම්, වගකීම් සහ ස්කන්ධය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබුණි. කෙසේ වුවද, එම ප්‍රාග්ධන කාර්යයන්ට අදාළ තොරතුරු නොමැතිවීම හේතුවෙන් එයින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා දෝෂ

ලංකා විදුලිබල මණ්ඩලය විසින් අඛණ්ඩව තවදුරටත් භාවිතයට ගනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද, ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය ගිණුම්කරණ ප්‍රතිපත්තිවල දක්වා ඇති පරිදි සමාලෝචනය කර නොතිබුණි. උදාහරණයක් වශයෙන් පිරිවැය රු.32,241,176,427 ක් හා රු.3,918,235,311 ක් වූ පිළිවෙලින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද බලාගාර 4 ක් සහ මෝටර් වාහන 1,683 ක සංඛ්‍යාවක් තථ්‍ය ජීව කාලය ඇස්තමේන්තු කිරීමකින් තොරව තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

සම්ප්‍රේෂණ අංශයේ රු.172,019,335,924 ක් වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ භෞතිකව පරීක්ෂා කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලං ගි ප්‍ර 27 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්

මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල (EPF) මඟින් මූල්‍ය උපකරණවල ආයෝජනය කර තිබූ රු.2,312,756,993 ක් එම මූල්‍ය උපකරණවල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැක සහිතය. ලංකා විදුලිබල මණ්ඩලය එහි සේවක අර්ථසාධක අරමුදලේ පාලන බලය පැවැරුණු භාරකරු වන බැවින් අසම්භාව්‍යයන් සඳහා (තිබේ නම්) අවසාන වගකීම මණ්ඩලයට පැවරේ. කෙසේ වුවද, මෙම අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් හෝ හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු.3,535,799,151 ක හර ශේෂයක් (තොග ඌනතාවය) රු.90,343,073 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව තොග ගැලපීම් ගිණුමේ පැවතුණි.

(ආ) අංක 10/2434/423/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ලක් විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු.159,184,187,965 ක ණය මුදල සහ ඒ සඳහා පොලිය ලංකා විදුලිබල මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතුය. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ණය ප්‍රදාන බැංකුවට එම ණය සඳහා පොලිය වශයෙන් 2018 දෙසැම්බර් 31 දක්වා රු.25,247,801,891 ක් ගෙවා තිබුණද, ලංකා විදුලි බල මණ්ඩලය විසින් ඉහත ගෙවීම් සිදුකර නොතිබූ අතර ඒ සඳහා ගිණුම්වල ප්‍රතිපාදනයන් හෝ සිදුකර නොතිබුණි.

පොලිය සඳහා ප්‍රතිපාදනය නොකිරීම හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට රඳවාගත් ඉපැයුම් රු.25,247,801,891 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) අංක පීඊඩී/1/සීඊඩී/2/11(ස) දරන ලිපිය මත භාණ්ඩාගාරයේ ඉල්ලීම පරිදි 2019 ඔක්තෝබර් 17 දින හිමිකම් සඳහා වාර්තා කර ඇති රු.3,556,442,931 ක මුදල සමාලෝචිත වර්ෂයේ පොලී වියදම වශයෙන් ආදායම් ප්‍රකාශනයට අයකර ඇත. තවද, මෙම මුදල ලංවිම විසින් වැය දරා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද රු.41,816,415 ක් වූ වියදම් ප්‍රතිපූර්ණය කිරීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ලංවිම විසින් 2013 වර්ෂයට පෙර කාලපරිච්ඡේදය සඳහා රජයේ ආයතනවලට විදුලි ජනක යන්ත්‍ර, විදුලි සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම යන කාර්යයන් සිදුකිරීම ඒවායේ ඉන්වොයිස් වටිනාකමට කාර්යයන් පදනම් කර ගෙන ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැයට අගය කර ඒ අනුව ගිණුම්ගත කර තිබුණි. ඒහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ලැබිය යුතු මුදල් හා රඳවාගත් ඉපැයුම් රු.66,987,761 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු.බිලියන 5 කින් රු.මිලියන 500 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ ගාස්තු ගෙවීමක් ලෙස වර්ගීකරණය කර ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබූ අතර රු.බිලියන 1 ක් සඳහා පෙර වර්ෂ ගැලපීමක් සිදුකර තිබුණි. ඉතිරි රු.බිලියන 3.5 ක මුදල හිමිකම් ප්‍රකාශනයට අයකරනු වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ණයගැතියන් ලෙස දක්වා තිබුණි. කෙසේ වුවද, මහා භාණ්ඩාගාරයෙන් කිසිදු කළමනාකරණ සේවාවක් ලංවිම විසින් ලබා ගෙන නොතිබුණි. එබැවින් වර්ෂය සඳහා පාඩුව රු.මිලියන 500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) උප ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.2,495,574,443 ක්වූ පොලිය ලංවිම විසින් ගෙවා නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයක් හෝ කර නොතිබුණි.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE
NAOSL

(උෟ) භාණ්ඩාගාරයෙන් සියයට 10 ක ලාභාංශ බදු ලෙස නම් කරන ලද රු.4,200,000 ක මුදලක් මූලස්ථාන කාර්යාල පොත්වල හඳුනානොගත් වෙනත් ණයගැතියෙකු ලෙස පවතින අතර මෙම මුදල සඳහා ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

(එ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ප්‍රමාද පොලී රු.31,119,302 ක මුදලක් ගිණුම් පොත්වලින් අත්හැරී තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා පාඩුව අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) රු.734,574,801 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් බෙදාහැරීම් අංශ 1 හි වත්කම්වලට මාරු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුණි. එම වත්කම්වලට අදාළ ක්ෂය ආදායම් ප්‍රකාශනයට අයකර නොතිබුණි.

(ඔ) මොරගහකන්ද විදුලි බල පිරියතෙන් විදුලි බල මිලදී ගැනුම් සඳහා ගෙවිය යුතු රු.128,264,040 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ගිණුම්පොත්වලින් අත්හැරී තිබුණි. එබැවින් වර්ෂය සඳහා පාඩුව එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) 2012 වර්ෂයේ නිම කරන ලද ඉහළ කොත්මලේ විදුලි බල පිරියතට අදාළ කෙරීගෙන යන වැඩ රු.944,030,864 ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා මාරු කර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙලින් රු.26,972,310 කින් හා රු.161,833,862 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2014 වර්ෂයේදී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු විදුලි බල ව්‍යාපෘතියට අදාළ කෙරීගෙන යන වැඩ රු.603,573,159 ක මුදලක් ස්ථාවර වත්කම්වලට මාරුකර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය හා රඳවාගත් ඉපැයුම් පිළිවෙලින් රු.20,119,105 කින් හා රු.100,595,526 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) අන්තර් අංශ ශේෂයන්ට හිලව් කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට රු.367,390,040 ක බැර ශේෂයක් අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පැවතුණි.

### 1.2.3 නොසැසඳූ වෙනස්කම්

(අ) 2019 දෙසැම්බර් 31 දිනට ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වෙන ශේෂය හා එදිනට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දැක්වෙන අනුරූපී ශේෂය අතර රු.764,717,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් පරිදි දක්වා තිබුණි.

*"2013 සැප්තැම්බර් 30 දින භාණ්ඩාගාර ලේකම් විසින් සභාපතිත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණය අනුව, 2013 අප්‍රේල් 20 දින සිට බලපැවැත්වෙන පරිදි කල් ඉක්ම වූ ඉන්වොයිස් වටිනාකම (ණය කාල පරිච්ඡේදයෙන් බැහැරව) මත පොලියක් ගෙවීමට තීරණය කරන ලදී. කෙසේ වුවද, රු.753,610,829 ක් වූ ප්‍රමාද වූ පොලී ගෙවීම ලංවිම විසින් 2013 අප්‍රේල් 20 දිනට පෙර මිලදී ගත් ඉන්ධන සඳහා අදාළ වේ. එබැවින් ලංවිම විසින් මේ සඳහා වගකිව යුතු නොවන හෙයින් මෙම වෙනස සඳහා සැසඳීමක් අවශ්‍ය නොවේ."*

කෙසේ වුවද, මෙම කරුණ 2013 වර්ෂයේ සිට අඛණ්ඩව විගණන වාර්තාවල නැවත නැවත දක්වා තිබුණද, මෙම මතභේදය 2019 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) බිල් කිරීමේ පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂයන් අත්හැරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට 01, 02, 03 හා 04 යන බෙදාහැරීම් අංශවල බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග වෙළඳ ණයගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී මුදල අතර එකතුව රු.31,813,455 ක නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, 2012 වර්ෂයේ සිට රු.423,764.624 ක මුදලක් හඳුනා නොගත් ලෙස පැවතුණි.

(ඇ) 2005 ජූලි 26 දින ස.මු.ක. (බෙ.අ.1) විසින් නිකුත් කරන ලද උපදෙස් ලිපිය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට හර හා බැර ලෙස රැස්කිරීම් පාලන ලෙජර් ගිණුමේ පවතින රු.4,073,824,173 ක හා රු.129,863,150 ක ශේෂය සඳහා සැසඳීමක් කර නොතිබුණු අතර එම ශේෂයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් රැස්කිරීම් පාලන ගිණුමේ පවතින ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඈ) අවිනිශ්චිත ශේෂයට අදාළ රු.79,512,030 ක මුළු වටිනාකමින් සියයට 66 ක් සඳහා හා නිරවුල් කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක් පැවති රු.70,306,494 කට අදාළව කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලංවිප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතාකරණ ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන ඇතුලත් වේ.

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

- තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම දැක්වෙන ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට මණ්ඩලය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- මෙම වාර්තාවේ ඡේද අංක 1.2.1(ආ), (ඇ), (ඈ), (ඉ), 1.2.2(අ), (ආ), (ඈ), (ඉ), (ඊ), (උ), 1.2.3 (අ), (ආ) දැක්වෙන විගණන නිරීක්ෂණ හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව,
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල කර්තව්‍ය හා කාර්යයන්වලට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව,

(අ) අංක CA/WRIT/193/2015 දරන නඩුව යටතේ ලබාදෙන ලද අධිකරණ තීන්දුව ප්‍රකාරව 2014 නොවැම්බර් 27 දිනැති අංක 2014/GM/46/Pers දරන චක්‍රලේඛය නීති විරෝධී වූ අතර එහෙත් එම චක්‍රලේඛය මත මණ්ඩලය විසින් වැටුප් ගෙවීම අඛණ්ඩව සිදුකරයි.

(ආ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලංවිම කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ අන්දමේ සේවක දීමනා ගෙවා තිබුණි.2019 වර්ෂයේ හා 2018 වර්ෂයේ පිළිවෙලින් එකතුව රු.මිලියන 1,712 ක් හා රු.මිලියන 1,873 ක් වූ එවැනි දීමනා ගෙවා තිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

(ඇ) 2007 සැප්තැම්බර් 13 දින වැටුප් සංශෝධනයේදී හා 2015 මැයි 20 දින සාමූහික ගිවිසුම සැලකිල්ලට ගැනීමේදී උපයන විට ගෙවීම් බදු බැරකම (PAYE) සේවකයන් වෙත මාරු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයන් ගෙන තිබුණි. කෙසේ වුවද, අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත තීරණයන්ට හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 3/2016 දරන චක්‍රලේඛයට පටහැනිව, 2010 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුළ අදාල සේවකයන්ගේ වැටුප්වලින් අඩුකිරීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි අරමුදල්වලින් රු.4,919,165,644 ක් වූ උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ ගෙවන ලද මුදල රු.709,110,273 ක් විය.

(ඈ) 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරන ගැසට් නිවේදනයේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම එක් එක් සේවකයාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගත යුතුය. කෙසේ වුවද, නිල නිවාස, මහල් නිවාස සැපයීම හා පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන ආදිය ලබා දීම වැනි මුදල් නොවන ප්‍රතිලාභ මෙම කාර්යය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඉ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා වූ පොලී අනුපාතයකට මෝටර් වාහන ණය ලබාදීම වෙනුවට ලංවිම විසින් සියයට 4.2 ක පොලී අනුපාතයකට මෙම වාහන ණය ලබා දී තිබුණි. තවද, ලංකා විදුලි බල මණ්ඩලය බරපතල ද්‍රවශීලතා ගැටලුවලට මුහුණදී තිබුණද, කිසිදු පාලනයකින් තොරව සේවක ණය ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස මණ්ඩලය ක්‍රියාකර ඇති බව,

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

| නීතිය/ විධානය සඳහා යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28(3) වගන්තිය | ලංවීම විසින් එහි පාරිභෝගික තැන්පතුවලට පනතේ දක්වා ඇති පරිදි පොලියක් ගෙවා නොතිබූ අතර, 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද රේටය පදනම් කරගෙන විගණනය විසින් කරන ලද ගණනය කිරීම් අනුව, ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු.මිලියන 1,592 ක් වූ අතර, 2019 දෙසැම්බර් 31 දිනට නොගෙවූ සමුච්චිත පොලිය රු.මිලියන 5,118 ක් විය. |
| (ආ)2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) පනතේ 43 වගන්තියේ 4 ඇ (ii) උප වගන්තිය | පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව, ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා ලංවීම විසින් හදිසි විදුලිබල මිලදී ගැනුම් (රු.බිලියන 59.4 ක් වටිනා ගිවොපැ 2,165.51 ක්) සිදුකර තිබුණු අතර නියාමකගෙන් විදුලි ජනන බලපත්‍රය ලබාගැනීමෙන් තොරව එම පිරියතයන් මෙහෙයුම් කෙරේ. |
| (ඇ)1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත<br>46 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ (II) කොටසේ II (අ) සහ (ආ) වගන්ති. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් 1989 වර්ෂයේ සිට එක් එක් වර්ෂය අවසානයේදී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1 ක දායකත්වයක් ඉන්ෂුරන්ස් එස්ක්‍රෝ අරමුදලට මාරුකළ යුතු බව දක්වා තිබුණද, 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 8,996 ක් පමණක් එම අරමුදලේ ආයෝජනය කර තිබුණි. |
| (ඈ)රාජ්‍යව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පීඊඩී/12 චක්‍රලේඛයේ 9.4 වගන්තිය | 2008 වර්ෂයේ සිට රේඛීය අමාත්‍යාංශයට වරින්වර මුදාහරින ලද නිලධාරීන් 26 දෙනෙකු සඳහා වැටුප් හා අනෙකුත් ගෙවීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රු.49,138,383 ක මුදලක්, පීඊඩී 12 චක්‍රලේඛයේ 9.4 වගන්තියට පටහැනිව ගෙවා තිබුණු අතර එම මුදල 2020 සැප්තැම්බර් 30 දින වන විටත් ප්‍රතිපූර්ණය කර නොතිබුණි. |

## 3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 21,080 ක් වූ වෙළඳ ණයගැති ශේෂයෙන්, සාමාන්‍ය හා තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 3,322.2 ක ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු.මිලියන 1,840 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් අය කරගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) පහත සඳහන් එකතුව රු.2,635,007,475 ක් වූ විවිධ ණයගැති ශේෂ 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

| ණයගැතියාගේ නම | මුදල<br>රු. | විස්තරය |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය | 225,000,000 | මාර්ග ආලෝකකරණය හා නඩත්තුව සඳහා පිරිවැය අයකිරීම්. |
| රජයේ ආයතන සඳහා විදුලි සෝපාන, වායු සමීකරණ හා වෙනත් විදුලි ජනන යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ලැබිය යුතු | 120,653,322 | |
| ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ | 8,601,341 | |
| සීමාසහිත වුඩ් ගෑප් ගෑස් ටර්බයින් සමාගම | 8,264,352 | වෙස්ට් කෝස්ට් විදුලිබල පිරියත සඳහා ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම වෙනුවෙන් කරන ලද ගෙවීම්. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවළපිටිය ඒකාබද්ධ විදුලිබල පිරියත විවෘත කිරීමේ උත්සවයට කරන ලද ගෙවීම්. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා විදුලිබල සංවර්ධකයින්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගාස්තු ගැලපීම් ගෙවීම. |
| සීමාසහිත ඒර්එස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,961,445 | මිල වෙනස්කම් පිළිබඳ ගෙවීම් මත අයකර ගත යුතු මුදල |
| සීමාසහිත නොදර්න් පවර් (පුද්ගලික) සමාගම | 358,739 | 2011 නිමකරන ලද වැඩිදියුණු කිරීම් කාර්යයකින් අයකර ගත යුතු මුදල. |
| එකතුව | 2,635,007,475 | |

# විගණකාධිපති වාර්තාව
# ලංවිම මූල්‍ය ප්‍රකාශන (ඉතිරි කොටස)

(ඇ) ගල් අඟුරු ඌනතාවයක් සඳහා ලංකා කෝල් සමාගමෙන් ලැබිය යුතු රු.714,965,435 ක මුදලක් කිසිදු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි

(ඈ) එකතුව රු.4,947,283,160 ක් වූ පහත සඳහන් බැර ශේෂයන් 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමෙන් තොරව දිගුකාලයක් පැවතුණි.

| **ණය හිමියාගේ නම** | **මුදල රු.** |
|---|---|
| රේගුව | 1,065,828 |
| චයිනා මැෂිනරි ඉන්ජියරින් කෝපරේෂන් | 3,596,324,467 |
| ගෙවිය යුතු ලාභාංශ බදු | 1,270,766,413 |
| ප්‍රාග්ධන වියදම | 10,928,756 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතියේ උපචිත වියදම් ඇතුළු විවිධ ණය හිමියන් | 68,197,696 |
| එකතුව | 4,947,283,160 |

(ඉ) වත්කම් කළමනාකරණ අංශයේ වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දැක්වෙන රු.151,421,219 ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. එම මුදලින් රු.142,477,285 ක මුදලක් රජයේ ආයතනවලින් අයකර ගත යුතු අතර ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගනුදෙනුවල ආරම්භක අවධියේදී අයකරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.3,371,599,434 ක මුදලක් සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් ලෙස පැවතුණි.

(උ) 2019 ඔක්තෝබර් 05 දිනට ගල් අඟුරු තොග ඌනතාවය ලෙස රු.95,211,376 ක් වටිනා මෙට්‍රික් ටොන් 4,952.85 ක ප්‍රමාණයක් හඳුනා ගෙන තිබුණද, සමීක්ෂණ මණ්ඩල කණ්ඩායම විසින් භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද, රු.456,197,162 ක් වටිනා මෙට්‍රික් ටොන් 28,006.66 ක ප්‍රමාණයක් ගල් අඟුරු තොගයේ අතිරික්තය ලෙස 2019 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට තිබෙන ගල් අඟුරු තොග ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඌ) ලංකා විදුලි බල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට විදුලි බලය විකිණීම හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදුකර තිබුණද, එම ආයතනයන් දෙක සමඟ සරලව මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා එම පාර්ශවයන් දෙක සමඟ විකුණුම් හා මිලදී ගැනුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(එ) කාලීනව අරමුදල් උපයෝජනය නොකිරීම හේතුවෙන් ලංකා විදුලි බල මණ්ඩලයේ විදේශ අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙනු ලබන ණයවලින් බැඳීම් ගාස්තු ලෙස 2019 වර්ෂයේදී රු.134,447,792 ක මුදලක් ණය නියෝජිතායතනය විසින් අයකර ගෙන තිබුණි. කෙසේ වුවද, ගණනය කිරීම් ලබාගැනීමට නොහැකි වූ බැවින් එම බැඳීම් ගාස්තුවල නිරවද්‍යතාවය පරීක්ෂා කළ නොහැකි විය.

(ඒ) 2018-2037 දිගුකාලීන විදුලි උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, තාප විදුලි බලය මෙගාවොට් 370 කින් හා පුනර්ජනනීය බලශක්ති මෙගාවොට් 287 කින් සමන්විතව මෙගාවොට් 657 ක නව විදුලි බල උත්පාදනයක් ජාතික පද්ධතියට එකතු කළ යුතුය. කෙසේ වුවද, සැලැස්මේ නොමැති මෙගාවොට් 222 ක තාප විදුලිබල ප්‍රමාණයක් හා මෙගාවොට් 25.25 ක පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණයක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ පද්ධතියට එකතු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.බිලියන 22.2 ක් වටිනා ගිවොපැ 735 ක ප්‍රමාණයක් හදිසි විදුලි බලය මිලදී ගැනීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණි.

(ඔ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ, 2014 වර්ෂයේදී හඳුනාගන්නා ලද රු.39,551,696 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 අප්‍රේල් මාසයේදී විශේෂ විමර්ශනයක් සිදුකරන ලදි. කෙසේ වුවද, මුළු ඌනතාවය වන රු.39,551,696 කින් රු.2,510,056 ක ඌනතා මුදල සඳහා වගකිව යුතු නිලධාරියාට එරෙහිව මෙම වාර්තාවේ දිනය දක්වා කිසිදු විනය පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. තවද, අනෙක් නිලධාරියාට එරෙහිව මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ නඩුවක් (නඩු අංකය බී/1164/15) ගොනුකර තිබුණි. තවද, අධිකරණ නඩුව සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඕ) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාල පරිච්ඡේදය තුළදී වත්කම් කළමනාකරණ අංශයේ (විදුලිබල පිරියත) සිදුවූ රු.3,674,861 ක තොග ඌනතාවන් සඳහා විධිමත් විමර්ශනයන් අවසන් කර තිබුණද, ඒ සඳහා වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, ඉහත කී වංචාවට පෙර ලංකා විදුලි බල මණ්ඩලයේ වෙනත් කාර්යාලයක එම සේවකයා විසින්ම වංචාවක් සිදුකර තිබූ අතර එම වංචාවේ වටිනාකම ලෙස රු.99,155 ක් පමණක් අයකර ගැනීමෙන් පසු ඔහුගේ රාජකාරිය අවසන් කර තිබුණි.

(ක) වටිනාකම රු.3,789,893 ක්වූ තොග ඌනතාවය සඳහා විමර්ශනය කිරීමට පත්කළ කමිටුවේ නිර්දේශය පරිදි පාඩුව අයකර ගැනීමෙන් තොරව ඒ සඳහා වගකිව යුතු වූ නිලධාරියාට 2011 ඔක්තෝබර් 15 දින විශ්‍රාම යාමට ඉඩ සලස්වා තිබුණි. තවද, කිසිදු නිවැරදි කිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ඉහත ප්‍රමාණාත්මක මුදල ගිණුම් පොත්පත්වල පැවතුණි. පැහැර හැරීම සිදුකළ තැනැත්තාට විශ්‍රාම යාමට ඉඩ ලබා දුන් නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව මෙම මුදල කපා හැරීම සඳහා මණ්ඩලය ක්‍රියා කරමින් ඇත.



**ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න**
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කල මතය

දැනගැනීම සඳහා

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමුවාප්‍ර) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවීම.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) මණ්ඩලය විසින් විවිධ ණයගැතියන් ශේෂය වූ රු.30,609,836 ක් ණය හිමියන්ට එරෙහිව හිලව් කර තිබීම.

ප්‍රමාද දෝෂයකින් වූ සටහන 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(ii) හරිත විදුලිබල සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ලාබදුන් ණය රු.1,262,503,405 ක මුදල

ප්‍රමාද දෝෂයකින් වූ සටහන 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(iii) රු. බිලියන 83ක් වූ ලබාගත් ණය සඳහා ණය සැකසුම් ගාස්තු වෙනුවෙන් ගෙවන ලද රු. මිලියන 25ක මුදල, මූල්‍ය පිරිවැය ලෙස දක්වනු වෙනුවට පරිපාලන වියදම් යටතේ වෙනත් වියදම් ලෙස ඉදිරිපත් කර තිබීම.

වියදම් වර්ගීකරණය නිවැරදි කර ඇත.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 2 - තොග සහ ශ්‍රීලංගිප 16 - දේපල, පිරියත හා උපකරණ

ලංවිම විසින් ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැය අගය කිරීම් සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනු ලැබීම.

ශ්‍රී ලං ගි ප්‍ර 2 හි 21 ඡේදය ප්‍රකාරව තොග අගය කිරීම සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය නිර්දේශ කෙරේ. ඒ අනුව තොග, කෙරීගෙන යන වැඩ හා දේපල,පිරියත හා උපකරණ අගය කිරීම සඳහා සත්‍ය පිරිවැය ක්‍රමය යොදා ගැනීමේ ප්‍රායෝගික අපහසුතාවය හේතුවෙන් ලංවිම විසින් ප්‍රමිත මිල යොදා ගනු ලැබේ. තොග පිළිබඳ ප්‍රමිත මිල තීරණය කිරීම සඳහා පත්කරන ලද කමිටුව, තොග වල සත්‍ය මිල ගණන් වලට ඉතා ආසන්නව නිරවද්‍ය හා සාධාරණ තක්සේරුවක් නිශ්චය කර ගැනීම සඳහා දුෂ්කර කාර්යයන් සිදුකරන ලදී. කෙසේ වුව ද, තාක්ෂණික සංකීර්ණතාව සහ විශාල තොග පරිමාව හේතුවෙන් සත්‍ය මිල හා ප්‍රමිත මිල අතර පරතරයක් පවතී. ඒකාබද්ධ ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දුන් පසු මෙම කරුණ විසදෙනු ඇත.

ප්‍රමිත මිල ගණන් හා සත්‍ය මිල ගණන් අතර පරතරය අවම කිරීම සඳහා ලංවිම විසින් පහත සඳහන් කාර්යයන් ආරම්භ කර ඇත.

- බෙදා හැරීම් අංශ 4 (DD4) හා බෙදා හැරීම් අංශ 3 (DD3) ශ්‍රම අනුපාත විචලනය 2019 වර්ෂයේ ගිණුම් වලින් ඉවත් කර ඇත. 2020 වර්ෂයේ දී අනෙක් අංශ දෙක සඳහා ද එසේ සිදු කළ හැක.
- තොග අගය කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශය පරිදි, තොග අගය කිරීම සඳහා බර තැබූ සාමාන්‍ය මිළ ක්‍රමය අනුගමනය කිරීමත් සමඟ මූල්‍ය ප්‍රකාශනවල ද්‍රව්‍ය මිල විචලනයන් හි බලපෑම ඉවත් කිරීමට හැකිවනු ඇත. දැනට වැඩිදියුණු කරමින් පවතින ව්‍යවසායකත්ව සැලසුම් පද්ධතිය (ERP System) තුළ මෙය විසඳනු ලබන බැවින් ERP ක්‍රමය ක්‍රියාත්මක වූ වහාම මෙම ගැටළුව විසදෙනු ඇත.
- කෙරීගෙන යන වැඩ වලින් මාරු කරන ලද බෙදා හැරීම් අංශ වලට අයත් වත්කම් හැරුණු විට අනෙක් සියළුම දේපල, පිරියත සහ උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ) ශ්‍රීලංගිප්‍ර හි නිර්දේශයන්ට අනුකූල වන පරිදි සත්‍ය පිරිවැයට අගය කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලං ගි ප්‍ර 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම හා දෝෂ

ලංවිම විසින් අඛණ්ඩව භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය

(i) පිරිවැය රු. 3,918,235,311ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන 1,683 ක සංඛ්‍යාව

මෝටර් වාහන වල ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳව අදාල අංශවලින් දත්ත එක්තු කර ඇති අතර ඒ පිළිබඳ විශ්ලේෂණයක් සිදු කරමින් පවතී. සංශෝධිත ඵලදායී ජීවකාලය 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීම සඳහා නිර්දේශ කිරීමට හැකිවේ.

(ii) රු.32,241,176,427ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද විදුලි බලාගාර 04

ජනන අංශයේ විදුලිබල පිරියත ලංවීමට අනන්‍ය වූ හා සංකීර්ණ වූ ස්වභාවයක් ගනී. විදුලි ජනන යන්ත්‍රවල ඵලදායී ජීව කාලය මුල් නිෂ්පාදකයාගේ නිර්දේශය මත පදනම්ව නිගමනය කෙරේ. විදුලිබල පිරියතවල ඵලදායී

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

ජීව කාලය නැවත බැලීම සඳහා කමිටුවක් පත් කරනු ලැබේ. ලංවිම විසින් විදුලිබල පිරියත හා විදුලි ජනන යන්ත්‍ර හොඳින් නඩත්තු කරනු ලබන බැවින් නිෂ්පාදකයාගේ (OEM) අපේක්ෂිත ජීව කාලයෙන් ඔබ්බට එලදායී ජීව කාලය ක්‍රියාත්මක වේ.

(ඈ) ශ්‍රී ලං ගි ප්‍ර 16 දේපල, පිරියත හා උපකරණ

සම්ප්‍රේෂණ අංශයේ රු.172,019,335,924 ක් වු ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබීම.

සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් වල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් වාර්ෂික භෞතික සත්‍යාපනයක් සිදුකිරීම සඳහා අදාල උපදෙස් නිකුත් කර ඇත.

(ඉ) ශ්‍රී ලං ගි ප්‍ර 27- ප්‍රතිපාදන,අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්

මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල (EPF) විසින් ආයෝජනය කරන ලද රු. 2,312,756,993ක්, එම මුල්‍ය උපකරණ වල නොපැවැත්ම හේතුවෙන් අයකර ගැනීම සැක සහිතය.

වාර්තාකරණ අස්ථිත්වයන් සඳහා සංකල්පීය රාමුවට 3.10 ඡේදය අනුව, වාර්තාකරණ අස්ථිත්වයන් යනු මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම සඳහා අවශ්‍ය හෝ තෝරා ගන්නා ආයතනයකි. ඒ අනුව ලංවිම අර්ථසාධක අරමුදල යනු අර්ථසාධක අරමුදල් රීති (ගැසට් අංක 1321/18-2003-12.31) මඟින් කළමනාකරණය කෙරෙන වෙනත් අස්ථිත්වයකි. අරමුදලේ වෙනම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම අර්ථසාධක අරමුදල් රීතිවලින් අවශ්‍ය වේ.

තව ද අර්ථසාධක අරමුදල් රීතිවල 21(ii) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ එක් එක් මුල්‍ය වර්ෂය අවසානයේදී කමිටුව විසින් අරමුදලේ ගිණුම් සකස් කර එය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එම අරමුදලේ ගිණුම් පිළියෙළ කිරීමේ දී අරමුදලේ විගණනකරුවන්ගේ උපදෙස් සමඟ කමිටුව විසින් එවැනි සංචිත නිර්මාණය කළ හැකි අතර සුදුසු යැයි සිතිය හැකි ප්‍රතිපාදන ලබා දිය හැකිය.

එබැවින් අසම්භාව්‍යයන් (තිබේ නම්) සඳහා අවසාන වගකීම අරමුදල සතුවේ. ඒ අනුව මෙම අසම්භාව්‍යයන් සම්බන්ධයෙන් අරමුදලේ මුල්‍ය ප්‍රකාශවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

## 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රු. 3,535,799,151ක හර ශේෂයක් (තොග ඌනතාවය) හා රු.90,343,073 බැර ශේෂයක් (තොග අතිරික්තය) වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව තොග ගැලපුම් ගිණුමේ පැවතීම.

2020 වර්ෂයේ දී සිදුකළ හැකි අවශ්‍ය ගිණුම් සටහන් සිදු කිරීමට අදාළ අංශ විසින් කටයුතු කරන අතර නීතිමය ක්‍රියාමාර්ග සම්පූර්ණ කිරීමෙන් පසු ඉතිරි හිඟ ශේෂයන් නිරවුල් කරනු ලැබේ.

(ආ) අංක 10/2434/423/034 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, ලක්විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබාගත් රු. 159,184,187,965 ක ණය මුදල සහ ඒ සඳහා පොළිය ලංවිම විසින් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතු වීම.

ලංවිම ද්‍රවශීලතා තත්ත්වයේ ප්‍රමාණාත්මක බව සැලකිල්ලට ගනිමින් 2018 වර්ෂය දක්වා ආපසු ගෙවීම මහා භාණ්ඩාගාරය විසින් අවශෝෂණය කරගෙන ඇත. කෙසේ වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය පරිදි, 2019 කාල පරිච්ඡේදය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද රු. 3,556,442,931.30 ක් වු පොළී ගෙවීම ලංවිම පොත්වල ගැලපීම් කරන ලදී. තව ද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට යටත්ව 2020 වර්ෂයේ සිට ගැලපීම් සිදුකළ යුතුවේ.

(ඇ) භාණ්ඩාගාරය විසින් හිමිකම් සඳහා මාරු කරන ලද මුදල් සඳහා ලැබුණු රු.3,556,442,931ක මුදල පොළී වියදම් වශයෙන් ආදායම් ප්‍රකාශනයට අය කර තිබීම.

ශ්‍රී ලං ගි ප්‍ර 23 (ණය ගැනීම් පිරිවැය) ට අනුව, වත්කම් වාණිජකරණයෙන් පසුව දරන ලද රු.3,556,442,931.30 ක පොළී වියදම ප්‍රාග්ධනිත කළ නොහැක. ඒ අනුව 2019 කාල පරිච්ඡේදය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද පොළිය ආදායම් ප්‍රකාශනයට අය කරන ලදී. එබැවින් ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව මණ්ඩලයේ පාඩුව වැඩියෙන් දැක්වීමක් නොමැත.

(ඈ) ලංවිම විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් ලංවිම විසින් දරන ලද රු. 41,816,475 ක් වු වියදම් ලැබිය යුතු මුදල් ලෙස සැලකීමෙන් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ වියදම් ලෙස සලකා තිබීම.

අංක 1321/18 දරන 2003 දෙසැම්බර් 31 දිනැති සාමාන්‍ය ගැසට් නිවේදනය යටතේ ප්‍රසිද්ධ කරන ලද අර්ථ සාධක අරමුදල් රීති 20(1) වගන්තිය අනුව, ආයෝජන මිල දී ගැනීම සහ විකිණීම සඳහා සෘජුවම ආරෝපණය වන වියදම් ඇතුළුව අර්ථසාධක අරමුදල කළමනාකරණය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ වියදම් වරින් වර මණ්ඩලය විසින් තීරණය කරනු නොලැබුව හොත් හැර එය මණ්ඩලයේ වියදමක් වේ.

එබැවින් ලංවිම අර්ථසාධක අරමුදලට අදාළ වියදම්ක් වු රු.41,421,524.00 ක් ලංවිම මුල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීම ඉහත කී ලංවිම අර්ථසාධක අරමුදල් රීති වලට අනුකූලවීමකි. එබැවින් අර්ථසාධක අරමුදල් වියදම් ලැබිය යුතු ලෙස ලංවිම මුල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීම අවශ්‍ය නොවේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඉ) ලංවිම විසින් 2013 වර්ෂයට පෙර කාල පරිච්ඡේදය සඳහා රජයේ ආයතන වලට විදුලි ජනක යන්ත්‍ර, විදුලි සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම හා අලුත් වැඩියා කිරීම යන කාර්යයන්ට අදාලව ඉන්වොයිස් වටිනාකමට ගිණුම්ගත කරනු වෙනුවට පිරිවැයට අගය කර ඒ අනුව ගිණුම්ගත කර තිබීම.

2013 වර්ෂයට පෙර ණයගැතියන් ගිණුම්ගත කරනු ලැබුවේ මුදල් පදනම මත වන අතර කාර්යයන්හි සත්‍ය පිරිවැය ගනුදෙනුකරුගෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇත. විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල්, රෝහල් වලින් ලැබිය යුතු මුදල් හා ලංවිම සභාපතිගේ උපදෙස් මත ලංවිම විසින් සිදුකරන ලද කාර්යයන්ගෙන් ලැබිය යුතු මුදල් වලින් එම අය කර නොගත් ශේෂ සමන්විත වේ.

ඇස්තමේන්තු වටිනාකම මත පදනම්ව අයකරගත නොහැකි ශේෂ ඉන්වොයිස් කිරීම විචක්ෂණශීලි නොවන අතර ඒ සඳහා එකතු කළ අගය මත බදු ගෙවීම ලංවිම සඳහා අනවශ්‍ය පාඩුවක් වේ. එබැවින් අයකර ගත යුතු මුදල ලෙස සත්‍ය පිරිවැය දක්වා ඇත.

මෙම ගැටළුව කිහිප වතාවක් විගණකවරුන්ට දන්වා ඇති නමුත් එම ගැටලුවම නැවත නැවත දක්වා ඇත. එසේම ලංවිම විසින් එම අයකරගත නොහැකි ලැබිය යුතු ශේෂ සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් කර ඇත. 2013ට පෙර සත්‍ය පිරිවැය සහ ඇස්තමේන්තුගත වටිනාකම අතර විචලනයේ වර්තමාන අගය (2020 ජුනි 30 දිනට) රු. 53,052,302.10ක් වේ.

සටහන :- විගණකාධිපති වාර්තාවේ සඳහන්ව ඇති මුදල වන රු.66,978,761 වෙනුවට රු. 53,052,302.10 ලෙස නිවැරදි විය යුතුය.

(ඊ) 2016 වර්ෂයේ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු. බිලියන 5කින් රු. මිලියන 500ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කළමනාකරණ ගාස්තු ගෙවීමක් ලෙස වර්ගීකරණය කර ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබූ අතර රු. බිලියන 1ක් සඳහා පෙර වර්ෂ ගැලපීමක් සිදු කර තිබීම.

2019.10.16 දිනැති අංක පීඩීඊ/I/සීඊබී/2/11/(iii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව, මෙම ගෙවීම 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරයට"කළමනාකරණ ගාස්තු" ගෙවීමක් ලෙස සලකන ලද අතර 2017 වර්ෂයේ සිට වර්ෂ 10ක කාලයක් තුළ ක්‍රමක්ෂය කර ඇත.

ලංවිමහි විධිමත් ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය කටයුතු සම්පාදනය කිරීමට භාණ්ඩාගාරය විසින් මණ්ඩලය වෙත පහසුකම් සලසන බවද තවදුරටත් අවධාරණය කෙරේ.

(උ) උප ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව, මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු. 2,495,574,443 ක් වූ පොළිය ලංවිම විසින් ගෙවා නොතිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයක් හෝ කර නොතිබීම.

උප ණය ගිවිසුම් මත පොළිය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු කිරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් ලංකා විදුලිබල මණ්ඩලයට උපදෙසක් හෝ නියෝගයක් කර නොතිබුණි. එබැවින් මේ සම්බන්ධයෙන් ලංවිම විසින් කිසිදු ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඌ) භාණ්ඩාගාරයෙන් 10% ක ලාභාංශ බදු ලෙස නම් කරන ලද රු. 4,200,000 ක මුදලක් මුලස්ථාන කාර්යාල පොත්වල හඳුනා නොගෙන වෙනත් ණයගැතියකු ලෙස පැවතුණි.මෙම මුදල සඳහා ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොතිබීම.

2005/2006 වර්ෂය සඳහා රු. 42,000,000 ක දළ ලාභාංශ ගෙවීමේ දී සීමාසහිත ලංකා ට්‍රාන්ස්පෝමර්ස් විසින් අඩුකළ 10%ක ලාභාංශ බද්ද එම මුදලින් නියෝජනය වේ. මෙය 2020 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(එ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ප්‍රමාද පොළී රු.31,119,302 ක මුදලක් ගිණුම් පොත් වලින් අත්හැරී තිබීම.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාද පොළී සටහන් කිරීම සඳහා පියවර ගෙන ඇත.

(ඒ) රු.734,574,801 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් බෙදා හැරීම් අංශ 1හි වත්කම් වලට මාරු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතීම.

විගණන විමසුමේ දක්වා ඇති මුදලට වඩා රු. මිලියන 714 කින් උතුරු මැද පළාතේ ශේෂය වැඩිවන බැවින් ඉහත ශේෂය රු. මිලියන 1,448ක් ලෙස නිවැරදි විය යුතුය. කෙසේ වුවද ඉහත දිගු කාලීනව පැවති කෙරීගෙන යන වැඩ ශේෂයෙන් 25% ක් 2020 මුදල් වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ සඳහා දැනටමත් මාරු කර ඇති අතර ඉදිරිපත් කර ඇති වැඩ නිම කිරීම් වාර්තා මත පදනම්ව උතුරු පළාතේ කෙරීගෙන යන වැඩ ශේෂය දේපල, පිරියත හා උපකරණ වලට මාරු කිරීමට 2020 වර්ෂයේ දී කටයුතු කර ඇත.

සියළු පළාත් විසින් කෙරීගෙන යන වැඩ ශේෂය පිළිබඳ කාලීන සාමාලෝචනයක් හා අධීක්ෂණයක් සිදුකර ගෙන යන අතර එම ක්‍රියාවලියේදී නිම කරන ලද කාර්යයන් වැඩ නිමි අවස්ථාවේ දීම දේපල,පිරියත හා උපකරණ ගිණුමට මාරු කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඔ) මොරගහකන්ද විදුලිබල බලාගාරයෙන් විදුලිබල මිලදී ගැනුම් සඳහා ගෙවිය යුතු රු.128,264,040ක මුදල වර්ෂයේ ගිණුම් පොත් වලින් අත්හැරී තිබීම.

මොරගහකන්ද විදුලි බලාගාරයට අදාල සියළු හිඟ ඉන්වොයිසි 2020-07-31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ගිණුම් පොත්වලට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර  සියළු ඉන්වොයිසි කඩිනමින් සටහන් කිරීමට පියවර ගනු ලැබේ.

(ඕ) 2012 වර්ෂයේ ආරම්භ කරන ලද ඉහළ කොත්මලේ විදුලිබල පිරියතට අදාළ කෙරීගෙන යන වැඩ රු.944,030,864 ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා මාරු කර නොතිබීම.

මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර අදාල අංශ වලට ප්‍රථම වරට වත්කම් මාරු කිරීම 2014 වර්ෂයේ දී සිදු කරන ලදී. කෙසේ වුව ද ප්‍රථමවර වත්කම් මාරු කිරීමෙන් පසු රු. 944,030,864 ක් වු වියදම 2019-12-31 දින දක්වා කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිතව පැවතුණි. මෙම වියදම ප්‍රධාන වශයෙන් සේවක වියදම් බේරුම්කරණය, නෛතික ගාස්තු හා ඉඩම් අත්පත් කර ගැනීමේ වියදම් යනාදියෙන් සමන්විත වේ. ඉතිරි පිරිවැය ප්‍රවර්තන වර්ෂය ඇතුළත අදාල අංශවලට මාරු කිරීම සඳහා පියවර ගනු ලැබේ.

(ක) 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලද පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතියට අදාළ කෙරීගෙන යන වැඩ රු.603,573,159 ක මුදලක් ස්ථාවර වත්කම් වලට මාරු කර නොතිබීම.

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ දී අවසාන කරන ලද අතර අදාළ අංශවලට ප්‍රථම වරට වත්කම් මාරු කිරීම 2015 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුවද, ප්‍රථමවර ආරම්භක වත්කම් මාරු කිරීමෙන් පසු රු.603,573,159 ක්වු වියදම 2019.12.31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිතව පැවතුණි. ඉතිරි පිරිවැය ප්‍රවර්තන වර්ෂය ඇතුළත අදාළ අංශවලට මාරු කිරීම සඳහා පියවර ගනු ලැබේ.

(ග) අන්තර් අංශ ශේෂයන්ට හිලව් කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට රු. 367,390,040ක බැර ශේෂයක් අන්තර් අංශ ජංගම ගිණුමේ ශේෂය ලෙස පැවතීම.

ප්‍රවර්තන මූල්‍ය වර්ෂයේ දී මෙම ශේෂය නිවැරදි කර ඇත.

1.2.3 නොසැසඳු වෙනස්කම්

(අ) 2019 දෙසැම්බර් 31 දිනට ලංවිම මූල්‍ය ප්‍රකාශවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දැක්වෙන ශේෂය හා එදිනට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස දැක්වෙන අනුරූපී ශේෂය අතර රු.764,717,080 ක වෙනසක් නිරීක්ෂණය විය.

වාර්තා නොකළ ප්‍රමාද වු පොළී ගාස්තු ගිණුමේ සැසඳීමකින් පසුව 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) බිල් කිරීම් පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමහර ශේෂයන් අත්හැරීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට 01, 02, 03 හා 04 යන බෙදා හැරීම් අංශවල බිල් කිරීම් පද්ධතියේ දැක්වෙන තොග වෙළඳ ණයගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණවල දැක්වෙන අනුරූපී මුදල අතර රු.31,813,455 ක නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විම. තව ද 2012 වර්ෂයේ සිට රු. 423,764,624ක මුදලක් හඳුනා නොගත් ලෙස පැවතීම.

ලංවිම බිල්පත් පද්ධතියහි  ගනුදෙනු සටහන් කිරීමේ ක්‍රියාවලිය හා ගිණුම් වාර්තා සකස් කිරීමේ ක්‍රියාවලිය මත එම ශේෂයන් කිසිවිටකත් සමාන නොවේ. එසේ හෙයින් එම ශේෂයන් අතර සැසඳුම් ප්‍රකාශනයක් සකස් කරනු ලබයි.

තොග සැපයුම් ණයගැති ලෙජර ශේෂයන්හි සක්‍රිය ණයගැතියන් හා අවසාන ණයගැතියන් අඩංගු වේ. කෙසේ වුවද තොරතුරු තාක්ෂණ ශාඛවෙන් උපුටාගත් බිල් කිරීම් වාර්තාවේ සක්‍රිය ණයගැති ශේෂයන් පමණක් ඇතුළත්වේ. එබැවින් තොරතුරු තාක්ෂණ ශාඛාවෙන් උපුටාගත් බිල් කිරීම් වාර්තාවේ ශේෂය හා ලෙජර ශේෂය අතර වෙනසට ප්‍රධාන වශයෙන් අවසාන ණයගැතියන් හේතු වී ඇත.

(ඇ) රැස් කිරීම් පාලන ලෙජර් ගිණුමේ පවතින රු. 4,073,824,173 ක් හා රු.129,863,150ක් වු පිළිවෙළින් හර හා බැර ශේෂයන් සඳහා සැසඳීමක් කර නොතිබුණු අතර එම ශේෂයන් සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබීම.

සාමාන්‍ය සැපයුම් බිල් කිරීම් අවසන් දිනය හා  මූල්‍ය ගිණුම් වර්ෂයේ අවසන් දිනය අතර පවතින විෂමතාවය හේතුවෙන් මෙම වෙනස්කම් පැන නගී. එබැවින් සාමාන්‍ය සැපයුම් බිල් කිරීම් දිනය හා මූල්‍ය වර්ෂයේ අවසන් දිනය සමාන කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත.

(ඈ) රු.79,512,030 ක් වු අවිනිශ්චිත ගිණුමේ ශේෂයෙන් 66% කට අදාලව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබීම හා රු.70,306,494 ක අගයක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂයකට වැඩි කාලයක් පැවතීම.

හඳුනාගත් පාරිභෝගික ගෙවීම් අදාළ පාරිභෝගික ගිණුම් වලට බැර කිරීම සඳහා අඛණ්ඩ වෑයමක් දරා ඇත.  ඉහත දැක්වෙන බොහෝ ශේෂයන් පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබෙන තෙක් ලංකා විදුලිබල මණ්ඩලයට හඳුනා ගත නොහැකිය. මෙම ශේෂයන් නිරන්තරයෙන් දැඩි අධීක්ෂණයට යටත්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

දැනගැනීම සඳහා

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

දැනගැනීම සඳහා

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

- මණ්ඩලය එහි බලතල වලින් බැහැරව සිදුකර ඇති කාර්යයන්

(අ) අංක CA/WRIT/193/2015 දරණ නඩුව යටතේ ලබා දෙන ලද අධිකරණ තීන්දුව ප්‍රකාරව 2014 නොවැම්බර් 27 දිනැති අංක 2014/GM/46/Pers දරන චක්‍රෙල්ඛය නීති විරෝධි වු අතර එහෙත් එම චක්‍රෙල්ඛය මත මණ්ඩලය විසින් වැටුප් ගෙවීම අඛණ්ඩව සිදු කිරීම.

අධිකරණ නියෝගයට අනුකූල වන්නේ කෙසේ ද යන්න පිළිබඳව නීතිපතිවරයාගේ මතය ලබා දී ඇත. නීතිපතිවරයා විසින් ලබා දෙන ලද මතය ලංවිම විසින් අනුගමනය කරනු ලැබේ.

(ආ) 2007 නොවැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති අංක 39 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ලංවිම කාර්ය මණ්ඩලයට වරින්වර විවිධ අන්දමේ සේවක දීමනා ගෙවා තිබීම.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතට අනුව මණ්ඩලයේ බලතල 12 වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.

*12 (ක) වගන්තිය මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සම්පාදනය කිරීම*

*12 (න) වගන්තිය මණ්ඩලයේ මතය අනුව සිය ව්‍යාපාර නිසිලෙස කරගෙන යෑමට පහසුකම් සැලසීමට අවශ්‍ය සියලු දේ කිරීම.*

ඒ අනුව සඳහන් කරන ලද සොයා ගැනීම්, මණ්ඩලයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සේවකයන්ගේ චිත්ත ධෛර්යය නංවාලීමට මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දී ඇති ප්‍රතිලාභ සම්බන්ධයෙන් වේ.

තව ද පනත මඟින් මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීතිරීති සම්පාදනය කිරීමට මණ්ඩලයට බලය ලබා දෙයි.

(ඇ) 2007 දෙසැම්බර් 13 දින වැටුප් සංශෝධනයේ දී හා 2015 මැයි 20 දින සාමුහික ගිවිසුම සැලකිල්ලට ගැනීමේ දී උපයන විට ගෙවීම් බදු (PAYE) බැරකම සේවකයන් වෙත මාරු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගෙන තිබීම.

ලංවිම සේවකයන්ගේ  උපයන විට ගෙවීම් බදු බැරකම, එහි සේවකයන් බදු සඳහා වගකිව යුතු වු අවස්ථාවේ සිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම කරුණ අවස්ථා කිහිපයකදීම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත දන්වා ඇති අතර වෘත්තිය සමිති සමඟ සාකච්ඡාවක් ද පවත්වන ලදී.

කෙසේ වුව ද එය නැවත සේවකයන්ට හැරවීම සම්බන්ධයෙන් එකඟතාවයකට පැමිණියේ නැත. සාමුහික ගිවිසුම 2018-01-04 දින අත්සන් කරන ලද අතර එය 2018-04-23 දිනැති අංක 2068/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. එකඟ වු පාරිශ්‍රමකය වෙනස් කිසිම සාමුහික ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස පෙනී යන අතර එය තවදුරටත් අහිතකර නිතී ප්‍රතිවිපාක ඇතිකරයි.

(ඈ) 2001 මැයි 20 දිනැති අංක 1706/18 දරණ ගැසට් නිවේදනයේ දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් දන්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභ වටිනාකම එක් එක් සේවයකයන්ගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේ දී සැලකිල්ලට ගත යුතුය.

උපයන විට ගෙවීම් බදු ගණනය කිරීම සඳහා නිල නිවාස,මහල් නිවාස සහ පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන ආදිය ලබා දීම වැනි මුදල් නොවන ප්‍රතිලාභ සැලකිල්ලට ගත යුතු බවට 2018/GM/39/FM  හා අංක 526 දරන ගිණුම් චක්‍රෙල්ඛයෙන් උපදෙස් නිකුත් කරන ලදී. නව දේශීය ආදායම් පනත 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමත් සමඟ උපදෙස් නිකුත් කර ඇති බැවින් ලංවිම සියළු අංශ විසින් මෙයට අනුකූලවීමට සාධාරණ කාලයක් ගතවනු ඇත.

(ඉ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සියයට 10 සිට සියයට 14 දක්වා වු පොලී අනුපාතයකට මෝටර් වාහන ණය ලබා දීම වෙනුවට ලංවිම විසින් සියයට 4.2 ක පොලී අනුපාතයට මෙම වාහන ණය ලබා දී තිබීම.

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වගන්තිය යටතේ මණ්ඩලයේ බලතල ලැයිස්තු ගත කර ඇත.

*12 (ක) වගන්තිය මණ්ඩලයේ කටයුතු පරිපාලන කිරීම සම්බන්ධයෙන් රීති සම්පාදනය කිරීම*

*12 (න) වගන්තිය මණ්ඩලයේ මතය අනුව සිය ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය සියලු දේ කිරීම*

ඒ අනුව සඳහන් කරන ලද සොයාගැනීම් මණ්ඩලයේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සේවකයන්ගේ

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

විත්ත ධෛර්යය නංවාලීමට මණ්ඩලය විසින් එහි සේවකයන්ට ලබා දී ඇති ප්‍රතිලාභ සම්බන්ධයෙන් වේ. තවද, පනත මගින් මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීතිරීති සම්පාදනය කිරීමට මණ්ඩලයට බලය ලබා දෙයි.

- මණ්ඩලයේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද ලිඛිත නීති හෝ වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවීම.

(අ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තිය

ලංවිම විසින් එහි පාරිභෝගික තැන්පතු වලට පනතේ දක්වා ඇති පරිදි පොළියක් ගෙවා නොතිබුණි.

1. 2009 අංක 20 දරණ ලංකා විදුලිබල පනතේ අංක 3 (ඈ) වගන්තිය හා අංක 30 වගන්තිය අනුව, විදුලි ගාස්තු ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියම කළ යුතුය. කෙසේ වුවද දැනට පවත්නා විදුලි ගාස්තු වලින් ලංවිම ව්‍යාපාර කටයුතු පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් උත්පාදනය නොකෙරේ. අදාළ වගන්ති පහත පරිදි වේ.

*"3. (1) කොමිෂන් සභාවේ කාර්යයන් වනුයේ ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය සඳහා ආර්ථික, තාක්ෂණික සහ ආරක්ෂක නියාමකයා ලෙස කටයුතු කිරීම, සහ*

*(ඈ) පාරිභෝගිකයින්ට හැකි උපරිම ආර්ථික හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා බලපත්‍රලාභීන් සහ වෙනත් විදුලිබල ආයතන විසින් අය කරනු ලබන විදුලි ගාස්තු සහ වෙනත් ගාස්තු නියාමනය කිරීම."*

*"30. (1) මෙම වගන්තිය අදාල වන්නේ:*

*(අ) විදුලිය සම්ප්‍රේෂණය කිරීම සහ තොග වශයෙන් විකිණීම සඳහා සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා විසින් පනවනු ලබන ගාස්තු හෝ අය කිරීම් (මින්පසු "සම්ප්‍රේෂණය හා තොග විකුණුම් ගාස්තු" ලෙස හැඳින්වෙයි); සහ*

*(ඈ) විදුලිය බෙදා හැරීම සහ සැපයීම සඳහා බෙදා හැරීම් බලපත්‍රලාභියා විසින් පනවනු ලබන ගාස්තු හෝ අය කිරීම් (මින්පසු "බෙදා හැරීම් සහ සැපයුම් ගාස්තු" ලෙස හැඳින්වේ)*

*2. අදාළ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව සම්ප්‍රේෂණය හා තොග විකුණුම් ගාස්තු සහ බෙදාහැරීම් හා සැපයීම් ගාස්තු අදාල පරිදි -*

*(අ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය නිරූපනය කෙරෙන ක්‍රමවේදයකට අනුකූලව අදාල බලපත්‍රලාභියා විසින් සකස් කිරීම.*

*(ආ) බලපත්‍රයෙන් ලබා දී ඇති නියාමනයන් ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද සියලු පිරිවැය කාර්යක්ෂම පදනමකින් අයකර ගැනීම සඳහා අදාළ බලපත්‍රලාභියාට අවසර දීම.*

*(ඇ) 5 වගන්තිය යටතේ දක්වා ඇති පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතුවීම; සහ*

*(ඈ) මහජනතාව දැනුවත්වීම තහවුරු කරගැනීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් අවශ්‍ය පරිදි සුදුසු ආකාරයට ප්‍රසිද්ධ කළ යුතුවීම"*

2. 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3) වගන්තිය ප්‍රකාරව "සෑම බෙදාහැරීම් බලපත්‍රයක්ම (DL) සිය ගනුදෙනුකරුවන්ට ඇප තැන්පතු සඳහා පොළිය ගෙවිය යුතුය. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ.

   28(3) වගන්තිය - " මෙම වගන්තිය අනුව ඇපයන් වශයෙන් කිසියම් මුදලක් බෙදාහැරීම් බලපත්‍රලාභියාට ලබා දී ඇති අවස්ථාවක, එම මුදල මත පොලී මුදලක් බලපත්‍ර ලාභියා විසින් වරින්වර කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව නියම කරන ලද එවැනි අනුපාතයකට බලපත්‍රලාභියාගේ අතැති කාලපරිච්ඡේදය තුළ ගෙවිය යුතුය."

3. වර්තමානයේ ලංවිම ව්‍යාපාරය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදලක් ලංවිම සඳහා නොලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගනුදෙනුකරුවන්ගේ ඇප තැන්පතු එහි කාරක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස භාවිතා කරනු ලැබේ. ඉතිරි කාරක ප්‍රාග්ධනය බැංකු අයිරා කෙටි කාලීන ණය ආදිය මගින් ලබා ගනු ලැබේ.

4. ලංවිම විසින් එහි ගැනුදෙනුකරුවන්ගේ ඇප තැන්පතු කාරක ප්‍රාග්ධනය ලෙස උපයෝජනය කිරීම මගින් ලබාගන්නා ප්‍රතිලාභ එනම්, බැංකු අයිරා මත පොළී ඉතිරි කිරීමෙන් එහි ගනුදෙනුකරුවන් සඳහා ගාස්තු අඩු කිරීම ආකාරයෙන් පොළී ඉතිරිය බෙදා හරිනු ලැබේ. වෙනත් ආකාරයකින් කිවහොත් ඇප තැන්පතුව බැංකුවක තැන්පත් කලේ නම් උපයාගත හැකිව තිබූ පොලිය වශයෙන් කෙටුම්පත් විගණන වාර්තාවේ දක්වා ඇති ඇස්තමේන්තු විටනාකම වන රු. මිලියන 1,592 කට වැඩි මුදලක් 2019 වර්ෂයේ දී එහි ගනුදෙනුකරුවන්ට බෙදා හැර ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

5. මෙම වගන්තිය අනුව බෙදාහැරීම් බලපත්‍රලාභියා (DL) ඇප තැන්පතු මත පොළියක් ගෙවීමට කටයුතු කරන්නේ නම් එය බෙදාහැරීම් බලපත්‍රලාභියා සඳහා අතිරේක මූල්‍ය වගකීමක් විය හැකි අතර කර්මාන්තය සඳහාද අතිරේක පිරිවැයක් විය හැකි වනු ඇත.

6. එබැවින් 2009 අංක 20 දරණ බිදුලිබල පනතේ 28 (3) වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට අමාත්‍යාංශයට නිර්දේශ කර ඇති අතර මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් ද කර ඇත.

(ආ)2013 අංක 31 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43 වගන්තියේ 4ඇ (iii) උප වගන්තිය - පනතේ අවශ්‍යතාවය ප්‍රකාරව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා ලංවිම විසින් හදිසි විදුලිබල මිලදී ගැනුම් (රු. බිලියන 54ක් වටිනා ගිවොපැ 2065 ක් සිදු කර තිබුණු අතර එම පිරියතයන් නියාමකගෙන් විදුලි උත්පාදන බපත්‍රය ලබා ගැනීමෙන් තොරව මෙහෙයුම් කෙරේ.

ලංවිම විසින් 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා තාප විදුලිබල උත්පාදන පිරියතයන් පහත සඳහන් වර්ගයන් 2 යටතේ එකතු කර තිබුණි.

1. ජාත්‍යන්තර තරඟකාරී ලංසු (ICB) ක්‍රියාවලිය අනුගමනය කරමින් කෙටි කාලීන පදනම මත අතිරේක විදුලිබලය ප්‍රසම්පාදනය

2. කල් ඉකුත් වූ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ තාප විදුලි මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) දීර්ඝ කිරීම

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මිලදී ගත් මුළු ඒකක සහ පිරිවැය පහත පරිදි වේ

| වසර | මිළදී ගනු ලැබූ ඒකක ගණන (ගිවොපැ) | මුළු පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් බිලියන) |
|---|---|---|
| 2016 | 442.26 | 11.93 |
| 2017 | 859.43 | 23.57 |
| 2018 | 474.79 | 13.85 |
| 2019 | 734.99 | 22.20 |
| එකතුව | **2,511.47** | **71.56** |

1. කෙටිකාලීන පදනම මත අතිරේක විදුලි බලය ලබා ගැනීම.

   මෙම කාණ්ඩය යටතේ ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ (ICB) ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් පහත සඳහන් ප්‍රසම්පාදන සිදු කර ඇත

i. ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr / 2016/02 (කෙටිකාලීන පදනම මත මෙගාවොට් 60 ක විදුලිය සැපයීම) එකතු කළ ධාරිතාව - මාස හයක් සඳහා මෙගාවොට් 60 ක්

ii. ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr / 2017/01 (කෙටිකාලීන පදනමක් මත ලංවිම වෙත අතිරේක විදුලි බලය සැපයීම) එකතු කළ ධාරිතාව - මාස හයක් සඳහා මෙගාවොට් 56

iii. ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr / 2019/01 (කෙටිකාලීන පදනමක් මත පරිපූරක විදුලි බලයෙන් මෙගාවොට් 100 ක් සැපයීම) එකතු කළ ධාරිතාව - මාස හයක් සඳහා මෙගාවොට් 100

මෙම සියලු ප්‍රසම්පාදනයන් 2009 අංක 20 දරණ ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 43 වන වගන්තියට අනුකූලව සිදු කර ඇත.

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මිලදී ගත් මුළු ඒකක සහ පිරිවැය පහත පරිදි වේ

| වසර | මිළදී ගනු ලැබූ ඒකක ගණන (ගිවොපැ) | මුළු පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් බිලියන) |
|---|---|---|
| 2016 | - | - |
| 2017 | 167.03 | 5.39 |
| 2018 | 36.80 | 1.96 |
| 2019 | 142.13 | 5.06 |
| එකතුව | **345.96** | **12.41** |

2. ගිවිසුම් කාලය ඉකුත් වූ ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගේ තාප බලාගාරවල මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම.

   මෙම කාණ්ඩය යටතේ ගිවිසුම් කාලය ඉකුත්වී ඇති අයිපීපී තාප බලාගාරවල මිලදී ගැනීමේ ගිවිසුම් පහත පරිදි දීර්ඝකර ඇත. 2009 අංක 09 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 43 වන වගන්තියෙන් කිසිදු නීතිමය බාධාවක් මුල් ගිවිසුම් කාලය ඉකුත්වී ඇති බලාගාර වල ගිවිසුම්කාලය දීර්ඝ කිරීම සඳහා හඳුනාගෙන නොමැත

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

i. සීමාසහිත වීස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගමේ මෙගාවොට් 100 ක බලාගාරය.
   අ. 2016-04-06 සිට වසරක්
   ආ. 2017-04-06 සිට වසරක්
   ඇ. 2018-04-06 සිට වසර තුනක
ii. සීමාසහිත වීස් පවර් මාතර (පුද්ගලික) සමාගමේ මෙගාවොට් 20 ක බලාගාරය.
   අ. 2017-03-25 සිට වසරක්
   ආ. 2019-04-08 සිට අවුරුදු දෙකක්
iii. සීමාසහිත වීෂියා පවර් (පුද්ගලික) සමාගමේ මෙගාවොට් 50 ක බලාගාරය.
   අ. 2019-04-12 සිට අවුරුදු දෙකක්

වීස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට අදාළව සමාලෝචනය කරන ලද කාල සීමාව තුළ මිලදී ගත් මුළු ඒකක මත දරණ ලද මුළු පිරිවැය පහත පරිදි වේ.

| වසර | මිළදී ගනු ලැබූ ඒකක ගණන (ගිවොපැ) | මුළු පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් බිලියන) |
|---|---|---|
| 2016 | 358.74 | 8.48 |
| 2017 | 513.34 | 11.84 |
| 2018 | 362.84 | 9.16 |
| 2019 | 460.92 | 12.70 |
| **Total** | **1,695.85** | **42.18** |

වීස් පවර් මාතර බලාගාරයට අදාළව සමාලෝචනය කරන ලද කාල සීමාව තුළ මිලදී ගත් මුළු ඒකක මත දරණ ලද මුළු පිරිවැය පහත පරිදි වේ.

| වසර | මිළදී ගනු ලැබූ ඒකක ගණන (ගිවොපැ) | මුළු පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් බිලියන) |
|---|---|---|
| 2016 | - | - |
| 2017 | 62.29 | 1.64 |
| 2018 | 19.55 | 0.51 |
| 2019 | 53.20 | 1.74 |
| **Total** | **135.05** | **3.89** |

සීමාසහිත වීෂියා පවර් බලාගාරයට අදාළව සමාලෝචනය කරන ලද කාල සීමාව තුළ මිලදී ගත් මුළු ඒකක මත දරණ ලද මුළු පිරිවැය පහත පරිදි වේ.

| වසර | මිළදී ගනු ලැබූ ඒකක ගණන (ගිවොපැ) | මුළු පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් බිලියන) |
|---|---|---|
| 2016 | 83.52 | 3.45 |
| 2017 | 116.76 | 4.69 |
| 2018 | 55.59 | 2.22 |
| 2019 | 78.73 | 2.70 |
| **Total** | **334.61** | **13.07** |

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඈ) 1696 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත 46 වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ II (අ) සහ (ආ) වගන්ති

ලංකා විදුලිබල මණ්ඩලය විසින් එක් එක් වර්ෂය අවසානයේ දී දළ ස්ථාවර වත්කම් මුළු වටිනාකමින් සියයට 0.1ක දායකයක් ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ අරමුදලට මාරු කළ යුතුබව දන්වා තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 8,996 ක් පමණක් එම අරමුදලේ ආයෝජනය කර තිබීම.

මෙම වෙනස ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ  ලංවිම වර්ෂ ගණනාවක සිට අහිතකර මුදල් ප්‍රවාහ තත්ත්වයක් අත්විදිමින් සිටින බැවින් රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ ආයෝජනයක් සිදු නොකිරීමයි. කෙසේ වුව ද ලංවිම ද්‍රවශීලතා තත්ත්වය හා මුදල් ප්‍රවාහයන් වැඩි දියුණු වූ පසු දළ ස්ථවර වත්කම් වලින් 0.1%කට සමාන ආයෝජනයක් රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පීඊඩී 12 චක්‍රලේඛනයේ 9 (4) වගන්තිය

සිය සේවකයන් නිදහස් කරන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම ඉවත දැමීමට මණ්ඩලයට නොහැකි බැවින් ඒ සඳහා දරන වියදම් ලංවිමට පාලනය කළ නොහැක.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 21,080 ක්වූ වෙළඳ ණයගැති ශේෂයෙන් සාමාන්‍ය හා තොග සැපයුම් වලට අදාළව රු. මිලියන 3,322.2 ක ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක් හිඟ හිට පැවති අතර, ඉන් රු. මිලියන 1,840 ක් වර්ෂ 05 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

ඉහත ශේෂයෙන් රු. 2,649,155,825 ක මුදලක් නඩු පැවරීම හෝ නිරවුල් කිරීමට අවශ්‍ය වන අවසන් ණයගැතියන්ගෙන් නියෝජනය  වන අතර ඒ සඳහා යම් කාලයක් ගතවනු ඇත.ඉතිරි ශේෂයෙන් රු. මිලියන 1,051 ක් මතභේදාත්මක වන අතර නිරවුල් කිරීම සඳහා නිර්දේශයන් ලබා ගැනීමට කමිටු පත් කරන ලදී.  තවත් රු. මිලියන 30ක මුදලක් සඳහා ලියා හැරීම් ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ඒ අනුව හිඟ ණයගැතියන්ගේ ශේෂයන් අධීක්ෂණය කිරීමේ හා අයකර ගැනීමේ නිසි ක්‍රමවේදයක් ලංවිම සතුව පවතී.

(ආ) රු. 2,635,007,475 ක් වු පහත සඳහන් විවිධ ණයගැති ශේෂ 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 5කට වැඩි කාලයක් අය කර ගැනීමෙන් තොරව පැවතීම.

| ණයගැතියාගේ නම | මුදල (ශ්‍රී ලං රු.) | අදහස් දැක්වේ. |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය | 225,000,000 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද නියෝගයට අනුකූලව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු උපණය ආපසු ගෙවීමේදී හිලව් කිරීමට ඇති හෙයින් රු. මිලියන 225ක ලැබිය යුතු මුදල ලංවිම පොත් වලින් 2015 වර්ෂයේ සිට පැවතීම නිරවුල් කළ නොහැක. |
| රජයේ ආයතන සඳහා විදුලි සෝපාන වායු සමීකරණ හා වෙනත් විදුලි ජනන යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ලැබිය යුතු | 120,653,322 | මෙය විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ජනාධිපති මන්දිරයෙන් ලැබිය යුතු මුදලේ වටිනාකමයි. ජනාධිපති මන්දිරයෙන් කරන ලද අරමුදල් ඉල්ලීම මත, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින්  උපදෙස් සී ඇත්තේ භාණ්ඩාගාර ණය ආපසු ගෙවීමේදී එම මුදල හිලව් කරන ලෙසයි.එබැවින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් වලට අනුව ක්‍රියා කිරීමට අපේක්ෂිතය. |
| ප්‍රාග්ධන නොවන කෙරීගෙන යන වැඩ | 8,601,341 | රජයේ සවිකිරීම් කාර්යයන් සඳහා ලැබිය යුතු මුදල් වලින් මෙම ශේෂය නියෝජනය වන අතර මෙම දිගු කාලීන ශේෂයන් නිරවුල් කිරීම සඳහා පියවර ගෙන ඇත. |
| සීමාසහිත වුඩ් ගෲප් ගෑස් ටර්බයින් සමාගම | 8,264,352 | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SEA) | 897,025,999 | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලැබිය යුතු ශ්‍රී ලංකා රුපියල් 897,025,999 ක්වු ශේෂය ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමට අතිරේක මුදල් කළමනාකරු (සම්ප්‍රේෂණ) විසින් කටයුතු ආරම්භ කර ඇත. ඊට අමතරව මෙම ගැටලුව සඳහා විමර්ශන කමිටුවක් ද පත්කර ඇත |
| සීමාසහිත ඒඊඑස් කැළණිතිස්ස (පුද්ගලික) සමාගම | 1,368,964,445 | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| සීමාසහිත නොදර්න් පවර් (පුද්ගලික) සමාගම | 358,739 | ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඈ) ගල් අඟුරු ඌනතාවයක් සඳහා ලංකා ගල් අඟුරු සමාගමෙන් ලැබිය යුතු රු.714,965,435 ක මුදලක් කිසිදු අයකිරීම් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව වර්ෂ 05කට වැඩි කාලයක් හිඟ හිට පැවතීම.

මෙම ශේෂය එම්/එස් ටොරියන් අයන් ඇන්ඩ් ස්ටීල් කම්පණි සමාගමට අදාල වන රු. 478,179,795.00 කින් හා එම්/එස් ලිබර්ටි කොමර්ඩිටීස් ලිමිටඩ් සමාගමට අදාළ වන රු. 236,785,639.43කින් සමන්විත වේ. ටෝරියන් අයන් සාමගම සම්බන්ධයෙන් ලැබිය යුතු ශේෂ සඳහා අමාත්‍ය මණ්ඩල කමිටුවක් පත්කරන ලද අතර අවසාන වාර්ථාව වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දෙන ලදී.

(ඇ) එකතුව රු. 4,947,283,160ක් වු බැර ශේෂයක් 2019 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමෙන් තොරව දිගු කාලයක් පැවතීම.

රු. 4,947,283,160 ක් වු වටිනාකමෙන්  රු. 1,065,828ක් 2017/2018 කාලයට අදාළව ලංකා ගල් අඟුරු සමාගමට ප්‍රමාද ගාස්තු ගෙවීමක් වන අතර ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම සඳහා ලක්විජය බලාගාරය විසින් 2020 වර්ෂයේ දී අනුමැතිය ලබා දී ඇත.

තවද චයිනා මැෂිනරි ඉන්ජිනියරින් කොපරේෂන් (CMEC) සමාගමට ගෙවිය යුතු රු. 3,596,324,467ක් ඉහත ශේෂයේ ඇතුළත් වේ. 2014 හා 2015 වර්ෂ සඳහා CMEC සමාගමේ හිඟ ගෙවීම් නිරවුල් කරන ලද අතර 2016, 2017 හා 2018 වර්ෂ සඳහා ගෙවීම් අපේක්ෂිතයි. වර්තමාන අයහපත් මුල්‍ය තත්ත්වය හේතුවෙන් මසකට ඩොලර් මිලියන 2ක් පමණක් ලංවිම විසින් මුදා හරිනු ලැබේ.

2013/2014 ගිණුම් වර්ෂය සඳහා "ගිණුම්කරණ ලාභය" පදනම් කරගෙන බදු බැරකම් තීරණය කිරීම මත ලංවිම හා දේශිය අදායම් දෙපාර්තමේන්තුව අතර ගෙවිය යුතු ලාභාංශ බදු ලෙස සලකනු ලැබු රු.1,270,766,413 පිළිබඳ ගැටළු පවතී. මේ සම්බන්ධයෙන් දේශිය ආදයම් දෙපාර්තමේන්තුව හා මහා භාණ්ඩාගාරය අතර සාකච්ඡා කිහිපයක් සිදුකරන ලදී. මෙම කරුණ මෙතෙක් විසදී නොමැති බැවින්

2020-07-08 දිනැති අංක FM (AFM (HQ)/DFM (Tax)/Deemed Dividend Tax දරන ලංවිම සභාපතිගේ ලිපිය මඟින් මෙම කරුණ විසඳීම සඳහා මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ මැදිහත් වීම ඉල්ලා සිටින ලදී.

උතුරු පළාතේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාල සංකීර්ණය සඳහා කලයුතු අවසාන ගෙවීම රු.10,928,756 ක් වු අතර ගාස්තු පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ අනුමැතිය නොමැති වීම හේතුවෙන් මෙම ගෙවීම හිඟ හිට පැවතුණි.

රු.4,947,283,160 ක් වු ශේෂයෙන් රු. 68,197,696 ක මුදලක් පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතියේ උපචිත වියදම් විය. ප්‍රවර්තන වර්ෂයේ ගිණුම් පොත්වල මෙම මුදල ගැලපීම සඳහා පියවර ගනු ලැබේ.

(ඉ) වත්කම් කළමනාකරණ අංශයේ වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ දැක්වෙන රු. 151,421,219ක මුදලක් වර්ෂ 5කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුනි. එම මුදලින් රු.142,477,285 ක මුදලක් රජයේ ආයතන වලින් අයකරගත යුතු අතර ගනුදෙනුවල ආරම්භක අදියරේදී අයකර ගැනීම සඳහා ලංවිම විසින් කටයුතු කර නොතිබුණි.

අමාත්‍යාංශය හෝ ලංවිම උසස් නිළධාරීන් විසින් දෙන ලද නියෝග මත මෙම සියළු කාර්යයන් ඒ ඒ අවස්ථාවන්හි වැදගත්කම මත පදනම්ව සිදුකරන ලදී. ගෙවීමට තිබෙන ප්‍රමාණයන් නිරවුල් කිරීම සඳහා ඉල්ලීම් කර දැනටමත් අදාළ ආයතනයන් වෙත සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර, ගෙවීමට ඇති මුදල් ලබා ගැනීම සඳහා පසු විපරම් කිරීමට අදාළ ඒකක ප්‍රධානීන් හා ගණකාධිකාරී (වැඩපල හා උපකාරක සේවා) දැනුවත් කර ඇත. ශේෂයෙන් වැඩි ප්‍රමාණයක් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් හා රජයේ රෝහල් වලින් ලැබිය යුතු මුදල් වලින් සමන්විත වේ.

වර්තමානයේ දී, අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමණාකරණය) විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්යයන් භාර ගැනීමට පෙර පාලිත ක්‍රියාපටිපාටියක් ලංවිම විසින් අනුගමනය කරන අතර හිඟහිට තිබෙන මුදල් නිතිපතා අධීක්ෂණය කරනු ලැබේ.

(ඊ) වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු 3,371,599,434 ක මුදලක් සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් ලෙස පැවතීම

වාර්තා අනුව, රු. බිලියන 3.3 කින් රු. බිලියන 3.1ක් නියෝජනය වන්නේ ස්වාධීන විදුලිබල මිල දි ගැනුම් වලට අදාළව ගැටළු සහිත ඉන්වොයිසි සම්බන්ධයෙනි. ගණනය කිරීම හා අදාළ ගිණුම්කරණය සිදුකිරීමේ අරමුණින් මෙම ඉන්වොයිසි අධ්‍යයනය කෙරේ.

(උ) 2019 ඔක්තෝම්බර් 05 දිනට ගල් අඟුරු තොග ඌනතාවය ලෙස රු. 95,211,376 ක් වටිනා මෙට්‍රික් ටොන් 4,952.82 ක ප්‍රමාණයක් හඳුනාගෙන තිබුණ ද සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතික සමීක්ෂණයක් හෝ සිදුකර නොතිබුණි. කෙසේ වුව ද රු. 456,197,162 ක් වටිනා මෙට්‍රික් ටොන් 28,006.66 ක ප්‍රමාණයක් ගල් අඟුරු තොගයේ අතිරික්තය ලෙස 2019 දෙසැම්බර් 31 දිනට ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට තිබෙන ගල් අඟුරු තොග ශේෂය පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

දැනට ගල් අඟුරු සත්‍යාපන ක්‍රියාවලිය අධ්‍යනයන කෙරෙමින් පවතී. 2020 භෞතික සමීක්ෂණ ක්‍රියාවලියේ දී ඉහත සඳහන් සියළු කරුණු සැලකිල්ලට ගනු ලැබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඐ) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂ ගණනාවක් ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට විදුලිබලය විකිණීම හා ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් ඉන්ධන මිල දී ගැනීම සිදුකර තිබුණ ද, එම ආයතනයන් දෙක සමඟ විකුණුම් හා මිල දී ගැනුම් ගිවිසුම් වලට එළඹී නොතිබීම.

ලංවිම සහ ලෙකෝ අතර විදුලිබල විකුණුම් ගිවිසුම් පිළියෙල කිරීම සඳහා පාර්ශවයන් දෙකේම උසස් නිළධාරීන්ගේ සහභාගිත්වය සහ නීතිමය නිෂ්කාශණය සහිතව කටයුතු සිදුකර තිබුණි. කෙසේ වුව ද මෙතෙක් අදාළ පාර්ශවයන්ට ගිවිසුමකට එළඹීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් 2018 ජුලි 24 දින නිකුත් කරන ලද ලිපිය මඟින් ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර තිබුණි.

ලංවිම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර ඉන්ධන සැපයුම් ගිවිසුමක් (FSA) සඳහා අධ්‍යයනය කිරීමට හා ගිවිසුම සකස් කිරීම සඳහා ලංවිම ඉහළ කළමනාකරණය විසින් කමිටුවක් පත්කරන ලදී. ඒ අනුව ඉන්ධන සැපයුම් ගිවිසුම සකස් කර අවසන් කිරීම සඳහා ලංවිම හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර සාකච්ඡාවන් කිහිපයක් පවත්වන ලදී.

අවසානයේ ලංවිම සාමාන්‍යාධිකාරී මඟින් ලංවිම සභාපතිගේ අවධානය සඳහා කෙටුම්පත් කරන ලද ඉන්ධන සැපයුම් ගිවිසුම ඉදිරිපත් කරන ලදී.

(එ) ලංකා විදුලිබල මණ්ඩලයේ විදේශ අරමුදල් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා දෙනු ලබන ණය වලින් බැඳීම් ගාස්තු ලෙස රු. 134,447,792 ක මුදලක් 2019 වර්ෂයේ දී ණය නියෝජිතායතනය විසින් අයකර ගෙන තිබීම.

සියළු ව්‍යාපෘති සඳහා බැඳීම් ගාස්තු පොදු කාරණයක් වන අතර ණය ගිවිසුම් වල දැඩි ණය කොන්දේසි හේතුවෙන් එය වැළක්විය නොහැක.

(ඒ) 2018-2037 දිගුකාලීන විදුලි උත්පාදන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, තාප විදුලි බලය හා පුනර්ජනනීය බලශක්තිය පිළිවෙලින් මෙගා වොට් 370 කින් හා මෙගා වොට් 287 කින් සමන්විත මෙගාවොට් 657 ක නව විදුලිබල උත්පාදනයක් එකතු කළ යුතුය.

පහත සඳහන් කරුණු හේතුවෙන් යෝජිත විදුලිබල පිරියතයන් ප්‍රමාද වී තිබුණි.

- බස්නාහිර කලාපයේ “LNG Fired Combined Cycle”විදුලිබල පිරියත

  අධිකරණ නඩුවක් හේතුවෙන් ආරම්භයේ දී ප්‍රමාද වී තිබුණි.

  LOI නිකුත් කිරීමට ලංවිම සඳහා අනුමැතිය ලබා දෙමින් හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව සී/ස ලක්දනව් සමාගම සමඟ විදුලිබල මිල දී ගැනුම් ගිවිසුමකට එළඹීමට 2020 පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. ව්‍යාපෘති කමිටුව සීමාසහිත ලක්දනව් සමාගම සමඟ සාකච්ඡා කර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට හා CANC වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අමාත්‍ය මණ්ඩලයට විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් මඟින් සමාලෝචනය කරන ලද අතර කමිටු වාර්තාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

- ගෑස් ටර්බයිනර්

  ටෙන්ඩර් කිරීම සිදුකරන ලදී. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදී. තාක්ෂණ ඇගයීම් කමිටු වාර්තාව සලකා බැලීමෙන් පසු අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් (2020-04-22 දින) ප්‍රසම්පාදනය පිළිබඳ තීරණය ගැනීමට හැකිවනු පිණිස ප්‍රතිපාදන වෙන්කර ගෙන දන්වන ලෙස ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලා ඇත.

- උමා ඔය

  ඉදිකිරීම් වල දී ගැටළු සිදුවීම හේතුවෙන් (පීඩන චනලය තුළට ජලය ප්‍රවේශනය) හා සමාජ ගැටලු හේතුවෙන් ප්‍රමාද විය. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ විෂය පථය යටතට ව්‍යාපෘතිය අයත් විය. වර්තමාන ඇස්තමේන්තු අනුව 2021 වර්ෂයේ දී විදුලි බලාගාරය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

- සුළං විදුලිබල පිරියත

  ටෙන්ඩර් කිරීමේ හා ප්‍රදානය කිරිමේ ප්‍රමාදය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය.

  විදුලිබල හිඟය සපුරාලීම සඳහා අදාල අනුමැතීන් සමඟ පහත සඳහන් විදුලිබල පිරියතයන් මෙහෙයුම් කෙරේ.

- ප්‍රධාන විදුලිබල පිරියත ක්‍රියාත්මක කරන තෙක් දැවි තෙල් විදුලිබල පිරියතයන් යොදා ගැනීම

  2019 වර්ෂයේ දී විදුලිබල ඉල්ලුම් අවශ්‍යතාය සපුරාලීම සඳහා කෙටි කාලීන අතිරේක විදුලි බලය මෙගා වොට් 100ක ධාරිතාවයක් ප්‍රසම්පාදනය කරන ලදී.අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 19/0173/113/001 ප්‍රකාරව 2019-01-14 දින මේ සදහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. රු. බිලියන 5.06ක පිරිවැයකට 2019 වර්ෂයේ දි මෙම විදුලි බල පිරියත වලින් ගිවොපැ142.13ක් උත්පාදනය කරන ලදී.

- විදුලිබල ඉල්ලුම් අවශ්‍යතාවය සැපයීම සඳහා මෙගා වොට් 171 ක සමුච්චිත ධාරිතාවයකින් යුත් එස් පවර් මාතර, එස් ඇඹිලිපිටිය හා ඒෂියා පවර් සමඟ වු කල් ඉකුත් වු විදුලිබල මිල දී ගැනුම් ගිවිසුම් 2021 වර්ෂය දක්වා දීර්ඝ කරන ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 18/0525/727/014/TBR ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018-03-27 දින ලබා දෙන ලදී. රු. බිලියන 17.15 ක පිරිවැයකට 2019 වර්ෂයේ දී ගිවොපැ 592.56ක් මෙම විදුලිබල පිරියත 3න් උත්පාදනය කරන ලදී.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(ඔ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේ දී හඳුනාගන්නා ලද රු. 39,551,696 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින් විශේෂ විමර්ශනයක් සිදුකරන ලදි.

ඉහත රු. 39,551,696 ක ඌනතාවය ශේෂයන් 2කින් සමන්විත වේ. එනම් තොග ඌනතාවය රු. 2,510,056 ක් හා තොග ඌනතාවය රු. 37,041,640 ක් යනුවෙනි.

*තොග ඌනතාවය - රු. 2,510,056*

2017-05-04 දිනැති අංක NP/DGM/HRO/Inquiry දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උ.ප.) ගේ ලිපිය මඟින් කමිටුවක් පත් කරන ලද අතර 2019-10-03 දින කමිටු වාර්තාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උ. ප.) වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව තොග ඌනතා මුදල වන රු. 2,510,056.33 (කමිටු ගාස්තු ඇතුළුව) ගබඩා භාරකරු වන ජේ. ඒ. එච්. අංසක ජයකොඩි මයාගෙන් (PF No' 37432) අයකර ගැනීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උ.ප) ඔහුගේ අංක NF/DGM/HRO/Inquiry හා 2019-10-09 දින දරණ ලිපිය මඟින් උපදෙස් දී ඇත. ගබඩා භාරකරු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උ.මැ.ප.) වෙත 2019 ඔක්තෝම්බර් මාසයේ දී මාරු කරන ලද අතර ඔහුගේ අය විය යුතු ශේෂය (රු මිලියන 2.5) වෙනත් ලැබිය යුතු ශේෂයන් යටතේ වාර්තා කර ඇත.

අතිරේක සාමාන්‍යාධිකාරී (DD1) විසින් ඔහුගේ අංක DGM (C & C)/DD1/HRO/ADMN/10හා 2019-11-28 දරන ලිපිය මඟින් මෙම මුදල එම සේවකයාගෙන් අයකර ගැනීම සඳහා උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වුව ද ජයකොඩි මයා ඔහුගේ 2020-01-05 දිනැති ලිපියෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස ඉල්ලා සිටි අතර ඒ අනුව චෝදනා පත්‍රයන් නිකුත් කර ඇත.

මෙයට අමතරව, අතිරේක සාමාන්‍යාධිකාරී (DD1) විසින් 2020-09-23 දිනැති අංක AGM (DD1)/DGM (CBC)/HRO/D1/162 දරණ ලිපිය මඟින් විධිමත් පරීක්ෂණ තීරණයට යටත්ව වාරික 180 කින් ඌනතා මුදල අයකර ගැනීම සඳහා උපදෙස් දී ඇත.

*තොග ඌනතාවය - රු. 37,041,640*

ද්‍රව්‍ය සැපයීමෙන් තොරව වංචනිකව මුළු වටිනාකම රු. 28,231,000 ක් වන මුදල් ලබා ගැනීම හේතුවෙන් සී/ස රිවර්ඩිසන් ප්‍රොජෙක්ට්ස් (ප්‍රද්) සමාගමෙන් ලංවිම වෙත ලැබිය යුතු රු. 28,331,000 ක මුදලක් 25%ක් කමිටු ගාස්තු ඇතුළත්ව අයකර ගැනීම සඳහා එම සමාගමට එරෙහිව ලංකා විදුලිබල මණ්ඩලයේ නීති නිළධාරී විසින් මේ සම්බන්ධයෙන් එන්තරවාසියක් නිකුත් කර ඇත. පාඩුවට එරෙහිව තවදුරටත් කිසියම් ගැලපීම් තිබේද යන්න හඳුනාග ැනීම සඳහා මීට අමතරව කඩිනම් ආකාරයකින් තොග ද්‍රව්‍ය පිළිබඳ තවදුරටත් සමීක්ෂණයක් සිදුකරන ලදී. ඒ අනුව ගැලපීම් කිහිපයක් සිදු කිරීමෙන් පසු පාඩු මුදල රු මිලියන 8.3 දක්වා අඩු කරන ලදී. දැනට අභ්‍යන්තර විමර්ශනය අවසන් කර ඇති අතර ඒ අනුව ගබඩා භාරකරු යු. පී. උදාර ගුණරත්න මයාට (PF No. 37475) එරෙහිව විනයානුකූල පියවර ගනු ලැබේ. තව ද අංක B/1164/15 දරන අධිකරණ නඩුව ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ තීරණයකට එළඹීම සඳහා ඇත.

(ඕ) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාල පරිච්ඡේදය තුළ දී වත්කම් කළමනාකරණ අංශයේ (විදුලිබල පිරියත) සිදු වූ රු. 3,674,861ක තොග ඌනතාවයන් සඳහා වගකිව යුතු වූ පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි.

තොග ඌනතාවය පිළිබඳ ගැටළුව විමර්ශනය කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) විසින් නව කමිටුවක් පත් කරන ලද අතර, එම වාර්තාවට අනුකූලව කටයුතු කරනු ඇත.

(ක) විමර්ශනය සඳහා පත්කළ කමිටුවේ නිර්දේශ පරිදි පාඩුව අයකර ගැනීමෙන් තොරව රු3,789,893 ක තොග ඌනතාවය සඳහා වගකිව යුතු වූ නිලධාරියාට 2011 ඔක්තෝබර් 15 දින විශ්‍රාම යාමට ඉඩ ලබා දී තිබුණි.

තොග ඌනතාවය පිළිබඳ ගැටළුව විමර්ශනය කිරීම සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ) විසින් නව කමිටුවක් පත් කරන ලද අතර එම වාර්තාවට අනුකූලව කටයුතු කරනු ඇත.

**සභාපති**
ලංකා විදුලිබල මණ්ඩලය

# කෙටි යෙදුම්

| | |
|---|---|
| ABB ELK | ASEA Brown Boveri Elasticsearch, Logstash, and Kibana |
| ABC | ඇහැසි පොදි බහන් |
| ADB | ආසියානු සංවර්ධන බැංකුව |
| AFD | ප්‍රංශ සංවර්ධන ඒජන්සිය |
| AFM | අතිරේක මුදල් කළමණාකරු |
| AGM | අතිරේක සාමාන්‍යාධිකාරී |
| AMC | විගණන හා කළමනාකරණ කමිටුව |
| AMHM | වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික |
| AVR | ස්වයංක්‍රීය වොල්ටීයතා නියාමනය |
| B&OS | ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය |
| BCD | ද්විමය කේත දශම |
| BHPP | බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය |
| BOI | ආයෝජන මණ්ඩලය |
| BOO | ඉදිකර, හිමිකරගෙන ක්‍රියාත්මක කිරීම |
| BST | තොග සැපයුම් අයක්‍රමය |
| BSTA | තොග සැපයුම් ගනුදෙනු ගිණුම |
| C&C | වාණිජ හා ආයතනික |
| CCPP-GT | ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය - වායු ටර්බයින |
| CCPP-ST | ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය - වාෂ්ප ටර්බයිනය |
| CDM | පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය |
| CE | ප්‍රධාන ඉංජිනේරු |
| CEB | ලංකා විදුලිබල මණ්ඩලය |
| CECB | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය |
| CENEIP - P2 | පවිත්‍ර බලශක්ති හා ජාල කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - පැකේජය 02 |
| CFL | සංයුක්ත ප්‍රතිදීප්ත පහන |
| CMDS | චක්‍රලේඛ, අත්පොත් හා ලේඛන පද්ධතිය |
| CMMS | පරිගණකගත නඩත්තු කළමනාකරණ පද්ධතිය |
| CMT | ආයතනික කළමනාකරණ කමිටුව |
| CNEEC | චීන ජාතික විදුලි උපකරණ සංස්ථාව |
| COPE | පොදු ව්‍යාපාර කාරක සභාව |
| CP | මධ්‍යම පළාත |
| CPC | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව |
| CPD | අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය |
| CRMS | පාරිභෝගික සබඳතා කළමනාකරණ පද්ධතිය |
| CS&RA | ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු |
| CS | ආයතනික ක්‍රමෝපාය |
| CSC | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය |
| CT | ධාරා ට්‍රාන්ස්ෆෝමරය |
| CW&B | සිවිල් වැඩ හා ගොඩනැගිලි |
| DAB | විනය අභියාචනා මණ්ඩලය |
| DAS | Distributed Antenna System |
| DC | සෘජු ධාරාව |
| DD1 | බෙදාහැරීමේ අංශය 1 |
| DD2 | බෙදාහැරීමේ අංශය 2 |
| DD3 | බෙදාහැරීමේ අංශය 3 |
| DD4 | බෙදාහැරීමේ අංශය 4 |
| DFM | නියෝජ්‍ය මුදල් කළමනාකරු |
| DGA | විසුරුම්ගත වායු විශ්ලේෂණය |
| DGM | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DL | බෙදාහැරීමේ බලපත්‍රලාභී |
| DSE&CSM | වේලි ආරක්ෂණ පරිසර හා සිවිල් නඩත්තු |
| DSM | ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණය |
| EAS | ඉංජිනේරු උපදේශන සේවා |
| EGC | සේවක දුක්ගැනවිලි කමිටුව |
| EIA | පාරිසරික බලපෑම් ඇගයීම |
| EIRI | බලශක්තිය ඉරාන ඉස්ලාම් ජනරජය |
| EMS | බලශක්ති කළමණාකරණ පද්ධතිය |
| EP | නැගෙනහිර පළාත |
| EPC | ඉංජිනේරු, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් |
| ERP | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ |
| EVCS | විදුලි වාහන ආරෝපණ ස්ථාන |
| FS&PD | ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන |
| FSUR | පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය |
| GCT&DLRP | මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය |
| GIS | වායු පරිවරණිත ස්විච් ගියරය |
| GIS | භූගෝලීය තොරතුරු පද්ධතිය |
| GL | ජනන බලපත්‍රලාභී |
| GOSL | ශ්‍රී ලංකා රජය |
| GPD&EEIPP | හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය |
| GPS | ගෝලීය ස්ථානගතකරණ පද්ධතිය |
| GSCS | කොටුවා උපපොළ තැනීම් ව්‍යාපෘතිය |
| GSS | කොටුවා උපපොළ |
| GT | වායු ටර්බයිනය |
| HI | සෞඛ්‍ය දර්ශකය |
| HR | මානව සම්පත් |
| HV | අධි වෝල්ටීයතාවය |
| HVDC | අධි වෝල්ටීයතා සෘජු ධාරාව |
| HVTLP | හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ රැහැන් ව්‍යාපෘතිය |
| IAEA | ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය |
| ICBC | චීන කර්මාන්ත හා වාණිජ බැංකුව |
| ICT | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| IEC | ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණික කොමිෂන් සභාව |
| IED | බුද්ධි විද්‍යුත් උපකරණය |
| IPB | පරිවරණිත කලා බසය |
| IPP | ස්වාධීන විදුලිබල නිෂ්පාදකයෝ |
| IT | තොරතුරු තාක්ෂණය |
| IVR | අන්තර් ක්‍රියාකාරී හඬ ප්‍රතිචාරකය |
| JICA | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය |
| KNGTP | කැළණිතිස්ස නව වායු ටර්බයින ව්‍යාපෘතිය |
| KPS | කැළණිතිස්ස විදුලි බලාගාරය |
| LCC | ප්‍රාදේශීය පාලන කුටිය |
| LECO | ලංකා විදුලි (පෞද්ගලික) සමාගම |
| LED | ආලෝක විමෝචන දියෝඩය |
| LKR | ශ්‍රී ලංකා රුපියල් |
| LKAS | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය |
| LNG | ද්‍රව ස්වභාවික වායු |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| LNGPP | ද්‍රව ස්වභාවික වායු විදුලිබල ව්‍යාපෘති |
| LOI | අභිප්‍රාය ලිපිය |
| LRP | පැටවුම් පර්යේෂණ වැඩසටහන |
| LRT | සැහැල්ලු දුම්රිය සංක්‍රමණය |
| LTGEP | දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LTL | ලංකා ට්‍රාන්ස්ෆෝමර සමාගම |
| LTTDP | දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම |
| LV | අඩු වෝල්ටීයතාවය |
| LVPP | ලක්විජය විදුලි බලාගාරය |
| MEPS | අවම බලශක්ති කාර්යක්ෂමතා ප්‍රමිතිය |
| MHPP | මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය |
| MIS | කළමනාකරණ තොරතුරු පද්ධතිය |
| MIV | ප්‍රධාන පිවිසුම් වැල්වය |
| MLKR | ශ්‍රී ලංකා රුපියල් මිලියන |
| MLTS | මධ්‍යම මට්ටමේ කාර්මික කාර්ය මණ්ඩලය |
| MMAI&RD | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය |
| MMT | මෙට්‍රික් ටොන් මිලියන |
| MOIWM | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය |
| MOPE&BD | විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය |
| MOU | අවබෝධතා ගිවිසුම |
| MV | මධ්‍යම වෝල්ටීයතාවය |
| MVA | මෙගා වොට් ඇම්පියර් |
| MWPP | මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘති |
| NCP | උතුරු මැද පළාත |
| NCRE | සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය |
| NEA | ජාතික පාරිසරික පනත |
| NKBP | නව කැළණි පාලම ව්‍යාපෘතිය |
| NTB | නේෂන් ට්‍රස්ට් බැංකුව |
| NTDND&EIP | ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය |
| NTPC | සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම |
| NWP | වයඹ පළාත |
| O&M | මෙහෙයුම් හා නඩත්තු |
| OEM | මුල් උපකරණ නිෂ්පාදනායතනය |
| OH&S | වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව |
| OLPS | පැරණි ලක්ෂපාන විදුලි බලාගාරය |
| OLTC | රැහැන් සවැති මාරුකුරුව |
| ONAN | Oil Natural Air Natural |
| P&D | සැලසුම් හා සංවර්ධන |
| PAP | ව්‍යාපෘතියෙන් බලපෑමට ලක්වූ පුද්ගලයා |
| PD | ආරක්ෂණ සංවර්ධනය |
| PD | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PHM | ව්‍යාපෘති හා අධිසැර නඩත්තු |
| PICS | පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධතිය |
| PLC | බල රැහැන් සංදේශ |
| PLTS | පාර්ශ්ව රේඛා දුරකථන පද්ධතිය |
| PMU | ව්‍යාපෘති සංවර්ධන ඒකකය |
| POS | අලෙවි මධ්‍යස්ථාන |
| PPA | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PPM | විදුලි බලාගාර කළමණාකරු |
| PS | විදුලි බලාගාරය |
| PS | ආරක්ෂක පද්ධතිය |
| PSRSP | විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය |
| PUCSL | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| PV | ප්‍රකාශ වෝල්ටීයතාව |
| QMS | පෝළිම් කළමනාකරණ ක්‍රමය |
| R&D | පර්යේෂණ හා සංවර්ධන |
| RCL | ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
| REATDP | පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය |
| REP | යෝජනා ඉල්ලුම |
| RLNG | ප්‍රති-වායුගත ද්‍රව ස්වභාවික වායු |
| ROR | ගලන නදී ජල |
| SAIDI | පද්ධති සාමාන්‍ය ඇණහිටුම් කාල සීමා දර්ශකය |
| SAIFI | පද්ධති සාමාන්‍ය ඇණහිටුම් සංඛ්‍යාත දර්ශකය |
| SAS | උපපොළ ස්වයංක්‍රියකරණ පද්ධති |
| SCADA | අධීක්ෂණ පාලන හා දත්ත උකහා ගැනුම |
| SEC | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව |
| SEPA | Societa Elettonica Per Automazione |
| SFRA | ඇමදුම් සංඛ්‍යාත ප්‍රතිචාර විශ්ලේෂණය |
| SLE | ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම |
| SLFRS | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය |
| SLS | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| SLT | ශ්‍රී ලංකා ටෙලිකොම් |
| SMS | කෙටි පණිවිඩ සේවය |
| SOE | රජය සතු ව්‍යාපාර |
| SP | දකුණු පළාත |
| SPPA | ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් |
| SSL | ගුණ තත්ත්ව ආලෝකකරණය |
| TCPP | ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය |
| TD1 | ද්විත්ව පරිපථ කුළුණ (කෝණය) |
| TL | සම්ප්‍රේෂණ බලපත්ලාභියා |
| TLCP | සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතිය |
| TMB | භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව |
| TPCL | ට්‍රින්කොමලී පවර් කම්පනි ලිමිටඩ් |
| UG | භූගත |
| UHF | අත්‍යාධික සංඛ්‍යාතය |
| UOHPP | උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය |
| UOMDP | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| USD | එක්සත් ජනපද ඩොලර් |
| VHF | ඉතා ඉහළ සංඛ්‍යාතය |
| VIP | ඉතා වැදගත් කොටස් සේවාවක් |
| VVIP | ඉතාමත්ම වැදගත් කොටස් සේවාවක් |
| WAN | පුළුල් ක්ෂේත්‍ර ජාලය |
| WOM | බලපත් මෙහෙයුම් හා නඩත්තු |
| WPN | බස්නාහිර පළාත උතුර |
| WPS | බස්නාහිර පළාත දකුණ |
| WS&AS | වැඩපොළ හා උපකාරක සේවාව |

Designed & Printing by **Ceylon Printers PLC**